# THE KOKILA SANDESA

**A CLASSICAL POEM**

BY

THE PRESIDENT OF THE IRUGALKULATILAKA PIRIVENA

***REVISED AND EDITED WITH THE OLD "SANNA"***

BY

P. S. PERERA.

ඉරුගල්කුලතිලක පරිවෙණාධිපති ෂඩ්භාෂා පරමේශ්වර

**මහා ස්වාමිපාදයන් විසින් විරචිත**

# කොකිල සන්දේශය.

(පුරාතන සන්නයෙන්ද යුක්තයි.)

**පී. ඇස්. පේ‍්‍රරා මහත්මයා විසින්**

ලිපිදෝෂාපහරණයෙන් සංස්කරණලදි.

**ජී. ඇෆ්. මුනසිංහ** සහ **ඇන්. ජේ. කූරේ**

යන අප විසින් මුද්‍රණය කරවනලදී.

PRINTED AT VIDYASAGARA PRINTING WORKS.

1906.

# THE KOKILA SANDESA

## A CLASSICAL POEM

BY

THE PRESIDENT OF THE IRUGALKULATILAKA PIRIVENA

*Revised and Edited with the old 'Sanna'*

BY

P. S. PERERA.

ඉරුගල්කුලතිලක පරිවෙණාධිපති ෂඩ්භාෂා පරමෙශ්වර

**මහා ස්වාමිපාදයන් විසින් විරචිත**

# කොකිල සඳෙශය.

(පුරාතන සන්නයෙන්ද යුක්තයි.)

**පී. ඇස්. ප්‍රේරා මහත්මයා විසින්**

ලිපිදෙෂාපහරණයෙන් සකස්කරණලදී.


**ජී. ඇෆ්. මුතසිංහ** සහ **ඇන්. ජේ. කූරේ**

යන අප විසින් මුද්‍රණයකරවනලදී.

PRINTED AT VIDYASAGARA PRINTING WORKS.

1906.

## සංඥාපනය.

# කෝකිල සන්දේශය.

---

මේනම් මධුර මනෝහර කාව්‍යය ජයවර්ධනපුරකාලයෙහි එනම් මීට වර්ෂ 433 කින් පමණ මත්තෙහි දකුණු ලක්දිව මූලගිරිපර්වතප්‍රාන්තයෙහි ඉරුගල්කුලතිලක පරිවෙණාධිපති **ෂඩ්භාෂාපරමේශ්වර මහාස්වාමි**පාදයන්වහන්සේ විසින් එකල යාපාපටුනනම් ජනපදයෙහි රාජ්‍යානුශාසනාකළ **චම්පකපුෂ්පාභිධාන** (සපුමල්) කුමාරෝත්තමයානන්ට හා තදනුවර්තීක අමාත්‍යජනයාටත් ශාන්තිප්‍රදානයකරවනු සඳහා **ශ්‍රීවිෂ්ණු** දිව්‍යරාජෝත්තමයානන්වහන්සේට ඊපසුකරණු පිණිස **කෝකිල** (කොවුල්) පක්ෂියෙකු දූතක්‍රියායෙහි යොදවා දෙව්නුවර පටන් යාපාපටුන දක්වා ගමනයකරවන ආකාරයෙන් ගම් නියම්ගම් ජනපද නගර රාත්‍රි උදය ගඟා තඩාක මාර්ගවර්ණනාදීන් සරසා මධුර කෝමල වෘත්තයන්ගෙන් සමුපලක්ෂිතකොට සකල කාව්‍යලක්ෂණයෙන් අනූනවකරණලද පද්‍යරචනාවකි. එහෙයින් මෙය කාව්‍යරසාස්වාදනයෙහි නියුක්තයන්ගේ ප්‍රමෝදයට අසහාය කාරණාවෙයි. මෙය බොහෝ ගරුකොට සලකණ කාව්‍යයක්නමුත් සොයාගැන්මපවා ඉතා දුෂ්කරවතිබිය. යම්පටක දුකසේ සොයාගත්තත්වරදින් ඉතා ආකූලව කවිගී සැහැලි කියවාගැණීමටපවා අමාරුලෙස පැවැත්තේය. එසේනමුත් පෙලපොත් කීපයක් සපයා හැකිපමණින් සුද්ධකර පුරාතන සන්නයද සොයාබැලිමු. මේවූකලි මීට වර්ෂ 133 කට පමණ පූර්වයෙහිදී අන්‍යතර භවතෙකු විසින් ලියනලද්දකි. කවරෙක් විසින් ලියනලද්දේනමුත් එය වඩා ගරුකළයුත්තක් වශයෙන් නොහැඟෙනවා පමණකුත්නොව කවි බොහෝගණනකට හා සියලුම සැහැලිවල අර්ථයකටත් සන්න නොලියාතිබේ. මෙසේ බැවින් අප විසින් මීට අමුතු සන්නයක් ලියන්ට පටන්ගත්නමුත් අප මිත්‍ර කීපදෙනෙකුගේ අයදුමනිසාත් පුරාතන සන්නයක් තිබියදී අළුත් සන්නයක් ලියා ප්‍රසිද්ධකළායයි එහි තත්වය නොදත් බොහෝදෙනාගෙන් ලැබෙන අපවාද භීතියෙනුත් මේවරට පුරාණ සන්නයම ඌනස්ථානපූරණයකිරීමෙන් ප්‍රසිද්ධකරවන්ට අදහස්කෙළෙමු. මේ සන්නයෙහි අප අදහසට නොගැළපෙනතැන් බොහෝසේ දක්නට ලැබුනමුත් පුරාණ ලිපියෙහි ආකාරය දැනගැන්මට තැබූයෙමු. ලියාගන යන සන්නයද නොබෝකලකින් ප්‍රසිද්ධකරවනබවද මතක්කරමු.

මෙහි 129 වෙනි 135 වෙනි කව්වල සත්ත පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති **ධම්මකිත්ති ශ්‍රී ධර්මාරාමාභිධාන** නායක ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ විසින් ලියාදුන්බව හා කව්වල අශුඩ පාඨ රාශියක් විද්‍යෝදයපිරිවෙණේ උප ප්‍රධානාචාර්ය **මහගොඩ ඥානේශ්වර** ස්ථවිරස්වාමිපාදයන්වහන්සේ ලවා ශුඩකරවාගත්බවද ගෞරවයෙන් මතක්කරමු.

තවද අපගේ මේ කෘත්‍යයෙහිදී අසමදූචාර්‍ය කොලොන්නාවේ විහාරාධිපති **සුගුණසාර** ස්ථවිරස්වාමීන්වහන්සේගෙන්ද විශිෂ්ටාධාර ලැබුනුබැව් සතුටින් මතක්කරමු.

මේවගට,

P. S. PERERA.

වර්ෂ 1906 සැප්තැම්බු මස
25 වෙනි දිනදීය.

සන්න සහිත

# කෝකිල සන්දේශය.

---

**සැරද කොවුලිඳුසඳ-සරසිරි අමා රසසේ**
**තුනුසිරිනි නිලුපුලතුල්-ලැබපුල් අමා රසසේ.**

සරසිරි, (මනුජ ලොකප්‍රසිඬවූ පංචමනම්) ස්වරශ්‍රීයෙන්; අමාරසසේ, (ලෝකයාහට කර්ණරසායන හෙයින්) අමෘතයක්හා සදෘශවූ; තුනුසිරිනි, තනුශ්‍රීයෙන්; නිලුපුල්තුල්, නීලොත්පලයක්හා තුල්‍යවූ; කොවුලිඳුසඳ, කෝකිල පක්ෂිරාජෝත්තමය; අමාරසසේ, (නමහට) දිව්‍යභොජනයක් බඳුවූ; උපුලලැබ, උත්පලයක් ලැබ; සැරද, යුෂ්මත්තෙම චිරකාලයක් ජීවත්වෙහිවා-උපුල්යන තන්හි උපචාරවශයෙන් රේණු යයි හැගේ—මේ සන්දේශ ප්‍රකරණයෙහි පූර්වෝක්ත ක්‍රියායොග්‍යවූ කුශලප්‍රශ්න පූර්වඞ්ගමකොට මේ කෝකිල පක්ෂිරාජයා දූතක්‍රියායෙහි ස්වභාව ලක්ෂණාන්විතභාවය ප්‍රකාශකර මිත්‍රාගලක්ෂණ දක්වා ගන්තව්‍යස්ථාන නියොගයෙන් ඉක්බිති නිෂ්ක්‍රාන්ත නගරවර්ණනාව හා ඒ නගරාධිපතිවූ දිව්‍යරාජයාගේ කීර්ත්තිසම්භාෂණයකොට අවසරගන්වා යාත්‍රාමුහූර්ත විධාන නෛමිත්‍ය ලක්ෂණ මාර්ගවර්ණනා වශයෙන් "ජාපාපට්ටන" නම්වූ නගරයට පැමිණ "වෙම්පගප්පු පෙරුමාල්" යන මහීපාලඞ්කුරෝත්තමයා දූක වක්තෘහුගේ වර ප්‍රාර්ථනාව සැළකර වන පිණිස "සැරදෙන ලකුණු" යනාදී කව කියනලදී.

2 සැරදෙන ලකුණු රුඳි—රතුනෙතිනි යුතු මම්තුර

සුවිමල් සහස පුරුමල් සේසත් සෙමෙ ර
සුවිසල් නව වසහිඳු දියම්හිඟු බෙ ර

පරපුර වදනතුම්—රණකුර කළකිරුළ මෙර

නළා ගෙණ වෙනිත් පිඹිවෙණුට සරමදින්
නළා කරණ කැළුමෙන් සහද පිය නදින්

පුන් සඳ සුරිඳු සඳ සලකුණ අඳින ව ර
බන් සොඳ තෙළි තුඩෙව් තෙල තුඹිනි මනහ ර
මින් දද ජය විරිඳු නද කරණ පියක ර
අන් කොද මෙදියතුර තොප සරිවන පව ර

**2–සැරදෙන**, සැරදෙන්නාවූ; **ලකුණුරුඳි**, ලක්ෂණයෙන් රඤ්ජිතවූ; **රතුනෙතිනියුතු**, රක්තනෙත්‍රයෙන් යුක්තවූ; **මම්තුර**, මාගේමිත්‍රය; **සුවිමල්**, අතිශයින් නිර්මලවූ; සහසපුරුමල්, නලිනපුෂ්ප (මුනපුෂ්ප) නැමති සේසත්සෙමෙර, ශ්වෙතච්ඡත්‍රහා චාමරඇති; සුවිසල්, අතිශයින්විසාලවූ; නව වසහිඳු, අභිනව වසන්තරාජ්‍යාගේ; දියම්හිඟුබෙර, ජයමෘදඟභේරි යක්බඳුවූද; රණකුරකළ, ස්වර්ණාඞ්කුර කළාවූ; කිරුළ, කිරීටයෙහි; මෙර, මාණික්‍යයක්බඳුවූ; පරපුරවදන, (කුණාලජාතකාදියෙහි දක්වන ලද) පරම්පරා වචනයෙන්; උතුම්, උතුම්වූද;–වෙනිත්, අන්‍යවූ; නළා ගෙණ, නලාසංඛ්‍යාත ශුෂිරයක් ග්‍රහණයකොට; පිඹි, ධමනයකළාවූ; වෙණුට, විෂ්ණුනට; සරමදින්, ස්වරඋන්නාමනයනිසා; කැළුමෙන්, අජන වර්ණයෙන්ද; සහද, ස්වකීයහෘදයට; පියනදින්, ප්‍රියවූ නාදයෙන්ද; නලා කරණ, පරක්‍රමකරවන්නාවූ;–සුරිඳුසඳ, සුරෙන්ද්‍ර රාජොත්තමයා; පුන් සඳ, පූර්ණචන්ද්‍රමණ්ඩලයෙහි; සලකුණ, සසලාංඡනය; අඳිනවර, අඤ්ජනය කරණකාලයෙහි; බන්, බන්ධනයකළාවූ; සොඳ, සුන්දරවූ; තෙළිතුඩෙව්, වර්ණතූලිකාද්‍රව්‍යක් බඳුවූ; තෙලතුඹිනි, තොපගේ මෙවංචුව කරණකොට ගෙණ; මනහර, මනොඥවූ; පියකර, ප්‍රියකරුවූ; මින්දද, මකරධවජයාගේ; ජයවිරිඳුනදකරණ, ජයාද්භූත නාදපවත්වන්නාවූ; පවර, ප්‍රවරවූ; තොපසරිවන, යුෂ්මත්තුභා සදෘශවන්නෙක්; මෙදියතුර, මේ ජනදත්‍යන්තරයෙහි; අන්කොද, අන්කවරෙක්ද;–

3 මෙලෙස පසිඳු ගුණමිණි මුහුද තු ල් ලා
ඇ සැ ස රසඳු නෙව් සියතුනු සුනි ල් ලා
පි වි ස සරණ වන අඹදළුව ලො ල් ලා
වෙසෙස අපට සැප තඳකුම කොවු ල් ලා

3–මෙලෙස, මේ යථෝක්තප්‍රකාරයෙන්; පසිඳු, ප්‍රසිද්ධවූ; ගුණමිණි, ගුණරත්නයන්ට; මුහුදතුල්ලා, සමුද්‍රතුල්‍යවූ; ඇසැස, නෙත්‍රයක් නෙත්‍රයක්පසා; රසඳුනෙව්, රසාජනයක්බඳුවූ; සියතුනු, ස්වකීය ශරීරයෙන්; සුනිල්ලා, අභිනීලවූ; අඹදළුවලොල්ලා, ආම්‍රකිසලය ලොභයෙන්; වන පිවිස, වනප්‍රවිෂ්ටව; සරණ, සඤ්චාරණය කරන්නාවූ; කොවුල්ලා, කෝකිලය; තඳකුම, යුෂ්මත්හුගේ දර්ශනය; අපට, අස්මත්ශබ්ද වාච්‍යයන්ට; වෙසෙසසැප, විශෙෂවූ සෞඛ්‍යයයි.

4 මිතුරු තුමෝ පෙරබැඳි මිතුරුදම් ත ර
මතුරු ලෙසින් නොහරිති දෙන ඉසුරු බ ර
සිතුරු වනෙව් සිතුවා සිදු කරණ ව ර
මිතුරු එයින් මනෙපල තසවණත පු ර

4–මිතුරුතුමෝ, මිත්‍රොත්තමයෝ; ඉසුරුබරදෙන, බොහෝ ඓශ්වර්‍ය්‍ය දෙන්නාවූ; පෙරබැඳි, පූර්වයෙහිබැඳිනලද; මිතුරුදම්තර, මිත්‍රධර්මයෙහි ස්ථිරභාවය; මතුරුලෙසින්, මන්ත්‍රයක්මෙන්; නොහරිති, නැති නොකරති; ඒ කෙබඳුදයත්? සිතුවාසිදුකරණවර, අභිමතාර්ථ සම්පාදනයකරණ අවස්ථාවෙහි; සිතුරුවනෙව්, චින්තාමාණික්‍ය රත්නයක් මෙන් වන්නේ; එයින්, ඒකාරණයෙන්; මිතුරු, මිත්‍රය; මනෙපල, මාගේ වචනය; තසවණතපුර, තාගේ කර්ණාභ්‍යන්තරයෙහි පූරණයකර;–

5 නොලැගේ කණට සිනිඳුව ගිරවුන් වද න
නි ස ගේ දුර ඇසෙයි තද සැළලිහිණි ස න
හැ ම ගේ ල ගෙණ පවසන මියුරු තෙපුලි න
නොහැගේ මෙතතු කීමට තොප මිසක් වෙ න

5–ගිරවුන්වදන, කීරපක්ෂීන්ගේ වචනය; සිනිඳුව, සනිග්ධව; කණට නොලැගේ, කර්ණයට ලග්නනොවෙයි; සැළලිහිණිසන, සාරිකා පක්ෂීන්ගේ ශබ්දය; නිසගේ, ස්වභාවයෙන්ම; තද, ස්තබ්ධබැවින්; දුර ඇසෙයි, දූරශ්‍රවණවේ; එහෙයින්–හැමගේ, සියල්ලන්ගේම; ලගෙණ, චිත්තග්‍රහණයකොට; පවසන, ප්‍රකාශකරන්නාවූ; මියුරුතෙපුලින, මධුරවචනයෙන් යුක්තවූ; තොපමිසක්, යුෂ්මත්නුවිනා; මෙතතුකීමට, මේ වක්‍ෂ්‍යමාන වචන කථනයකිරීමට; වෙන, අන්‍යපක්ෂියෙක්; නොහැගේ, නොදන්නා ලැබේ.

6 සෙබෙවින් ගන කලට හස සපද සුරප   තේ
තබමින් ගමන් සරතුරු සිඳුරු සැඟවෙ තේ
ලොබයෙන් රැඟු මලස් වෙති මියුරු දිය නෙතේ
එබැවින් නොපම නිසිබව මෙ යතුරට සි තේ

6–ඝනකලට, වර්ෂාකාලයෙහි; සෙබෙවින්, ස්වභාවයෙන්; හස, හංසයෝද; සපද, ෂට්පාදයෝද; සුරපතේ, ආකාශමාර්ගයෙහි; ගමන්, ප්‍රයාණය; තබමින්, අත්හරිමින්; සර, තටාකාදියෙහිද; තුරුසිඳුරු, වෘක්ෂච්ඡිද්‍රාදියෙහිද; සැඟවෙතේ, නිලීනවන්නාහුය; මියුරු, මයුරයෝ; දියනෙතේ, සූර්ය්‍යයාකෙරෙහි; ලොබයෙන්, ලෝභයෙන්; රැඟුමලස්වෙති, නෘත්‍යයෙහි ප්‍රමාදවත්නොය; එබැවින්, ඒභාවයෙන්; මෙයතුරට, මේයාත්‍රාවට; නොපම, පුෂ්මත්නුම; නිසිබව, සුදුසුබව; සිතේ, හැඟෙයි;–

මිතුරු තුරුපති වොරදින–සරද කල්තුල් සබඳ න අදහා කිමකයත්

7 අස්නක් සදිසි සිරිසඳ ඉඳින හැමව   ර
දිස්නක් ලෙසින් මුළු සිරිලකට පුවත   ර
සස්නත් ලොවත් රකිනා රජෙකුට පව   ර
අස්නක් රැගෙණ යන ගමනකි දුරුකත   ර

මිතුරු, සූර්ය්‍යයාද; තුරුපති, චන්ද්‍රයාද; වොරදින, බලවත්නාවූ; සරදකල්තුල්, ශරත්කාලයක්බඳුවූ; සබඳ, සුහෘදය; නඅදහා, නොප අදහාය යනු; කිමකයත්, කියනු කිම්ද?

7–හැමිසඳ, සඳකල්හි; සිරිසඳ, ශ්‍රියාකාන්තාව; ඉඳින, නෘත්‍යකරන්නාවූ; අස්නක්සදිසි, ආසනයක් සදෘශවූ; මුළුසිරිලකට, සකල ලංකාද්වීපයට; පුවතර, ප්‍රසිද්ධවූද; දිස්නක්සදිසි, දීප්තිමණ්ඩලයක්බඳුවූ; සස්නත්, නෛර්‍යාණිකශාසනයද; ලොවත්, මනුජලෝකයද; රකිනා, රක්ෂාකරන්නාවූ; පවර, ප්‍රවරවූ; රජෙකුට, රාජොත්තමයෙක්හට; අස්නක්රැගෙණ, කර්ණරසායනවූ සන්දේශයක් ග්‍රහණයකොට; දුරුකතර, දූරකාන්තාරයක; යන, ප්‍රයාණයකරන්නාවූ; ගමනෙක, යාත්‍රාවෙක;–

ඉතිම්හපල් කිත් තිලිනදිවි මඬලෙහි රැඟුම් කළකවිකම්හි නෙරපත විසකුණන් තිලිකරපදයොන් විලොම්නොවමහඳ දෙව්බණ ඇව්හිටල තුවන සියබසින් ගෙණ වණම්—නේ විදුලිය සුහුඹුල් කිරිය රැසිතිවත්සඳ තුවනිමුවරද නෙලටකන ඉතිලියයේ පාමොක මිණ්කොමොල් සැව්න්සද–

8 උ න් ආරිය සක්විති රජ දූහැදුර ට
දූ න් වැජඹෙන යාපාපටුන තිරකො ට
න න් සිරියුත් සපුමල් රජ කුමරිඳු ට
දෙන් මෙහසුන් ගෙණගොස් මම්තුර සතු ට

8–උන්, යාපාපටුනෙහි උන්නාවූ; ආරියසක්විතිරජ, ආර්‍ය්‍යචක්‍රවර්ත්ති නම් මහීපාලයා; දුරටදූහැ, දුරට පහකොට; දූත්, වත්මන්කල; යාපාපටුන, යාපාපට්ටනම් නුවර; තිරකොට, ස්ථිරකොට; වැජඹෙන, විජෘම්භමානවූ; නන්සිරියුත්,සම්සැපතින්පැවති; සපුමල්රජකුමරිඳුට, සපුප්කැන් කුමරහට; මෙහසුන්, මේසන්දේශ; ගෙණගොස්, රැගෙණයර; සතුව, සන්තුෂ්ටවූ; මම්තුර, මසබඳ; දෙන්, දුනමැනවි;–

ඉෂ්ටප්‍රියබඳුන්හට කුසලපැන පවසා ගතයුතුතැන් සන්නිදෙස්කර අනතුරු නිකුත්පුරසිරි උසුරුවනු සඳහා ජලදලයනාදී සැහැල්ලපැවසු-

නවද ජලදෙනළු නීලවර්ණානුකාර ශරීරලාවණ්‍යයෙන් නෙත්‍රාභිරාමවූ මිත්‍රොත්තමය මධුරශබ්දාභිසම්පූර්ණ සන්දේශය පසුවපවසම්–දූත් මේ තා යාත්‍රාකරණ පුරප්‍රවරයෙහි වර්ණනා නැමති සවර්ණාලඞ්කාරයෙන් කර්ණාලඞ්කාරකර—

9 ගිරි රද අයුරු පානන් පැය වී දි ය
පිරි මිණි පබල තුල්සල් දෙපස වී දි ය
සිරි කර සතත ගෙවුයන් කුසුම වි දි ය
සිරි දෙව් නුවර බල තුරු නිනද වී දි ය

9–ගිරිරදඅයුරු, (උත්තමකාංචන) සුමෙරු පර්වතරාජයාසේ; පාන්පැය, (ඉන්ද්‍රනීල ලොහිතංකරජතසුවර්ණාදී කර්මාන්තයෙන් පැනනැඟි)නානාවෙක්ප්‍රභාව; වීදිය, විහිදෙන්නාවූ; පා, (අනේකභූමිභෙදෙද්ධිත ප්‍රසාදවත) ප්‍රාසාදපඞ්ක්තියෙන්ද; මිණිපබල, (පියුම්රාවෙරළු මරකත) මාණික්‍යප්‍රවාලාදියෙන්; පිරි, සම්පූර්ණවූ; අතුල්, උපමා විෂයාතික්‍රාන්තවූ; දෙපස, උභයපාර්ශ්වයෙහි; සල්, ආපනසමූහයෙන් යුක්තවූ; වීදිය, (පවුරවරසන්ධිසිංඝාටකාදී විවිධවර්ණ නරනාරි ගණානුචරිත) වීථි වින්‍යාසඇති;සතත, නිරන්තරයෙන්; සිරිකර, ශොභාවට ආකරවූ; කුසුමවිදිය, විකසිත පුෂ්පාදීන් යුක්තවූ; ගෙවුයන්, (මාලතී මල්ලිකාදී ලතාලිඞ්ගිත සමන්තානන්තපාදපාදීන්විසිතුරුවූ) ගෘහොද්‍යානයන්ඇති; තුරු, (වජ්මෘදඟ භෙරිවංශ භූනාතුලල් සක්සින්නන් සොරණෑ කොඹුකාහල වෙණ වීණා මද්දලකුළුතාලංආදී පඤ්චවාද්‍යය) තූර්‍ය්‍යභාණ්ඩයන්ගේද; නිනදවීදිය, නොයෙක් නාද නික්මෙන්නාවූ; සිරිදෙව්නුවර, ශ්‍රීවිෂ්ණුදිව්‍යරාජ නගරය; බල, හිරිසැණයකර;–

10 පිරිදිය පිරුණු පුරළර දිසි මිණි මෙවු ල
තුඟු සුලකළ කළ පුර දොර කර විපු ල
සොම්සිය කිරණ යුගමිණි තෝඩු රසු දු ළ
සුරරද කිරුළ දූරු නිති මෙපුර වර ක ල

10–දියපිරුණු, (ශිශිරනිරපූරිතසුපුෂ්පිත කමලකුවලයාදී ජලජ පුෂ්ප කාන්තෝපශොභිත) පඞ්කජාකුලවූ; පිරි, පරිඛානැමති; නූපුර, පාසල ඔයෙන් යුක්තවූ; පුරළර, (සඵටිකමාණික්‍යයෙන් නිමවනලද) පවුරුව ලල්ල නැමති; මිණිමෙවුල, මණිමෙඛලාදාමයක්ඇති; තුඟු, උස්වූ; සුල කල, සමලඞ්කෘතකොට; කළ, නිර්මිතකළාවූ; පුරදොර, (සාලඞ්කෘතතො රණාඞ්ග) ගොපුරවාරනැමති; විපුල, මහත්වූ; කර, බාහුවක් ඇති; සොම් සියකිරණ, චන්ද්‍රසූර්‍ය්‍යනැමති; රසුදුළ, රශ්මියෙන් බබලන්නාවූ; මිණි තෝඩුයුග, මාණික්‍යතාඩංකයුග්මයක් ඇති; මෙපුරවරකල, මේපුරවරය නැමති කාන්තාව; නිති, නිරන්තරයෙන්; සුරරදකිරුළ දූරු, ශ්‍රීවිෂ්ණු දිව්‍යරාජනැමති කිරීටයපැළැන්දාය වෙයි;–

11 නොවහළ සඳෙහි රිවිසඳ ගණඳුර ලෙස ම
නොවහළ කිරණ තුබුවාමෙන් නොවසර ම
සි රි දු ළ මෙපුරවේ සුසැදූ දොර දොර ම
සු ල ක ළ මිණිතොරණ බබලයි හැමදින ම

11–රිවිසඳ, සූර්‍ය්‍යචන්ද්‍රදෙදෙන; ගණඳුර, ඝනාන්ධකාරය; නොවහළ සඳෙහි, පහනොකළකාලයට; රිවිසඳලෙසම, සූර්‍ය්‍යචන්ද්‍රයන්ගේ බබුළුව නාපිණිස; නොවහළ, නොවළහා; කිරණ, ස්වකීය රශ්මිය; නොවසරම, අවකාශයක්නැතිව; තුබූවාමෙන්, ස්ථාපනකළාසේ; සිරිදුළ, (විචිත්‍රචිත්‍ර කර්මනිර්මිත කනකශෘඞ්ගප්‍රභාවිසරාභිමාන සුධාධවල විමලවිපුල විවිධප්‍රා සාදරාජභවන විශිඛාදී) පුරසිරින් බබලන්නාවූ; මෙපුරවේ, මේනගරවීථි යෙහි; දොරදොරම, වාරයක්වාරයක්පාසා; සුසැදි, සුසජ්ජිතවූ; සුලකළ, අලංකෘතවූ; මිණිතොරණ, මාණික්‍යඛනිර්වාර; හැමදිනම, සදාකාලයෙ හිම; බබලයි, විරාජමානවෙයි;–

12 ඉ ඳු නි ල් මිණිතුළ පා සිව්මැදුර තු ර
ම න ක ල් කල්වත සඳ සදිසි නොවිත ර
සු වි පු ල් ගෙදිගු විල්වැද සරණා නිත ර
වි ය වු ල් දුක්වසක්වායුගගියෝ හැ ර

12–ඉඳුනිල්මිණි, ඉන්ද්‍රනීලමාණික්‍යයන්; තුළ, අතුළාවූ; පා, ප්‍රාසාද යන්හි; සිවුමැදුරතුර, සීහපඤ්ජරඅතුරෙහි; (ප්‍රකාශවන්නාවූ) මනකල්, මනෝඥකුලවූ; කල්, කාන්තාවන්ගේ; සඳසදිසි, චන්ද්‍රසාදෘශවූ; වත, වන් තුයෝ; නොවිතර, අප්‍රමාණවූවාහුද; ඒකාරණයෙන්, සුවිපුල්, සූත්පුල්

ලවු; ගෙදිගුම්ල්, ගෘහතටාකවල්හි; නිතර, අනවරතයෙන්; වැදසරණා, ප්‍රවිෂ්ටව සඤ්චාරණයකරන්නාවූ; සක්වායුග, චක්‍රවාකයුග්මයෝ; වියවුල් දුක්ව, වියෝගදුඃඛයෙන් යුක්තව; හැර්ගියෝ, ඒ අත්නැරගියාහුවෙත්;–

13 ව න් සුරඟන වරඟන උවන දුටුමනි න්
ර න් පියුමැයි දක නොහැකිලෙන සැක සිති න්
න න් මිණි තොරණ කැළුමෙහි පිවිස සුරපති න්
පු න් සිසි වෙස්වලා යනවැන්න බියපනි න්

13–වන්සුරඟන, දිව්‍යාඞ්ගනාවන්වැනිවූ; වරඟන, උත්තමාඞ්ගනාවන්ගේ; උවනදුටුමහින්, මුඛමණ්ඩල දුටුපමණින්; දක, තමා දර්ශනයෙන්; නොහැකිලෙන, මුකුලිත නොවන්නේ; රන්පියුමැයි, ස්වර්ණපද්මයෙක්හෝයන; සැකසිතින්, ශංකාචිත්තයෙන් යුක්තව; සුරපතින්, ආකාශමාර්ගයෙන්; නන්මිණිතොරණ, අනේකමාණික්‍ය බහිර්ද්වාරයන්ගේ; කැළුමෙහි, කාන්තියෙහි; පිවිස, ප්‍රවිෂ්ටව; පුන්සිසි, පූර්ණචන්ද්‍රයෙනුව; බියපතින්, (අසම්භාවයෙන්) භීතියටපැමිණ; වෙස්වලා, ස්වකීයවිලාසය වසාකොට; යනවැන්න, ප්‍රයාණයකරන්නාක්මෙනි;–

14 මෙ පු ර සොබන පිළිමිණි රුඳු පහඟබ ඳ
අ ඹ ර ලෙලෙනසඳ සේදද පවන්වැ ඳ
ප ව ර ඉසුරු ගිර සුරගඟිනි මනන ඳ
නිතොර වැහෙන හැලිසියසිරිසිලි සබ ඳ

14–සොබන, සෝභමානවූ; මෙපුර, මේපුරයෙහි; පිළිමිණිරුඳු, සඵටිකමාණික්‍යයෙන් උපලක්ෂිතවූ; පහඟ, ප්‍රාසාදාග්‍රයෙහි; බඳ, බඳනාලද්දාවූ; සේදද, ශ්වේතධ්වජ; පවන්වැද, මාරුතවේගයෙන්; අඹරලෙලෙනසඳ, ආකාශයෙහි ලීලෝපෙතවූකල්හි; සබඳ, යහලුව; පවර, ප්‍රවරවූ; ඉසුරුගිර, කෛලාශකූටයෙහි; සුරගඟිනි, ආකාශගංගාවෙන්; මනනඳ, (දේවතාවන්ගේ) මනෝනන්දනයකොට; නිතොර, නිරන්තරයෙන්; වැහෙන වහනයවන්නාවූ; හැලි, ජලධාරයෙහි; සියසිරිසිලි, ස්වකීය ශොභාව දරුයේයි;–

15 දි ලි වි දු ලී සැරහූ ඝනරන් පොරො දු
තියුණු වූ ලි දල දළ කොකවැල විහි දු
කනතහැ ලී ගිලි මදවැසි පොද සිනි දු
සර ණ බ ලී ගජමුළු මේ කුළන් බ දු

15–සැරහූ, සජ්ජිතවූ; පොරොදු, ඝන කනකපොරෝදු නැමති, දිලිවිදුලී, දීප්තිමත් විද්‍යුල්ලතාඇති; තියුණු, තීක්ෂණවූ; උලි, උල්වූ; දල; මහත්වූ; දළ, දන්තනැමති; කොකවැලවිහිදු, (ඝනාශ්‍රිතබකාකුල්මත් ■ කෙකාර වයෙන් අහසවිසිරගියාවූ මදමත්)බලාකපඞ්ක්තිඇති; කනත, කර්ණාන්ත

යෙත්; ගිලි, ගලා; හැලි, වහනයවන්නාවූ; මද, මදජලනැමති; සිනිඳු, ස්නිග්ධවූ;වැසි, දියබින්දුඇත්තාවූ; සරණ, සඤ්චාරණය කරන්නාවූ; බලි, බලවත්වූ; ගජමුළු, හස්තිසමූහය; මේකුළුත් බඳු, මේඝකූටසමානයි;-

16 ම ලි ගි ය ම ලි න් රුදි දිගුනිල් වරල ස රා
ගෙලෙමුතු පටි න් දිළිහෙන උවන සඳ ස රා
සැදිහෙළසඳු න් තන අඟනෝ මෙපුර ස රා
යස ලි ය ලෙ සි න් පැළඹෙති සතතපන් ස රා

16–මලිගියමලින්, මාලතීපුෂ්පයන්ගෙන්; රුදි, රජිතවූ; දිගු, දීර්ඝවූ; නිල්, අතිනීලවූ; වරල, කෙශකලාපය; සරා, සමලංකෘතකොට; ගෙළෙ, ගලයෙහි; මුතුපටින්, මෞක්තිකාපට්ටයෙන් යුක්තව; දිළිහෙන, දීප්තිමත්වූ; උවන සඳසරා, ශරත්චන්ද්‍රබිම්බය බඳු මුඛ මණ්ඩල ඇති; හෙළසඳුන්, ශ්වෙතචන්දනාලෙපයෙන්; සැදි, සජ්ජිතවූ; තන, පයෝධරයන් ඇති; මෙපුර, මේපුරප්‍රවරයෙහි; සරා, සඤ්චාරණයකරන්නාවූ; අඟනෝ, කාන්තාවෝ; පන්සරා, අනඞ්ගයාගේ; යසලියලෙසින්, යශස්නැමති ලතාවන්සේ; සතත, නිරන්තරයෙන්; පැළඹෙහී, ප්‍රලම්බමානවෙත්;-

17 ල ක ළ උයන්වල සිටි කපුරුතුරු පෙ න
හ ස ළ සුවඳ මදනල මෙපුර දිගුනෙ න
පු ව ළ සුරත සරතස දුරුකර නැව න
ඉ පි ළ අවල කෙළියෙහි සැලසිය සත න

17–ලකළ, (පලපල්ලව මල්තිලොල්වූ කලකණ්ඨවලිමුඛ කෝකිලසාරසාදීන්ගේ රාවප්‍රතිරාවකර්ණරසායනයෙන්) අලංකෘතවූ; උයන්වල, උද්‍යානයන්හි;සිටි,අවස්ථිතවූ; කපුරුතුරුපෙන, කර්පූර වෘක්ෂපඞ්ක්තීන්හි;හසළ, සඤ්චරිතවූ; මදනල, මන්දමාරුතයෙන්; මෙපුර, මේපුරයෙහි; දිගුනෙන, දීර්ඝාක්ෂිහුතුමූ; සුරතසරතස, සුරතික්‍රීඩාවෙන්යුක්තවූ ග්‍රීෂ්මය; දුරුකර, පහකොට; නැවන, ඉක්බිතිවන්; පුවළ, ප්‍රෞඪව; ඉපිළ, උත්සන්නව; අවලකෙළියෙහි; රති ක්‍රීඩායෙහි: සතත, නිරන්තරයෙන්; සැලසීය, යෝජනවූහ;-

18 සි තු පිනවන මත සලෙළුන් දුටුවිග සී
නෙ තු පටුනලලට නොසමව පුරදිගැ සී
යු තු ලපතද බියෙනුදු සුරහනව සි සී
ම තු දිනාහුය ඇසිරුකළවිය දළදලැ සී

18–මත සලෙළුන්,(යෞවනාවනාර මකර ධවජයාමෙන් පුවැති ජනනයන හෘදයට රඟමඬුළුවූ) මත්තසල්ලාලයන්ගේ; නෙතු, නෙත්‍රයෙන්; දුටුවිගසී, දර්ශනය කළාවූ ක්ෂණයෙහි; සිතුපිනවන, චිත්තය ප්‍රීතිකරවන්

නාවූ; පුරදිගැසි, පුර ශ්‍රීන්ගේ; පවුන ලලට, පැවිවූ ලලාටයට; නොස මව, අසම්භාවයෙන්(පැරද;) පුතුලප, ලාංඡනයකින් යුක්තවූයෙහින්; නද බිඳෙයනුදු, දැඹිවූ හිහියකින්ගෙනෝ; නවසිසි, අභිනව චන්ද්‍රනම්; සුරඟ, දිව්‍යාඞ්ගනාවට; පිවිස, ප්‍රවිෂ්ටව; මතු, අනාගතයෙහි; දිනාහුය, ජයගත් නා පිණිස; දලැසි, ඊශ්වරයාගේ; දල, ලලාටය; ඇසුරුකළම්ය, ආශ්‍රය කළාක්මෙන්විය.

19 ම න හින් නොහළ දසදම් පෙමැති හැමවි ට
වෙන හින් සව්ඉසුරු තෙවුනා තිසිලෙස ට
වෙන හින් ගත් සකෙව් සිරිපැ මෙනුවර ට
වෙන හින් උවම් කිවිසර විමසනු කුම ට

19–මනැහින්, සිතතුළෙන්; නොහළ, නොහැරියාවූ; දසදම්, දශධර්ම යෙහි; හැමවිට, නිරන්තරයෙන්; පෙමැති, ප්‍රේමඇත්තාවූ; වෙණහින්, විෂ්ණුහුගේ හස්තයෙන්; ගත්, ග්‍රහණයකළාවූ; සකෙව්, ශඞ්ඛයගේ; සිරිපැ, ඓශ්වර්‍ය්‍ය ප්‍රහළකළාවූ දිව්‍යරාජයාගේ; වෙනහින්, අනන්තවූ; සව්ඉසුරු, සකලෛශ්වර්‍ය්‍යයෙන්; තිසිලෙසට, යෝග්‍ය පරිද්දෙන්; තෙවුනා, විරාජමානවූ; මෙනුවරට, මේ නගරයට; වෙනහින්, අන්‍යඅර්ථ යෙන්; කිවියර, කවීහු; උවම් විමසනු, උපමා පරීක්ෂාකරණු; කුමට, කිමෙක්ද.

20 සුරපුර සපිරිසිරි–එකතැනෙක්හි වුත් දිස්සේ
සව්සත සතන් රඳනා–පුවතර මෙපුරවරෙහි

20–සුරපුර, දිව්‍ය පුරයෙහි; සපිරි, සම්පූර්ණවූ; සිරි, ඓශ්වර්‍ය්‍යය; එක තැනෙක්හි, එක් ස්ථානයකට; වුත්, ආගමනයකොට; දිස්සේ, දෘශ්‍ය මානාකාරයෙන්; සව්සත, සකල සත්ත්වයන්ගේ; සතන්, චිත්තයන්; රඳ නා, රංජමාන කරන්නාවූ; පුවතර, ප්‍රසිද්ධවූ; මෙපුරවරෙහි, මේ පුර ප්‍රවරයෙහි.

21 වි සේ සවන් විකුමෙන් සදිසි දියඹ ද
රෙ සේ රුපෑ පෙරසුර කුරිරු මන් බි ද
නො සේ මුනිඳු සාසන රකිමින් නිබ ද
වෙ සේ සිරින් කිහිරළිපුල් සුරිඳු ස ද

21–විසේසවත්, අසාධාරණවත්නාවූ; විකුමෙන්, වික්‍රමයෙන්; දියබඳ, විෂ්ණුහට; සදිසි, සදෘශවූ; කුරිරු, කෘරවූ; පෙරසුර, අසුරයන්ට; රෙ සේරුපෑ, රෞද්‍රභාවය ප්‍රහලකොට; මන්බිඳ, මානමර්දනයකර; නිබඳ, නිරන්තරයෙන්; නොසේ, තුෂ්ණි භාවයෙන්; මුනිඳු සාසන, මුනීන්ද්‍රයාගේ

ශාසනය; රකිමින්, රාජ්‍යකෙරෙමින්; කිතිරැලිපුල් සුරිඳුසඳ, බඳිරෙන් පලමණ්ඩි දිවැරජෝපාමයා; සිරින්, ඓශ්වර්‍ය්‍යයෙන්; මෙසේ, වාසය කෙරෙති.

22 ස ඟ ස් කිරණ සඳසුරු මොහු තෙද යස ඟ
අ ඟ ස් පොළොව ගැවසුනි නොහැර එකර ඟ
ස ඟ ස් නවමින් යුගකෙළපත් මොළ සුල ඟ
වෙසෙ ස් කිරණ මිණිරල සඟ සෙවු ර ඟ

22—මොහු, මෙදිව්‍යරාජයාගේ; තෙද, තේජස්හා; යසඟ, අග්‍රකීර්ත්‍ියද; සනස්කිරණ,සූර්‍ය්‍යයාගේද; සඳ,චන්ද්‍රයාගේද; අයුරු, ආකාරයෙන්; අනය් පොළොව, ආකාශයනා පෘථිවියත්; එකරඟ, එකාකාරව; නොහැර,අව කාශයක් නැතිව; ගැවසුනි, ව්‍යාපාවී; යුගකෙළ, යුගාන්ත කාලයෙහි; මොළසුලඟ, චණ්ඩමාරුතය; සනස්නවමින්, සානසිකව; පත්, ප්‍රාප්තවූ කල්හි; කිරණ, ක්ෂීරාර්ණවයෙහි; වෙසෙස්, විශේෂවූ; මිණි, මාණික්‍ය සමූහය; රලසඟ, තරඟයන් සහිතව; සෙවුරඟ, සේවනයකළා වැනිසි.

23 පැ හැ ති සිපත් මින් පටහල කුමුපෙල ද
නැ ම ති සකවි උදුරුදු දිය සළා බ ද
දි ග ති නොසල දත්වා රදසෙන් මුහු ද
නැ ව ති මෙසුරරද පදනිය වෙලළ වැ ද

23—පැහැති, ප්‍රභා ඇත්තාවූ; සිපත්, අසිපත්‍ර නැමති; මින්, මත්ස්‍ය යන් ඇති; පටහල, පලිස් නැමති; කුමුපෙල, කුම්භ පඞ්ක්ති ඇති; නැමිති සකවි, චක්‍රායුධවැනිවූ; උදු, සෘජුවූ; රුදු, රෞද්‍රවූ; දියසළාබද, බද නාලද ජලභ්‍රම ඇත්තාවූ; දිගති නොසල, දිශාන්තයෙන් රැස්වූ; දත්වා රද, දානව අසුරරාජයාගේ; සෙන්, සේනාවනැමති; මුහුද, සමුද්‍රය; මෙ සුරරද, මේ දිව්‍යරාජයාගේ; පදනියවෙලළ, පාදනඛනැමති වෙලාන්ත යෙහි; වැද, ආසන්නව; නැවති, නිවාරණවී.

24 පැ හැ ස ර සුරනැගිලි දළු අත් අතුලක ර
පු ව ත ර තිළිත පලබර මුතුමල් පත ර
පි ය ක ර පැලදි නිල්මිණි වැලරැඳි බව ර
සි රි ස ර රුපැසි මෙසුරිඳු පවර සුරතු ර

24—සුරත, අභිරතනාවූ; පැහැසර,ප්‍රභාස්වරයෙන් යුක්තවූ;ඇඟිලි, අඞ්ගුලි නැමති; දළු, කිශලය ඇති; අත්, භුජනැමති; ලකර,අලංකාරනාදී ; අතු, ශාඛා ඇති; පුවතර, ප්‍රෘඪවූ; තිළින, කිනරණ නැමති; පලබර, ඵලභාර ත ඇති; මුතු, මුක්තාදාම නැමිති; පතර, පැතිර තිබෙන්නාවූ; මල්,

පුෂ්පයන් ඇති; පියකර, ප්‍රියකරුවූ; පැලඳි, ප්‍රසාධනයකළාවූ; නිල්මිණි වැල, නීලමාණික්‍ය ලතිකා නැමති; බමර, භෘංගයන්; රැඳි, රජිනවූ; මෙ සුරිඳු, මේ සුරේන්ද්‍රතෙම; සුරතුර, සුරද්‍රැමයාගේ; සිරිසර රුපැසි, ඓශ්වර්ය්‍යසාරය පහළකෙළේයි.

25 දූ කු රඹ අරණ මුළුපුටදිර දෙව් අර දෑ
වි කු මට පසිදු මොහු වෙපසිත් අසුර ර දෑ
දූ කු මට බියෙන් සැඟවී බලකොට වෙර දෑ
හි කු ළන වෙසෙයි සිතෙනුය වටකොට නිර දෑ

25–දූකු, ශත්‍රූන් නැමති; රඹ අරණ, රම්භාවනය; මුළුපුට, මුළොච්ඡින්නකොට; අරුද, ගෝචර ග්‍රහණයකළාවූ; දිරදෙව්, ත්‍රිවදගල හස්ති රාජයෙක් බඳුවූ; මොහු, මේදිව්‍යරාජයාගේ; පසිදු, ලෝකප්‍රසිඩවූ;විකුමට, වික්‍රමයට; වෙපසිත් අසුර රද, වෙපචිත්ති නම් අසුර රජයා;දූකුමටබියෙන් දශීනයට භීතියෙන්, සැඟවී, තිලිනව; වෙරද, වෛරී රජයා; බලකොට, බලවත්කොට ගෙණ; නිරද, නාදීන්ද්‍රයන් හෙවත් සත්සයුරෙන්; වට කොට, හාත්පසින් ආවරණයකොටගෙණ; හිකුළන වෙසෙයි,ත්‍රිකූටාභ්‍යන්තරව වාසය කෙරෙයි; සිතෙනුය, හැඟෙත්තේයි.

26 අ ව ර දිනිඳුසේ ලෙස දියුණුවනසැ පා
ප ව ර සුරිදු ගුණයට වැජඹි සිරිසි පා
නිතොර කලා අඩුවැඩිවන පැතිර ල පා
සි සි ර කර සරිය කියැකිද විසින් අ පා

26–අවර දිනිඳු, දිනේන්ද්‍රයා අපරපර්වතවූකල්හි; සේලෙස, නිසාකරයා මෙන්; දියුණුවන, විතුණ වන්නාවූ; සැපා, සෞඛ්‍ය ඇති; පවර, ප්‍රවරවූ; සුරිඳු, මේ සුරේන්ද්‍රයාගේ; ගුණයට, තාදෘශවූ ගුණ සමූහයට; සිරි, ශ්‍රීකාන්තානාමෝ; සිපා, උපශීකොට; වැජඹී, විජෘම්භිතවීය; නිතොර, අනවරතයෙන්; කලා, හිම්ක්‍රමයෙන්; අඩුවැඩිවන, ඌනාභාවයට හා පූර්ණභාවයට පැමිණෙන්නාවූද; ලපා, ලාංඡන ප්‍රවේශයෙන්; පැතිර, ප්‍රකාශවත්නාවූද; සිසිරකර, චන්ද්‍රයා; අපාවිසින්, අපවිසින්; සරියකියැකිද, සමාන කළහැකිද; නොහැක්කේමය.

27 නි සි විසිතුරු සිවුමැළි සුසිරිත නිඳු නී
රි සි ලෙස කෙළෙන සුරඟන නුවන දියදි නී
දි සි මොහු යස සිසිදිය උදයග හිසි නී
නැසි පිළිමල් සරසුර සියුරු තොසදි නී

27–සුරඟන, දිව්‍යාඞ්ගනාවන්විසින්; රිසිලෙස,කැමතිසේ; කෙළෙන,ක්‍රීඩා කරන්නාවූ; විසිතුරු, විචිත්‍රාකාරයෙන්ද; සිවුමැලි, සුකුමාලභාවයෙන්ද; සුසිරි, සුවර්නයෙන්ද නිසි, අභිලාෂ වර්ණ ඇති; නිදුනී, නදීන්ද්‍රයා වැනිවූ; හෙවත් ආකාශ ගඞ්ගාවක් වැනිවූ;මොහු, මේදිව්‍යරාජයාගේ; නුවන,

ප්‍රභාසයෙන්; දියදිනි, ලෝකයාජීවත් වන්නේය; යස, යසස් නැමති; සිසි, චන්ද්‍රයා; දියළුදගගනිසිනි, ජගත්නැමති උදයගිරි ශිඛරයෙන්; දිසි, දෘශ්‍ය මානව්‍ය(එකල); පිළිමල්,ප්‍රතිමල්ලවයන්; හෙවත් අසුරයන් නැමති; සර, තාමරස සමූහය; නැසී, විනාශකොට; සුර, නිර්ජරනැමති; සියුරු, චකෝරයන්ට; නොසදිනි, සන්තොෂදූනාග කෙළෙයි.

28 අ  මා ඇදුරු උත්සඳ විදුර සුත්ම  තු
ප  මා නොවී පැමිණෙත යුදට වසව  තු
ත  මා ම සැවුබල පැසිටි නොබා සි  තු
මෙ මා වණනු කිම මොහු තෙදබල අමු  තු

28–අමා ඇදුරු, මොක්ෂාචාරීත්වහන්සේ; විදුරසුත්මතු, වජ්‍රාසනමස්තකයෙහි; උන්සඳ, උපවෙශන ප්‍රාප්තකාලයෙහි; (හෙවත් තිකුළුකැන මුකුළු කෙරෙමින් මුනිහිරු උදාවනකල්හි) වසවතු, වශවර්ති මාරයා; පමානොවී, අප්‍රමාදව; යුදට පැමිණෙන, යුද්ධප්‍රවිෂ්ටව එනකල්හි; තමාම, සවකීයවවූ; සැවුබලපැ, චාපබල ප්‍රකාශකොට; නොබාසිතු, කිසි මාර භයඩකාරයක් නොසිනා; සිටි, සපිහි ප්‍රාප්තවූ; මොහු, මේ දිව්‍යරාජයාගේ; අමුතු තෙදබල, අනන්‍යවූ තෙජානුභාවයක්; මෙමා, මාවිසින්; වණනුකිම, වර්ණනාකරණු කිමෙක්ද;

29 දෙ හි රු න් සුවඳ රොන් ගෙණ නදදෙන ලෙස  ට
ග න  ර න් කිකිණි සන්කොට යුගපද අව්  ට
කෙ රෙ මි න් සැඳෑ රඟහළු මුළු නැවති වි  ට
නු ඹ ම  න් ලෙසට වැද සුරරද මැදුරත  ට

29–සුවඳ රොන්ගෙණ, සුගන්ධ මකරන්ද ග්‍රහණය කොට; දෙහිරුන්, ෂට්පදින්; නදදෙනලෙසට, රාවප්‍රති රාවදෙන්නාවූ විලාසයෙන්; යුගපද අවට, පාදයුග්මය භාන්පසින්; ගනරන් කිකිණි, ඝනකනක කිංකිණීකයෙන්; සන්කොට; මධුරනාද පවත්වා; සැඳෑරඟකෙරෙමින්, සන්ධ්‍යා නෘත්‍ය කෙරෙමින්; නළුමුළු, නාටක සමූහයා; නැවතිවිට, නිවාරණවූ කල්හි; නුඹමන්ලෙසට, යුෂ්මත්හුගේ සිත්වූ පරිද්දෙන්; සුරරද, ඒ දිව්‍ය රාජයාගේ; මැදුරනට, මන්දිරාභ්‍යන්තරයට; වැද, ප්‍රවිෂ්ටව.

30 පෙර සුර දිරද කුම්බුත් සිහලෙස නිතො  ර
යස හ ර කිවිදුකැල ගෙලසුසැදූ නොහැ  ර
ම න හ ර උපුල්වන් සුරරද පා තඹ  ර
න ම කර මිතුරු සඳ බැනිසහ ගණුව ස  ර

30–පෙර සුර, අසුර නැමති; දිරද, හස්තින්ගේ; කුඹු, කුම්භයන්; නිතොර, නිරතුරු; බුන්, භක්නකළාවූ; සිහලෙස, සිංහයෙකුවැනිවූ; කිවිදුකැල, කවීන්ද්‍ර සමූහයාගේ (හෙවත් යමක ප්‍රහේලිකා ක්‍රියා ගුප්තගූඪ

චතුෂ්ඨාදිකවිකර්මයෙන් අනේක විචිත්‍රාබන්ධනයෙහි දක්‍ෂවූත්තේ); ගෙල සුසැදු, ශ්‍රීවණ්ණනී සුසජ්ජිතවූ; යසහර, කීර්තිනැමති මුක්තාහාර ඇති; මනහර, මනොඥවූ; උපුල්වන් සුරරද, උත්පල වර්‍ණ්ණ දිව්‍යරාජයාගේ; පාතඹර, පාදපද්මයට; මිතුරු මිත්‍රාත්මජය; බැතිසහ, භක්ති සහිතව; නමකර, නමස්කාරකොට; ගණුවසර, අවසර ග්‍රහණයකර.

31 සු නි ම ල් සපිරි සඳ රැස්වන් එක පැහි ර
එ ක තු ල් ලකළ රළවැල ලෙල කිරිසයු ර
හැ මක ල් දිමුතු මුතු වැලිතල මළු පව ර
සු වි ස ල් මෙපුර මැද වෙහෙරට වැද මිතු ර

31–සුනිමල්, අතිශයින් නිර්මලවූ; සපිරි සඳ, ෂොඩශ කලාවෙන් සම්පූර්‍ණ්ණ චන්ද්‍රයාගේ; රැස්වන්, රශ්මි වැදගැන්මෙන්; එකපැහිර, එකප්‍රස්තාරිතව; ලකළ, අලංකෘතවූ; කිරිසයුර, ක්‍ෂීර සාගරයෙහි; ලෙල, ලීලොපේතවූ; රළවැල, තරඟ සමූහය හා; එකතුල්, ඒකාකාරවූ; හැමකල්, සදාකල්හි; දිමුතු, දීප්තිමත්වූ; මුතු, මෞක්තික වැනි; වැලිතල, වාළුකා සහලයකින් යුක්තවූ; පවර, ප්‍රවරවූ; මළු, අඟනඇති; සුවිසල්, අතිවිශාලවූ; මෙපුර මැද, මේ නගරමධ්‍යයෙහි; වෙහෙරට, විහාරයට; මිතුර, මිත්‍රය; වැද, ප්‍රවිෂ්ටවව.

32 සි නි ය ම් රුවින් විසිතුරු මුනි මැඳුරු ව ල
ම න් ර ම් ලෙසින් බබලන මුනි රූ නිම ල
සි තපෙම් වඩා වැඳ සිරිපා යුග කම ල
බ ව ගි ම් නිවණ නිවණත් කර සැප විපු ල

32–සිතියම් රුවින්, චිත්‍රකර්මාන්ත රූප කරණකොටගෙණ; විසිතුරු, විචිත්‍රවූ; මුනි මැඳුරුවල, සර්වඥ මන්දිරවල්හි; මනරම් ලෙසින්, මනොරම්‍ය විලාසයෙන්; බබලන, භ්‍රාජිතවන්නාවූ; නිමල, නිර්මලවූ; මුනිරූ, ප්‍රතිමා රූපයගේ; සිරිපායුග, ශ්‍රීපාදවන්ද නැමති; කමල, පද්මයට; සිත පෙම්වඩා, චිත්තප්‍රේම වර්ධනයකොට; වැඳ, නමස්කාරකොට; බවගිම්, සංසාර ඝර්මය; නිවනා නිර්වාපණය කරන්නාවූ; සැපවිපුල, සෞඛ්‍ය මහත්වූ; නිවණත්කර, නිර්වාණය හස්තප්‍රාප්තකර.

33 සි ඳු රු අසන තුරුපති මහවියත ස රා
ම හ රු සුදුකඳින් රැඳි තම ඉටු මිතු රා
ස ස රු නිමල්කැන් සතපුදැති පිණක රා
සො ඳුරු දුමිඳු සඳ පිණිපා කර මිතු රා

33–උරු, මහත්වූ; සිඳුඅසන, සමුද්‍රාසන්නයෙහිවූ; තුරුපති, වෘක්‍ෂාධිපතිවූ; මහවියත සරා, මහාහැතිවූ ව්‍යාකාශ මාර්ගය සැරහුවාවූ; මහරු, මනොඥවූ; සුදුකඳින්, ශ්වෙතස්කන්ධයකින්; රැඳි, රජිතවූ; තම, පාපනිර්වාපණයෙහි; ඉටුමිතුරා, ඉෂ්ටමිත්‍රවූ; සසරු, ශාඛාවන්ගෙන් සොභාමත්වූ; නිමල්

කැත්, නිම්ලපුෂ්ප මඤ්ජරියෙන් ගැවසීගත්තාවූ; සතපුදුනි, සත්වයන්විසින් කරණලද පූජා ඇති; පිණකර, පුණ්‍යාකරවූ; සොඳුරු, සුන්දරවූ; දුමිඳුසඳ, ද්‍රැමෙන්ද්‍රොත්තමයාට; මිතුර, මිත්‍රය; පිණිපාකර, නමස්කාරකරව; (කී හෙයින් ඒ ද්‍රැමෙන්ද්‍රයා වැනිවූ; චන්ද්‍රයාද; උපමා උපමෙයාලංකාරයෙන් යුගලාර්ථ බන්ධනය පිණිස) සිඳුරුඅසන, සිංහාසනවූ; තුරුපති, තාරකාධිපතිවූ; මහවියනසර, විසාලවූ ආකාශ මාර්ගයෙහි සංචාරණය කරන්නාවූ; මහරු, මනොඥවූ; සුදුකඳින්, ශුභ්‍රකාන්තියකින්; රුඳි, විජෘම්භිතවූ; නව, ගිම්රයෙහි; ඉටු මිතුරු, ඉෂ්ට මිත්‍රවූ; සසරු, ශශරූපයකින් යුක්තවූ; නිමල් කැත්, නිර්මලකාන්තියක් ඇති; සතපුදුනි, පද්මයක් ඇත්තාවූ; සොඳුරු, සුන්දරවූ; දුමිඳුසඳ, ද්‍රැමෙන්ද්‍රයාහට; මිතුර, මිත්‍රය; පිණිපාකර, නස්කාරකර;–මෙහි සිඳුරු අසන යනු ගජාසනඃ යනු කීහෙයින් සමහර කෙනෙක් සිංහුර භූතනිඃයයි කියත් හේ සමාර්ථයට විරුද්ධ හෙයින් කාණ්ඩ කලපනායි.

34 ප සැ ස් මදුරු විසිතුරු තුරෙහි න ද
වි සෙ ස් විලස විහිදුනු කුසුමෙව් සුව ඳ
අ පි ස් ගුණෙන් යුතු යතිඳුන්හට නිබ ඳ
ස තො ස් සිතෙහි පුරමින් නමඳුව සබ ඳ

34–පසැස්, සර්වඥයන්වහන්සේ නැමිහි; විසිතුරු, (මකරන්දභරිත ස්ඵුෂ්පිත පුෂ්ප මඤ්ජරීන්) විචිත්‍රවූ; මදුරතුරෙහි, මන්දාර වෘක්ෂයෙහි; නද, හටගත්තාවූ; සුවඳ විහිදුනු, සුගන්ධ ව්‍යාප්තවූ; කුසුමෙව්, පුෂ්පයන්වැනිවූ; විසෙස් විලස, විශේෂයන්ම අභිලාස වණ් ඇති; අපිස් ගුණෙන්, අප්‍රමාණ ගුණයෙන්; නිබඳ, නිරන්තරයෙහි; යුතු, යුක්තවූ; යතිඳුන්හට, යතීන්ද්‍රයන්ට; සිතෙහි, චිත්තයෙහි; සතොස් පුරමින්, සොම්නස්පුරා; සබඳ, යහළුව; නමඳුව, නමස්කාරකර.

35 එ න ගුවනත පුන්සඳ හැර දු රේ දු රේ
ප ත බිගුරැවිදි පිපිමල් තු රේ තු රේ
වෙත එවෙහෙර සුපිහිටි අඹ තු රේ තු රේ
සැ න පෙව යෙහෙන් මුළු රැ මම් තු රේ තු රේ

35–දුරේ, අන්ධකාරය; දුරේහැර, දුරිභූතකොට; ගුවනත, ගගනාන්තයට; පුන්සඳ, පූර්ණ චන්ද්‍රයා; එන, ආගමනය කරණකල්හි පිපිමල්, පුෂ්පිත පුෂ්පයන් ඇති; තුරේ තුරේ, වෘක්ෂයක් වෘක්ෂයක් පාසා; බිගු, භෘංගයෝ; රැවිදී, රාවය පවත්වා; පත, ප්‍රාප්ත වෙද්ද එකල්හි; එවෙහෙර වෙත, ඒ විහාර සමීපයෙහි; සුපිහිටි, සුප්‍රතිෂ්ඨිතවූ; අඹ තුරේ, ආම්‍ර වෘක්ෂයන්ගේ; අතුරේ, මධ්‍යයෙහි; තුරේ, වෘක්ෂයක; මම්තුරේ, මාගේ මිත්‍රය; මුළුරැ, රාත්‍රිය මුළුල්ලෙහි; යෙහෙන්, සුවයේ; සැනපෙව, සයනයකර.

36 ක ර කි ර ණින් මිණිමුතු විලතඹුරු කැ ල
පෙර ගි ර ගින් නුබමිණ පැමිණෙන උදු ල
අ ර න ර මොනොහාතින් ශ්‍රීසිරිසි උදක ල
න ර ස ර මිතුරයාකර නැමද දසබ ල

36–විල, තටාකවිල්හි; තඹුරුකැල, පද්මසමූහය; කිරණින්, තමාගේ කාන්තිය කරණකොටගෙණ; මිණිමුතුකර, ප්‍රබෝධකොට; පෙර ගිරගින්, පූර්ව ගිරිඅග්‍රයෙන්; උදුල, උජ්ජ්වලිතවූ; නුබමිණ, නභොමාණික්‍යය; පැමිණෙන, ප්‍රාප්තවනකල්හි; (හෙවත් අරුණොද් ගමනකාලයෙහි;) ශ්‍රීසිරිසි, සම්පත්විසින් කැමතිවන ලද්දාවූ; උදකල, උද්ගතකාලය (හෙවත් පෙවනාලනම්වූ;) අරනර මොනොහාතින්, අරුණකරයා බලවත්වූ මේ යෝගයෙන්; නරසර, සපිර ස්වරයෙන් යුක්තවූ; මිතුර, මිත්‍රය; දසබල, සර්වඥයන්වහන්සේ; නැමද, වැඳ; යාකර, යාත්‍රාකර.

37 ද ස දෙස වනය නනවා පිපිමල් කැන ති
පි ස එන සුවඳ මදනල විඳ ලෙස කැම ති
වෙස ගන මිහිඟු සක්සත් පෙරමග පැව ති
ල ස නොව වඩින් සකි දූක මේසුබ නිමි ති

37–දසදෙස, ඉන්ද්‍රාදි දශදිග්භාගයෙහි; වනය, අරණ්‍යයෙහි; නනවා, කම්පිතකරවමින්; පිපිමල් කැනති, සුපුෂ්පිත පුෂ්පමඤ්ජරීන්; පිස, ස්පර්ශකොට; එන, එන්නාවූ; සුවඳ මදනල, සුගන්ධවත් මාරුතය; කැමති ලෙස, රුචිවූ පරිද්දෙන්; විඳ, අනුභවකොට; පෙරමග පැවති, පූර්වමාර්ග ප්‍රකාශවූ; වෙසගන, නගර සොභිනීන්ද; මිහිඟු, (නානාවිධ) මෘදඟභෙරිද; සක්සත්, ශඞ්ඛධ්වනිද; (මේ යටකියනලද) සුබ නිමිති, යහපත් නිමිත්ත ලක්ෂණ; දූක, දර්ශනයකොට; සකි, යහළුව; ලසනොව, අලසභාවයට නොපැමිණ; වඩින්, ගමනාරම්භකරන්; මෙතැන් පටන් මාර්ග වර්ණනා කරන්නානු "**අළුත් විහිදි**" යනාදිය කීහු.

38 අ ළු ත් විහිදි තඹරෙවි උවන හැමදි න
අ ළු ත් විහිදි සිවුමැළි තුනුවග සොබ න
අ ළු ත් ලපළු පැහැ රඳවනසග අඟ න
අ ළු ත් විහිදියේ සිරි දූක සකිවඩි න

38–හැමදින, සදාකල්හි; අළුත් විහිදි, සෙණෙයෙහි විකසිතවූ; තඹරෙව්, නාමරසයන් බඳු; උවන, මුඛ මණ්ඩල ඇති; සොබන, සෝභමානවූ; සිවිමැලි, සුකුමාලවූ; අළුත්විහිදී, ආලෝකවිසුරුනාවූ; තුනුවග, නාඩගඇති; ලපළු, බාලපල්ලවයන්ගේ; පැහැ, වර්ණය; රඳවන, රජමානවූ; අළුත්, අතුල් පතුල් ඇති; සග, තරුණවූ; අඟන, ස්ත්‍රීන්ගෙන් (ගැවසීගත්) අළුත් විහිදියේ, එනම් වීථියෙහි; සිරිදූක, ඓශ්වර්ය නිරීක්ෂණය කොට; සකි, යහළුව; වඩින, ප්‍රයානය කරන්නේයි.

39 වඩුතුපුල් සුරරද–සයුර තිනෙදිනැ මිහිකත
ලූපියවිලිය සිරිගත්–යාගන්මගුල්වැල්ලෙත්

39–උපුල් සුරරද, උත්පලවණ් දිව්‍යරාජයා; සයුරතින්, සාගරාන්තයෙන්; වඩුතු, වඩිනාකල්හි; මිහිකත, මහිකාන්තාවවිසින්; එදිනැ, එද වසැ; ලූ, ලනලද්දවූ; පියවිලියසිරි, පාවාඩ සොභාව; ගත්, ග්‍රහණය කළාවූ; මගුල්වැල්ලෙත්, එනම් ප්‍රදෙශයෙන්; යානත්, යාත්‍රාග්‍රහණය කරත්.

40 වැ ල් ලේ විසුළ තර තරඟින් ලෙවත් මි ණි
දි ල් ලේ ගණිඳු පුදයට එැ මෙන් ගෙම් ණි
තු ල් ලේ සුරිඳු විමනෙවු පෙරමග පැම් ණි
වැ ල් ලේ මඩම දූකයන් සිරිසර ගිහි ණි

40–තර, මහත්වූ; තරඟින්, තරඟයන් කරණකොටගෙණ; වැල්ලේ, වාළුකාන්තරයෙහි; විසු, විසාර්ණවූ; ලෙවත්මිණි, ලෝහිත වර්ණ මාණික්‍ය සමූහයා; ගණිඳු පුදයට, විශෙෂාශවරයාගයට; ගෙම්ණිඑැමෙන්, ප්‍රදීප දල්වූවාක්මෙන්; දිල්ලේ, දීප්තිමත්වීද; එවු, එනිවූ; සුරිඳු විමන තුල්ලේ, වෛජයන්තප්‍රාසාදය බඳුවූ; පෙරමග පැම්ණි, නාගේ මාර්ගාභිමුඛවත්නාවූ; වැල්ලේ මඩම, එනම් මඩමෙහි; ගිහිණි, ගහනවූ; සිරිසර, ශ්‍රීසාරය; දූක, දර්ශනයකොට; යත්, ප්‍රයානයකරත්.

41 වි ක සිත තමළලියමල් බරකිනඹුවැ ලී
අ ක නුනි තඹපුලවනගන කරණ ති ලී
එ ක සරසරණ පැහැසර රුන සැදිකි ලී
දූ ක තට සිතෙයි සැකනොව ලෙලෙන මිණිවැලී

41–විකසිත, සුපුෂ්පිතවූ; තමළලිය, තමාලනා නැමති; මල්බර, පුෂ්ප ද්‍රව්‍යයන්ගෙන් භරිතවූ; කිනඹුවැලි, කෙශකලාපයක් ඇති; පුලවන, උත් පලවනය; නෙවත් තටාක නැමති; අකනුනිතඹ, පෘථුලවූ ශ්‍රොණි භාගයක් ඇත්තාවූ; වනගන, අරණ්‍යවනිතාව; කරණතිලි, සන්තොෂ කරවන්නාවූ; එකසර, එකගේ සැරසෙමින්; සරණ, ලීලෝපේතවන් නාවූ; පැහැ, ප්‍රභායෙන් යුක්තවූ; සරරුනසැදි,මුවලිඟු සවර්ණ පුෂ්පාදි සම්පූර්ණ තරුණතරුණි කරමුදුනෙන් නොවූනාමල්දම්සේ ලබාදෙන පු ෂ්පමජරී සමූහයෙන් සුසජ්ජිතව; කිලී, ක්‍රීඩාකරන්නාවූ කල්හි; හෙවත් මදමාරුතයෙන් ලීලෝපෙතවන කල්හ; දූක, දර්ශනයකොට; සැක නොව, එකාන්තයෙන්; ලෙලෙන මිණිවැලි, ලීලෝපෙතවන්නාවූ; මාණි ක්‍යද්මයපිකිකා; තටසිතෙයි, තාගේ හියබිගනා ප්‍රඥාවට අවබෝධනය වෙයි.

42 ස ව ණ සවන සතියෙහි වැඩගුදින ලෙ ස
ලෙලෙණ දරන වැලලූ මුදලිඳු විල ස
ක ර ණ පහෙව් පෙත් රැඳි නාරද සක ස
සොබ ණ නාගකෝවිල දකු මිතුරු තො ස

42–සවණ, සමන්ත භද්‍රයන්වහන්සේ; සවන සතියෙහි, ශ්‍රවණ සති යෙහි; වැඩගුදිනලෙස, උපදේශන ප්‍රාප්තවන්නා පිණිස; මුදලිඳු විලස, මුචලින්ද නම් විල්අසබඩ; (මුචලින්ද නම් වෘක්ෂමූලයට පැමිණ වැඩ උන්කල්හි දසදෙසෙන් නැගි නිල් වදුල් දුක මුචලින්ද නම් නාරජ බුදුන්ට වැසි සුලන් මඳුරු පිරිපන්වලකනු සඳහා) ලෙලෙන, ලිලෝපප තාවූ; දරණ වැලඑ, සත්දරණ පටකින් වටලූ; කරණපහෙව්, ප්‍රාසාද යක් සිඛකරන්නාක්මෙන්; පෙත්රැඳි, එණාගෙන් උපලක්ෂිතාවූ; නාරද සකස, නාගරාජයාගේ විලාසයඇති; සොබන, සොභාවත්වූ; නාගකෝ විල, එනම් චෛත්‍යස්ථානය; තොස, සන්තොෂයෙන්; මිතුර, සුහෘදය; දකු, දශීනයකර.

43 උ ක් තු ල් තෙපුල් තෙපලා දක්වා රතො ට
අ ක් තො ල් සිනාසී නෙත්සරලා අව ට
ස ක් ක ල් සඳිසි ලියසිටිනා මදයුද ට
උ ක් ග ල් බැවිල දකිමින් යාගන් එපි ට

43–උක්තුල්, කාමචාපරසමෙන් මධුරවූ; තෙපුල් තෙපලා, වාගුච්චාර ණයකොට; රතොට, සඳකැන්සේ සුරකතවූ ඔෂ්ඨයන්; දක්වා,දක්වමින්; අක්තොල්, ඔෂ්ඨාග්‍රයෙන්; සිනාසී, මන්දහාස්‍යයකොට; අවට, හාත්පසින් නෙත් සරලා, නෙත්‍රාසන බහා; සක්කල් සඳිසි, මහෙන්ද්‍රකලාවන් වැනිවූ; මදයුදට, අනඟ යුඩයට; සිටිනා, සිටිනාවූ; ලිය, පරම සුන්දරීන් ගෙන් යුක්තවූ; උක්ගල් බැවුල, උක්ගල් බැවුල නම්වූ කපිකාවල; දකි මින්, දශීනය කරමින්; එපිට යාගන්, ඔබ්බෙහි ප්‍රයානය කරන්.

44 යන එන දිගැසියන් ඇඳි සළුමිණි මෙ වු ල
ලිහිලිඳු කෙරෙ නිල්වරලස මලින වු ල
ඩාබිඳු වැද තවසි ගමනින් කරඅ වු ල
එසෙසින් සලෙළු ගුණගති උග්ගල් බැ වු ල

44–යන එන, ගමනා ගමන කරන්නාවූ; දිගැසියන්, දීඝාක්ෂීන් විසින්; ඇඳිසළු, අවණාදනය කලාවූ වස්ත්‍රයද; මිණිමෙවුල, මණිමෙඛලා දාමයද; මලිනවුල, මල්ලිකා මාබම් ආදි පුෂ්පදාමයන්ගෙන් ගැවසී ගත්නාවූ; නිල් වරලස, ඝනනීල බම්මිල්ල කලාපයද යනමේ ආදිය; ලිහිලිදු කෙරේ,

සිපිලද කෙරෙයි; ඩාබිදු වැද, සෝද බිඳුත්වැදී; ගමනිත්කර අවුල, යාත්‍රාභිඩාවෙන් වෙහෙසකොට; නවසි,සරනස භාවයට පමුණුවයි; එසෙ සිත්, ඒ භාවයෙන්; උක්ගල්බැවුල්, එනම්වූ කදුවැටිය; සලෙළු ගුණගන්, සල්ලාලයන්ගේ ගුණදූරුයේයි.

45 මා පා හිම්සදිසි යසතෙදැහි සුනිම ල
ම් පා වීරබාකරවූ සසිරි දු ල
මා පා පටන සිරි නරඹා නොසිනිපි ල
තා පා සතපමින් යාගන් ගුණවිපු ල

45–මාපාහිම්, වසළු සූ‍ර්‍යයි දෙදෙනා හා; සදිසි, සදෘශවූ; සුනිමල, අතිශ සිත් නිර්මලවූ; යසතෙදැහි, යසස් හා තෙජස් ඇති; ම්පාවීරබා, සම්‍යක භූමඩල මඬින ප්‍රමඬිත ජනපුණ්ඩරික බන්ධු ශ්‍රී වීරබාහු නම් පෘථිවීශ්වරයානන් විසින්; කරවූ, (සකල නාගරඟ සම්පත්තියෙන් නිර්මිතව) කරවන ලද; සසිරිදුල, ඓශ්වර්‍ය්‍යයෙන් බබලන්නාවූ; මාපාපටන, මහත් ප්‍රාසාද පඞක්තින් සොභින ඒ ගම් පට්ටනයෙහි; සිරි, ඓශ්වර්‍ය්‍යය; නරඹා, නිරීක්ෂණයකර; නොසිනිපිල, සන්තොෂයෙන් පිනා; ගුණවිපුල, ගුණාධික්‍යය; තාපා සතපමින්, ග්‍රීෂ්මය සන්තාපිතාය කෙරෙමින්; යාගන්, යාත්‍රා කරත්තේයි.

ඉහි සව් ලකුණෙන් හොබනා මනැත්හට නඟුලි සතුල්තල යලප මස්වෙසින් ගනකුරු ලොප්සහසයු සඳට සල්මලැසිවිසඳුකුකම් මහදනත් සේ මහදනත් සෙබෙනි ගරහන නොබජරුවන්සේ යසබජන රුසිසේ නිත් සඳදතුවනි පාමොක් රුවනින් තිලක පිරිවෙන් ගිම් කළ මෙකුදු පියවින් පියව උගහ නොය්වා–

46 කු ල් ව ලා පෙණෙන ගොන්ගිර උසබව ර
ලො ල් ව ලා අදනසිඳු ගවපල් සස ර
නි ල් ව ලා සසල රුදිගුණ සදිසිත ර
නි ල් ව ලා ගගින් එතරට යව මිතු ර

46–කුල්වලා, ශරදම්බොදරයක් මෙන්; පෙණෙන, දෘශ්‍යමාන වන්නාවූ ගොන්ගිර, එනම් පර්වතය නැමැති; උසබවර, වෘෂභ රාජයාට; ලොල්වලා. ලෝලත්වයෙන්; සිඳුගවපල්, සමුද්‍රය නැමැති වෘෂභ ධ්වජයාවිසින්; සසර, මධුර ජලය; අදන, නමාකරා ඇදගන්නාවූ; නර, පසුරක් බඳුවූ; නිල්, නීලවර්ණයද; සසල, චංචල භාවයද; (යනාමේ) ගුණරුදී, ලක්ෂණයෙන් උපලක්ෂිතවූ හෙයින්; වලාසදිසි, නීලවඩුපිකා වැනිවූ; නිල්වලා ගඟින්, එනම් සරිතායෙන්; එතෙරට, පරතීරයට; මිතුර, මිත්‍රය; යව, යාත්‍රාකර.

47 සිදුබොන අටින් මේකුළු රැස්වූ සේව පි න්
බැඳි කඹ පටින් සිටිනා ගලනමදක පි න්
නුඹ ර න දිටින් දක නොබවම්නි සිතඅ පි න්
යා ක ර තුටින් පුවතර පවර මාතො පි න්

47–සිදුබොන අටින්, සමුද්‍ර පානයකරණ ලෝලයෙන්; වටින්, හාත් පසින්; මේකුළුරැස්වූසේ, මේඝකූට රාශිභූතවූවාක්මෙන්; කඹපටින් බැඳි, තරපට්ටයෙන් බඳනාලද; ගලනමදකටින්, කපොලතලයෙන් ගලිත වන්නාවූ මද ජලයෙන් යුක්තව; සිටි, සිටියාවූ; නා, හස්ති සමූහය; නුඹ, තාගේ; රනදිටින් දක, රක්ත නෙත්‍රයෙන් දර්ශනයකොට; සිත අටින්, චිත්ත ලෝලයෙන්; නොබවම්නි, නොබා; පුවතර, ලෝකප්‍රසිඞ වූ; පවර, උතුම්වූ; මානොටින්, (ධරණීදර්පණ තලයෙන් පෙණිගිය අමර පුරාකාර සමදර්ශිබ්‍රාජන වාසප්‍රාසාද පඞක්තියෙන් හෙබියාවූ) මාතරනම් පුරප්‍රවරයෙන්; තුටින්, සන්තොෂයෙන් යුක්තව; යාකර, යාත්‍රාකර.

48 ර ඟු ව න් තරිඳුරත දනවරනිඳු දූ ලි ය
මැගු ව න් නිබඳ ලොබවඩවන රතිකෙ ලි ය
අ ඟු ර න් ලියෙව් ලියදක වෙම්නද නි ලි ය
ප ඟු ර න් වෙල්එලිය දක යන්නොව ඇ ලි ය

48 තරිඳුරඟ උවන්, චන්ද්‍රයා බඳුවූ මුඛමණ්ඩල ඇති; රන, රක්තවර්ණ වූ; දනවරනිඳ, දනනාවරණයන්ගෙන්ද; දූලිය, බබලන්නාවූ; මැගුවන්, නිරීක්ෂණයකළාවූ ජනයන්ට; නිබඳ, නිරන්තරයෙන්; රතිකෙළිය, රති ක්‍රීඩායෙහි; ලොබ වඩවන, ලොභ වර්ධනය කරවන්නාවූ; අඟුරන්ලි යෙව්, අනර්ඝවූ රත්න රූපයන් වැනිදෙ හෝ නොහොත් ස්වර්ණ ලතා වැනි; ලියන්, ලලනාවන්; දක, දර්ශනයකොට; පඟුරන් වෙල්එලිය, එනම්වූ ක්ෂෙත්‍රයාය; දක, දර්ශනයකොට; අඳනිලිය වෙමින්, චිත්ත සන්තු ෂ්ටව; නොවඇලිය, එහි ආලයනොවී; යන්, ප්‍රයාණය කරත්.

49 මි දෙ ල් මල් කැකුළුමිණිවැල් පැළඳග න
සු පු ල් නාකුසුම් රත්තෝඩුලා ක න
ක ම ල් වත් වතින් රසගී පවසම් න
ල ක ල් බල කෙළින ඇල්කෙත්වල නද න

49–මිදෙල්, නිපවෘක්ෂයන්ගේ; මල්කැකුළු, (මිණිදදිරි) මුකුලයන් නැමති; මිණිවැල් පැලඳගන, මාණික්‍ය මාලාවෙන් මණ්ඩනයකොට; සුපුල්, සුත්පුල්ලවූ; නාකුසුම්, කාංචනපුෂ්පයන් නැමති; රත්තෝඩු, කනක තාඩංක; කණලා, කර්ණයෙහි බනා; කමල්වත්වතින්; පද්ම වැනිවූ

වස්ත්‍රයෙන්; රසඟී, රස ගීගිකා; පවසමින, ප්‍රකාශකරමින්; හාදන, සන්තොෂයෙන්; ඇල්කෙත්වල, ශාලික්ෂෙත්‍රයන්හි; කෙළෙන, ක්‍රීඩාකරන්නාවූ; ළකල්, තරුණ කාන්තාවන්; බල, නිරීක්ෂණය කර.

50 පබසර සොඳුරු පියයුරු රණපා නව ල
සපිරිතුරු රස තළකල් පාණිත ල
ගෙනසිටි සලෙල මුළුරුප්පේ මූණම ල
බලමින් යතුරුකර සකි මා පානතු ල .

50–පබසර, ප්‍රභාස්වරවූ; සොඳුරු, සුන්දරවූ; පියයුරු, පයෝධරනැමති; රණපාන, ස්වර්ණ හංසරාජයන්ගෙන්; අවල, ගැවසීගත්තාවූ; තුරුරස, අනුරාගජලයෙන්; සපිරි, සම්පූර්ණවූ; තළ, තටාකයන් වැනිවූ; කල්, අඟනාවන් විසින්; පාණිතල, හස්තතලයෙන්; සලෙල, ලීලාසහිත; මුළුරුප්පේ, සකල වෘක්ෂච්ඡායා මණ්ඩලෙහි; මූණමල, වකුලපුෂ්පයන්; ගෙණසිටි, ග්‍රහණයකොට සිටින්නාවූ විලාසය; බලමින්, නිරීක්ෂණය කරමින්; මාපානතුල, මවා පාත්නොක්මෙන් නොවත් සෑහිමනොක්මෙන්; සකි. සබඳ; යතුරුකර, යාත්‍රාකර.

51 සි ටි නා මනා රඟ මග අසතුරු රැ න් ද
බි ගු නා දිනා පිරි පිපි සපු එරහැ න් ද
ම ලි නා වනා එන මදනල මකර න් ද
ගි ම නා උනා විඳ විඳ යව මිතුරි න් ද .

51–මගඅස, මාර්ගසන්තානයෙහි; සිටිනා, ප්‍රතිෂ්ඨිතවූ; මනාරඟ, (මගීන් ගේ) සිත්වූ පරිද්දෙන් (ග්‍රීෂ්මය සංසිඳුවන්නාවූ;) තුරු, වෘක්ෂසමූහයෙහි; රැඳ, රජිනවූ; බිගුනාදිනා, භෘඟනාදයෙන්; පිරි, පූර්ණවූ; පිපි, පුබුදුනාවූ; සපුඑරහැන්ද මලිනා, හේමපුෂ්ප ස්වර්ණපුෂ්පාදීන්; වනා, කම්පිතකරවමින්; එන, එන්නාවූ; මදනල මකරන්ද, මුවරද සලාමෙන් නිකුත්මන්ද මාරුතය; විඳවිඳ, අනුභවකිරීම් වශයෙන් විඳවිඳ, ගිමනාඋනා, ඝර්ම නිර්වාපණයකොට; මිතුරින්ද, මිත්‍රොත්තමය; යව, ප්‍රයාත්‍රාකර.

52 පි ල් සැ ත් තේ සෙද විදහා එකිනෙ කා ය
ග ල් ම ත් තේ ලඟිනට යන සිකිය කා ය
ක ල් නැ ත් තේ යසි නොසිතා සිට දූ කා ය
පො ල් ව ත් තේ හේයෙන් යන් නොවසැ කා ය

· 52–පිල්සැත්තේ, කලාප සමූහය; සෙද, ස්වර්ණයෙහි; එකිනෙකාය,පිළිවෙළින්; විදහා, විහිදුවා; ගල්මත්තේ, පර්වත මස්තකයෙහි;ලඟිනට, ලැගීම්පිණිස; යන, නික්මෙන්නාවූ; සිකියකාය, මෝර සමූහය ;දූකා, දශීණාම

කොට; කල්නැත්තේයයි, කාලාතික්‍රාන්තවූයේයයි; නොසිනා, චින්තනය නොකොට; සිට්, අවසිඳනව; පොල්වත්තේ නේයෙන්, පොල්වත්ත නම්වූ ග්‍රාමයෙහි සේතුවෙන්; නොවසැකය, ශංකා නැතිව; යත්, ප්‍රයාණය කරත්.

53 සො බ ව මි නේ සේපට පසිතුලේ රැ — දී
ප බ ළු මෙ නේ ගනරත් පැහැයෙන් ඔරැ — දී
වෙ සෙස ව නේ තැන තැන මකුළුදූල් බැ — දී
ම ග ස පෙ නේ මුහුකල ඉඳිකැන් සුසැ — දී

53–සේපටපසිතුලේ, ශ්වේතපට්ටපසුම්බි අභ්‍යන්තරයෙහි; රැදී, රඤ්ජමානවූ; පබළුමෙනේ, ප්‍රවාලයන්මෙන්; සොබවමිනේ, සෝභාවත් කරවන්නාවූ; ගනරත් පැහැයෙන්, ඝනකනක වර්ණයෙන්; ඔරැදී, ඔලම්බමානවූ; වෙසෙසවනේ, විශේෂවූ(ඛර්ජ්ජුර)වනයෙහි; තැන තැන, තන්හි තන්හි; මකුළුදූල් බැඳී, කෘමිජාලාවන් බඳනාලද; මුහුකල, පැසීගියාවූ; සුසැදී, සුසජ්ජිතවූ; ඉඳිකැන්, ඛර්ජ්ජූරමඤ්ජරි; මගස, මාර්ග සමීපයෙහි; පෙනේ, දෘශ්‍යමානවේ.

54 තු ව න් පිනන තැන තැන මිණිතොරණ රැ සින්
නොවන් වෙනස දිවරැ දිලෙන එකලෙ සින්
ස ව න් පුරා පවසන දෙමළ ගී ර සින්
මෙ ව න් සොඳුරු මහවැලිගමට වදුගො සින්

54–තුවන්පිනන, නේත්‍රප්‍රසන්න කරන්නාවූ; තැන තැන, තන්හි තන්හි; මිණිතොරණරැසින්, මාණික්‍ය ඛචිතාර රශ්මිය කරණකොටගෙණ; දිවරැ, දිවාරාත්‍රිය; එකලෙසින්, එකාකාරයෙන්; නොවන් වෙනස, වෙනසක් නැතිසේ; දිලෙන, දීප්තිමත් වන්නාවූද; දෙමළ, ද්‍රවිඩ භාෂාවෙන්; සවන්පුරා, කර්ණපූරණය කොට; පවසන, ප්‍රකාශකරන්නාවූ; ගීරසින්, සකල සත්ත්වයන්ගේ කර්ණරසායන මත්තසල්ලාල සත් පුරුෂයන්ගේ සිත් අලවා පවකාව සෞඛ්‍යලම්භන කරවන්නාවූ වෘෂභ තුරග මයූර අජ ක්‍රෞඤ්ච කෝකිල කුඤ්ජරයයි යන චතුෂ්පාදයන්හා විහඟගණයාවිසින් මනුජ ලොකප්‍රසිද්ධවූ වෘෂභ දෛවත ෂඩ්ජ ගන්ධාර මද්ධ්‍යම පඤ්චම නිෂාද යන සප්ත ස්වරයෙන් හා ලලිත රාග ගීත ධ්වනියෙන් යුක්තවූ; මෙවන්, මෙසේ; සොඳුරු, සුන්දරවූ; මහවැලිගමට, මහාවාලුකා ග්‍රාමයට; ගොසින්, ගමනයකොට; වදු, ප්‍රවිෂ්ටවෙව.

55 සු වි ස ල් වේ දෙපස තුඟු සල්පිල් මුදු — න
පැහැදූ ල් නන්රුවන් රැස් තැන තැන තිබෙ — න
කස ම ල් වන් ගතැති කප්හුරු වෙස්ගෙ — න
ර ස න ල් දළින් යටිඋඩුහුරු කළාමෙ — න

55–සුවිසල්, අතිවිසාලවූ; වේදෙපස, වීථිදෙපාර්ශ්වයෙහි; තැන තැන, ඒ ඒ තන්හි; තිබෙන, තිබෙන්නාවූ; තුඟු, උස්වූ; සල්පිල් මුදුන, ආපණශාලා මස්තකයෙහි; පැහැදුල්, ප්‍රභාවයෙන් බබලන්නාවූ; නන්රුවන් රැස්, නානාවිධ රත්න රාශී; කෙසේද කසමල්වන්, හරිද්‍රා පුෂ්ප

යන් වැනිවූ; ගනැහි, ගාත්‍රයක්ඇති විජ්ජු දිව්‍යරාජයෙම; කළුහුරු වෙස් ගෙණ, කෘෂ්ණවර්ණක වෙශග්‍රහණයකොට; දළින්, දෘඪ කරණකොට ගෙණ; යටි, අධොභූවනාවූ; රසතල්, නාගලෝකය; උඩුහුරු කළාමෙනි, පරිවර්තනය කළාක්මෙනි.

56 වි බා ග දත් සව්වත අගය ඇති ලෙ ස
නො බා සෙබෙහි නෙපලන සුර ඇදුරුලෙ ස
ස බා සමුව සිරිනිම්යුරු උතුරුදෙ ස
ප බා ගුණැති වෙස්කුල වෙසෙති එහි තො ස

56–සව්වත, සකල වස්තූන්ගේ; අගය, වටනා ගණන්; ඇතිලෙස, තත්වූ පරිදි; විබාගදත්, විභාග දත්නාවූ; නොබා, අසම්භිනව; සෙබෙහි, සභායෙහි; සුරඇදුරුලෙස, සුරාචාර්යයියාගේ; නෙපලන, උච්චාරණය කරන්නාවූ; සබාසමුව, සත්‍යවාදිසමූහයක්ඇති; උතුරුදෙස, උත්තර දිශාවෙහි; සිරි නිම්යුරු, ධනෙශ්වරයා වැනිවූ; සබාගුණැති, ස්වභාව ගුණ ඇත්තාවූ; වෙස්කුල, වෛශ්‍යකුල ජනයෝ; තොස, සොම්නසින්; එහි, ඒමහා වාළුකානම් ග්‍රාමයෙහි; වෙසෙති, වාසය කෙරෙති.

57 නු දු න් අතුරු උර පියයුරු යුග සුව ට
ස ඳු න් කොකුම් සමගිව ගා සුවඳකො ට
ල දු න් සරණ තැන තැන රුදුටු නෙත ට
ස දු න් කපුරු එක්කොට අඳිනේ කුම ට

47–උර, ලයෙහි; නුඳුන් අතුරු, අන්තරයක් නුදුන්නාවූ; සුවට, මනාව වූ; පියයුරු යුග, පයෝධර යුග්මයෙහි; සඳුන්, ගන්ධසාරය; කොකුම්, කුංකුමය; සමගිව, මිශ්‍රකොට; ගා, ආලේපකිරීම් වශයෙන්; සුවඳකොට, සුගන්ධපතුරුවා; තැනතැන, තන්හි තන්හි; සරණ, සංචාරණය කරන් නාවූ; ලදුන්, (මහලාතනතනුවශුභමහාප සොභිනවූ) කාන්තාවන්ගේ; රූ, රූපවිලාසය; දුටු නෙතට, දර්ශනයකළාවූ නෙත්‍රයට; සඳුන් කපුරු, චන්දන කර්පූරාංගය; එක්කොට, ගලනා; අඳිනේ, අඤ්ජනය කරන්නේ; කුම ට, කුමක් පිණිසද.

58 ර න් ව න් පැහැති සිවුමැලි ගතිනි වොරඳ න
තැ න් තැ න් වලම සොබමන් යොන්ලිය නොසින
ග න් මි න් අතට ගිරවුන් සරසවිය මෙ න
ම න් මෙන් උගන්වති රස තෙපුල වෙනවෙ න

58–රන්වන් පැහැති, ස්වර්ණ වර්ණ ප්‍රභාඇති; සිව්මැලි ගතිනි, සුකුමාලවූ ගාත්‍රයෙන්; වොරඳන, බබලන; තැන් තැන්වලම, ඒ ඒ තන්හි; සොබමන්, සොභමානවූ; යොන්ලිය, යොනකාඞ්ගනාවෝ; නොසින,

සන්තොෂයෙන්; ගිරවුන්, කිර පක්ෂීන්; සරසවියමෙන, වාග්දෙවියමෙන්; අතට ගණිමින්, හස්තග්‍රහණය කොට; මත්මෙන්; සිත්වූලෙස; වෙන වෙන, අන්‍යොන්‍යව; රසතෙපුල්, මධුර වචන; උගන්වති, උද්ග්‍රහණය කරවත්.

59 මේ කු ල් සුසැදි ගෙවුයන් මියුරුකල අ ටී
පැ දු ල් පුලිනතල හිම්සිසිකිරණසැ ටී
වා ස ල් විසල් පිළිම්ණි පවුරුයෙන් ගැ ටී
බෝකල් පවතිනා එපටුන් මැද පිහි ටී

59–මියුරු අටීකල, මයූරයන් විසින් ආලයකළාවූ; මේකුල්, මේඝකූට යන් බඳුවූ; සුසැදි, (සහකාර කේසර පුණ්ඩරීක තින්දුක තිලකනාග මාල ඛදිර කරජ වකුල අශෝක ශාඛාහරිත දුෂ්ප මකරන්ද පළිපල්ලවාදීන් දරාසිටි නොයෙක් පාදපපඞ්ක්තීන්) සුසජ්ජිතවූ; ගෙවුයන්, ගෘහොද්‍යාන සමූහයෙහි; හිම්සිසිකිරණසැටි, සියුම් චන්ද්‍රකාන්තියමෙන්; පැහැදුල්, පැහැයෙන් බබලන; පුලිනතල, ශිශිරකිරණ විකසිත ප්‍රසාදගි සනති හවිසද පුලිනතල නිර්මල ශ්වෙතාංගන පඞ්ක්තීන් හා; පිළිම්ණි, පවුරු යෙන් ගැටි, ස්ඵටික මාණික්‍යයෙන් ඝට්ටනය කරණලද; ඝනතරයෙන් තුංග ප්‍රාකාරවලයකින්ද යුක්තවූ; විසල්, විසාලවූ; වාසල්, ගොපුරවාරයන් ඇත්තාවූ; බෝකල් පවතිනා, බොහෝ කාලයක් පවත්නාවූ; එපටුන් මැද, ඒ මහාවාලික නම් ග්‍රාම මධ්‍යයෙහි; පිහිටි, සුප්‍රතිෂ්ඨිතවූ; සරද භ්‍රසං ජනනාශරද්ගගනතලයක්මෙන් සුධාසිතාභිධවල ශෛලාසතූප ප්‍රධානවූ ඒ විහාරය වන්දනාකරණු පිණිස පිවිතුරුය නාදී සැහැල්ල කිහු–

60 පිවිතුරු ගුණ කපුරු–පිරිසිරි රන් සුමුහුයුරු
ව ස් වා දහම් වහරේ සත සිත නෙත ය
දි ස් වා නිවන්පුර පිරිවිසි මහවත ය
මතු බුදුබව ලබන–ලෙසින් අදියර අගමැති
ස ත ර දිගින් වඩිනා සඟ උදෙසා ය
ස ත ර පසය දෙනලෙස නිති සලසා ය
කා ර වූ වෙහෙර රැඳි මුනිමැදුරතට වැ ද
වෙ ර වූ වැසන නොසිතා ගවතින් එස ද
ගො ර වූ සසර සයුරෙන් ගැලවෙන සබ ද
තා ර වූ බැතින් වඳු එහි බැබලි මුනිර ද

60–පිවිතුරු, පවිත්‍රවූ; ගුණ, ගුණ නැමති; කපුරු, කර්පූරයෙන්; පිරි, පිරුණාවූ; සිරි, සොභාවත්වූ; රන්සුමුහුයුරු, ස්වර්ණ සමුද්ගයක් වැනිවූ; දහම්වහරේ, සද්ධර්ම වර්ෂාව; වස්වා, වර්ෂා කරවා; සත, සත්ත්වයන්ගේ; සිත නෙතය, මනො නෙත්‍රයන්ට; නිවන්පුර පිරිවිසි, නිර්වාණපුර ප්‍රවෙශවත්

නාවූ; මහඬිනය, මහාමාත්‍ය; දිස්වා, දක්වා; අදියර අගමැති, අධිකරණ යෙහි නියුක්ත අග්‍රාමාත්‍යයා විසින්; මතු, අනාගත කාලයෙහි; බුදුබව, බුද්ධභාවය; ලබනලෙස, ලබනපිණිස; සතරදිගින්, චතුර්දිශාවෙන්; වඩනා, වැඩම වන්නාවූ; සඟ උදෙසාය, සංඝයා උදෙසා; නිති, නිරන්තර රයෙන්; සතරපසය, චීවරාදිචතුර්විධ ප්‍රත්‍යය; දෙනලෙස, දානයකරණ පරිද්දෙන්; සලසාය, සලස්වා–

කරවූ වෙහෙර, (සමස්ත රත්නාකර විබුධජනාකීර්ණවූ මාතොට· නම් පුරප්‍රවරයෙහි රාජ්‍යශ්‍රීකර වදාල සමස්ත භුවන භාස්කරවූ ශ්‍රී විජය බාහු මහා රාජෝත්තමයානන්වහන්සේගේ ලෝකබහුමාන භාජන ප රම නිකරවූ අග්‍ර මන්ත්‍රීශ්වරයා විසින් බුදුබව පතා සුවිසුඞ ප්‍රාකාරාංගන ගොපුර සංඝාරාම ප්‍රතිමාලය බොධි චෛත්‍යාදින් විසිතුරුකොට) කර වන ලද්දාවූ විහාරයෙහි; රුදී, රජමානවූ; මුනි මැඳුරනට, මුනීන්ද්‍රයානන් වහන්සේගේ ගන්ධකුටි මණ්ඩපයට; වැද, ප්‍රවිශ්ටව; ගමනින්, යාත්‍රාව කර ණකොටගෙණ; වෙරවූ වැසන, තාගේ ශරීරයෙහිවූ පීඩාව; නොසිතා, චෙතනා නොකොට; එසඳ, ඒ ක්ෂණයෙහි; ගොරවූ සසර සයුරෙන්, ඝොරබිරම්වූ සංසාර සාගරයෙන්; ගැලවෙන, ගිලිහෙන්නාවූ; හෙවත්, මුක්තවන්නාවූ;(උපායපිණිස)එහි බැබලි, ඒ ගඳකිළි තුල බබලන්නාවූ; මුනිරද, සර්වඥරාජෝත්තමයානන් වහන්සේට; සබඳ, කල්‍යාණය; නරවූ බැතින්, ස්ථිරවූ භක්තියෙන් යුක්තව; වඳු, නමස්කාර කරව.

61 මදක් ලිහිල්නොව තවතමිනි පසිඳු රත්
උදක් තොසින් පිළිවෙත් පුරණ තවස රත්
සඳක් සතුටු කරනමදිමිනිපද ස රත්
සඳක් සෙ සොම්ගුණ සකි සුසිරි අත්ක රත්

61–මදක් ලිහිල්නොව, නිමේෂකල් පමණත් අවකාශනොදී; පසිදු රත්, පඤ්චේන්ද්‍රියයන්; තවනමිනි, නිවාරණය කෙරෙමින්; උදක්තොසින්, අධිකවූ සන්තොෂයෙන්; පිළිවෙත් පුරණ, ප්‍රතිපත්ති පුරන්නාවූ; තව සරන්, ප්‍රව්‍රජිතයන්ගේ; පදසරන්, පාදපද්මයන්ට; සඳක් සතුටුකර, තාගේ නෙත් සිත් සන්තොෂකොට; නමදිමින්, නමස්කාර කරමින්; සඳක්සෙ, චන්ද්‍රබිම්බයක්මෙන්; සොම්ගුණැති, සෞම්‍ය ගුණඇත්තාවූ; සකි, මිත්‍රය; සුසිරිඅත්කරන්, සුචරිත සම්පාදන කරන්.

62 ප ව ර කැළුම් පිය විදහාගොස් නුබ ත
අ ව ර ගුවන් මිණිරන් හිසරිඳු දිමු ත
මූ ව ර කර ලකර සරතුර පැමිණග ත
එ ව ර තුරෙක සකි මැනවිය ලැගුම්යු ත

62–පවර, ප්‍රවරවූ; කැළුම්, රශ්මිනැමති; පිය, පක්ෂපත්‍ර; විදහා, විසුරුවා; ගොස්නුබන, නභානතයට ගමනකොට;අවර, අස්තංගතවූ; ගුවන් මිණි, දිනෙන්ද්‍රයා නැමති; රන්හිසරිඳු, සුවර්ණ හංසරාජයා; දිමුත, දිලි

නෙමින්; ලකර, අලංකෘතවූ; මුවරකර, මකරාකාරය නැමති; සරතුර, නවා කාභ්‍යන්තරයට; පැමිණෙනත, ප්‍රවිෂ්ටවූ; එවර, ඒ වේලෙහි; සකි, මිත්‍රය; මැනවිය, මනොඥව; තුරෙක; වෘක්ෂයෙක; ලැගුම් යුත, ලග්නකටයුතු.

63 ඉ ටු වූ තිසර හරකල විලඹු මනහ රා
දු ටු වූ සඳ දිනිඳු පෙබයුමෙනි මුවස රා
තු ටු වූ බමර රසබස් කියත නොමහැ රා
ප ටුනු ගුණැති මමිතුර යන්න තුබස රා

63–ඉටුවූ, ඉෂ්ටවූ; තිසර, හංස සමූහයා; හරකල, මුක්තාහාරයක් කළාවූ; විලඹු, විල්නැමති අඹිකාවන්විසින්; මනහර, මනොඥවූ; දිනිඳුදුටුවූ සඳ, (තමාගේ වල්ලභවූ) දිනෙන්ද්‍රයා දුටු ක්ෂණයෙහි; මුවසර, මුඛනැමති පද්මයන්; පෙබයුමෙනි, ප්‍රබොධකිරීමෙන්; තුටුවූ, සන්තුෂ්ටවූ; බමර, භෘංගයන්ගේ; රසබස්, මිහිරිනෙපුල්; නොමහැර, අවකාශයක් නොව; කියත, කථනයකරණ කල්හි; පටුනු ගුණැති, විසාලවූ ගුණඇති; මමිතුර, මාගේ මිත්‍රය; තුබසර, ගගනාරූඪව; යන්න, ප්‍රයානය කරන්නේයි.

64 හි ම සි වි යා බිඹුලෙස සසලපිනි දු ල
බි ගු සෙ වි යා මිනිමුතු හෙළ පියුම ව ල
ම හ නැ වි යා පොකුණෙනි සිරිසර විපු ල
නොමැනවියා කළ නරඹා සිට අස ල

61–සසලපිනි, ශශලාඤ්ජනයෙන්; දුල, දිලිහෙන්නාවූ; හිමසිවියා බිඹුලෙස, හිමාංශු මණ්ඩලාකාරවූ; බිගු සෙවියා, (මුවරදලොලින් අවුදු රෙන් පවින් යුත් පියුම්වනබැස තුඩුනබා මධුරස උකාබිදවන රවන) භෘංගයන් විසින් සේවනය කරණලද්දාවූ; මිනිමුතු, සුපුෂ්පිතවූ; හෙළපියුම්, ශ්වෙත පද්මයන්ගෙන්; අමල, ගැවසීගත්තාවූ; මහනැවියා පොකුණෙනි, (කුසුම් නැමති රතනින්ගත් මුත්හරබඳු පොසොන් පතරින් ගලන දියදහරඇති) එනම් පුෂ්කරිණියෙහි; විපුල, බොහෝවූ, සිරිසර, ශ්‍රීසාරය; අසල සිට, ආසන්නප්‍රාප්තවසිට; නරඹා, නිරීක්ෂණයකොට; නො, යුෂ්මත්නොම; යාකල, යාත්‍රාකළහොත්; මැනවි, යෙහෙකී–

65 අක්බෝ වෙහෙරරැඳි–මුනිරූ බලත වෙසෙසින්
අක්බෝ පහළවුවමිස–නොපිළිවනි සක්දෙවිඳු විලසින්*

65–අක්බෝවෙහෙර, අග්‍රබෝධිවිහාරයෙහි; රැඳි, රජිතවූ; මුනිරූ, බුද්ධ ප්‍රතිමාවහන්සේ; වෙසෙසින්, විශෙෂයෙන්; බලත, බලත්හොත්; සක්දෙවිඳු විලසින්, ශක්‍රදෙවෙන්ද්‍රයාට මෙන්; බෝ, බොහෝවූ; අක්, අක්ෂීන්; පහළවුවමිස, ප්‍රාදුර්භූතවූවොත් මිනා; නොපිළිවනි, නොහැකියි;.

* මේ ගිය 60 වෙනි සැහැල්ල ලඟට යෙදියයුතුයයි ඇතෙත තමුත් පොත් වල තිබුනලෙසම යෙදීමු.

66 දුල්ලව සැදි සමුදුර සක් පබළු රැ ස
ලොල්ලව ගෙණ නුබනැගිමේ කුළුවිල ස
පල්ලව කේතකී මල් සුසැදි නිසිලෙ ස
පොල්ලව වෙත වනපෙත නරඹත් නොල ස

66-දුල්ලව, ජ්වලිතවූ; සැදි, සජ්ජිතවූ; සමුදුර, රත්නාකරයෙහි; සක්පබළුරැස, සඞ්ඛප්‍රවාලරාශිය, ලොල්ලවගෙණ, ලෝලයෙන් ග්‍රහණය කොට; නුබනැගි, ගගනොද්ගතවූ; මේ කුළුවිලස, මේඝකූටයක් බඳුවූ; පල්ලව, දලයෙන්ද; මල්, පුෂ්පයන්ගෙන්ද; නිසිලෙස, යොග්‍යාකාරයෙන්; සුසැදි, සුසජ්ජිතවූ; කේතකී, වැටකේ වෘක්ෂයෙන් යුක්තවූ; පොල්ලවවෙත, පොල්ලවග්‍රාමය සමීපයෙහි; වනපෙත, වනප්‍රදේශය; නොලස, අලස නොවී; නරඹත්, නිරීක්ෂණයකරත්;

67 දුලනා පුලින තලවග මුතු පැහැ ස ර ම
සෙමෙනා වැඩව කර තුනුගිම් හැර දු ර ම
සිටිනා සුර මැදුර සිරි සමුදුර තෙ ර ම
දකිනා මැනවි සකි ලනුමෝදර අ ර ම

67-මුතුපැහැසරම, මෞක්තික සමූහයක්මෙන් ප්‍රභාසාර ඇති; පුලින තල, වාලුකාස්ථලයෙන්; දුලනා, දිලිහෙන්නාවූ; මග, මාර්ගයෙහි; සෙමෙනා, සත්පුරුෂාවයෙන්; වැඩවකර, යාත්‍රාකොට; තුනුගිම්, තනුඝර්ම්ය; හැරදුරව, දූරීභූතකරමින්; සමුදුරතෙරම, සමුද්‍රතීරයෙහිම; සිටි, ප්‍රතිෂ්ඨිතවූ; නාසුරමැදුර, නාථසුරේන්ද්‍රයාගේ මන්දිරයෙහි; සිරි, ශෝභාශ්‍රීයද; ලනුමෝදර, ලනුමෝදරනම් ග්‍රාමයෙහි; අරම, ආරාමයද; සකි, යහළුව; දකිනාමැනවි, දර්ශනය කළමැනවි;

68 වැදසුරමග යන වනදෙවඹු ව න් නේ
පදතලවැකි වෙන් තුඟු තුරු මුදු න් නේ
මදලෙලල පළුපත් දැක මිරි පැ න් නේ
ඉඳමදකල් නුඹ නුබ වැද වඩි න් නේ

68-සුරමගවැද, ආකාශමාර්ග ප්‍රවිෂ්ටව; යන, ප්‍රයාණය කරන්නාවූ; වනදෙවඹුවන්නේ, වනදිව්‍යස්ත්‍රීන්ගේ; පදතල, පාදතලයන්; වැකි මෙන්, තැවරීමෙන්; තුඟුතුරුමුදුන්නේ; තුඟද්‍රැම මස්තකයෙහි; මදලෙල, මන්දමාරුතයෙන් ලිලෝපෙත කරනුලබන්නාවූ; ලපළුපත්, අභිනවපල්ලව; දැක, දර්ශනයකොට; මිරිපැන්නේ, මිරිපැන්න නම් පියසෙහි; මද කල්, ස්වල්පකාලයක්; ඉඳ, නිෂන්නව; නුඹ, යුෂ්මත්තෙම; නුබවැද, න භොගතව; වඩින්නේ, ප්‍රයාණයකරන්නේයි-

69 වැ ද ඌ නු න ට  පසු බැස බැස කොට ස  ට න
ඇ ද කු ර බි ම  ඇන ඇන පඳුරු දව  ට න
ම ද නැ ගී තු ඟු  ගවරල සිටි තුරු ය  ට න
ම ද කා ල් සි ට  දූක සකි යන් උන ව  ට න

68–උනුනට, ඔවුනොවුන්කරා; වැද, ප්‍රවිෂ්ටව; පසුබැසබැස, පාශ්චාත් භාවයට පැමිණ පැමිණ; සටනකොට, යුද්ධකර; කුර, ගොකුර; බිම, භූමියෙහි; ඇද, අදිමින්; ඇනඇන, අනිමින්; පඳුරුදවටන, ගුල්මද්වටීම කරන්නාවූ; මදනැගි, මදනොත්සන්නවූ; තුඟු, උස්වූ; තුරු යටන සිටි, වෘක්ෂයන්යට සිටියාවූ; ගවරල, වෘෂභසමූහයා; දූක, දර්ශනයකොට; උනවටන, එනම්ග්‍රාමයෙහි; මදකල්, ස්වල්පකාලයක්; සිට, අවස්ථිතව; යන්, ප්‍රයානයකරන්;

70 ම න් තුටුවන  බිඟු තඹරෙවු සැ ඳෑ  ල් ලේ
බ න් තනයුග රන්පට නොව ලි  ල් ලේ
ව න් සුර ඟන  ලිය රූ දුට ගා  ල් ලේ
දු න් රසඳුන් මෙන් දෙනුවන් සී  ල් ලේ

70–සැඳෑල්ලේ, චන්ද්‍රාලෝකයෙහි; (දිනකර නිකර අමරගිරාසනනාව; හිසුලවිය සන්ධ්‍යානුභාෂයට පටන්ගත්කල්හි;) තඹරෙවු, තාමරසයෙහිවූ; (හෙවත් සුගන්ධ මකරන්ද මධුරස උකාබිමත්ව කාලාතික්‍රමණ වනකල්හි කෞමුදවනප්‍රබොධකොට එන ශශාංකරාජයාදූක මුකුලිතවන පද්මාභ්‍යන්තරයෙහි බඹවලඳ;) මන්තුටුවනබිඟු, චිත්තසන්තොෂවත්නාවූ භෘංග යන්මෙන්; තනයුග, (මදරාජාභිෂෙක ස්වර්ණකලසසංස්ථාන උන්නතග අති නීල චංචුපුගලයකින් නෙත්‍රරසායනවූ) පයොධර යුග්මය; රන්පට, ස්වර්ණ රත්පටින්; නොවලිල්ලේ, නරකොට; බන්, බඳනාලදාවූ; වන්සුරඟන, දිව්‍යාඟනාවන් වැනිවූ; ලියරූ, (පරමරුචිර යෞවන අවතාර මකරධ්වජ විජිත ශරීරසොභාඇති) අඟනාවන්; ගාල්ලේ, (හිමගිරිශිඛරාකාර අනෙක භූමිභෙදදින සහස්‍රාම්න ප්‍රාසාදශ්‍රෙණින් හා විවිධරත්නාකිණිණි, සරි තාපන තොරණාගසික ධජමාලාදීන් ප්‍රබන්ධනාවූ) ගාල්නම් පුරප්‍රවරයෙහි; දුට, දර්ශනය කළකල්හි; දෙනුවන්, නෙත්‍රයුග්මයට; දුන්, දුන්නාවූ; රසඳුන්මෙන්, රසාඤ්ජනයන්මෙන්; සීල්ලේ, සීතල වන්නේසි–

71 න ලි න  වදන මදහස දෙමිනි එක ර  ඟ
කෙලි න  නැතින් නැන ලිය සලෙළුන් සම  ග
දෙලි න  ඔවුන් නරඹා ලස් නොවී ම  ග
නි ලි න  වඩින් මම්තුරු සඳිනි මන ර  ඟ

71–නලිනවදන, රන්පියුම්වැනි වක්ත්‍රයන්ගෙන්; එකරඟ, එකපැහැර; මදහසදෙමිනි, මන්දහාස්‍ය දානයකෙරෙමින්; නැතින් නැන, ඒ ඒ තන්හි; සලෙළුන් සමග, (සමානකුල යෞවනාවතාර මකරධ්වජයා

වැනිවූ) සලීලාල පුරුෂයන් හා; කෙළිනා, (සුමිහිරිවදන් අමකැන් පානය කරවමින්) ක්‍රීඩාකරන්නාවූ; ලිය, ලලනාවන්; දෙළිනා, ලෝලයෙන්; නරඹා; නිරීක්ෂණයකොට; ඔවුන්, ඔවුන් හා; ලස්සනාවී, ආලස්‍යයට නොපැමිණ; මග, මාර්ගයෙහි; හිළිනා, සතොෂයෙන් යුක්තව; එනරඟ, සිත්වූපරිද්දෙන්; මමිතුරු සඳිනි, මාගේ මිත්‍රොත්තමය; වඩින්, ප්‍රස්ථානය කරන්.

72 දු ල මිණිගන සැදි සිරිලකඟන ලක ළ
ලෙ ල පෙනවැල මලිගිය මල් බර මුහු ළ
ර ල තිනි සයුරු රදගත් සිරිපහළ ක ළ
මොල සිලිලුතුළ ගිංගගිනෙතරව පුව ළ

72-මිණිගන, මාණික්‍යසමූහයෙන්; දුල, උජ්ජ්වලිතව; සැදි, සජ්ජිතව; සිරිලකඟන, ශ්‍රීලාංකාඞ්ගනාවගේ; ලකල, අලංකෘතවූ; ලෙල පෙනවැල, ලලිත බින්බිරවලිනැමති; මලිගිය මල්බර, මාලතී පුෂ්පයන්ගෙන් භර නවූ; මුහුල, කෙසකලාපය; සයුරුරද, සමුද්‍ර නැමති වල්ලභයාගේ; රල තිත්, තරඟනාමැති හස්තයෙන්; ගත්, ග්‍රහණයකළාවූ; සිරිපහලකල, ශොභාවිප්‍රකාශකළාවූ; මොල සිලිලුතුල, මෘදුසිසිල් සිනිඳු සැඩසලාතර ග අතුරුතු තඹවතුරුළුතුළ; පුවල, වෘත්තිමානකාලප්‍රෞඪවූ; ගිංගගින් එතරව, එනම් ගංගාවෙන් පරතිරප්‍රාප්තව.

73 ම ත් ක ම රණට ගසනෙව් රුදු මිහිගු බෙ ර
දෙත් ගු ම බමර දූල්මග දෙපස වන තු ර
ප ත් ගි ම නිවා ගත සැතපී ගොස් මිතු ර
ර ත් ග ම වෙහෙර වොරුදින මුනිඳු නමක ර

73-මත්කම, මන්මථයාගේ; රණට, යුඩයට; රුදු, රෞද්‍රවූ; මිහිගු බෙර, මෘදඟභෙරීන්; ගසනෙව්, ගසන්නාක්මෙන්; බමරදූල්, භෘඟජාලාවන්; මගදෙපස, මාර්ග උභයපාර්ශ්වයෙහිවූ; වනතුර, වනාන්තරයෙහි; ගුම්දෙත්, ගුම්භන අනුකරණ නාද පවත්වනකල්හි; ගත, ගාත්‍රයෙහි; පත්ගිම්නිවා, පැමිණීයාවූ ග්‍රීෂ්ම සන්සිඳුවා; සැතපී, සන්තර්පිතව; ගොස්, ගමනයකොට; මිතුර, මිත්‍රය; රත්ගම්වෙහෙර, රත්ගම්විහාරයෙහි; වොරුදින, (තාරකානිකරප්‍රභාසමූහයෙන් දීප්තිමත්වූ, සරදම්බොදරයක් සේ)බබලන්නාවූ; මුනිඳු, සර්වඥයන්වහන්සේට; නමකර, නමස්කාරකර.

74 වැ ටි ය නොදී බැඳිතන ඉන් ඉන් ගැ ටි ය
පැ ටි ය කොරෙයි ඇපනිසිගනරත්තැ ටි ය
සැ ටි ය මෙවන් අඟනන් තැන තැන සි ටි ය
අ ටි ය නොකර දූකයන් උඩුගල් පි ටි ය

73-වැටියනොදී, පතිත නොවනු සඳහා; බැඳි, (පයොධර පට්ටයෙන්) බඳනාලද; තන, (හෙම්වාරු ශ්‍රීඵලයුග්මාකාර උන්නාග) පයොධරයන්; ඉන් ඉන්ගැටිය, අන්‍යොන්‍ය ඝට්ටනයෙන් යුක්තව; නිසි, මනොඥවූ; ගන

රත්නැපිය, ඝනඝනඝනලීලයෙහි; ඔප, ප්‍රභාවය; පැවිය නොහැරයි, පටු කරන්නේයි; පැන නැන සිටිය, ඒ ඒ නැන සිටින්නාවූ; මෙවන්, මෙවෙ නිවූ; සැටිය, සටහන්ඇති; අගහන්, අඝගනාවන්; දක, දර්ශනයකොට; අපියනොකර, ආලයනොකොට; උඩුනල්පිටිය, උඩුනල්පිටියනම්වූ පිය සිත්; යන්, යාත්‍රාකරන්;

75 වක් අඩු වෙන් සිටි පමණට ඇන ති ලය
දික් කඩු වෙන් බියගත්වා පැබ ලය
දුක් වැඩු වෙන් සිටිනා මගෙහි අස ලය
සික් කඩු වෙන් සෙබළුන් දක සකි ප ලය

75–වක්අඩුවෙන්, අර්ධචන්ද්‍රාකාරයෙන්; තිලය, ඉලක්කය තබනලද; පමණට ඇනසිටි, එනම් ක්ෂුද්‍රවාහිනිකාවට නියතයෙන් ඇනසිටින්නාවූ; දික්කඩු වෙන්, දීර්ඝ අසිපත්‍රයෙන්; බියගත්වා, භීතකරවා; පැබලය, බාහුබල ප්‍රකාශකොට; දුක්වැඩුවෙන්, ප්‍රයාතාගමන ජනයන් අය සුංගම්ගැන ව්‍යසනවර්ධන කිරීම්වශයෙන් දුක්දී; මගෙහි අසලය, මාර්ගාසන්නයෙහි; සිටිනා, ස්ථිතිප්‍රාප්තවූ; සෙබළුන්දක, සේවකයින් දර්ශනයකොට; සික් කඩුවෙන්, සික්කඩුවනම්වූ ආවරණස්ථානපියසිත්; සකි, සඛීත්‍රය, පලය, ප්‍රයානයකර;–

76 රලින් ද මහා සිදුසක් මුතු වෙලල මුව
දෙලින් රුහෙණ කෙළනා පැවිලිය සු මුව
පලින් පළම ඉඳ නරඹා සිත් යො මුව
හිලින් දිනත වඩු ලැක්මට තොට ග මුව

76–සිඳු, සමුද්‍රයෙහි; වෙලලමුව, වෙලාතන මුඛයෙහි; රළින්දමන, ගම්භීරොත්තුංග තරංග සමූහයෙන් ක්ෂෙපනය කරන්නාවූ; සක්මුතු, සඛ මෞක්තිකාදී නානාවිධ රත්නයන්; දෙලින්, ලෝලයෙන්; රුහෙණ, හැරගෙණ; පලින් පළම, නැගින්නැන; ඉඳ, තිෂ්ඨනව; කෙළිනා, ක්‍රීඩා කරන්නාවූ; සුමුව, ශුභපත් මුවඇති; පැවිලිය, බොලඳයත්‍රින්; සිත්යො මුව, චිත්තාය යොමුකොට; නරඹා, නිරීක්ෂණයකර, හිලින්, සතොෂ යෙන්; දිනත, දිවාන්තයෙහි;ලැක්මට, ලැගීමපිණිස; තොටගමුව, එනම් ග්‍රාමයට; වඩු, ප්‍රවිෂ්ටවෙව;

77 නහිඳු නිමල් මොලකැටි සිරුරෙන් පත ල
සිනිඳු කැළුම් කඳසේ තිරතුරු උදු ල
පසිඳු විහත් පෙන්මග පුලිනතලක ල
නොසිඳු යතුරු කෙරෙමින් වැද වෙහෙර තු ල

77–නාගිඳු, නාගද්වීපරාජයාගේ; නිමල්, නිර්මලවූ; මොලකැටි, මෘදු මාරුගාත්‍රයෙන්; පතල, ප්‍රකාශවූ; සිනිඳු කැළුම්කඳසේ, ස්නිග්ධවූ කාන්ති ස්කන්ධයක්සේ; තිරතුරුඋදුල, නිරන්තරයෙන් උජ්වලිතවූ; පසිඳු, ප්‍රසිද්ධවූ; පුලිනතලකල, (සිඳුවාර මකරන්ද රශියක්මෙන් අහ්බවල) වැලි

නලාටයෙන් සමලංකෘතවූ; මහත්පෙත්මග, විසාලවූ ප්‍රතිමාගෘහයෙහි; නො සිඳ, නිෂ්ඵලනොකොට; යතුරුකෙරෙමින්, යාත්‍රාකොට; වෙහෙරතුල, විහාරාභ්‍යන්තරයට; වැද, ප්‍රවිෂ්ටව.

78 ස රා බියෙන් නිල්ගනකුළු මුළු අඹ ර
වරා අවුත් කැටිවුමෙන් එක පැහැ ර
ස රා පිළිම ගෙයි වැඩසිටි මුනිපව ර
පු රා තනෙත දූක වැඳ සිත එකඟ ක ර

78–සරාබියෙන්, සූර්ය්‍යකෙරෙහි භීතියෙන්; මුළුඅඹර, ආකාශය මුලුල්ලෙහි; නිල්ඝනකුළු, මේඝකූටයන්; වරාඅවුත්, වෙත්වවිත්; එකපැහැර, එකාඝනව; කැටිවූමෙන්, එකනැත්වූවාක්මෙන්වූ; පිළිමගෙයි, ප්‍රතිමාගෘහයෙහි; සරා, (අශීත්‍යනුව්‍යඤ්ජන රශ්මිප්‍රභාකෙතුමාලාලංකාරයෙන්) සමලංකෘතව; වැඩසිටි, සම්ප්‍රාප්තවූ; පවර, ප්‍රවරවූ; මුනි, සර්වඥයන්වහන්සේ; තනෙතපුරා, තාගේ නෙත්‍රපූරණයකොට; දූක, දර්ශනයකර; සිත එකඟකර, චිත්තෛකාග්‍රතාකොට; වඳු, නමස්කාරකර.

79 මු නි වි රූ වෙතම මෙම මනරම් ලෙස පිහි ටී
නර තු රූ කෙලෙස ගිරමෙන් සඳකැන් දූව ටී
වි සි තු රූ රුවින් යුතු මතු බුදුවන්ට සි ටී
නති සු රූ නමදු සිදුවන ලෙස තසිත අ ටී

79–මෙම, වර්ත්තමානකාල ප්‍රවෘත්තවූ; මුනිවිරුවෙතම, මුනීන්ද්‍රයාගේ ප්‍රතිමාරූප සමීපයෙහිම; මනරම්ලෙස, මනෝරම්‍යවූ පරිද්දෙන්; පිහිටි, ප්‍රතිෂ්ඨිතවූ; නරතුරු, නිරන්තරයෙන්; සඳකැන්දූවටි, චන්ද්‍රකාන්තියෙන් වෙළිගිඝාවූ; කෙලසගිරමෙන්, කෛලාශකූටයමෙන්; විසිතුරු රුවින්, විචිත්‍ර රූපයෙන්, යුතු; යුක්තවූ; මතු, අනාගතයෙහි, බුදුවන්ට සිටි, ලොවුතුරා බුදුවන්ට වැඩසිටින්නාවූ; නාතිසුරු, නාථෛශ්වර්ද්දිව්‍ය රාජයාහට; තසිතඅටි, තාගේ චිත්තාභිලාෂය; සිදුවනලෙස, සිද්ධවනපරිද්දෙන්; නමඳු, නමස්කාරකර;

80 දෙ ර ණ සරණිතින් මැනඳූන ගත්පිය ත
න ර ණ අනත ගුණයෙන් රැගෙණ මෙරම ත
කි ර ණ සලත ඉන්නැගි බුබුල සිරි ග ත
පො ර ණ ලකුණු සුතුදනගැබ වඳු දිමු ත

79–සරණිතින්, ශ්‍රීපාදද්වන්දයෙන්; දෙරණමැන, පෘථිවිය මානයකොට; පියන, ව්‍යක්තභාවයෙන්; දූනගත්, විජානනයකළාවූ; නරණ, ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයා විසින්; අනතගුණයෙන්, අනන්තයා නැමැති රැහැනින්;

රැගෙණ, ග්‍රහණය කොට; මේරමත, සුමේරු මථනයෙන්; කිරණසලන, ක්ෂීරසාගරය ඇලළුකල්හි; ඉන්නැගි, එයින් පැනනැංගාවූ; බුබුල සිරි ගන, බුද්බුදශෝභා ග්‍රහණයකළාවූ; පොරණ ලකුණුයුතු, පුරාණ ලක්ෂණයෙන් යුක්තවූ; දිමුන, දීප්තිමත්වූ; දහගැබ, ධාතුගර්භය; වඳු, නමස්කාර කර;

81 එවෙනෙර රඳන නිති–දිය තුළයස ඝොසපතළ
කඳ වූ රු කුල තඹුරු පොබයන දිනිඳු යු රු
වැඩකරු උතුරු මූලමහ තෙරිඳු මුනුබු රු .
ගුළු කිවි මුළුවරණ–කුඹුදප්බිඳි කෙසර යුරු
නෙවළා සත්රුවන් හරපැලඳි උරතු ම
නෙවළා වදනිසුරු විජයබ් තෙරිඳු තු ම
සබා සමුව ලොව වෙසෙසින් පෙණුනු ලෙ ස
සබා සකිවි බැඳඋන් සඳ තෝ පිවි ස
සබා සුරිඳු සපුමල් කුමරු වැණු ය ස
සබා සයෙන් අස්නක් ගෙනයම් පව ස

81–එවෙනෙර, (ත්‍රිවිධරත්නාකරවරනිකරයෙන් ප්‍රභාස්වරවූ) ඒ විහාරයෙහි; රඳන, රාජමානවූ; නිති, නිරන්තරයෙන්; දියතුළ, ජනදෘෂ්ටාන්තරයෙහි; යස ඝොසපතළ, යශොඝොෂා ව්‍යාප්තවූ; කඳවූරුකුල, ස්කන්ධාවාරවංශ නැමැති; තඹුරු පොබයන, තාමරසවනය ප්‍රබොධකරන්නාවූ; දිනිඳුයුරු, දිනෙන්ද්‍රයාබඳු; වැඩකරු, (ධර්මාර්ථදේශනා ප්‍රතිවේධ දක්ෂසමස්තශාස්ත්‍ර භෙරීනාදයෙන් එකකොලාහලකළහෙයින් සකලසත්ත්වයන්ට) උභයලොකාර්ථ දෘෂ්ටකවූ; උතුරු මූලමහතෙරිඳු, උත්තරමූලමහාස්ථවිරයන්වහන්සේට; මුනුබුරු, නප්තෘවූ; කිවිමුළු, කවිසමූහයානමැති; ගුළුවරණ, ත්‍රිමදගල හස්තීන්ගේ; දප්, දර්පනැමැති; කුඹු, කුම්භස්ථලයන්; බිඳි, භින්නකළාවූ; කෙසරයුරු, කෙශරී සිංහරාජයෙක්බඳුවූ; නෙවළා, ත්‍රිපිටකධර්ම නැමැති; සත්රුවන්හර, සප්තවිධරත්නහරයක්; තුම, තමන්ගේ; උරපැලඳි, හෘදයෙහි පැලැන්දූවූ; නෙවළාවදනිසුරු, ත්‍රිපිටක වාගීශ්වරවූ; විජයබ තෙරිඳුතුම, (ත්‍රිවිධරත්නවර්ණනාර්ථ මහාවිහාරවාසී ස්ථවිරපරම්පරානුගත) ශ්‍රීවිජයබාහු නම් මහාස්ථවිරෝත්තමයන් වහන්සේ;

සබා, ස්වභාවයෙන්; සමුව, ජම්බුද්වීපරාජ්‍යයා, ලොව, ලෝකයාට; වෙසෙසින්, විශෙෂයෙන්ම; පෙණුනුලෙස, දෘශ්‍යමානවූවාක්මෙන්; සබාසකිවි, ෂඩ්භාෂාවෙන් යුක්ත කාව්‍යයන්; බැඳඋන්සඳ, යමකප්‍රහේලිකා ක්‍රියා ගුප්තගූඪ චතුර්ථ්‍යාදි කවි කර්මයෙන් අනේක බන්ධනයකොට වැඩඉඳිනා කාලයෙහි; තෝ, යුෂ්මත්තෙම; පිවිස, ප්‍රවිෂ්ටව; සබාසුරිඳු,

ස්වභාවයෙන්ම සූර්‍යෙන්ද්‍රාකාරවූ; සපුමල්කුමර, චම්පකපුෂ්ප රාජකුමාර යාණන්; යසවැණු, යශස්වර්ණනාකළාවූ; සබාසයෙන්, සවභාෂායෙන්; අය්නක් තෙණයම්, සත්දෙශයක් ග්‍රහණයකොට ප්‍රයාණයකරමි; පවස, සැලකර;

82 පු න් ස ඳ  කිරණ පෙරදිගිනෙත විපු  ල් ලේ
නන් කො ඳ  කුමුදු විකසිත වන ඇසි  ල් ලේ
මෙන් ග න  සොබන තුරුමැද වෙහෙර තු  ල් ලේ
ම න් බැ ඳ  ලගින් කෙවිලගනක තුරු  ල් ලේ

82–විපුල්ලේ, බොහෝවූ; පුන්සඳකිරණ, පූර්ණචන්ද්‍රකාන්තිය; පෙරදිගි නෙත, පූර්විදිග්භාගයෙන් පහලවළිනාකල්හි; නන්, අනෙකවිධවූ; කොඳ කුන්දපුෂ්පයන්ද; කුමුදු, කෞමුද පුෂ්පයන්ද; විකසිතවන, සුපුෂ්පිතවන් නාවූ; ඇසිල්ලේ, ක්ෂණයෙහි; වෙහෙරතුල්ලේ, විහාරාභ්‍යන්තරයෙහි; මෙන්ගන, මෙෂකූටයක්සේ; සොබන, සොභමානවූ; තුරුමැද, වෘක්ෂයන් මධ්‍යයෙහි; මන්බැඳ, මනොබන්ධනයකොට; කෙවිලගනක, කොකිලාඞ්ග නාවකගේ; තුරුල්ලේ, උසඞ්ගයෙහි; ලගින්, ලග්නවන්;

83 නැගි  දිවයුරු දූකගන අඳුර යෙතබ  බා
ලැ ගි  පියුමෙහි බිඟුමුව රදෙහි තුඩු න  බා
ලැ ගි  තුරනින් නැගිසිට පියෙහි මැලිහ  ඹා
හැ ගි  ලෙස නුඹ නුබ වැදයන්න පියඅ  ඹා

83–නැගි, උදූවූ; දිවයුරු, දිවසකරයා; දූක, දර්ශනයකොට; ගනඅඳුර, ඝනාන්ධකාරය; බබා, පසුබැස බැස; යෙත, යනකල්හි; පියුමෙහි, පද්ම යෙහි; ලැගි, ලග්නවූ; බිගු, භෘඞ්ගයෝ; මුවරදෙහි, (ඒපද්මයන්සම්බන්ධිවූ) මකරන්දයන්හි; තුඩු, තුණ්ඩයන්; නබා, ස්ථාපනයකොට; (යනකල්හි.) ලැනිතුරගින්, නිවාසග්‍රහණය කළාවූ වෘක්ෂමස්තකයෙන්; නැගීසිට, උත්ථානයකර; පියෙහි, පත්‍රපත්හි; මැලිනඹා, මලිනපහකොට; පියහඹා, පක්ෂපත්‍ර ප්‍රසාරණයකොට; නුඹහැගිලෙස, තාගේ අභිප්‍රායවූ පරිද්දෙන්; නුබවැදයන්න, නභස්තලයනව ප්‍රයානයකරන්න;

84 ම හ ද ම් පා  මහමුවදෙර මැද තිබෙ  න
න ත ද ම් පා  තෙයි ලිතු කුරුපෙළ තද  න
වෙන පෙ ම් පා  වෙසෙතෙයි සිඳුගිම් අති  න
තොය ක ම් පා  ඇරගත් කැටපතක් මෙ  න

84–මහදම්පා, මාදම්පය නම්වූ ග්‍රාමයෙහි; මහමුවදෙරමැද, විසාලවූ ද්‍රෝණමුඛ මධ්‍යයෙහි; තිබෙන, තිබෙන්නාවූ; පාණෙහි, ශිලාලයෙහි; නත, නාථේශ්වරයාගේ; දන, වැතුරුයිය; නදන, නිධානකොට; ලිතු,

ලිඛිතකරණලද්දාවූ; කුරුපෙළ, අක්ෂරපඞ්ක්තිය; (කුමක්මෙන්ද) මෙන
පෙළිපා, අන්‍යයන්කෙරෙහි ප්‍රේම පහළකර; වෙසෙසනයි, විෂයකෙරෙ
තිබී සිනා; සිඳුහිම්අහින, සමුද්‍රනැමැති වල්ලභයාගෙන්; නොයකම්පා,
නදීනැමැති කාන්තාව විසින්; ඇරගත්, ග්‍රහණයකළාවූ; කැටපතක්
මෙන, දර්පණයක්මෙනි.

85 තො ට ග මු පා ය රැඳි මහතෙරිඳු ගුණ හි වී
ස ත සැ ප සේ ය යනලෙස රැක තමන් දි වී
කා ල ස ල මේ ය තරකර කරවූ බැහැ වී
වැ ලි තො ට ඒ ය සිරිදැක වඩිනේ මැන වී

85–තොටගමුපාය, එනම් ප්‍රාසාදයෙහි; රැඳි, රඳනාවූ; ගුණහිවි, ගුණ
යෙන් උස්වූ; මහතෙරිඳු, මහාස්ථවිරයන්වහන්සේ විසින්; සත, සත්ත්වයන්
ට; සැපසේය, කායචිත්ත පීඩාවක්නොව; තමන්දිවිරැක, සම්ක්ෂයවූ ජීවි
තරක්ෂාකොට; යනලෙස, ප්‍රධානයකරණු පිණිස; කලසලමේය, කාල
ශිලාමයමෙහෙවරින්; තරකර, ස්ථිරකොට; කරවූ, කරවනලද්දාවූ; වැලිතො
ට ඒය, වැලිතොටනම් ග්‍රාමයෙහිවූ පාලමෙහි; බැහැවී, බොහෝවූ; සිරි,
ඓශ්වර්යශ්‍රීය; දැක, දර්ශනයකොට; වඩිනේමැනවි, ප්‍රයාණයකිරීම මනායි.

86 දු ල රන්රසු රැව්දී මෙවුල ඉකි ලි ය
ලොල වඩවන සිතුසලෙලුන් නොහැකි ලි ය
තු ල රන්ලිය ලිය යනඑන තුනුළු ලි ය
බ ල මම්තුරු සෙද කොස්ගොඩ වෙල්එ ලි ය

86 ඉකිලිය, කටිස්ථලයෙහි; දුල, බබලන්නාවූ; මෙවුල, මේඛලා
දාමයෙහි; රන්රසු, ස්වර්ණ කිංකිණිකයෙන්; රැව්දී, නාදදෙමින්; සලෙ
ලුන්, (යෞවනාභිරාම මකරධ්වජයාමෙන් යුවතිජනනයන නෘත්‍යයට
රඟමඬුලුවූ)සල්ලාලපුරුෂයන්ගේ; සිතු, චිත්තයන්; නොහැකිළිය, ප්‍රබොධ
කරමින්; ලොලවඩන, ආලයකරන්නාවූ; රන්ලියතුල, ස්වර්ණලතාවන්
වැනිවූ; යනඑන, ගමනා ගමනය කරන්නාවූ; ලිය, කාන්තාවන්ගේ;
තුනුළුලිය, ශරීරලොකයෙන් යුක්තාවූ; කොස්ගොඩ වෙල්එලිය, එනම්
ග්‍රාමයෙහි විශාල ක්ෂෙත්‍රය; මම්තුරුසද, මාගේ මිත්‍රොත්තමය; බල,
නිරීක්ෂණයකර;–

87 බ ස ර ස කා ය කියමින් වැද එකිනෙ කා ය
වෙ ර ල ස කා ය සිටි පෙණෙමින් දෙනසැ කා ය
සු ර ස ර කා ය සිරි තුනු අඟනන් දෑ කා ය
ප ර ත ර කා ය විගසක් ඉඳුව තුර කා ය

87–වැද එකිනෙකය, ඔවුනොවුන් හා වාදකොට; බසරස, සත්වයන්
ගේ කර්ණරසායනවූ මධුරනාදයෙන්; කය කියමින්,ගීතිකා කියමින්; වෙ
රලසකය, වෙලාන්තයෙහි; පෙණෙමින්, දෘශ්‍යමානව; සිටි, සිටිනාවූ; තුනු

සිරි, තනුශ්‍රීයෙන්; සුරසරකා, දිව්‍යප්සරාදෙහෝපි කියා; දෙන සැකා, ශංකාදෙන්නාවූ; අඟනන් දකාය, අඟනාවන් දශීනයකොට; පරතර කය, එනම්වූ ග්‍රාමයෙහි; මිගසක්, ස්වල්පකාලයක්; තුරකය, විශ්‍රෘතයක; ඉදුව, නිෂ්ද්‍යාකර.

88 නි ල් ල දුලය වරලස සරහා මලි න
තු ල් ල කළැකි සුරඟන වරඟන යනෙ න
වැ ල් ල වෙතම සැදි නදුනුයනෙව් සොබ න
නි ල් ල පොලය දුක යාගත් විඳ පව න

88–නිල්ලදුලය, නීලවණීයෙන් බබලන්නාවූ; වරලස, කෙශකලාප යන්; මලින, (කොඳකුමුදු) පුෂ්පදාමයෙන්; සරහා, සමලඩකානකොට; යනෙන, ගමනාගමනයකරන්නාවූ; වරඟන, උත්තමාඞගනාවන්; සුර ගන, දිව්‍යාඞගනාවන්ට; තුල්‍යකළැකි, සමානකළහැක්කෙය; වැල්ලවෙ තම, වාපීකානල සමීපයෙහිම; සැදි, සජීනවූ; නදුනුයනෙව්, නන්ද නොද්‍යානයමෙන්; සොබන, ශොභාවත්වූ; නිල්ලපොලය, එනම්වූ නාල් කෙරෙද්‍යානය; දුක, දශීනයකොට; විඳපවන, උතුරුනැලපහස්ලැබ; යා ගත්, යාත්‍රාග්‍රහණය කරත්.

89 පි න ආ ස ය සිතවඩමින් නොපටුකො ට
පැ න ආ ස ය සෙදගොස් රම්භිය ලෙස ට
ව න වා ස ය බවයෙහි නොවනුව් තොප ට
ව න වා ස ය වෙහෙරෙහි වදුව මුනිඳු ට

89–සිත, චිත්තයෙහි; නොපටුකොට, ස්වල්පනොව; පිනආසය, පුණ්‍යආශ්‍රය; වඩමින්, වර්ධනයකරමින්; රම්භියලෙසට, රමසැරයක් මෙන්; පැනආසය, නභඃස්පන්දනයකොට; සෙද, සුණ්ණයින්; ගොස්, එක ද්‍රව්‍යවට; නොපට, යුෂ්මත්හට; බවයෙහි, සංසාරයෙහි; වනවාසය, වනයෙහි වාසය; නොවනුව්, නොවීම පිණිස; වනවාසය, වනවාසනම් වූ; වෙහෙරෙහි, (ශරදභ්‍රසංජනන ශරද් ගගනතලයක්මෙන් සුධාශ්‍රීනාහි බවල ශෛලස්තූපප්‍රධාන) විහාරයෙහි; මුනිඳුට,(සඞ්ඛාවලා ඉන්ද්‍රචාප විද්‍යු ල්ලතාවෙන් වලදනාලද ප්‍රභාස්වරවූ රත්මෙරක්මෙන් දිලියෙමින් සයන ස්කලාවූ) සර්වඥරාජෝත්තමයානන්වහන්සේට; වදුව, නමස්කාර කරව.

90 හි ම් කොට නොදනගැකි මෙනෙකැයි පුලුපුවල
ග ම් ව ට සුසැදි මනහර වෙහෙරින් විපු ල
ගෙ ම් ප ට පිළි සැදි වෙළඳුන්ගෙ පිළිවෙ ල
බෙ ම් තොට මෙසිරි දුක ලබ තනෙත ලන්ප ල

90–හිම්කොට, කෙළවරකොට; මෙනෙකැයි, මෙපමණක්යයි; නොදන හැකි, දනගතනොහැක්කාවූ; පුලුපු, නාලිකෙරවෘක්ෂයන්ගෙන්; අවල, ශ්‍රැවසිගත්තාවූ; අවට, හාත්පස; විපුල, බොහෝවූ; මනහර, මනොඥවූ;

ගම්, ග්‍රාමයන්ගෙන්; සුසැදි, සුසජ්ජිතවූ; වෙහෙරින්, විහාරයෙන්ද; නෙ
ම්පටපිළී, රත්කම්කරණලදපට්ටවස්ත්‍රයෙන්; සැදි, සජ්ජිතවූ; වෙළඳුන්,
වණික්ජනයන්ගේ; ගෙපිළිවෙල, ගෘහපරිපාටියෙන්ද; සුසැදි, සුසජ්ජිතවූ;
බෙම්නොට, බෙම්නොට ග්‍රාමයෙහි; මෙසිරි, මේ ඓශ්වර්‍ය්‍යය; දක, දර්ශ
නයකොට; තනෙනලත්පල, තාගේ නෙත්‍රප්‍රතිලාභ ඵලය; ලබ, සම්පාද
නයකර–

91 ව ලා වලගලෙල සොබනා ලපෙම්ක ර
ස ලා දෙමින් කෙළිනා ළඳගන සොඳු ර
නොලා දෙඇසිපිය මගමින් මින් අයු ර
ක ලා වියෙන් එතරව යාකර මිතු ර

91–ලපෙම්කර, (චන්ද්‍රානනමෙවකොත්පලදලාකාර දිගුනෙත් ඇති
තරුණ රමණීන් විසින් යෞවනාවතාර මකරධ්වජ විජිත මත්තසල්ලාල
යන්නට වාක්අමෘතකාන්තීන් පානයකරවා)විත්තප්‍රේමකොට; සොබනා,
ශොභමානවූ; වලගලෙල, ලීලාපෙන කටිප්‍රදෙශයන්; වලා,චාමරපන්ති
යක්මෙන්; සලාදෙමින්, එකපැනැර වලනය කරවා; කෙළිනා, ක්‍රීඩා
කරන්නාවූ; සොඳුර, සුන්දරවූ; ළඳගන, තරුණ ස්ත්‍රීසමූහයා; දෙඇසි
පිය, යුග්මනෙත්‍රපත්‍රයන්; නොලා, නොහෙලා; මගමින්, නිරීක්ෂණය
කරමින්; මින්අයුර, ස්වභාවයෙන් මත්ස්‍යයෙකුසේ; කලාවියෙන්, කලා
විනාම්වූ හොයින්; එතරව, පරතීරප්‍රාප්තව; මිතුර, මිත්‍රය; යාකර,යාත්‍රා
කර.

92 මි තු රු දක රැගෙණ තැබුවා සේ රු ව ල
ය තු රු කර කරඬු මුතු මිණි තා රු ව ල
අ තු රු නොදී සැදි සල්පිල් තේ රු ව ල
මි තු රු යතුරුකර නරඹන් බේ රු ව ල

92–තාරුවල, (තාරකානිකර විරාජිතවූ) සායණ්හකාලයෙහි; යතුරු
කර, යන්ත්‍රඝටනයකරණලද්දාවූ; කරඬු, සමුද්‍රසමූහයෙහි; මුතුමිණි,මෞ
ක්තිකමාණික්‍යය; මිතුරුදක, දිවසකරයාගේ දර්ශනයෙන් හෙවත්ප්‍රත්‍යූ
ෂකාලයෙහි; රැගෙණ, ග්‍රහණයකොට; රුවල, ලකාරය; තැබුවාසේ,ස්ථා
පිත කලාක්මෙන්; අතුරුනොදී, අවකාශයක්නොව; සැදි, සජ්ජිතවූ;
සල්පිල්, ආපනසමූහයන්ගේ; තේරුව, අනෙකවිධවූ විලාසයෙන්;
අවල, ගැවසීගත්තාවූ; බේරුවල, බේරුවලනම් ග්‍රාමයට; යතුරුකර, යා
ත්‍රාකර; මිතුර, මිත්‍රය; නරඹන්, නිරීක්ෂණයකරන්.

93 ම ත් ග න කුළු ගන සාතුරු බර පලය
අ ත් ගෙ න සිට කෙළිනා මියුරු තෙ පලය
සි ත් ගෙ න ලිය සරණා සලෙලු තැ පලය
ම ත් ගො න දක නෙත් සනහමිනි තො පලය

93–මත්, මහත්වූ; ඝනකුළු, ඝනනීල මේඝපටලයක් බඳුවූ; තුරුසා, (නාගපුන්නාග තාලහින්තාල සලල සත්තිර රම්භාම්බජම්බුජම්බීර සිඤ්චාර මධුගන්ධි නාගශොක කෙතකාදී ශාඛාභරිත පුෂ්පමකරන්ද ඵලපල්ලවාදීන් දරාසිටි නොයෙක්) පාදපශාඛාවන්ගේ; ගන, බැරවූ; බරපලය, භාරයෙන් අතුපතර නැමී ලඹදෙන පලුපල්ලවාදිය; අත්ගෙණසිටි, හස්තග්‍රහණයකර සිටි; මියුරුතෙපලය, මධුරාලාප ඇතිව; කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; ලිය, (පරමරුචිර) යෞවනාඞ්ගනාවන්ගේ; සිත්ගෙණ, චිත්තග්‍රහණයකොට; සරණා, සඤ්චාරයකරණ; තැපලය, රූපශබ්දගන්ධරසස්පර්ශාදීන් වශීකරගන්නා සිත්ඇති; සලෙලු, සල්ලාලසිත්ගෙන් යුක්තවූ; මත්ගොන, මත්ගොනනම් ග්‍රාමය; දක, දර්ශනයකොට; නෙත්සනහමිනි, නෙත්‍රයන් අස්වසා; තෝ, යුෂ්මත; පලය, ප්‍රයාණයකර.

94 වසියාකරණ නත්-දෙමළ කිවිවර රඳනා,
පසියාගල වෙහෙර මුනි-දක නැමද යව තොසිනා.

94–වසි, ශීඝ්‍රව; යාකරණ, යාගකරන්නාවූ; නත්දෙමළකිවිවර, නානාවිධ ද්‍රවිඩකවිවරයන්; රඳනා, රඳන්නාවූ; පසියාගල, එනම් ග්‍රාමයෙහි; වෙහෙර, විහාරයෙහි; මුනි, සර්වඥයන්වහන්සේ; දක, දර්ශනයකොට; නැමද, නමස්කාරකර; තොසිනා, සන්තෝෂයෙන්; යව, ප්‍රයාණයකර.

95 ව ත සි සි තු ල් ල දිගුනෙත නිලුපුල පු ල් ල
තුනු සි වු මැ ල් ල විසිතුරු රණලිය දු ල් ල
ළඳ ලිය ගො ල් ල කෙළිනා තුරු සෙවනැ ල් ල
දක සකි ලො ල් ල නොකරන් සිට කලමු ල් ල

95–තුරු, වෘක්ෂයන්ගේ; සෙවනැල්ල, සිහිල්වූ ඡායාමණ්ඩලයෙහි; කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; සිසිතුල්ල, චන්ද්‍රයාවැනිවූ; වත, මුඛමණ්ඩලඇති; පුල්ල, ප්‍රබුද්ධවූ; නිලුපුල්ල, නීලොත්පල බඳුවූ; දිගුනෙත, දිගුනිල්නුවන් ඇති; සිවුමැල්ල, සුකුමාළවූ; තුනු, ශරීරයෙන්; රණලිය දුල්ල, ස්වර්ණලතාවන්මෙන් බබලන්නාවූ; විසිතුරු, (හෙමකනකවලයාභිරාම උනාභූෂණ නමණිනවරශ්මි සමුජ්ජලිත) විචිත්‍රාකාරවූ; ළඳ, බාලවූ; ලියගොල්ල, ස්ත්‍රීසමූහය; දක, දර්ශනයකොට; කලමුල්ල, කලමුල්ලනම් ග්‍රාමයෙහි; සිට, අවස්ථිතව; සකි, කලත්‍රය; ලොල්ල නොකරත්, ලෝලනොකරන්නෙහිසි.

96 තු ං ගා අවරගිරිසිර දිනිඳු පත් ව ර
නා ං ගා මදන එන සඳසේසත පව ර
ග ං ගා තිලක වෙහෙරෙහි මුනිඳු මනහ ර
අ ං ගා ලෙසින් වැඳ ලගු තැනෙක මමිතු ර

96–තුංගා, උන්නතවූ; අවරගිරිසිර, අපරපර්වතමස්තකයට; දිනිඳු, දිවසකරයා; පත්වර, ප්‍රාප්තකාලයෙහි; සඳසේසත, චන්ද්‍රබිම්බ නැමැති ශ්වේතච්ඡත්‍රය; නංගා, උද්ගතකොට; මදන, අනංගදිව්‍යරාජයා; එන, එනකල්හි; පවර, (සුධාසිතාභිධවල කෛලාශකූටෝද්භූත ලොකනාථ ප්‍රතිබිම්බ මඤ්ජීරනිරාම) ප්‍රවරවූ; ගංගාතිලක, ගංගාතිලකනම්වූ; වෙහෙරෙහි, විහාරයෙහි; මනහර, මනොහරවූ; මුනිඳු, මුනීන්ද්‍රයන්වහන්සේට; අංගාලෙසින්, පඤ්චාඞ්ගසමන්විතව; වැඳ, නමස්කාරකොට; මමිතුර, මාගේමිත්‍රය; තැනෙක, එකස්ථානයක; ලගු, ලග්නයකර.

97 අ ත් ගිරිතුර සිරි පුල් මල් පල පත ර
ග ත් ලෙස පෙණෙන සහතුරු මිලි සිසිරක ර
සි ත් ලෙස ලැගි නිවෙසින් නැගිසිට මිතු ර
ය ත් මැනවිය දූක දිසි උදයග මිතු ර

97–පුල්මල්, ප්‍රබුද්ධ පුෂ්පයන්ගේ හා; පතර, මහත්වූ; පල, ඵලයන් ගේත්; සිරිගත්ලෙස, සෞභාග්‍යභණ්ඩයකළ පරිද්දෙන්; සහතුරු, තාරකා සහිතවූ; මිලිසිසිරකර, මිලිනවූ චන්ද්‍රමණ්ඩලය; අත්ගිර, අස්තපර්වත නැම ති; තුර, වෘක්ෂයෙහි; පෙණෙන, දෘශ්‍යමානවූකල්හි; මිතුර, මිත්‍රය; ලැගි නිවෙසින්, ලග්නවූ නිවාසයෙන්; නැගිසිට, උත්ථිතව සිට; සිත්ලෙස, සිත් වූපරිද්දෙන්; උදයග, පූර්වගිරිශිඛරයෙහි; දිසි, දීලිහෙන්නාවූ; මිතුර, දිව සකරයා; දූක, දර්ශනයකොට; යත්, යාත්‍රාකළහොත්; මැනවිය, යහපති.

98 දෙ බා සිලිල් කෙළිනා ලියනෙතිඳුව ර
ප බා සුනිල් රුඳුනෙව් රැඳි දියදහ ර
ස බා පහන් කළුගඟ ලෙල රළ පත ර
නොබා සෙමින් එතරව පලයන් මිතු ර

98–දෙබා, උභයභාගයෙන් නොහොත් දිය දෙබෑකොට; සිලිල්කෙළිනා, දියකෙළින්නාවූ; ලියනෙත, අඟනාවන්ගේ නෙත්‍රයෙහිද; ඉඳුවර, ඉන්දීවරයන්ගේද; සුනිල්, අතිනීලවූ; පබා, ප්‍රභාව; රුඳුනෙව්, රජත වූවාක්මෙන්; දියදහර, අභිනීල ජලධාරාව; රැඳි, රජමානවූ; සබාපහන්, (සඳකැත්යේ උඟුල් ගඟුල් කෙළඑන අභිමධුර ගීතාල) ස්වභාවයෙන්ම ප්‍රසන්නොදක ඇති; පතර, පුළුල්වූ; කළුගඟ, කාලගඞ්ගානම් ශ්‍රවන්ති යෙහි; ලෙලරළ, ලීලොපෙතවූ තරඞ්ගසමූහයට; නොබා, භීතනොව; සෙමෙන්, සුවිනීතභාවයෙන්; එතරව, පරතීරප්‍රාප්තව; මිතුර, මිත්‍රය; පලයන්, ප්‍රයානයකරන්.

99 පි බි දි පුළුපුවළු සුනුඹුල් කුමුකු තු රු
වි හි දි සුවඳ අඹරඹකැනිනි විසි තු රු
සු සැ දි වතුපෙළින් නිති මගදෙපස තු රු
පැ හැ දි මෙසිරිසර දැක යන්න මම් තු රු

99–පිබිදි, පුබුදුවූ; පුළුපුවළු, ඵලහරිත නාලිකෙරවෘක්ෂය; සුනුඹුල්, සඤ්කවූ; කුමුකුතුරු, ක්‍රමුකවෘක්ෂය; විහිදිසුවඳ, සුගන්ධව්‍යාප්තවූ; අඹරඹ කැනිනි, ඝනාකාර කදලි මඤ්ජරීන් යනමෙයින් හා; විසිතුරු,(මුවලඹ අඹරඹ කැනෙනි සුගන්ධ ග්‍රහණයකොට විත් තුඹුනබා මධුරස උකාබී මත්ව සත් දිදී තුරිත්තුර උනුනුත් මුවනබා කෙළනා නන්ද කලන්ද කාදීන්) විසිතුරු වූ; තුරු, වෘක්ෂයන්ගෙන්; නිති, නිරන්තරයෙන්; සුසැදි, සුසජ්ජිතවූ; වතු පෙළින්, ගෘහොද්‍යානපඞ්ක්තියෙන්; මගදෙපස, මාර්ගොභය පාර්ශ්වයෙහි; මෙසිරිසර, මේ ඓශ්වර්‍ය්‍යසාරය; දැක, දර්ශනයකොට; පැහැදී, ප්‍රසන්නව; මිතුර, මාගේ මිත්‍රය; යන්න, ප්‍රයානය කරන්නේසි.

100 කළු වැල් කපුරු දුම්නුදු සිරිනි රන්ව ට
සු වි ස ල් මිහිගු සක්සින්නමිනි හැමවි ට
ම න ක ල් මෙලෙස පවතින පුද නිසිලෙස ට
පැ හැ දු ල් ගනිදුකෝවිල දැක යන් නොසි ට

100–කළුවැල්කපුරු, කාලාගුරු කර්පූරයන්ගේ; දුම්නුදු, ධූමයෙන්ද; රන්වැට, ස්වර්ණ ප්‍රදීපයන්ගෙන්ද; සිරිනි, ශොභාවත්වූ, සුවිසල්, අතිවිශාලවූ; මිහිගුසක්සින්නමිනි, මෘදඞ්ගසම්බද්ධ ව නියෙන්; හැමවිට, නිරන්තර වූ; මනකල්, මනෝඥවූ; මෙලෙස, මේ යථොක්තප්‍රකාරයෙන්; නිසිලෙසට, සුදුසුවූපරිද්දෙන්; පුදපවතින, පූජාපැවතඑන්නාවූ;පැහැදුල්, (ඝන කශෘඞ්ගමඤ්ජරියෙන් හා ස්වර්ණධ්වජයන්ගේ ආලොකයෙන්) දිලියෙන්නා වූ; ගණිදුකෝවිල, විඝ්නෙශ්වර දිව්‍යරාජයාගේ දේවාලයය; දැක, දර්ශනය කොට; නොසිට, එහිද ස්ථිතියනොකර; යන්, ප්‍රයානයකරන්.

101 ය න බි ගු දූ ල් ඉදුසැව් ලපළු විදුලෙ ල
පි පි ම න ක ල් පියගඳ කුමුදු කොකාවැ ල
රුදු ග න තු ල් ගනසා තුඟු වන ගහ ල
දැ ක හැම ක ල් රඟදෙති මියුරු ගිරිකු ල

101–ඝනබිගුදූල්, (සුගන්ධමකරන්දග්‍රහණයට) දමන රමන භෘඞ්ගජාලා නැමති; ඉඳුසැව්, දෙව්දුනුඇති; ලෙල, කම්පිතවූ; ලපළු,බාලපල්ලව නැමති; විදු, විදුලිඇති; පිපි, සුපුෂ්පිතවූ; මනකල්,මනොඥවූ; පියගඳකුමුදු, ප්‍රියගන්ධ කෛරවාදී ශ්වෙතපුෂ්ප නැමති; කොකාවැල, බලාකපාලි ඇත්තාවූ; තුඟු, උස්වූ; ගනසා, බැරමශාඛාවන්ගෙන් යුක්තවූ; වනගහල,

වනාගාරය නැමිති; රුදුගනකුල්, මහත්වූ අම්බුධරකූටය; දක, දර්ශනයකොට හෙවත් මෙඝකාලයයි සිතා; ගිරිකුල, පර්වතසමූහයෙහි; ඇම කල්, සදාකල්හිම; මියුරු, මයූරයෝ; රඟදෙති, නෘත්‍ය දනයකෙරෙති.

102 දි ගු රු වයෙන් නැගි තුඟු ගනකුළු සැ පි ය
ව ගු රු ගත මූන වැකි ගත ගුරු මැ පි ය
ගු ගු රු පොරට තැන තැන ගවරැළ සි පි ය
ඉ දු රු බලන් සබඳිනි සිට පොතුපි පි ය

102–දිගුරුවයෙන්, ගනගජ්ජිත් හෙතුකොටගෙණ; නැගි, උදාවූ; තුඟු, උන්නතවූ; ගනකුළුසැපිය, මෙඝකූටයක් බඳුවූ; ගත, ගාත්‍රයෙහිද; මූන, මුහුනෙහිද; වගුරු, වැගිරගියාවූ; ගුරුමැපිය, ගෛරිකමෘත්තිකා; වැකී ගෙණ, ආලිම්පනයකොටගෙණ; පොරට, යුද්ධයට; ගුගුරු, ගර්ජනාකොරමින්; තැනතැන, ඒඒ තන්හි; සිපිය, අවස්ථිතකලාවූ; ගවරැළ, ගො සමූහය; පොතුපිපිය, පොතුපිපියනම් පියසෙහි; සිට, අවස්ථිතකොට; සබ ඳිනි, සුහෘදය; ඉදුරු, සෘජුව; බලන්, අවලොකනය කරත්.

103 බෝ ක ර සුවඳ ගෑ තන රන්පා න යු රේ
සේ ක ර අඩෙව් දලනෙත් මදබාන යු රේ
ආ ක ර වන් ලඳුන් සරණා පා ණ දූ රේ
යා ක ර මිතුර දක ඉඳ මල්මූ න තු රේ

103–බෝකර, බොහෝකොට; සුවඳගෑ, අඞ්ගරාග ලිම්පනයකලාවූ; රන් පානයුරේ, සවර්ණපාත්‍රවැනි; තන, පයොධරයන්ඇති; සේකරඅඩෙව්, අර්ධ චන්ද්‍රයාවැනිවූ; දල, ලලාටඇති; මදබානයුරේ, මන්මථශරකාරවූ; නෙත්, (මදලස්වහස්බැලුම් ශරයෙන් විද දනන් දස්කොටගන්නා) දීර්ඝාක්ෂි ඇති ව; සරණ, සඤ්චාරණයකරන්නාවූ; ලඳුන්, අඟනාවන්ට; ආකරවන්, උත්පත්තිස්ථානයක් වැනිවූ; පාණදූරේ, පානදූරයනම්වූ ග්‍රාමයෙහි; මූන මල්තුරේ, වකුලවෘක්ෂයක; ඉඳ, නිෂද්‍යකොට; දක, දර්ශනයකොට; මිතුර, මිත්‍රය; යාකර, යාත්‍රාකර.

104 එ ක් ව ලොබින් සිදුපාකර වලාපෙ ල
දු ක් ව නොයාහි සිටිනාමෙන් වෙල ල
ල ක් ස පතිනම් පොල්උයන සුලක ල
දු ක් ක හැකිය මදනැන් එසිනි ගියක ල

104–එක්ව, සංයොගව; ලොබින්, ලොභයෙන්; සිදුපාකර, සමුද්‍ර පාන යකලාවූ; වලාපෙල, වලාහක සමූහය; දුක්ව, දෞර්මනස්සින්; නොයාහි, යානොහැකිව; වෙලල, වෙලාන්තයෙහි; සිටිනාමෙන්, අවස්ථිත් ක රන්නාක්වැනිවූ; ලක්සපතිනම්, ලක්ෂපතියන නාමයෙන්යුක්තවූ; සුලකල,

සමලංකෘතවූ; පොල්උයන, නාලිකෙරොද්‍යානය; එසිනි, ඒ පානදුරය නම් ග්‍රාමයෙන්; මදතෑන් ගියකල, මදක්නැන්ගියකල්හි; දක්කහැකිය, දක්නයකළහැක්කේය.

105 ගෙණ තෙඑත සිටිනා–ගොපලුලිය තුනු එලියෙන්
මෙන සෝ අඳුරු දුරුකර–යව ඉටු මොරටුඑලියෙන්

105–තෙඑත, වස්සත්; ගෙණ, ග්‍රහණයකොට; සිටිනා, සිටින්නාවූ; ගොපලුලිය, ගොපාලිකාඞනාවන්ගේ; තුනුඑලියෙන්, ශරිරාලොකයෙන්; මෙන, චිත්තය සම්බන්ධවූ; සෝ, සෝකනැමැති; අඳුරු, අන්ධකාරය; දුරු කර, දූරීභූතකොට; මොරටුවඑලියෙන්, එනම් ප්‍රදෙශයෙන්; ඉට්ඨ, මිත්‍රය; යව, ප්‍රයානයකර.

106 ග ත් දූඹිනු මොලකැටි මල්දම් ලෙසි න
අ ත් පොඩි උඩනගමින් ලතඹුරු සිරි න
ම ත් වැඩි ලෙස ලියගීකියන රැව් දෙ න
අ ත් තිඹිරියේ සිට අසමින් යව සෙමි න

106–මල්දම්ලෙසින, පුෂ්පදාමයන් වැනිවූ; මොලකැටි, මෘදුකොමලවූ; දූඹිනු, වෘධනුවූවාවූ; ගත්, ගාත්‍රයෙන් යුක්තව; ලතඹුරු සිරින, කොකනදාකාරවූ; අත්පොඩි, විකිරිහස්තයන්; උඩනගමින්, උද්ගතකොට; මත්වැඩිලෙස, සුරාදියෙන් බොහෝ මත්වගියාසේ; ලිය, තරුණාඞනාවන් විසින්; ගීකියන, ගීතිකා කියමින්; රැව්දෙන, දෙන්නාවූ රවප්‍රතිරවය; අත්තිඹිරියේ, අත්තිඹිරියනම් දනව්වෙහි; සිට, අවස්ථිතව; අසමින්, ශ්‍රවණයකරමින්; සෙමින, හෙමින්; යව, යාත්‍රාකර.

107 ස ඳ දල දල නල විසුරුණු ස මා නේ
ස ඳ දෙවු දුලන පැලඹර දිසි ව සා නේ
වැ ද නිදිගන්ට සහයුරු වෙලපි යා නේ
සෙ ද නුඹ වඩින් වෙහෙරට පැපිලි යා නේ

107–සඳදල, ඊශ්වරයාගේ; දල, ලලාටලොචනයෙන්; විසුරුණු, විසීර්ණවූ; නලසමානේ, වහ්නිස්කන්ධයන්සේ; සඳදෙවු, සන්ධ්‍යාවලා පඞ්ක්තිය; පැලඹර, පශ්චිමාම්බරයෙහි; දිසි, දීප්තිමත්වූ; වසානේ, අවසානයෙහි; සහයුරුනේ, නොයෙක් මීඅම්බවෘක්ෂයන්ගේ; වෙලපියා, වෙලෙප්හි; වැද, අවතීර්ණව; නිදිගන්ට, නිද්‍රාගතවීමට; සෙද, ක්ෂණයකින්; පැපිලියානේ, එනම් ග්‍රාමයෙහි; වෙහෙරට, විහාරයට; නුඹ, යුෂ්මත; වඩින්, ප්‍රයානය කරන්–මෙසේද කියා ඉස්බිහි රජත රත්න තාලවෘන්තවයක් දෙපස මාණික්‍යභිත්තිවයක් ප්‍රලම්බකලාක්මෙන් වළඳසුයයි දෙදෙනා පූර්වාපරම්බරාන්තයට පැමිණි ඉස්බිහි උදාවණ්නා දක්වනු පිණිස "නිසාලිය විෂයොව" යනාදී කව කිහු.

108 නි සා ලිය වියොව හැරතරු පිරිවර ද
නි සා කර සොවින් එකඟනව ගියස ද
ර සා යන නුවන් රුසිරි පිරිසබ ද
ල සා නොව ගඝින් බසිමින් හදපැහැ ද

108–නිසාලිය, නිසානැමති කාන්තාවගෙන්; වියොව, වෙන්වෙමින්; තරුපිරිවරද, තාරකා නැමති පරිවාරයන්ද; හැර, අත්හැර; නිසාකර, ශශාංකරාජයා; සොවින්, ශොකයෙන්; එකඟනව, එකාඟනව; ගියසඳ, ගමන්කළ ඇසිල්ලෙහි; රුසිරිපිරි, රූපශ්‍රීන් සම්පූර්ණවූ; රසායනනුවන්, නෙත්‍ර රසායනවූ; සබඳ, ප්‍රියබඳ; ලසානොව, අලසනොවී; ගඝින්බසිමින්, වෘක්ෂයෙන්බැස, හදපැහැද, චිත්තප්‍රසන්නකර–

ඉක්බිති ඒ විහාරයෙහි චෛත්‍ය බොධිද්‍රැම ලොකනාථ ප්‍රතිබිම්බ වන්දනාකරවනු පිණිස "රම්රදුට දිනිතිය" යනාදී සැහැල්ල කියනුලැබේ.

109 රම්රදුට දිනිතිය–කොසලිඳු දූ රදූමෙන
පි ය කර නවසදෙව් සතනමදින වෙසෙ ස
සි ය ගුරු බිසෝ හිම්සඳ නම්නි නිසිලෙ ස
අප පැරකුම් නිරිඳු–කරවූ සොඳුරු වෙහෙරෙහි
විසි තුරු සිරින් සපිරුණු මුනි මැඳුරත ට
මම් තුරු පිවිස මතුවනලෙස නිවණ ත ට
බි ඳ ම න් වසවතුගෙ බෝමුලෙහි වැඩඉ ඳ
ස ඳ ව න් යසස සපිරුණු දිගත හැමස ඳ
දි ව ම න් මුනිඳු දුටුමෙන් ඒ මුනිඳුස ඳ
බැතියෙන් නමදු මිතුරිඳු තුන්සිත පැහැ ද

109–රම්රදුට, රාමරාජයාගේ; දිනිතිය, ජනෙත්‍රියවූ; කොසලිඳු, කොශලෙන්ද්‍රයාගේ; දූ, දුහිතෘවූ; රදූමෙන, රාජදුහිතෘවවැනිවූ; සත, සත්ත්වයන් විසින්; වෙසෙස, විශෙෂයෙන්; නමදින, නමස්කාරකරන්නාවූ; පියකර, ප්‍රියකරුවූ; නවසඳෙව්, අභිනව චන්ද්‍රයා වැනිවූ; සියගුරු, ස්වකීය මාතෘවූ; බිසෝහිම්සඳ නම්නි, බිසෝඋත්තමියගේ නාමයෙන්; අප පැරකුම් නිරිඳු, අපගේ පරාක්‍රමබාහු නරෙන්ද්‍රයානන් විසින්; නිසිලෙස, සුදුසුපරිද්දෙන්; කරවූ, කරවනලද්දවූ; සොඳුරු, සුන්දරවූ; වෙහෙරෙහි, විහාරයෙහි; විසිතුරුසිරින්, විචිත්‍රවූ ශොභාවෙන්; සපිරුණු, සම්පූර්ණවූ; මුනිමැඳුරතට, සර්වඥමන්දිරාභ්‍යන්තරයට; මම්තුරු, මාගේ මිත්‍රය; තට, යුෂ්මත්හට; මතු, අනාගතයෙහි; නිවන, නිර්වාණය; වනලෙස, භසන ප්‍රාප්තවනපරිද්දෙන්; පිවිය, ප්‍රවිෂ්ටව–බෝමුලෙහි වැඩඉඳ, බොධිද්‍රැම මූලයෙහි උපවෙශනප්‍රාප්තව; වසවතුගෙ, වශවර්තිමාරයාගේ; මන්බිඳ,

අභිමානමර්දනායකර; හැමසඳ, කාලත්‍රයෙහිම; දිගන, දශදික්හි; සපිරු ණු, සම්පූර්ණවූ; යසස, යශස්ඇති, සඳවන්, චන්ද්‍රයා බඳුවූ; දිවමත් මුනිඳු, ජීවමාන සර්වඥයන්වහන්සේ; දුටුමෙන්, දෘශ්‍යමානවූවාක්මෙන්; ඒමුනිඳු සඳ, ඒ මුනීන්ද්‍රයාණන්ට; තුන්සිතපැහැද, ත්‍රිවිධ චේතනා ප්‍රසාදව; මිතුරිඳු, මිත්‍රානන්දමය; බැගිමෙන්, භක්තිප්‍රෙමභාරවනතොත්තමාඞ්ග යෙන් යුක්තව; නමඳු, නමස්කාරකර.

110 නත් දද නිසර තුඟුකඳුපෙළ තරඟවැ ල
සත් පැහැදළු පබළු ගණපත් සිලිලතු ල
මෙත් මිණකර බබලන දුම්දුත් ලක ළ
මත් තොසවෙමින් නමඳුව දෙවනු මනදෙ ළ

110–නත්දද, නොයෙක් ධජපතාක නැමැති; නිසර, ගංගාවන්ගෙන් සැරහුනාවූ; තුඟුකඳු, උන්නතඞ්ගවූ ස්කන්ධ නැමැති; තරඟවැල, උල්ලෝල පාලිඇත්තාවූ; සත්පැහැදළු, ශ්‍යාමවර්ණවූ කිශල නැමැති; පබළු, ප්‍රවාලාඞ්කුරඇති; ගනපත්, පත්‍රසමූහ නැමැති; සිලිලතුල, අතුල්‍යවූ ජල ඇති; මිණකරමෙන්, රත්නාකරයයේ හෙවත් සමුද්‍රයසේ; බබලන, භ්‍රාජනවන්නාවූ; ලකළ, අලඞ්කෘතවූ; දුම්දුන්, දෘමෙන්ද්‍රරාජයාට; මනදෙළ, චිත්ත දෝහලය; දෙවිනු, දනයකරන්නාක්මෙන්; මත්තොසවෙමින්, චිත්තසන්තොෂයෙන් යුක්තව; නමඳුව, නමස්කාරකර.

ඉක්බිති ඒ පරිවෙණාධිපතිවූ සුගතමනාදෙව ස්ථවිරයන්වහන්සේට නමස්කාරකරවනු පිණිස "එවෙහෙරතඹරකර" යනාදී සැහැල්ලකියන ලදී.

111 එවෙහෙර තඹරකර–සරසන රණතිසරයුරු
බිජුවල් කිරළ සෙමෙරෙව් සිහි ඇතිවෙමි න
හැම කල් සිතින් සිව් පිරිසිදු සිල්රකි න
නැණ දිනමිණිරැසින්–තුන්දෙස් අඳුරු දුරුකළ
සොඳුරු දසසිඳුරු කුඹුතල කන්ත ලය
සි ඳුරු සෙමෙරකළතම තෙදයසඳු ලය
ස ද සරපත් නොලහන මිසුරු දියබි ඳු
න ද ගුණමෙන් සිලිලෙන් පිරි මහමුහු ඳු
වැ ද සැතපෙන් සතසිත තුරවන් පසි ඳු
සොඳ එසුගන් මහදෙව් තෙරිඳුන් නම ඳු

111–එවෙහෙර, ඒ විහාර නැමැති; තඹරකර, පද්මාකරය; සරසන, අලංකාරකරන්නාවූ; රණතිසරයුරු, සවර්ණහංසරාජයෙකු වැනිවූ; බිජුවල්, බීජවාලධීන් රක්ෂාකරන්නාවූ, කිරළසෙමෙරෙව්, කිරළ සෙමෙර යන උභය පක්ෂයමෙන්; සිහිඇතිවෙමින, සමෘතිමත්වෙමින්; හැමකල්, සැමකල්හි; සිතින්, ශුද්ධාචිත්තයෙන්; සිව්පිරිසිදුසිල්, චතුපාරිශුද්ධිශීලය;

රකින, රක්ෂාකරන්නාවූ; නැණ, ඥාණ නැමති; දිනමිණිරැසින්, සූර්‍ය්‍ය රශ්මියෙන්; තුන්දොස්, රාගාදි දෝෂත්‍රය නැමති; අඳුරු, අන්ධකාරය; දුරුකල, දූරීභූතකළාවූ; සොඳුරු, සුන්දරවූ; දසදිදුරු, දශදිග්නැමති හස්තීන්ගේ; කුඹුතල කන්තල්‍යා, කුම්භස්ථලයන්හි හා කර්ණතලයන්හි; දුල්‍යා, දීප්තවන්නාවූ; නම, නාමත්‍රයේ; නොදයස, නොජායශස්; සෙමෙරකල, චාමරකලාවූ–සඳ, සවර්ගීය හෘදය නැමති; සරපත්, පොකුරු පතනති; මසුරු දිගබිදු, මාත්සර්‍ය්‍ය නැමති ජලබින්දු; නොලගන, ලග්න නොවන්නාවූ; නද, සන්තානාශ්‍රද; ගුණ, ශීලව්‍රතාදී ගුණයද; මෙත්, මෛත්‍රියද (නැමති); සිලිලෙන්, සලිලයෙන්; පිරි, සම්පූර්ණවූ; මහමුහුදු, මහාසමුද්‍රය (මෙන්වූ); වැදසැනපෙත්, සත්‍යානානප්‍රාප්ත කාලයේ හිඳු; තුරවත්පසිදු, කල්පවෘක්ෂයක්මෙන්; සතසින, සකලසත්වයන්ගෙ රෙහි සිත්ඇතිව (දෙලොව වැඩසාදාදෙන්නාවූ); සොඳ, (මේ යථෝක්ත ලක්ෂණයෙන්) සුන්දරවූ; එසුගත්මනදෙව්නරිඳුන්, ඒ සුගතමහාදෙව සර්විරයන්වහන්සේට; නමදු, නමස්කාරකර.

112 වෙහෙර අවට සල්සපුනා තුරු මුදු න
පවර පුබුදු මල්මුවරද සුවඳගෙ න
නොහැර හමන සිසිලසපවන විඳිමි න
මිතුර තොසින් සෙද වැද යාගත් ගුව] න

112–වෙහෙර, ඒ විහාරයෙහි; අවට, හාත්පස තිබෙන්නාවූ; සල්, සාලවෘක්ෂය; සපු, චම්පකවෘක්ෂය; නාතුරු, නාගවෘක්ෂය(යනාදීන්ගේ) මුදුන, මස්තකයෙන් දරාසිටින; පවර, ප්‍රවරවූ; පුබුදු, සුපුෂ්පිතවූ; මල්, පුෂ්පයන්ගේ; මුවරදසුවඳගෙණ, මකරන්දසුගන්ධග්‍රහණයකොට; නොහැර, නිරන්තරයෙන්; හමන, හමන්නාවූ; සිසිලස, ශීතලාසනනවූ; පවන, මාරුතය; විඳිමින, අනුභවකරමින්; මිතුර, මිත්‍රය; තොසින්, සන්තෝෂයෙන් යුක්තව; සෙද, ක්ෂණයෙන්; ගුවන, ගගනතලයට; වැද, ප්‍රවිෂ්ටව; යාගත්, යාත්‍රාග්‍රහණයකරන්.

113 හැවියන කැනිත් කැන වැද පවනනැ වියන
වැවියන විටින් අඹගැලවෙමිනි නැ වියන
පැවියන කවා කලඳුත් තුරග සැ වියන
අවියන දැක නොසිට යාගන්න ය වියන

113–පවන නැවියන, වාතවේගයෙන්; කැනිත්කැන, මඤ්ජරියෙන් මඤ්ජරිය, වැද, ප්‍රවිෂ්ටව; ගැවියන, ඝට්ටනයවන්නාවූ හෙවත් වෙළිගියාවූ; අඹ, සහකාර ඵලයන්; නැවියන, වෘන්තයෙන්; ගැලවෙමිනි, ගිලිහී; වැටියන විටින්, වැටීයනකාලය කරණකොටගෙණ හෙවත් එම ඇසිල්ලෙහි; පැවියන කවා, (නලාතුල නොවුනා පොකුරෙහි මීඅයුරු මියුරු සපුරුපක්ෂි ලොලව මධුරබිම්බපානයකොට මත්ව සන්දෙමින් සෙළනා

නඳ) පැටවුන්ට අනුභවකරවමින්; කලදුන්, කලන්දකයන්; තුරග,තුරු මුදුනෙන්; යනසැටි, යන ආකාරය; දැක, දර්ශනයකොට; අම්යන, ආලයෙන්; නොසිට, එහි නොසිට; යම්යන, එනම් ග්‍රාමයෙන්; යාගන්න, ප්‍රයාණයකරන්න.

114 ලෙ ළ දු න් මිණිමෙවුල නරුබර පුලුලුකු ල
සො බ ම න් වලාරැදි දිගු යුවලත් කොම ල
ප ද ර න් සලඹ හඬ යනඑන ලියන්කෙ ල
අ ස මි න් තපියබඳ නදයයි නොවන්දෙ ල

114–කෙළ, ක්‍රීඩාකොට; යනඑන, ගමනාගමනයකරන්නාවූ; ලියන්, කාන්තාවන්ගේ; නරුබර, නිවීපට්ටයෙන් භාරවූ; පුලුලුකුල, පෘථුලවූ ජඝනස්ථලයෙහි; ලෙලදුන්, ලීලාපෙනකලාවූ; මිණිමෙවුල, මාණික්‍යාභරණයෙහිද; සොබමන්, සොභමානවූ; වලාරැදි, වලයරඤ්ජිතවූ; දිගු, දීර්ඝවූ; කොමල, සුකුමාලවූ; යුවලත්, උභය හස්තයෙහිද; පද, පාදයෙහිද; රන්සලඹහඬ, ස්වර්ණනූපුරධ්වනිය; අසමින්, ශ්‍රවණයකරමින්; තපියබඳ, තාගේ ප්‍රිය භාර්‍යාවගේ; නදයයි, නාදයයි (සිනා); දෙලනොවන්, ලෝලනොවන්නේයි.

115 පු ර ණ සොඳුරු සිල්තෙද දසසත පා ය
හ ර ණ ඳුරටපත් සරමෙන් සර පා ය
කා ර ණ පොහොය නිති යතිගණ වර පා ය
දු රි ණ නොගොස් දැකයන් පියසත පා ය

115–සොඳුරු, සුන්දරවූ; තෙද, තේජාභිරාමවූ; දසසතසිල්, සියදහසක හෙවත් කෝටියක්සංවරශීලයන්; පුරණ, පූරණයකරන්නාවූද; අඳුරට, අන්ධකාරයට; පත්, ප්‍රාප්තවූ; සරපාය, ශරත්කාලයෙහි පහළවූ; සරමෙන්, සූර්‍යබිම්බමණ්ඩලයසේ; පාය, දුශ්චරිතයන්; හරණ, හරින්නාවූ; යතිගණ, යතීශ්වරයානන්වහන්සේලා; නිති, නිරන්තරයෙන්; කරණ පෝය, පොහෝකරන්නාවූ; වරපාය, උත්තම ප්‍රාසාදය; දුරින නොගොස්, (ඒ යම්යනනම් දනව්වෙන්) දුරට නොගොස්; දැක, දර්ශනයකොට; පියසතපාය, තාගේ පඤ්චප්‍රාසාදවාසිට; යන්,ප්‍රයාණයකරන්.

116 කු ල් මත් ලඳුන් පිහිනන උඩුකුරුව සො ද
දු ල් උවනත් පියයුරු කැකුළු මනන ද
පු ල් පියුමෙනි කැකුලෙනි සුසැදුනු නොම ද
ග ල් පොකුණෙන් දියනා ගිම්නිවා ක ද

116–සොද, සුන්දරවූ; කුල්මත්, ක්‍රීඩාලෝලයෙන් මත්ව; උඩුකුරුව, ඌර්ධ්වමුඛව; පිහිනන, පිහිනන්නාවූ; ලඳුන්, අඞ්ගනාවන්ගේ; දුල්, දිලියෙන්නාවූ; උවන්, මුඛමණ්ඩලයන්ද; මනනද, මනොඥවූ; පියයුරු

කැකුළු, පයෝධර මුකුලයන්ද; (වැනිවූ) දුල්පියුමෙනි, සුපුෂ්පිත පුෂ්ප යන්ගෙන්ද; කැකුලෙනි, මුකුලයන්ගෙන්ද; නොමද, බොහෝකොට; සුසැදු, සුසජ්ජිතවූ; ගල්පොකුණෙන්, ශිලාපුෂ්කරණියෙන්; දියනා, ජලස්නානයකොට; කඳ, ශරීරයෙහි; ගිම්නිවා, ඝර්මනිවාරණයකර–

117 ග ජ බා නිරිඳු කරවූ පහයමෙන් පෙ ර
ම හ බා මෙ පැරකුම් නරනිඳු සසිරිබ ර
ස සොබා රන්කොතින් කරවූ සිරිමැදු ර
න ර ඹා පතිනි පුදවැද යාගන් මිතු . ර

117–පෙර, පූර්වකාලයෙහි; ගජබානිරිඳු, (ශත්‍රුවික්‍රම කර්පූරප්‍රාප්‍ත ජනවෙද නෙදසිත්දිලිහි) ශ්‍රී ගජබාහු ධරණීශ්වරයානන්වහන්සේවිසින්; කරවූ, කරවනලද්දාවූ; පහයමෙන්, ප්‍රාසාදයමෙන්; මහබා, මහත්වූ බාහු බලවික්‍රමයක්ඇති; මෙ, වර්තමානයෙහි; සසිරිබර, සකලෛශ්වර්‍ය්‍යයෙන් භරිතවූ; පැරකුම්නරනිඳු, (සකලකුල නිඛිල දශනකිරණවංශ දිතුයට නබඳ ධවජයක් හා සමානවූ) ශ්‍රී පරාක්‍රමබාහු නරෙශ්වරයානන්වහන්සේ විසින්; සසොබා, ධාරාඛරශ්‍රේණි සන්නිභ ප්‍රාසාදපඞ්ක්තීන් සොභමාන කොට; රන්කොතින්, හෙමශෘඞ්ගයෙන් යුක්තව මෙහෙයිමවනලද, සිරිමැදුර, ශ්‍රී මන්දිරයට; වැද, ප්‍රවිෂ්ටව; පතිනිපුද, මනුජලොකප්‍රසිද්ධ තෙජඃසිරාම සිඛ සිරිමා පත්නිදෙවියන්හට කරණ යාගය; නරඹා, නිරීක්ෂණයකොට; මිතුර, මිත්‍රය; යාගන්, ප්‍රයානයකරන්.

118 ම ල ය ගි නේ එන මදනල සිහිල්කො ට
ග ත ගි ම නේ දූහැ විඳවිඳ සිතුලෙස ට
ඉ වු ස කි නේ මග නොරඳ වැඩමකො ට
ප ළ මු වෙ නේ වදු මනරම් වෙහෙරත ට

118-මලයගිනේ, (සපුදුනුකේ කිනදෙඹ යොහොඹු වැකොඳ ඉද්ද සෙව්වන්දි ජාසුමන මහනිල් උපුල්නෙළුම් ආදී සුපුෂ්පිත) පුෂ්පමුදුනෙන්(මුවරදසලා වගුරුවමින්'වනලා විල් ජල තලාසුර නදියෙහි ගැලි) සිහිල්කොට,සිහිල් සිහිදු පහසින් යුක්තව; එන, එන්නාවූ; මදනල, මන්දමාරුතය; සිතුලෙසට, සිත්වූ පරිද්දෙන්; විඳ විඳ, අනුභවකිරීම් වශයෙන්; ගත, ගාත්‍රයෙහි; ගිමනේ, ඝර්මය; දූහැ, දුරුකොට; ඉවුසකිනේ, ඉෂ්ටමිත්‍රයානෙනි; මගනොරඳ, මාර්ගයෙහි අවස්ථිති නොකොට; වැඩම කොට, ප්‍රයාණය කරමින්;පළමුවෙනේ, ප්‍රථමයෙන්; (සුපුල්ල මාලතීමල්ලිකාදි ලතා ලිඞ්ගිතසමන්තානන්ත උපවනාදියෙහි පාදපාදීන්) මනරම්, මනෝරම්‍යවූ; වෙහෙරනට, විහාරාභ්‍යන්තරයට; වදු, ප්‍රවිෂ්ටව–

ඉක්බිති ඒ පරිවෙණාධිපති ධර්මකීර්තිනම් මහා ස්ථවිරයන්වහන්සේට නමස්කාර කරණුපිණිස "පුමතර විමලකුල" යනාදි සැහැල්ල කිනු–

119 පුවතර විමලකුල-කිරණව සුපුන් සඳයුරු
මි හි ප ල් කිරුළු මිණිරැස් සඳවෙල ගිහි ණි
සු වි ම ල් පදනඹර නිය නවසඳ දිලි ණි
හරසර පිරි ඉතිරි-ගනනඹ වතුරු පැතිරෙණ
හෙම්පත් අයුරු සදහම් සීතෙල රඳ න
දම් කි ත් මෙමා හිමිසඳ සමග උදුල න
මු නි ඳු සසුන් වරසුරගඟෙහි ඇතිවු නු
සි නි ඳු සිහිල් සිල්මුව රඳිනි ගැවසු නු
පු බු ඳු යතිඳුසර ගුණසුවඳ විහිඳු නු
න ම ඳු මිතුරුසඳ සඳ තුටුකර දිවු නු

119–පුවතර, ප්‍රසිද්ධවූ; විමල, නිර්මලවූ; කුල, වංශනැමති; කිරණව, ක්ෂීරාර්ණවයට; සුපුන් සඳයුරු, සම්පූර්ණ චන්ද්‍රයාවැනිවූ; මිහිපල්, මහීපාල යන්ගේ; කිරුළු, කිරීටයන්ගේ; රුස්, රශ්මිනැමති; සඳවෙල, සන්ධ්‍යාව ලායෙන්; ගිහිණි, ගහණවූ; සුවිමල්, අතිශයින් නිර්මලවූ; පදන, පාදතන නැමති; අඹර, ආකාශයෙහි; නිය, නඛනැමති; නවසඳ, අභිනව චන්ද්‍ර යාගෙන්; දිලිනි, දීප්තවූ; සදහම්, සද්ධර්මනැමති; සීතෙල, සිංහ තෛලය; රඳන, රඳන්නාවූ; හෙම්පත් අයුරු, ස්වර්ණපාත්‍රයක් වැනිවූ; උදුලන, උජ්ජ්වලිත වන්නාවූ; දම්කිත්මෙමා හිමිසඳ සමග, ධර්මකීර්තිනම් මාගේ ස්වාමිසන්ද්‍රානාමයා හා; හර, මුක්තාහාරයක් බඳුවූ; සර, ජලය; පිරි, පූර් ණවූ; ඉතිර, උත්තරිතවූ; ගන,ඝණ නමැති; නඹවතුරු,අභිනව ජලසක න්ධය; පැතිරෙන, ව්‍යාපනවන්නාවූ; වර, උතුම්වූ; මුනිඳුසසුන්, මුනීන්ද්‍ර ශාසනත්වහන්සේගේ සද්ධර්ම නැමති; සුරගඟෙහි, ආකාශ ගඟාවෙහි; ඇ තිවුනු, සුනුමිල්වූ; සිනිඳු, සනිග්ධවූ; සිහිල්, සීතලවූ; සිල්, සීලනැමති; මුව රඳිනි, මකරන්දයෙන්; ගැවසුනු, අවිලවූ; පුබුඳු, ප්‍රබුද්ධවූ;ගුණසුවඳ,(සෞශී ල්‍යාදි) ගුණනැමති සුගන්ධය; විහිඳුනු, විස්තීර්ණවූ; යතිඳුසර, (එ ධර්මා දින්‍ය විමලකිත්ති මහාස්ථවිරයන්වහන්සේ නැමති) පද්මය; මිතුරුසඳ, මිත්‍රොත්තමය; සඳතුටු, නාගේ චිත්තසන්තෝෂය; දිවුණුකර, විශුණ කර; නමඳු, නමස්කාරකර.

ඉක්බිති ධරණීදර්ණ තලයෙහි පෙණීගිය අමරපුරයක්වැනි නො කහෙද වාද්‍යාදි අලංකාර මර්දන ජයවර්ධනපුර සිරිවණනු සඳහා "සැදූ මිණිබරණ" යනාදිකව කිනු.

120 සැ දූ මිණිබරණ මිහිලිය හසලෙස ට
මු දූ පුලිනදිලි වේමග නිසිලෙස ට
සැ දූ ගජතුරහසෙන් සරණ හැමවි ට
ව දූ වෙවන් ජයවද්දන පුරවර ට

120–සැදූ මිණිබරණ, මාණික්‍යාභරණයෙන් සැරසුනාවූ; මිහිලිය, මහී කාන්තාව; හසලෙසට, හාස්‍යකරන්නාක්මෙන්; මුදු, මෘදුවූ; පුලිනතල, වාලිකාස්ථලයෙන්; දිලි, බබලන්නාවූ; නිසිලෙසට, කැමති වනසේ;

සැදූ, සජ්ජිතවූ; වේමන, වීථිමාර්ගයෙහි; හැමවිට, නිරන්තරයෙන්ම; ගජ තුරඟසෙන්, හස්ති අශ්ව සේනාසමූහය; සරණ, සංචාරණය කරන්නාවූ; මෙවන්, මෙවැනිවූ; ජයවද්දන පුරවරට, (උරගපුරොද්ගතව පරිවර්තිත යවුවාක්මෙන් අනේක සහස්‍ර පරිමිත සාර්තාපන කූටාගාරික විවිධ භූමිප්‍රභෙදයෙන් සවලඞ්කෘතව සියගණන් වීථිපඞ්ක්තියෙන් නිරන්තරවූ) ජයවර්ධනනාම් පුරප්‍රවරයට; වදු, ප්‍රවිෂ්ටවෙව.

121 ගි රි ඳු යුරු නිසල් වාසල් පෙළිනුදු ල
වි හි දූ මිණිපවුර නතළු දරණවැ ල
ප සි ඳු පුර කිරණයුතු හය තරහපෙ ල
නි රි ඳු සඳසඳින් හැමසඳ උදම්ක ල

121–ගිරිඳුයුරු, සුමේරු පර්වතරාජයා වැනිවූ; නිසල්, නිශ්චලවූ; වාසල් පෙළින්, අනෙක භූමි භෙදෙදින කූටාගාර රාජභවන පඞ්ක්තියෙන්; උදුල, උජ්ජ්වලිතවූ; නත, අනන්තයා විසින්; ලුදරණවැල, හල භොගාවලිය; විහිදූ, විස්තීර්ණවූ; මිණිපවුර, මාණික්‍ය ප්‍රාකාරය ඇති; පසිඳු, ලොක ප්‍රසිද්ධවූ; හය, තුරඞ්ග නැමැති; තරඟපෙල, රලපඞ්ක්තියෙන්; යුතු, යුක්තවූ; පුරකිරණ, ඒ ජයවර්ධනනම් පුරප්‍රවරය නැමති ක්ෂීරාර්ණවය; නිරිඳු සඳ, මහාසම්මත පරම්පරානුජාත ශුද්ධ සූර්‍ය්‍යවංශොද්භූතවූ පෘථිවීපාලොත්තමයානන්වහන්සේ නැමති; සඳින්, චන්ද්‍රයා කාරණකොටගෙණ; හැම සඳ, සදාකල්හි; උදම්කල, උද්දාමකෙළේයි.

122 සැ ප තික් සපිරි එපුරෙහි පසිඳු පහඅ ගේ
ල ප සුත් තරිඳු රන්කොත් දිලෙත සුරම ගේ
අ ප සියහිමි නරඹන ලෙසිනි සිතුර ගේ
සැ ප මිණ දිනිඳු සහකිරණින් සිටියි හැ ගේ

122–සැපතින්, සම්පත්තීන්; සපිරි, සම්පූර්ණවූ; පසිඳු, මනුලොකප්‍රසිද්ධවූ; එපුරෙහි, ඒ ජයවර්ධන පුරප්‍රවරයෙහි; පහඅගේ, ප්‍රාසාදමස්තකයෙහි; ලපසුත්තරිඳු, ලාංඡනප්‍රවේශයක් නැත්තාවූ ශශාංකමණ්ඩලයක් මෙන්; රන්කොත්, කනකශෘඞ්ගයන්; සුරමගේ, ආකාශමාර්ගයෙහි; දිලෙත, දීප්තිමත්වනකල්හි; අපසියහිමි, මාගේබන්ධුවූ ශ්‍රී පරාක්‍රමබාහුනම් මහරජානන්; සිතුරගේ, සිත්වූපර්ද්දෙන්; නරඹන ලෙසිනි, නිරීක්ෂණය කර මැයි සිතා; දිනිඳු, දිනෙන්ද්‍රතෙම; සහකිරණින්, සමන්තිය රශ්මි සහිතව; සැපැමිණ, ඒ ප්‍රාසාදශෘඞ්ගයට සම්ප්‍රාප්තව; සිටිති, සිටින්නාසේ; හැගේ, සංඥාවෙයි.

123 වැ ද පුරවේ මැද මදූතුන් සෙද දිවෙ ත
බ ඳ රසුවැල සිඳ ගිලිහෙනලෙස අන ත
ම ද ලොබකළු බිගුමුළු පැමිණි කොපුල ත
න ද කන්තල තැළුමෙන් වත විසුළුයු ත

123–බඳ, බඳනාලද්දාවූ; රසුවැල, කිංකිණීකජාලාවන්; සිඳ, ජිහ්නාව; ගිලිහෙනලෙස, ගලිතවන්නාවූ පරිද්දෙන්; අනත, බොහෝකොට; මදූතුන්, මතනාගයින්; පුරවේමැද, නගරවීථිමධ්‍යයෙහි; සෙද, ඝණ

යෙහි; වැදදිවෙන, බාවනයකරණකල්හි; මදලොබකළ, මදජලයෙහි ලෝලකළාවූ; බිඟුමුළු, භෘඞ්ගසමූහය; කොපුලත, කපෝලාන්තයට; පැමිණි, ප්‍රාප්තවූ කල්හි; තද, දැඩිකොට; කන්තල තැළුමෙන්, කර්ණතාල ප්‍රහාරයෙන්; වන, මුහුණෙහි; විසුලයුත, විසිණිවූවාක්මෙනි.

124 සි ටි නා තුඟු ලකුළු යුග පියයුරු බරි නී
මි ටි නා ගතැති ඉඟසුඟ දසත වැනෙමි නී
ව ටි නා මෙමුළු රට මදමද හසදෙමි නී
සි ටි නා කළුන් බල දෙර දෙරෙහි පෙනිපෙ නී

124–සිටිනා, ප්‍රතිෂ්ඨිතවූ; තුඟු, (හෙමවාරුශ්‍රිළුලාකාරයෙන්) උත්සාපිතවූ; ලකුළු, (මදරාජගජකුම්භාකාර වටමටසිලුටු ද්‍රුටුවන් නුවන් තුටු කර අඳනා රසඳුන්සේ අභිනිල චූචුයුග්මයකින්) අලංකෘතවූ; පියයුරු යුග, මහාසලලාලයන්ගේ විසෝදර පයොධර යුගලයෙහි; බරිණි, භාරයෙන් යුක්තාව; මිටිනාගතැති, මුෂ්ටිග්‍රාහණිය කළහැකිවූ; ඉඟසුඟ, සිඟු වලඟ; දසතවැනෙමිණි, දසදිසාවෙහි වැනෙමින්; මේ, වත්තිමානයෙහි; මුළුරට, විජිතමණ්ඩලය; වටිනා, අගයවත්නාවූ; මුව මදහස දෙමිනි, (කොකනද පද්මාභ්‍යන්තරයට අපහාසකරන්නාවූ මුවපියුම් විදහා) මන්දහාස්‍යකොට; දෙරදෙරෙහි පෙණීපෙණී, වාරයක්පාසා දෘශ්‍යමානවෙමින්; සිටිනා කලුන්, සිටින්නාවූ කාන්තාවන්; බල, නිරීක්ෂණයකර.

125 උ ම ග නවන් ලිය සුමුවට පැරද ස ඳ
තම ලපදූහැ යලි දිය මතුලබන ලෙ ඳ
අ ම ඔසු විමසනුව තුරුසෙන්ගෙණ නොම ඳ
හැම සඳ වෙහෙස විද විදි රන්ගිරි බෙය ඳ

125–උමඟනවන්, පාවීතියවැතිවූ; ලිය, ඒ පුරස්ත්‍රීන්ගේ; සුමුවට, යහපත්වූ මුඛයට; සඳ, ශුභ්‍රාංශුමාලිමණ්ඩලය; පැරද, පරාජිතව; තමලප, තමාගේ ලාංඡනය; දූහැ, දුරුකොට; යලි, අනාගතයෙහි; දියලබන ලෙද, ජයගන්නා පිණිස; අමඔසු, අමෘතෞෂධයන්; විමසනුය, විභාගකරණුසඳහා; නොමද, බොහෝවූ; තරුසෙන්ගෙන, තාරකා පිරිවර කොටගෙණ; හැමසඳ, සදාකල්හිම; වෙහෙසවිඳ, විඛෙදනාවිඳිනය කොට; රන්ගිරිබෙයද, ස්වර්ණමේරු පර්වතයෙහි; විදි, දුගුම්ගත්තේසී.

126 ප සි න් කොමලලිය රන්සලඹ සල ස ලා
වෙ සි න් කෙළෙනලෙස නිල්වරල මල්ස ලා
මෙසි න් ගලන දියබිඳු විලස සිතුනො ලා
මෙසි න් පිටත් කිවුවම් කියත කිවිබ ලා

126–කොමලලිය, සුකුමාලවූ කාන්තාවන්ගේ; පසින්, පාදයෙන් පාදයට; රන්සලඹ, ස්වර්ණ නූපුර, සලසලා, චලිතකිරීම් වශයෙන්; නිල්වරලමල්සලා, නීලකුන්තලයෙහි අවල කුසුම් පියා වගුරුවමින්; වෙසින්

127 මල් සුඹු ළු  බැඳිනිල් වරලගන කු  ළු
තනකැ කුළු  ඝනරන්කලස සුලකු  ළු
තුනු බැ බළු  ලිය ලිය සදිසි පන්සි  ළු
දූටුස ලෙ ළු  වෙනිලෙස ඇකිලි පාවෙ  ළු

127–මල්සුඹුළු, පුෂ්පපටලයෙන්; බැඳී, බඳනාලද්දාවූ; නිල්වරල, අතිනීල කෙශකලාපය; ගනකුළු, ඝනනීලමෙඝපටලයක්සෙය; සුලකුළු, සමලංකෘතවූ; තනකැකුළු, යෞවනඳුනල දූරිබඳූරි ඵලාකාරඋන්නතඝාතිතව වටමටසිලිටු තදපියයුරුන්; රන්කලස, ස්වර්ණකුම්භයෙස්සයි; තුනු, තනුශ්‍රීයෙන්; බැබළු, භ්‍රාජිතවූ; ලිය, ඒ කාන්තාවෝ; පන්සිළු, පඤ්චශිඛයාගේ; ලියසදිසි, භාර්‍ය්‍යාව හා සදෘශවූවාහු; දූටුසලෙළු, ( ඒ ) දර්ශනය කළාවූ සල්ලාලජනයන්ගේ; පාවෙළු, පාදවෙධ්‍යකළාවූ; ඇඟිලිලෙස, හැකිල්ලක්සේ (හෙවත් යදමක්සේ) ·වෙති, වෙත්; හෙවත් මනොබන්ධනයකරත්.)

128 න  ල ලෙලරන් ලියවන්පුරඟන නිම  ල
දූ  ල මුවගැබ පිරිමදහස පැනපැකි  ල
ලො ල වඩමින් නිතිදූවටී නුවන්දූ  ල
බ  ල සකිසඳ සිටිනාසලෙලු මුවකැ  ල

128–නල, මාරුතයෙන්; ලෙල, ලීලෝපෙතවූ; නිමල, නිර්මලවූ; රන් ලියවන්, ස්වර්ණලතාවන්වැනිවූ; පුරඟන; පුරස්ත්‍රීන්ගේ; දූල, දිලියෙන්නාවූ; මුවගැබ, මුඛගර්භයෙහි; පිරි, පිරුණාවූ; මදහස, මන්දහාස්‍යනැමති; පැන, ජලයට; නිති, නිරතුරු; ලොලවඩමින්, ලෝභවර්ධනයකරමින්; පැකිල, ප්‍රස්ඛලනයකොට; නුවන්දූල, නෙත්‍රජාලායෙහි; දූවටී, වෙළී; සිටිනා සිටින්නාවූ; සලෙලු, සල්ලාලනැමති; මුවකැල, මෘගසමූහයා; සකිසඳ, මිත්‍රොපානමය; බල, නිරීක්ෂණයකර.

129 දෙකකින් සත තිසවන විසිමාපසැ  නි
අනුඅටතුනු නවසා අක්දලැ  නි
අසූසත ගණන් එක්කොට සැටින්නි  නි
එපුරලියෝ විසිඑකකින් දස කෙරෙ  නි

129–දෙකකින්සත, මිතයෙන් (ගුණිතවූ) සප්තකයෙක හෙවත් තුදුසෙක; තිස, නැවතතිසෙක; විසි, නැවත විංශතියකැයි; වන,(සඞ්ඛ්‍යාත) වන්නාවූ; හෙවත් මේ සියලුගණන් එක්කිරීමෙන් සූසැටක් ප්‍රමාණවූ; මාපසැති, මාත්‍රාසඞ්ඛ්‍යාත පාශඇත්නාවූ; අනු, (රූපලාවණ්‍යයෙන්)

අනූනාවූ; නවඅටතුනුසා,යුවතිවූඋමාදෙවියහා සමානවූ; අක්දලැහි, අක්ෂි පත්‍රාදි (අවයව) ඇත්තාවූ; එපුරලියෝ, ඒ ජයවර්ධනපුරයෙහි වනිතාවෝ; නිති, අනවරතයෙන්; සැවින්, ශෘංගාරචෙෂ්ටාවෙන්; අසූ, බබවූ; සනග ණන්, (කාමුක) ජනසමූහයන්; එක්කොට, එකාබන්ධයකොටගෙන; විසිඑකකින්; එක් වචනමාත්‍රයෙකින්; දසකෙරෙති, දාසයන්වැනිකෙ රෙත්; තමන්වශයට පමුණුවතියිසේයි.

130 පත මුඑසක් වළ සිරිඑක තැනෙක පි රි
ගත විලසක් පානා එපුරවර සි රි
සිත වෙනසක් නොව පවසත අනතස රි
වත දහසක් තව ලදුවොත් මිසක්බැ රි

130–මුඑසක්වළ, සකලචක්‍රවාටයෙහි; පිරිගත, පිරිනිබුනාවූ; සිරි, ඓ ශ්වර්‍ය්‍යය; එකතැනෙක, එක්ස්ථානයකට; පත, ප්‍රාප්තවූ; විලසක්, ආකා රයක්; පානා, ප්‍රකාශකරන්නාවූ; එපුරවර, ඒපුරප්‍රවරයෙහි; සිරි, සෝ භාව; සිතවෙනසක්නොව, චිත්තයෙහි අන්‍යථාභාවයක්නැතිව; පවසත, ප්‍රකාශකරත්හොත්; අනත, අනන්තනාගට; සරි, සමානව; වතදහසක්, වක්ත්‍රසහස්‍රයක්; තව, යලිදු; ලදුවොත්මිසක්, ලැබූවහොත්විනා; බැරි නොහැකියි.

131 දුලනා සොඳුරු පුරඳුරු විජයොත් පා ය
තුලනා දෙරණ සපැමිණි තුඟුමහ පා ය
රඳනා පසිඳු මහසෙන් දෙව්රද පා ය
බැතිනා සපිරි දූකයත් කර පිණි පා ය

130–දුලනා, දිලිසෙන්නාවූ; සොඳුරු, සුන්දරවූ; දෙරණසපැමිණි, ධර ණිප්‍රාප්තවූ;පුරඳුරු, ශක්‍රයාගේ; විජයොත්පාය, වෛජයන්තනාම ප්‍රාසා දයනා; තුලනා, සමානවූ; තුඟු, උස්වූ; මහ, මහත්වූ; පාය, ප්‍රාසා යන්හි; රඳනා, රඳන්නාවූ; පසිඳු, ප්‍රසිද්ධවූ; මහසෙන් දෙව්රදපාය, මහා සේනනම් දිව්‍යරාජයාගේප්‍රාසාදය; දූක, දර්ශනයකොට; සපිරි, සම්පූර්ණවූ; බැතිනා, භක්තියෙන්; පිණිපායකර, ප්‍රණිපාතයකොට; යත්, ප්‍රයාණය කරත්.

132 දිනිඳු මඬල අපහසකරණ විලසි නේ
විහිඳු කිරණ යුතුකළ ලකළ ගතර නේ
පසිඳු විමන මුනිඳසනිඳුට සතොසි නේ
සිනිඳු නඳුනි මම්තුරුසඳිනි නමදි නේ

132–දිනිඳුමඬල, සූර්‍ය්‍යමණ්ඩලයට; අපහසකරණවිලසිනේ, අපහාසකරන්නාක්මෙන්; විහිදූ, විසනිණිවූ; කිරණයුතු, රශ්මීන්යුක්තාවූ; ඝනරණේ, ඝනකනකයෙන්; ලකලකල, අලංකෘතකලාවූ; මුනිඳසනිඳුව, සර්‍වඥදළදාවහන්සේගේ; පසිඳුවිමන, ප්‍රසිද්ධවිමානය; සිනිඳුනදනි, ස්නිග්ධනාදඇත්තාවූ; මමිතුරුසඳිනි, මාගේමිත්‍රොත්තමය; සතොසිනේ, සන්තොෂයෙන්; නමදිනේ, නමස්කාරකරන්නේයි.

සබඳ ඒපුරාධිප ප්‍රභාකර කුලොද්භූත නරශ්‍රෙෂ්ඨයාගේ ගුණවිශෙෂයක්ශ්‍රවණයකර.

133 උ තු ර දිපති සිරිපැරකුම්බා සු රි ඳු
ප ව ර බරණ දිලිවනරම්බා ගි රි ඳු
ප ත ර තෙදයසිනිරිවි බිම්බා ත රි ඳු
එ පු ර වැජඹි සිරිපැරකුම්බා නි රි ඳු

133–සිරි, ඓශ්වර්‍ය්‍යයෙන්හා; පැරකුම්, පරාක්‍රමයෙන්ද; බා, භාග්‍යයෙන්ද; උතුරදිපති, උත්තරදිශාධිපතිවූ; සුරිඳු, සුරෙන්ද්‍රයාමෙන්ද; දිලි, දීප්තවූ; පවර, උතුම්වූ; අබරණ, ආභරණයෙන්; මනරම්බා, සිත්කලුවූ; ගිරිඳු, පාර්වතියමෙන්ද; පතර, මහත්වූ; තෙදයසිනි, තෙජසහයසසින්: රිවිබිම්බාතරිඳු, සූර්‍ය්‍යයා හා චන්ද්‍රයාමෙන්ද; සිරිපැරකුම්නිරිඳු, ශ්‍රීපරාක්‍රමබාහුනරෙන්ද්‍රතෙම; එපුර, ඒ (ජයවර්ධන) පුරයෙහි; වැජඹි, විජෘම්භමානවිය.

134 සි ව් සමුදුර තුර මිහිමඬලට ගිහි ණි
දෙ ව් වෙසෙසින් රුදුයස තෙදස මුතු මි ණි
ලෙ ව් තුටුකල පැරකුම්බා මෙරජ මි ණි
ස ව් සිරිබර සිරිලක රජ සිරිපැමි ණි

134–සිව්සමුදුරතුර, චතුස්සමුද්‍රාන්තරයෙහි; මුතුමිණි, මුක්තාමාණික්‍යයන්ගෙන්; ගිහිණි, ගහණවූ; මිහිමඬලට, මහීමණ්ඩලයට; දෙව්, අධිපතිවූ; වෙසෙසින්, විශෙෂයෙන්; රුදු, මහත්වූ; යසතෙදස, යසස් හා තෙජස්ඇති; ලෙව්, ලොකයා; තුටුකල, සන්තුෂ්ටකලාවූ; පැරකුම්බා, පරාක්‍රමබාහුනම්වූ; මෙරජමිණි, මේරාජනැමති මාණික්‍යය; සව්සිරිබර, සකලෙශ්වර්‍ය්‍යයෙන්භරිතවූ; සිරිලක, ශ්‍රීලඞ්කාවිපයෙහි; රජසිරි, රාජ්‍යශ්‍රියට; පැමිණි, සම්ප්‍රාප්තවී.

135 ර ත් ද රතෝ මිණිසමග කළත දැ
ර ත් ද රා නදසා මෙහිමිගේ න දැ
ර ත් ද රා පියවෙස්ගෙන විරිදුර දැ
ර ත් ද රා ගිය සිය සුතඹුගෙන සෙ දැ

135–අනේර, අනේකරාගඇති හෙවත් නානාවර්ණවූ; මිණිසමග, මාණික්‍යයන් හා සමඟව; රත්දු, රජතායකොට (බඩකොට;) නදකළ, මනොනන්දනාවනසේ කරනලද; මෙහිමිගේ, මේපරාක්‍රමබාහුනරෙන්ද්‍රයන් වහන්සේගේ; නද, මනොනන්දකියවූ රත්දුරානද, සවර්ණමය ශුෂිර තූර්‍ය්‍යවිශෙෂයාගේ නාදය; අසා, ශ්‍රවණයකොට; විරිඳුරද, විරුඹරාජ(වගී) තෙම; රත්දුරාපිය, වනචරවධූවල්ලභයන්ගේ හෙවත් ව්‍යාධයන්ගේ; වෙය්, වෙශය; ගෙන, ග්‍රහණයකොට; සියසුනඹු, සවකීය පුත්‍රදාරයන්; ගෙන, ග්‍රහණයකොට; රත්දුරා, අරණ්‍ය දුරණය කොට හෙවත් වල්බිඳ ගෙන; සෙද, ශීඝ්‍රව; ගිය, ගමනකෙළේය; බියව වල්වැද පලාගියේයයි සේයි.

136 ස ව න් දෙසූ තෙවළාදම් අමරසි ත
ස ව න් පුරා නරතුරු සුසිරිවඩමි ත
ස ව න් අකුරු මෙනිරිඳු තිළිත තඹර ත
ස ව න් මිණි රෙණිත් යදිබිඟුකෙළෙ නද ත.

136–සවන්දෙසූ, සර්වඥයන්වහන්සේ විසින් දෙශනාකළාවූ; තෙවළා දම්, ත්‍රිපිටකධර්මනැමති; අමරසින, අමෘරසයෙන්; සවන්පුරා, කර්ණ පූරණයකොට; නරතුරු, නිතර; සුසිරිවඩමින, සුචරිතවර්ධනයකරමින්; තිළින, ත්‍යාගනැමති; තඹරන, තාමරසයන්ගේ; සවන්, ශ්‍යාමවර්ණවූ; මිණිරෙණින්, මාණික්‍යනැමති රෙණුයෙන්; සවන්අකුරු, දූඩාංකුරවූ; මෙනිරිඳු, මේ නරෙන්ද්‍රතෙම; යදි, යාචකනැමති; බිඟු, භෘඞ්ගයන්; නදනකළෙ, සනතුෂ්ටකෙළේය.

137 ප හ ළා විලස යුගකෙළරිවි බිඹුලෙල ව
පු ව ළා මෙහිමි සඳ නදතෙද රැස්මොළ ව
නොව ළා රුපු සයුර වියලාවැද වෙල ව
ස ස ළා සළාදී බබලයි මුළු පොළො ව

යුගකෙළ, කල්පාන්තයෙහි; රිවිබිඹු; සූර්‍ය්‍යබිම්බය; ලෙලවා, ලීලෝ පෙනව; පහළාවිලස, පැවූවාක්මෙන්; මෙහිමිසඳ, මේස්වාමිචන්ද්‍රයාගේ; පුවළා, ප්‍රෞඪවූ; නද, සනාථවූ; තෙද, තෙජස්නැමැති; රැස්, රශ්මිය; මොළව, වඩව; නොවලා, වහා; රුපු; ශත්‍රුනැමති; සයුර, සාගරය; වියලා, ශුෂ්කකොට; වැද, ප්‍රවිෂ්ටව; වෙළව, වෙඨනව; සසලා, චංචලව; සළාදී; ජවාදනායකොට; මුළුපොළොව, සකලපෘථ්වියෙහි; බබලයි, භ්‍රාජිතවෙයි.

138 මි හි තු ල් නිසල ගුණමෙනිරිඳු සඳ සත ත
දි ගු නි ල් පැහැදි යුගබැම නව මෙනහද ත
පි ළි ම ල් තුමුල් කිඳුලිය පාකරනැව ත
සු හු ඹු ල් කෙලෙ සව්සත සතොස ඇල්කෙ ත

138–මිහිතුල්, පෘථිවියමෙන්; නිසලගුණ, නිශ්චලගුණඇති; මෙනිරිඳු සඳ, මේනරෙන්ද්‍ර චන්ද්‍රතෙම; සතත, නිරන්තරයෙන්; දිගු, දීඝීවූ; නිල්, නීලවණ්ණීවූ; පැහැදි, ප්‍රසන්නවූ; යුගබැම, භ්‍රෑයුග්මනැමති; නවමෙන, අභිනවමෙඝයන්; හදන, සජ්ජනකරනකල්හි; පිළිමල්, ප්‍රතිමල්ල නැමැති; තුමුල්, උස්වූ; කිඳුලිය, කන්‍දලිගුල්මයන්; පාකර, දූරිභූතකොට; නැවත, ගළිත්; සව්සත, සකලසත්වවගීයාගේ; සතොස, සන්තොෂ නමැති; ඇල්කෙත, ශාලික්ෂෙත්‍රය; සුහුඹුල්කෙළේ; සමෘඩකෙළේයි.

139 රි වි කු ල කමල පොබයන නව රිවිමඩ ල
රි වි කු ල කලනිවෙස් මෙනිරිඳුට රිවිකු ල
ස ම බ ල තෙදැති නිරිදෙකු නුබව මෙක ල
හැ ම ව ල තුරක් නැතිමෙනි දෙව් තුරටතු ල

139–රවිකුලකමල, සූය්‍යීවංශනමැති පද්මකුඩ්වලය; පොබයන, ප්‍රබෝධ කරන්නාවූ; නවරිවිමඩල, අභිනව සූය්‍යීමණ්ඩලයවැනිවූ; රිවිකුල, සූය්‍යීවංශය; කලනිවෙස්, කල්‍යාණ නිවෙසකොටඇත්තාවූ; රිවිකුල, සූය්‍යීවංශොද්භූතවූ; මෙනිරිඳුට, මෙනරෙන්ද්‍රයාට; සමබලතෙදැති, සමාන බලතෙජස්ඇත්තාවූ; නිරිදෙකු, නරෙන්ද්‍රයෙක්; මෙකල, වත්තීමාන කාලයෙහි; නුබව, ඇතිනොවූබැව්; හැමවල, සියලුවනයෙහි; දෙව් තුරටතුල, දිව්‍යවෘක්ෂයට සමානවූ; තුරක්, වෘක්ෂයක්; නැතිමෙනි, නැත් තාක්මෙනි.

140 ප ල ග වන් වියත් දද තුටුවන්ට බ ලී
ප ල ග අවිරුගත් වරමෙවිරු රුපුක ලී
ප ල ග හුනු මුහුනු සහදුන් කදුළුහැ ලි
ප ල ග අඩගහණ මිලිනරිඳු සිරිසි ලී

140–වියත්දද, විජගණයා; තුටුවන්ට, සන්තෝෂජනනයකිරීමට; බලී, ගෝචරවූ; පලගවන්, අග්‍රඵලයක්වැනි; මෙවිරු, මේවීරබලපරාක්‍රම පරාක්‍රමබාහුමහරජානන්; පලගඅවිරුගත්වර, පටලායුධ සන්නද්ධව රණ ප්‍රාප්තවූ කල්හි; රුපුකලී, වෛරීනෘපකලත්‍රයන්ගේ; සහදුන්, අජනාලෙ පදිගුපුචිල්නායනින්; කදුළුහැලි, නෙත්‍රජලවහනකලාවූ; පලගහුනු, පලාවන්වූ; මුහුනු, මුඛයෝතුමු; පලග, රාජුභ්‍රභයාවිසින්; අඩගහණ, අධිග්‍රහණය කලාවූ; මිලිනරිඳු, මලීනවන්ද්‍රයාගේ; සිරිසිලී, සෝභාවද්දරුණයයි,

141 ස ව් සිරිදෙන සෙව්නාසන හටනිබ ද
දෙ ව් කුඹුවන් මෙනිරිඳු රජකරණ ස ද
ලෙ ව් තුරු රුපු නිරිඳුන් පැලඹෙනුකෙබ ද
එ ව් රිවි අබියසෙහි සරණාකඳේලෙ ද

141–නිබද, නිරන්තරයෙන්; සෙවුනාසනහට, සේවනයකරන්නාවූ සත්වයන්ට; සව්සිරිදෙන, සම්පත්දායකවූ; දෙව්කුඹුවන්, භද්‍රඝටයක්බඳුවූ; මෙනිරිඳු, මේජගත්පාලයා; රජකරණසඳ, රාජ්‍යශ්‍රීපැමිණිකාලයෙහි; ලෙවුතුරු, ජගදභ්‍යන්තරයෙහි; රුපුනිරිඳුන්, ශත්‍රුනරේන්ද්‍රයන්; පැල ඹෙනු, ප්‍රලම්බනාවීම; කෙබඳ, කුමක්මෙන්ද; රිවිඅබියසෙහි, දිනකරාභිමුඛයෙහි; සරණා, සමාරණයකරන්නාවූ; කඳේලෙද, ඛද්‍යෝතක්‍රිමිමෙනි.

142 අ මා කිරණ කැලලැතියෙන් පළමුකො ට
ත මා ම සරි නොමවනුයෙන් හැරිදුර ට
ත මා ම තම හටසරිඹනු ගුණරුස ට
යොමා බලනු කිවියර උපමා කුම ට

142–පළමුකොට, පුරාතනයෙන්; අමාකිරණ, අමෘතකිරණයා;(හෙ වත්චන්ද්‍රයා) කැලලැතියෙන්, ශශලාඤ්ඡනයෙන් යුක්තබැවින්; සරිනොම වනුයෙන්, අසම්භාවයෙන්; තමාම, තමන්විසින්ම; දුරටහැරි, දුරුකෙළේය; තමාම තමනටසරි, තමාම තමහට සමානවන්නාවූ; ඹහුගුණරුසට, ඒ නරෙන්ද්‍රයාගේ ගුණරාශියට; කිවියර, මුක්තකකුලකාදී අනේක පද්‍ය බන්ධනයෙහි දක්ෂකවිවරයන්; උපමං, උපමාවන්; යොමාබලනු, යුහුව පරීක්ෂාකිරීම; කුමට, කිමයිද.

143 රි පි ගො ත් කිරිමුහුද ඔදදුන් සිසිලෙස ට
ම හ ස ත් ගුණෙන් වැජඹෙනනිති මෙමුලු ර ට
දි ය කො ත් මෙනිරිඳුගෙ තෙදයසස වැණුම ට
කි වි ව ත් නොවෙත් මත්වෙත් සරසවි නෙත ට

143–රිපිගොත්, ශත්‍රුකිරණවංශනාමගි; කිරිමුහුද, ක්ෂීරාර්ණවය; ඔදදුන්, සතුවූකළාවූ; සිසිලෙසට, සීතරශ්මිවැනිවූ; මහසත්ගුණෙන්, බෝධිසත්වගුණයෙන් යුක්තව; නිති, නිරන්තරයෙන්; මෙමුළුරට, මේපිජිනමණ්ඩලයෙහි; වැජඹෙන, විජෘම්භමානවන්නාවූ; දියකොත්, ජයකේතුවක්වැනිවූ; මෙනිරිඳුගෙ, මේනරේන්ද්‍රයාගේ; තෙදයසසවැණු මට, තේජස්හා යශස්වර්ණනාකිරීමට; කිවි, කවිවරයෝ; මත්නොවෙත්, සමර්ථනොවන්නෝය; සරසවිනෙතට, වාක්දේවියහා චතුර්මුඛඅණ ලොවනමහාබ්‍රහ්මයා; මත්වෙත්, සමර්ථවෙත්.

144 ස ඳ කැ න් සදිසි බබලන පිළිමිණි දෙ   ර ණ
ග න් ර න් මැඹින් සුලකල විහිදෙන කි   ර ණ
සැ දි න න් රුවන් රුවිනඟ නවහන්බ   ර ණ
සො බ ම න් සබා මඬුවෙහි නිතිපියක   ර ණ

141–බබලන, භ්‍රාජිතවන්නාවූ; සඳකැන්සදිසි, චන්ද්‍රකාන්තියටබඳුවූ; පිළිමිණිදෙරණ, ප්‍රතිබිම්බමාණික්‍යයෙන් අතුරණලද භූමිප්‍රදේශයෙහි; ගනරන්මැඹින්, ඝනකණකයෂ්ටිපංක්තියෙන්; සුලකල, සමලංකෘතවූ; කිරණ, විහිදෙන; රශ්මීන්, ව්‍යාප්තකරන්නාවූ; නන්රුවන්, අනේක රත්නයෙන්; සැදි, සජ්ජිතවූ; රුවින්, රූපයන් කරණකොටගෙණ; අඟ, අඟුවූ; නවහන්බරණ, නොයෙක් අභිනවකටහන් කර්මාන්තයෙන් නිර්මිතකරණලද; සොබමන්, සෝභමානවූ; නිතිපියකරණ, නිරන්තර යෙන් ප්‍රියකරවූ; සබාමඬුවෙහි, ඒසන්නිපාතමණ්ඩපයෙහි.

සවර්ණමණිතාරකා නිකර විචිත්‍ර විතානානුබද්ධ උත්තමකාඤ්චන නවරත්නාන්විතවූ උඳුල ලෙලම්ණිකිංකිණීක මංගලාසන මස්තක ප්‍රාප්තව ශ්‍රීකීර්තිකාන්තීන් මුළුලෝ ධවලච්ඡත්‍රනංවා වැඩහුන්ලීලාවිලාස දක්වනු පිණිස "තරුපිරිවර සුපුන්සඳ" යනාදී සැහැලලකිනු.

145 තරුපිරිවර සුපුන්–සඳබබලනෙව් නුබමැද
නන්මිණි පෙලින් පෙල විසිතුරු ලෙසට   ඔබා
බන්සුදුවියන් යටසේසනිති සිටිප   බා
කන්කළු රුසිරුවූ–පුවතර මුවර තොරණින
හිමසෙල් නිමල් සුවිපුල් සිඅස්නම   තු
සුවි මල් රුවන් බරණින් සැරසිදිමු   තු
දිගැසි සොඳුරු කරසලසෙමෙර පවනි   න
නොසලමිණි කිරුළු මුතුලැල් ලෙලවමි   න
දෙපසනිරිඳු කැලඅත්මුදුන දෙවමි   න
මෙලෙස එඅප පැරකුම්රජ උන්සඳි   න

145–නුබමැද, නභොමධ්‍යයෙහි; තරුපිරිවැරූ, තාරකාපරිවෘතවූ; සුපුන්සඳ, සම්පූර්ණචන්ද්‍රයා; බබලනෙව්, භ්‍රාජිතවන්නාක්මෙන්; නන් මිණිපෙළින්පෙළ, නානාවිධ මාණික්‍යපංක්තීන් පංක්තිය; විසිතුරු ලෙසට, විචිත්‍රාකාරයෙන්; ඔබා, ගිල්වා; බන්, බඳනාලද; සුදුවියන්යට, ශ්වේතවිතානයන්ගේ යටභාගයෙහි; පබාසිටි, ප්‍රභාරජිතවූ; සේසතිනි, ශ්වේතච්ඡත්‍රයෙන් යුක්තවූ; කන්කළු, නෙත්‍රාභිරාමවූ; රුසිරු, රුචිරවූ; පුවතර, ප්‍රසිද්ධවූ; මුවරතොරණින, මකරතොරණයෙන්; (හෙබියාවූ) හිම සෙල්, හිමාලයපර්වතයසේ; නිමල්, නිර්මලවූ; සුවිපුල්, අතිවිසාලවූ; සිඅස් නමතු, සිංහාසනමස්තකයෙහි; සුවිමල්, ඉතානිර්මලවූ; දිමුතු, දීප්තිමත්වූ; රුවන්බරණින්, රත්නාභරණයෙන්; සැරසී, සජ්ජිතවූ. සොඳුරු,

සුන්දරවූ; දිගැසි, දීර්ඝාක්ෂීන්ගේ; (සුපුරුදු කම්තිමෘදුතනු ප්‍රභා භාසුරවූ, තරුණරමනීන්ගේ;) කර, මණිරත්නවලයාභිරාමකොමල යුවලත් තලින්; සල, චලනයකරන්නාවූ; සෙමෙරපවනින්, චාමරයෙන් නැගි සිහිල් සිනිඳු ඇල්බොල්පවනින්; මිණිකිරුළු, සවර්ණමාණික්‍යරත්නාලඞ්කාර කිරීටාභරණය; නොසල, නිශ්චලව; මුතුලැල්ලෙලවමින, මුක්තාලතිකාවන් ලීලෝපෙතකොට, දෙපස, උභයපාර්ශවයෙහි; නිරිඳු කැල, නෛකදෙශ ප්‍රසිඩ නරේන්ද්‍රයන් විසින්; අත්මුදුනදෙවමින, හස්තාග්‍රව මස්තකයෙහි තබවමින්; මෙලෙස, මේයථොක්ත ලක්ෂණයෙන්යුක්තව; අප, අපගේ; ඒ පැරකුම්රජ, ශත්‍රුජනගජේන්ද්‍ර කුම්භ විදාරණ කේසර සිංහවූ ඒ පරාක්‍රමබාහු මහරජෝත්තමයා; උත්සඳින, උපවසන ප්‍රාප්තවූ කාලයෙහි.

| | | |
|---|---|---|
| 146 පබසර | මිණිකිරුළු පලඳිම්නි නිසිලෙ | ස |
| සුබකර | මෙසිරිලක රක්නා එනදව | ස |
| නැබසර | විකුම් රජකුමරුන් සිටිවිල | ස |
| දඹතුර | දෙපස රණකුරුසිරිපැයි වෙසෙ | ස |

146–නිසිලෙස, අභිප්‍රායානුකූලවූ පරිද්දෙන්; මිණිකිරුළු, මාණික්‍ය කිරීටය; පලඳිම්නි, ප්‍රසාධනයකරමින්; පබසර, ඒ ප්‍රභාස්වරයෙන්; සුබකර, සොභාමත්කොට; එනදවස, අනාගතයෙහි; මෙසිරිලක, මේ ශ්‍රීලංකාවීපය; රකිනා, රක්‍ෂාකරන්නාවූ; විකුම්, වික්‍රමයෙන්; නැබසර, වෛෂ්ණවයාබඳුවූ; රජකුමරුන්, රාජකුමාරයන්; සිටිවිලස, සිටින්නාවූ විලාසය; දඹතුරදෙපස, සවර්ණජම්බුවිටප උභයාන්තයෙහි; රණකුරු සිරි, සවර්ණාඞ්කුරසොභාව; වෙසෙස, විශෙෂයෙන්ම; පැයි, පහළක ළේයි.

| | | |
|---|---|---|
| 147 දිගත් | පසිඳු රිවිසඳඅනල කුලෙනු | ද |
| මහත් | සොලී පඬිකේරළ නිරිඳුස | ද |
| දිමුත් | මකුට මිණිමල් සරණතල පු | ද |
| සිටින් | පසෙක කරතල තඹුරු මතයො | ද |

147–දිගත්පසිඳු, ජගත්ප්‍රසිද්ධවූ; රිවි, සූර්‍ය්‍යවංශය; සඳ, චන්ද්‍රවංශය, අනලකුලෙන්, අනලවංශය යනමෙයින්; උදු, පහළවූ; මහත්, මහත්වයෙන් යුක්තවූ; සොලි, සොලිරජය; පඬිකේරළනිරිඳුසඳ, පඬිරජ්ජය කේරළරජයයි; (යනමෙ නරපතිහු) දිමුත්, දීප්තිමත්වූ; මකුටමිණි, කිරීටමාණික්‍ය නැමති; මල්, පුෂ්පයන්; සරණතල. ශ්‍රීපාදතලනැමයි(මලස්තෙහි); පුදා, පූජාකොට; කරතල, හස්තතලනැමැති; තඹුරු, තාමරසයන්; මතයොදා, මස්තකයෙහි යොජිතකොට; පසෙක, පාශ්වයෙක; සිටින්, සවිතවෙත්.

148 ක පූ රැ සඳුන් මුවමදසොඳ සුවඳ ඇ ති
රැ සි රැ සියුම් පටසළු සමඟ නන්ව ති
ච තු රැ ලෙසින් ගෙණනන්දෙස නිරිඳු නි ති
අ තු රැ නොදී දී වැඳ වැඳ එහි සිටි ති

148–සොඳ, සුන්දරවූ; සුවඳඇති, සුගන්ධවත්වූ; කපුරු, කර්පූරය; සඳුන්, චන්දනය; මුවමද, මෘගමදය; සියුම්, සිනිඳුවූ; පටසළු, කෞෂෙය කාසෙය්‍යාදී පටවස්ත්‍රය; රුසිරු, රූඇත්තාවූ; නන්වති, නොයෙක්වස්ත්‍රද; චතුරු ලෙසින්, මහචතුරුලෙසින්; ගෙණ, ග්‍රහණයකොට, නිති, නිරන්තර යෙන්; නන්දෙසනිරිඳු, නෙකදෙශභූපාලයෝ; අතුරුනොදී, අන්තර යක්නැතිව; දී, දක්වා; වැඳවැඳ, වන්දනයකොටකොට; එහිසිටිති, ඒ සභාමධ්‍යයෙහි සිටිත්.

149 ක ර ත ත් වෙනස් තමගැලවෙන උපාදූ න
නැව ත ත් එරන්රස විලසින් එක්කර ණ
දූ න ග ත් රජනීති සතනතුලෙස නැණී න
සි රි ම ත් ඇමතිගණ වැඳසිටිති අදරි ණ

149–තම, තමා; ගැලවෙන, මුක්තවන්නාවූ; උපා, ප්‍රයොග; දූන, ජාන නයකොට; වෙනස්, වියෝගයක්; කරනත්, කරත්තේනමුත්; නැවතත්, යළිදු; එරන්රසවිලසින්; හේමපාරද කාරයෙන්; එක්කරණ, සමගිකරන් නාවූ; රජනිති, රාජනීතිහා; සත සම්සතශාස්ත්‍රද; නැණීන, ප්‍රඥාවෙන් අලලා; තතුලෙස, තත්වූපරිද්දෙන්; දූනගත්, අවබෝධකළාවූ; සිරිමත්, ඉසුරුමත්වූ; ඇමතිගණ, ආමාත්‍යගණයෙහි අභිදක්ෂ විචක්ෂණඅමාත්‍යසමූ හයෝ; අදරින, ආදරබහුමානයෙන් යුක්තව; වැඳසිටිති, දෙහොත්මුදුන් දීසිටිත්.

150 ච ද න සතර පැවසූ සතදූන නොහැ ර
කා ර ණ සකම් විදිනොවරදවා පව ර
න ද න පෙරවි බමුණන් සිට එකපැති ර
කි ය න නොයෙක් ආසිරි වදනින් නිතො ර

150–චදනසතර, චතුර්මුඛ මහාබ්‍රහ්මයා විසින්; පැවසූ, ප්‍රකාශකළාවූ; සත, ශාස්ත්‍රය; නොහැර, පිරිනොහෙළා; දූන, අවබොධකොට; පවර, ප්‍රවරවූ; සකම්විදි, ෂට්කර්මවිධිය; හෙවත්, අධ්‍යයන අධ්‍යාපන යජන යා ජාපන දාන ප්‍රතිග්‍රහණයයි යන ෂට්කර්මය; නොවරදවා, නිවරැදිව; කරණ, කරන්නාවූ; නඳන, නන්දනයකළාවූ; පෙරවිබමුණන්, පුරෝහිත බ්‍රාහ්මණ

යන්; සිට, අවසර්නව; එකපැහැර, එකනපත්ව; කියන, උසුරුවන්නාවූ නොයෙක්, අනෙකවිධවූ; ආසිරිවදන්, ආයුඃශ්‍රීවචනයෙන්; නිතොර, නිරන්තරව්.

151 සොඳ එළු දෙමළ මාගද දෙව් බස පසි දු
සොඳ මියුරසින්*නොසැකෙව් කිවියෙහි පුරු දු
ඔ ද ගුණ ගිහිණි නමකුලයුත් මහකිවි දු
වැ ද වැඳ කියති නොමදව කව් බැඳවිරි දු

151–සොඳ, යහපත්වූ;එළු, සිංහලය; දෙමළ, ද්‍රවිඩය; මාගද, මාගධය; දෙව්බස, සංස්කෘතයන භාෂාමයවූ; පසිදු, ප්‍රසිඩවූ; සොඳ, සුන්දරවූ; මියුරසින්, මධුරරසයෙන්; යුක්තවූ; නොසැකෙවු, සංකාරහිතවූ: කිවියෙහි, කවිකර්මයෙහි; පුරුදු, අභ්‍යාසඇත්තාවූ; නම කුලයුත්, නාම ගොත්‍රයෙන් යුක්තවූ; මහකිවිඳු, සව්සදන් දිව්රගකළ විසතුණෝ; ඔද, උත්සහනාවසිට; නොමද, බොහෝවූ; විරිදු, විශෙෂවූ; ගුණගිහිණි, ගුණයෙන්ගහණවූ; කව්බැඳ, කාව්‍යබන්ධනයකොට; වැඳ වැඳ, නමස්කාර කරමින්; කියති, කථනයකරත්.

152 නි ම ල් බරණ ගතසරසා සකස් කො ට
තු එ ල් උතුරු පටසළුවෙන් එකස්කො ට
ක ම ල් සදිසි අත්ලෙලවා උසස්කො ට
වි පු ල් ව වැදි තෙපලත තුති වෙසෙස්කො ට

152–ගත, ගාත්‍රයන්; නිමල්, නිර්මලවූ; බරණ, ආභරණයෙන්; සකස්කොට,මනාසේ; සරසා, සජ්ජිතකර; තුළුල්, සිනිඳුවූ; උතුරුපටසළුවෙන් පට උත්තරශාටකයෙන්; එකස්කොට, එකාංශකරමින්; කමල්සදිසි, පද්මයන්ටබඳුවූ; අත්ලෙලවා, හස්තලීලෝපෙතකොට; උසස්කොට, උත්සාපිතකරමින්; විපුල්ව, බොහෝවූ; වැදි, වන්දිභට්ටයන්: වෙසෙස්කොට, විශෙෂයෙන්; තුති, ඒ නරෙන්ද්‍රයාගේ යසඃස්තුතිය; තෙපලත, උසුරුවනකල්හි.

153 දිවසරවන් ලිය රන්තලි ගෙණඅත ට
විලස පැපැසිරිවිලි ආවඩත සි ට
මෙලෙස සව්සිරින් සුසැදුනු සබමැද ට
පිවිස සෙමෙන් ගොස් බුහුමන් කරවෙත ට

153–දිවසරවන්, දිව්‍යාඞ්ගනාවන්වැනිවූ; ලිය, කා[illegible]නාවෝ;රන්තලි, සවර්ණභාජන: අතටගෙණ, හස්තග්‍රහණයකොට; සිරිවිලි, ශ්‍රීයෙන්වෙලීගියාවූ; විලසපැපැ, රූප විලාස දක්ව දක්වා; සිට, අවසර්නව; ආවඩන, ආශුර්

* සෙදයුරු සිනින්. සමහර.

ඝීනාය කරණකල්හි; මෙලෙස, මෙයථා යථාකාරයෙන්; සව්සිරින්, සකලෛශ්වර්‍ය්‍යයෙන්; සුසැදුනු, සුසජ්ජිතවූ; සබමැදට, ඒසභාමධ්‍යයට; පිවිස, ප්‍රවිෂ්ටව; සෙමෙන්, සුවිනීතභාවයෙන්; වෙනටනොයා, සමීපයටපැමිණ; බුහුමන්කර, බහුමානකොට; අන්‍යදෝෂවර්ජිතව; කාව්‍යකර්තෘන්ගේ සන්දේශවාක්‍ය සැලකරණු පිණිස මිතුරුකුලයනාදි කවකීනු.

154 මි තු රු   කුලග දුන්රසුදුල මිණිමිතු   රු
ස තු රු   අඳුරු දුරුකල සියපත් මිතු   රු
උ තු රු   කරණ වර පැරකුම් දෙරණි සු   රු
රු සි රු   සරණ වැඳ මෙලෙසින් කියමිතු   රු

154–මිතුරුකුල, සූර්‍ය්‍යවංශනැමති; අගදුන්, ප්‍රාසාදයෙහි ලැවූ; රසදුල්, රශ්මියෙන්උජ්වලිතවූ; මිණිමිතුරු, මාණික්‍යප්‍රදීපයක්වැනිවූ; සතුරු, ශත්‍රුනැමති; අඳුරු, අන්ධකාරයට; සියපත්මිතුරු, ශතපත්‍රමිත්‍ර (භාස්කර) යාබඳුවූ, පැරකුම්දෙරණිසුරු, සමස්තභුවන භාස්කර ශ්‍රීපරාක්‍රමබාහුනම් ධරණීශ්වරයන් වහන්සේ; උතුරුකරණවර, සකලවිද්‍යාවිෂයෙහි ආචාර්‍ය්‍ය විචිත්‍රකවිකවූ මහාමාත්‍යගණ පරිවෘතව ලොකවිනිශ්චයෙහි නියුක්තව උතුරුපසුරුවන්නාවූ කල්හි; රුසිරු, රුචිරවූ; සරණ, ශ්‍රීපාදය; වැඳ, නමස්කාරකොට; මිතුරු, මිත්‍රය; මෙලෙසින්, මේවක්ෂ්‍යමානවචනයෙන් කිය, සැලකර.

155 සැ ප තින් දිනිඳු දිනු හිමිසඳ දූත්ඔබ   ට
ඔ ප තුනු සිරි යුත්පත් තෙනෙතනතුර   ට
සි ප සිරිසඳ වැඩි සපුමල් කුමරිඳු   ට
අ ප යතිහිමි අස්නක්දුනි දෙනලෙස   ට

155–හිමිසඳ, ස්වාමිපාද; දූත්, වර්ත්තමානකාලයෙහි; සැපතින්, සකලෛශ්වර්‍ය්‍යයෙන්; දිනිඳුදිනූ, වෛශ්‍රවණයා ජයගත්තාවූ; ඔබට, ඔබවහන්සේගේ; තෙනෙතනතුරට, පුත්‍රස්ථානාන්තරයට; පත්, ප්‍රාප්තවූ; තුනු, ශරීරයෙහි; ඔප, ප්‍රභාශෝභා; සිරියුත්, ශ්‍රියෙන්යුක්තවූ; සිරිසඳ, ශ්‍රීකාන්තාව; සිප, ස්පර්ශකොට; වැඩි, වර්ධිතවූ; සපුමල් කුමරිඳුට, චම්පකාභිධාන රාජකුමාරයාහට; දෙනලෙසට, දානයකරණ පිණිස; අප, අපගේ; යතිහිමි, ප්‍රමාණාතික්‍රාන්ත ස්වීරසාරසාරගම්භීර අගණිත ගුණසමූහභූෂණ භූෂිතවූ ඉරුගල් කුලතිලක පරිවේණාධිපති මහාස්ථවිර ස්වාමීතෙම; අස්නක්, විචිත්‍ර පදාර්ථයක සන්දේශයක්; දුනි, දුනාය කෙළේයි.

156 එ ගෙ න යන පවත් දූත් එරදුන් ලඟ , ට
ළ ඟෙ න සැලකරණලෙස කිවෙන් ඔබ ට
මෙ මන න පැමිණියෙමි පවසා මේ ලෙස ට
රැ ගෙ න වසර වැඳනැගෙමින් නුබපත ට

156–දූත්. මේකාලයෙහි; එරදුත්, ඒ නරෙන්ද්‍රයාගේ; ලඟට, සමීපයට; එගෙන, ඒ සන්දේශය ග්‍රහණයකොට; යන, ප්‍රයානය කරන්නාවූ; පවත්, ප්‍රවෘත්තිය; ළඟෙන, චිත්තාග්‍රහණයකොට; ඔබට, පෘථිවීශ්වරවූ ඔබතුමා නන් වහන්සේට; සැලකරණලෙස, ප්‍රකාශකරණ පරිද්දෙන්; කිවෙන්, වදලබැවින්; මෙමනා, මේස්ථානයට; පැමිණියෙමි, ප්‍රාප්තවූයෙමි; මෙලෙසට, මේආකාරයෙන්; පවසා, ප්‍රකාශකොට; වැඳ, වන්දනයකර; අවසර රැගෙණ, සමුගෙණ; නුබපතට, ආකාශමාර්ගයට; නැගෙමින්, ආරූඪ වෙමින්.

157 අ තු රු නොහැර ඉවුරසපිහිටි වනග ට න්
ල තු රු වතුර මින්බිඟුරැඳුනු මල්පි ට න්
ව තු රු උතුරුවා ඇවිදින් පිරෙණ ව ට න්
මි තු රු එතර යාකර කොන්තගංතො ට න්

157–අතුරුනොහැර, අන්තරයක්නැතිව; ඉවුරස, ගංගාතීරසන්ත යෙහි; පිහිටි, ප්‍රතිෂ්ඨිතවූ; වනගටින් වනෂණ්ඩයෙන්; බිඟුරැඳුනු, භෘඟ රජිතවූ; මල්පිටින්, පුෂ්පයන්සමග; ලතුරු, තරුණතරු; වතුරුවමින්, ඇදහෙලාගෙණ; වටින්, හාත්පසින්; උතුරුවා, උත්සන්නව; ඇවිදින්, අවුත්; වතුරු,(සමන්තකූටගිරිශිඛාසනැමැති වෘෂභධේනුවගේ බුරුළුබරින් පැනනැගි ක්ෂීරධාරාවක්මෙන් සිනිදු සිහිල් විමලින) ජලස්කන්ධය; පිරෙණ, සම්පූර්ණවන්නාවූ; කොන්තගංතොටින්, එනම් නදීතීර්ථයෙන්; මිතුරු, එම මිත්‍රය; එතර, පරතීරයට; යාකර, යාත්‍රාකරව.

158 ස ර සිය සිය පැරකුම් නිරිඳු පුව ත ර
ත ර හිවි මුතු සේසත් සේද අර ත ර
පෙ ර දිගහන මූකුරෙව් එත සිසිර ක ර
ව ර ම මිතුර සැහපෙව තුරෙක ප ල බ ර

158–සරසිය, පද්මබන්ධුහුගේ; සිය, ස්වකීයවූ; පුවතර, ලොකප්‍රසිද්ධවූ; පැරකුම්නිරිඳු, පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාගේ; නා මහත්කොට; හිවි, නංවනලද; අරතර, සම්රසාරවූ; මුතුසේසත්සේද, මුක්තාලම්බිතාවලම්බිත ධවලච්ඡත්‍රය මෙන්ද; පෙරදිගහන, පූර්වදිශානැමැති කාන්තා වගේ; මුකුරෙව්, දර්පණතලයක්මෙන්ද; සිසිරකර, නිශාකරයා; එත

වර, එන්නාවූ කාලයෙහි; හෙවත්. කුසුමකෙරවාදීන් ප්‍රබොධකොට, උදගිරිනිසින් ස්දපහත්කල්හි; මම්තුර, මාගේමිත්‍රය; පලබර, ඵලභරි තවූ; තුරෙක, වෘක්ෂයෙක; සැතපෙව, ශයනයකර.

159 අ ඹ ර මිණි රැසින් ගනඳුරු යන බැහැ ර
න ඹ ර පුපුදුවන පෙති එකිනෙකින් හැ ර
බ ඹ ර කැලෙහි වැද වැද දෙන තුඩුනොහැ ර
අ ඹ ර තුර පිපිස යත් පිය පිය පැහැ ර

159–අඹරමිණි, නභොමාණික්‍යයාගේ; රැසින්, රශ්මිය කරණකොට ගෙණ; ගනඳුරු, ඝනාන්ධකාරය; බැහැරයන, දුරුවෙයෙන්ද; නඹර, තාමරසයන්ගේ; පෙති, පත්‍ර; එකිනෙකින්හැර, එකින්එකවිදහා; පුපුදු වන, ප්‍රබොධකරත්ද; එහි, ඒ පද්මසමූහයෙහි; බඹරකැල, භෘංගසමූහයා; වැද වැද, උඩුනුත්පරයා අවතීර්ණව; නොහැර, අවකාශයක්නො කොට; තුඩුදෙන, චංචුප්‍රදානයකෙරෙත්ද; ඒ සූර්‍ය්‍යොදය කාලයෙහි; අඹරතුර, ගගණතලයට; පිපිස, ප්‍රවිෂ්ටව; පිය, ප්‍රියය; පියපැහැර, පක්ෂ ප්‍රසාරණයකොට; යත්, ප්‍රයානය කරත්.

160 ඇ ල ව ඉපිල පිලගන විදුලිය දු ලි ය
බ ල ව දිවනවරලින් දී දිය රැ ලි ය
නි ල ව කලක සිට කෙළිනා නොහැකි ලි ය
බ ල ව කැලණිගඟ මින්ගණ මස්කෙ ලි ය

160–ඝනවිදුලිය, දිනකර නිකර ප්‍රවර්ෂනා ඉන්ද්‍රචාපබාරාධරනිර්ඝෝෂ යෙන් ශරත් ගගණතලයට පැනනැගි කදම්බිනිමාලාන්තරයෙන් ක්ෂණ ක්ෂණයට දිලිහිවැටෙන විදුලියසේ; දුලිය, දිලිහි; ඇලව, ඉලයෙන්; ඉපිලි පිලි, ඉපිලි ඉපිලි; වරලින්, කලාපයකරණකොටගෙණ; දිදියරැලිය, දිය කඳමුදුනෙන් පැනනැගි වලි[illegible]ක්ව දක්වා; බලවදිවන බලවත්සේ ධාව නයකරන්නාවූ නිලව, නිලිනව; කලකසිට, අතීතයෙහි පටන්; නො හැකිලිය, බිලිජාලාදීන් නොපැකිල; කෙළිනා, රමනීය රුකන්යට දෙ පස නැනිතලාවැලිරැලි දිදී නෙම නොමා හැලිනසා පැනනැගෙණ ගඟුල් හැලි නිවී නික්ම ක්‍රීඩාකරන්නාවූ; මින්ගණ, මිහුසිඟු රෝහිත මුජපාවු ස සවංක සනවංක අමර නලී තුලිර කුම්භාදී මත්ස්‍යසමූහයා ඇත් තාවූ; කැලණිගඟ, කල්‍යාණී නදීප්‍රදේශයෙහි; මස්කෙළිය, එනම් නදී තීර්ථය; බලව, නිරීක්ෂණය කලමැනවි.

161 කි ර ණි නුදුල මිණිකොත් කැරලි ලෙලදි දී
පැ ර ණි නොවන හැමසඳ නවහමින් රු දී
ත ර ණි පතට අසලව උසැති පාසැ දී
කැල ණි පුරව වදුදියනා විඩා සි දී

164–කිරණිනුදුල, රශ්මීන් උජ්වලිතවූ; මිණිකොත්කැරලි, මාණික්‍ය ශෘඞ්ග මඤ්ජරීන්; ලෙලදිදී, ලීලෝපෙතකරවමින්; හැමසඳ, සදාකල්හි; පැරණිනොවන, ජරාපත්නොවන්නාවූ; නවහමින්රුදි, විචිත්‍ර චිත්‍රකර්මාභිනවකටනං කර්මාන්තයෙන් රජිතවූ; තරණිපතට, තාරානාථමාර්ගයට; අසලව, ආසන්නව; උසැති, උත්තුඞ්ගවූ; පා, ප්‍රාසාදයන්ගෙන්; සැදි, සජ්ජිතවූ; කැලණිපුරව, ලොකනාථ ප්‍රතිබිම්බාංකිරාදී නා නා රමණීරමසමන්තානන්ත විහාරශ්‍රේණීන් ප්‍රතිමණ්ඩිතවූ කල්‍යාණිනම්පුර ප්‍රවරයට; දියනා, ජලස්නානයකොට; විඩාසිදී, විහෙසසංසිඳුවා; වදු, ප්‍රවිෂ්ටවෙව.

162 ත ද නිසසර විරිඳුන්මන් සිදපසි ඳ
බ ද යසදද දිගුදිගුසට ගෙහි නොම ඳ
න ද කළ සත සව්සිරිදීමෙන් නිබ ඳ
වැ ඳ අනතුරු එනි විබිසණ සුරිඳුස ඳ

162–නිසසරවිරිඳුන්, විරූඪවූ නිශාචරයන්ගේ; හෙවත්, යක්‍ෂයන්ගේ; තද, සන්නද්ධවූ; මන්, අභිමානය; සිඳපසිඳ, ඡින්නප්‍රච්ඡින්නකොට; නොමඳ, අමන්දවූ; දිගු, දීර්ඝවූ; යසදද, යශස්නැමතිධ්වජයන්; දිගුසටගෙහි, දිශාෂ්ටයන්ත්‍රයෙහි; බඳ, බැන්දාවූ; සව්සිරිදීමෙන්, සකලසම්පත්තිදානය කිරීමෙන්; සත, සත්ත්වයා; නිබඳ, නිරන්තරයෙන්; තදකල, සන්තොෂ කළාවූ; එනි, ඒ කැලණිපුරයෙහි; විබිසණ සුරිඳුසඳ, විභීෂණ සුරෙන්ද්‍රනාමයා; වැඳ, නමස්ක්‍රියාකොට; අනතුරු, ,ඉක්බිත්තෙන්;

163 ස ඳ සිළු මලඟ නොකෙලෙස දිමුතු මුතුරු ස
බ ඳ පිළිමින් තරසර සෑය මහ උ ස
න ද මුනිසඟ දුම්ඳු නරඹා පුරා ඇ ස
වැ ඳ ඉටු මිතුරු සඳදිවුණුව සිත සතො ස

163–සඳසිළු, ඊශ්වරයාද; මලඟ, අනඞ්ගයාද; නොකෙලෙස, නික්ලෙශීන්ද; දිමුතු මුතුරුස, දීප්තිමත්වූ මුක්තාරාශීන්ද; (තුල්‍යවූ) පිළිමින්, ස්ඵටිකමාණික්‍යයෙන්; බඳ, බඳනාලද්දාවූ; තරසර, ස්ථිරසාරවූ; මහඋස, බොහෝඋද්ගතවූ; සෑය, චෛත්‍යයද; නද, නාඥනීයවූ; මුනි, සර්වඥයන්වහන්සේගේරූපයද; සඟ; සංඝයාවහන්සේද; දුම්ඳු, ද්‍රැමෙන්ද්‍රරාජයාද; ඇසපුරා, අක්‍ෂිපුරා; නරඹා, නිරීක්‍ෂණයකොට; වැඳ; අඤ්ජලිකරණයකොට; ඉටුමිතුරුසඳ, ඉෂ්ටමිත්‍රොත්තමයා; සිතසතොස, චිත්ත සන්තොෂයෙන්; දිවුණුව, දිගුණව–;

165 සඳ කැන් මිණින් යුතු බිතුපා සැඳු ල් ලේ
සඳ වන් උවන් පැකෙළිනා මඬු ල් ලේ
බලමින් මදක් ඉඳ රන්කොත් කැරැ ල් ලේ
සතොසින් පියාසරකර එමැ ඇසි ල් ලේ

164–සඳකැන්මිණින්, චන්ද්‍රකාන්තිපාෂාණයෙන්; යුතු, යුක්තවූ; බිතු, භිත්තීන්ඇත්තාවූ; පා, ප්‍රාසාදවල; සැඳුල්ලේ, චන්ද්‍රිකාසාලයෙහි; සඳ වන්, පූර්ණචන්ද්‍රයාවැනිවූ; උවන්පා, මුඛයත් ප්‍රකාශකිරීමෙන්; කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; (කාන්තාවන්ගේ) මඬුල්ලේ, මුවමඬුලු; බලමින්, නිරීක්ෂණයකරමින්; රන්කොත්කැරැල්ලේ, සුවර්ණශෘඞ්ගමඤ්ජරියෙහි; මදක්, ස්වල්පකාලයක්; ඉඳ, නිෂන්නව; එමඇසිල්ලේ, ඒක්ෂණයෙහි: සතොසින්, සන්තෝෂයෙන්; පියාසරකර, පක්ෂපත්‍ර ප්‍රසාරණයකරව.

165 ගගා මිණි වෙණින් ගෙණසිතිඳු තන්න ගා
නගා සුරඹ ලිය ගීකියන මනර ගා
රගා මිතුරු තුමලඳ බොලඳ කොමල ගා
ලගා නොවැද වැද යාගන්න සුරම ගා

165–මිණිවෙණින්, කිංකිනිවීණාවෙන්; සිතිඳුතැන්නගාගෙණ සැනි ඹවූ තන්ත්‍රීන් ආරූඪකරගෙණ; ගගා, නැවත නැවත ගායනාකරමින්; මනරගා, සිත්කළුවූ; ගී, ගීතිකාවන්; කියන, කියන්නාවූ; සුරඹ දිව්‍යාප්ස රාවන්වැනි, අනගා, අනර්ඝවූ; ලිය, කාන්තාවන් කෙරෙහිද; ලඳබොලඳ, ලාබාලවූ; කොමලඟ, තරුණාඞ්ගනාවන්ගේ; රගා, නෘත්‍යයෙහිද; මිතු රුතුම, මිත්‍රෝත්තමය; ලගානොවැද, ලග්නනොවී; සුරමගා, ආකාශ මාර්ගයට; වැද, ප්‍රවිෂ්ටව; යාගන්න, ප්‍රයාණයකරන්න.

166 වත්තල කුසුම තුගු නැහැ ඔරැදි හැමස ඳ
වත්තල පල නිමල පියයුරු බරිනිත ඳ
වත්තල නලල සුදිලිය ලිය රැඳිනොම ඳ
වත්තල සොඳුරු සිරිදූකයන් මදක් ඉ ඳ

166–හැමසඳ, සැමකල්හි; වත්තලකුසුම, තිලපුෂ්පාකාර; තුඟු, උස්වූ; නැහැ, නාශිකාවන්ගෙන්; ඔරැදි, බබලන්නාවූ; නිමල, නිර්මලවූ; වත් තලපල, නෘණරාජඵලාකාර; පියයුරුබරිණ, පයෝධරභාරයෙන්; නද, නන්දනියවූ; නලල, ලලාටයන්හි; සුදිලිය, අතිසයින්දිලියෙන්නාවූ; වත් තල, තිලකයන්ඇත්තාවූ; නොමද, බොහෝවූ; ලිය, කාන්තාවන්ගෙන්; රැඳි, රජිතවූ; වත්තල, එනාමිනාදිත ප්‍රදේශයෙහි; සොඳුරු, සුන්දරවූ; සිරි, ඓශ්වර්‍ය්‍යය, දූක; දර්ශනයකොට; මදක්, ස්වල්පකාලයක්; ඉඳ, නිෂ න්නව; යන්, ප්‍රයානයකරන්;

167 නෙත නිලු පුල්වන් වත පුන්සඳ සේ ය
ර ත ලවනත කෙම්පලබඳු වද සේ ය
වෙ ත එනලියන් දක දක රණලිය සේ ය
සෑ ත පෙව මදක් සකිමාබෝ වේ සේ ය

167–නිලුපුල්වත්, නිලොත්පලවැනිවූ; නෙත, නෙත්‍රයෙන්ද; පුන්සඳ සේය, පූර්ණචන්ද්‍රයාවැනිවූ; වත, වක්ත්‍රයෙන්ද; කෙම්පලබඳුවදසේය, බිම්බුපලහා බන්ධුජීවකපුෂ්පාකාරවූ;රත රක්තවූ; ලවනත, ඔෂ්ඨයෙන්ද; (සොභිතව) වෙනඑන, නමාකරඑන්නාවූ; රණලියසේය, ස්වර්ණලතා වන්වැනිවූ; ලියන්, කාන්තාවන්; දකදක, දර්ශනයකරමින්; මාබෝවේ, එනම්ග්‍රාමයෙහි; සේය, සේතුමසනකයෙහි; මදක්, ස්වල්පකාලයක්; සකි, යහළුව; සෑතපෙව, සන්තර්පිතවෙව;

168 ම තු වනු නොදන ගුරු එරහත් හිමිනිම ල
සි තු විකලින් බඳනෙහි ලම්නි උණුතෙ ල
ඇතු සහ තිරිඳු ගෙණගිය මහපොළෝතෙ ල
ඇතු බුන්වළැසියෙහි ඒදකු මග අස ල

168–මතුවනුනොදන, අනාගතයෙහිවන්නාවූ අනිෂ්ටවිපාකයනොදන; නිමල, කිසිදෝෂයක්නැති; ගුරු, ශික්ෂාචාර්යවූ;ඒ රහත්හිමි, අර්හත්වූ ඒස්ථවිරස්වාමින්වහන්සේ; සිතුවිකලින්, චිත්තභ්‍රාන්තියෙන්; උණුතෙල බඳනෙහි, උෂ්ණතෛලකටාරයෙහි; ලම්නි, සෙෂපනයකිරීමෙන්; තිරිඳු, අනර්ථකාරීවූ ඒකල්‍යාණ තිස්සනම් නරේන්ද්‍රයා; ඇතු සහ, ආරූඪව උන් චිරදවාහනයත්සමග; පොළෝතෙල ගෙණගිය, පෘථිවිතල විවෘතව මහානරකයට ගෙනගිය මාර්ගය; ඇතුබුන්වළෙසියෙහි, ඇතුබුන් වළයසිකියති; මගඅසල, නා යනමාර්ගාසන්නයෙහිවූ; ඒ, එය; දකු, නිරීක්ෂණයකර.

169 න රි ඳු කිරණ කිරණව රලපෙල තු ල් ල
සි නි ඳු සිහිල් මළුතුළ පල සුදුවැ ල් ල
වි හි ඳු කුසුම සුවඳැති තුරු සෙවනැ ල් ල
න ම ඳු වෙහෙර මහවත වෙත රිලමු ල් ල

169–නරිඳුකිරණ, චන්ද්‍රරශ්මිකදම්බ [illegible]නවූ; කිරණව, ක්ෂීරසාගර ප්‍රායාගේ රලපෙළතුල්ල, තරඞ්ගපඞ්ක්තියගේ ශුභ්‍රවූ; සිනිඳු,සියුම්වූ;සිහිල්, ශීතලවූ; මළුතුල, අඞ්ගනාභ්‍යන්තරයෙහි; පළසුදුවැල්ල, ව්‍යාප්තශ්වෙත පුලිනතලයෙන්ද; සුවඳැති, සුගන්ධවත්වූ; විහිඳුකුසුම, විකසිත පුෂ්පයන් ඇත්තාවූ; තුරු, රෝහිතාශොකපජ්ජන ඇසළමුඹුරු කොබෝ ලිල දෙඹ කොසඹ සල් කිතුල් මිදෙල් පොල් පුවක් ආදී වෘක්ෂයන්ගේ; සෙව නැල්ල, ශීතලච්ඡායාවෙන්ද; (ගහණවූ) මහවතවෙත, මහාමාර්ගාසන්න යෙහි; රිලමුල්ල. එනම්ග්‍රාමයෙහිවූ; වෙහෙර, ජිනවර පරිභෝගාශෙෂධාතු ගර්භකෛලාශකූටොද්භූත තොරණ ශසිකධ්වජමාලාදීන් විසිතුරුවූ ඒ විහාරයට; නමඳු, නමස්කාරකර.

170 ඉඟ සු ඟ හිසින් මොළකත් මල් දම්සැ | පි ය
රඟ අ ඟ වන අඟනන් තනහෙම් තැ | පි ය
ගඟ ල ඟ සුසැදි මල්බර සල්‍රන් ය | පි ය
මඟ ම ග අසල සිරිසර වැලිගම් පි | පි ය

170-ඉඟසුඟනිසින්, ශෝභනවලාකාර සිඟුවලඟ මස්තකයෙන් දරන්නාවූ; මල්දම් සැටියෙ, පුෂ්පදාමාකාරවූ; මොළකත්, මෘදුකොමල දිගු රතන් ඇත්තාවූ; නෙම්නෑවිය, කනකප්‍රභායන්ගේ; රඟ, ආකාරය; අඟවන, අඟවන්නාවූ; තන, මකරධ්වජාභිෂේක හෙමඝටසණ්ඨාන උරෙහත්සාපිත වටමටසිලුවූ තද පියයුරත්ඇති; අඟනන්, සලෙල දන මන නයනනට රඟමිඬුළුවූ පරම රුචිර යෞවනාඟනාවන් ඇත්තාවූ, ගඟලඟ, ගඟා සමීපයෙහි; සුසැදි, සුසජ්ජිතවූ; මල්බර, පුෂ්පභරිතවූ; සල්රම්යවිය, සාලද්‍රැම යෂ්ටිඇත්තාවූ; වැලිනම්පිටිය, වැලිගම්පිටියනම් දනව්වෙහි; මඟ අසල, මාර්ගාසන්නයෙහිවූ; සිරිසර, ඉසුරු සාරය; මඟ, නිරීක්ෂණයකර;

171 රැ දි ඉව්රස පුල්නාමල් වෙල | ප තු ර
බැ දි නිල්වරල ගෙනහැර හර කළ | ප තු ර
ඇ දි සළු සමග ලිය පැන පැන කල | ප තු ර
කි දි ගොඩ හොය කෙළිනුදුක තොසතල | ප තු ර

171-ඉව්රස, නදීවරාසන්නයෙහි; රැඳි, රජිතවූ; නා, නාගවෘක්ෂයන්ගේ; වෙලපතුර, වෙලෙප්හි; පුල්, පිපියාවූ; මල්, පුෂ්පයන්; ගෙණහැර, ග්‍රහණයකොට; කළ, කරණලද්දාවූ; හර, පුෂ්පමාලාවෝ; අතුර; අභ්‍යන්තරයෙහිලා; බැඳි, බඳනාලද; වරල, නීලකෙශ කලාපඇති; ලිය, ස්ත්‍රීසමූහයා; ඇඳි සළුසමඟ, අවශාදිතවස්ත්‍රසා; කලපතුර, කලපු අභ්‍යන්තරයට; පැන පැනා, ස්පන්දනයකරමින්; කිඳිගොඩ හොය; එනම් අනග්නියෙහි; කෙළිනුදුක, ක්‍රීඩාකරණුවන්නරඹා; තොස, සන්තොෂය; තලපතුර, තාගේ හෘදයාභ්‍යන්තරයෙහි පතුරව.

172 ලෙ සි නේ සෙමෙර පෙල මලවලත | ලා නේ
රි සි නේ ලපළු බිඳකන මුවර | ලා නේ
තොසි නේ මෙහැම දුටුදන මන වෙ | ලා නේ
ගො සි නේ නරඹ සිරිබෝනා ව | ලා නේ

172-සෙමෙරපෙල ලෙසිනේ, චාමරපඞ්ක්තියක්සේ; මලවල,මලින්ගැව සිගත්තාවූ; තලානේ, වල්තලායෙහි; රිසිනේ, ගොචරතෘෂ්ණායෙන්; ලපළු, අභිනව කිසලයන්; බිඳ, භෙදකොට; කන, භක්ෂණයකරන්නාවූ;

යෙන්, නොයෙක් තන්හි, මුවරල, සුරත් පළුදෙලෙහි දිවුලලා පියගෙ පිය ටබෙදනි සංසර්ගය සපර්ශ රතික්‍රීඩා සැපවිඳිමින් මත්ව කෙළිනාකෙහෙල් මෘත පඩිතනින් ඇත්තාවූ; මෙනැමසිරි, මේ ආදී නොයෙක්වනඉසුරු, ඳුවු, දර්ශනීයකලාවූ; දන, ජනයාගේ; මන, චිත්තය; වෙලාතේ, වෙඩ ණයකලාවූ; සිරි, ඓශ්වර්‍ය්‍යඇති; බෝනා වලාතේ, එනම් වනප්‍රදෙශය; ගොසිතේ, කිඳිගොඩ නොසිත් ගොස්, නොසිතේ, සන්තොෂයෙන් නරඹ, නිරීක්ෂණයකර;

173 නැරමුවේ පියලිය කියන රසකො ට  
ගීලමුවේ පුරමින් සවණ කරතු ට  
බාගමුවේ ගත්ගොදුරට ලොබනොකො ට  
මීගමුවේ ගෙමුවෝ සිටිති හැම්වි ට

173–මුවේ, මුඛයෙන්; නැර, නොහැරම; පියලිය, ප්‍රියකාන්තාවන්විසින්; රසකොට, මධුරසම්භාෂණයෙන් යුක්තව; කියන, කථනය කරන්නාවූ; ගී, ගීතිකාරාවය; සවණකර, ශ්‍රවණයකොට; ලමුවේ පුරමින්, හෘදයපුරා; තුට, සන්තුෂ්ටව; මුවේ, මුඛයෙන්; බාග, අර්ධයක්; ගත්, ග්‍රහණයකලාවූ; ගොදුරට, තෘණගොචරයට; ලොබනොකොට, ලෝභනොකොට; ගෙමුවෝ, ගෘහමෘගයෝ; හැමවිට, සැමකල්හි; මීගමුවේ, එනම් ජනපදයෙහි; සිටිති, සිටිත්;

174 පැ ල පෙර ගිරි රද දකිනෙව් ඔවුනොවු න  
දු ල දින මිණි සඳ කිරුළෙන් සියමුදු න  
ක ල සුල කුලු ඒ නරඹා නොවගම න  
කො ල තුරු තුරක වැද නිදිගත් රතනුව න

174–පැලපෙරගිර, පශ්චිම පූර්වපර්වත නැමති; රද, රාජයන්; ඔවුනොවුන, අන්‍යොන්‍යයන්; දකිනෙවු, දක්නාපිණිස; සියමුදුන, ස්වකීය මස්තකයෙහි; දල, දිලියෙන්නාවූ; දිනමිණි, සූර්‍ය්‍යයාද; සඳ, චන්ද්‍රයාද; (යන) කිරුළෙන්, කිරීටයෙන්; කළසුලකුලු, අලංකෘතකලාවූ; ඒ, ඒ කාලයෙහි ශොභාව; නරඹා, නිරීක්ෂණය කොට; නොවගමන, ගමන්නවත්වා; රතනුවන, කෝකිල පක්ෂිරාජයා; තුරක, වෘක්ෂයක; කොලතුරු, ඝනනීල ඡදනාන්තරයෙහි; වැද, අවතීර්ණව; නිදිගත්, නිද්‍රාග්‍රහණය කරත්;

175 දි එනු නිසා කල තුරුමල් කළුවර ල  
මැළුනු වර සැලි පැලසිඳු යහන්තු ල  
ඇළුනු නෙතෙයි නිදි දුහැවැද ගුවන්ත ල  
කුළුනු දියුණු නුඹයත් රැවිදිදීගෙ ල

175–නිශාකල, රාත්‍රිවනිතාවගේ; කළු, තිමිරනැමති; විරල, කේශකලාපයෙහි; දිළුනු, දීප්තිමත්වූ; තුරුමල්, තාරකානිකරනැමති පුෂ්පසමූහය; පැලසිඳු, පශ්චිම සාගරනැමති; සයනතල, සයනාසනාන්තරයෙහි; සැලී, වැගිරගොස්; මැළුනුවර, මලිනවූකල්හි; නෙතනසි, නේත්‍රයෙහි; ඇළුනු, ඇළුනාවූ; නිදි, නිද්‍රාව; දුහැ, දුරුකොට; භුවන්තල, නභස්තල යට; වැද, අවතීර්ණව; ගෙළෙ, ගලයෙහි; රුවිදිදී, රවිප්‍රතිරවදෙමින්; කුරුළුදියුණු, කරුණාවබීන කළාවූ; නුඹ, යුෂ්මත් තෙම; යන්, ප්‍රයාන යකරත්;

176 හෝප්පු වේ  සනහා මග දෙපස මහ විල්හි  ය
තෝප්පු වේ  නම් පියසින් යාගන්නිවී සැනහි  ය

176 මගදෙපස, මාර්ගයේ උභය පාර්ශ්වයෙහි; මහ විල්හිය, මහා තඩාගයන්හි; (සිට) හෝප්පුවේ, බැසගත වාරිමාර්ගයන්හි; සනහා, ස්නානය කොට; නිවී, සීතීභූතව; සැනහී, ශාන්තව; තෝප්පුවේනම් පියසින්, එනම් ප්‍රදේශයෙන්; යාගන්, යාත්‍රාග්‍රහණය කර;

177 පානව  බට මුවගණනෙත් පිළිරුව  ට
මානව  මින් ලැගි රුවටෙන සමගම  ට
මානව  හොයින් එතරව සෙද බැසමග  ට
පානව  යාකර මමිතුර සිතුලෙස  ට

177–පානව, ජලපානයපිණිස; බට, අවතීර්ණවූ; මුවගණ, මෘගසමූහයා; අවට, හාත්පස; නෙතපිළිරූ, නෙත්‍ර ප්‍රතිබිම්බරූපයන්; (දර්ශනය කොට) සමනමට, සංභෝගයට; මානවමත්; සිත්එලවා; ලැගි, ලක්නව; රුවටෙන, රුවටෙන්නාවූ; මානව හොයින්, එනම් අහස්නියෙන්; එතරව, පාරප්‍රාප්තව; සෙද, එම ඇසිල්ලෙන්ම; මගට බැස, මාර්ගාවතීර්ණව; පානව, ප්‍රසන්නව; මමිතුර, මාගේමිත්‍රය; සිතුලෙසට, කැමතිපරිද්දෙන්; යාකර, යාත්‍රාකර;

178 සීරා  ලෙසින් උල්තියුණුව තුඟු අඟි  නී
සාරා  දෙරණ පස්සියො ලහෙහි ඉසිම්  නි
සූරා  මහත් කොට පිළිමල්න දකිමි  නී
මාරා  විලා සිටිති වනම්වූ මේ ලෙසි  නී

178–උල්, උල්වූ; තියුණු, තීක්ෂණවූ; තුඟු, උස්වූ; අඟිනී, ශෘංගයෙන්; දෙරණ, පෘථිවිය; සාරා, සාරමින්; සියොලඟනි, සකලශරීරයෙහි; පස්,

පාංශුපටලය; ඉසිම්නි, විසුරුවමින්; පිළිමල්න, ප්‍රතිමල්ලවයන්; දකිමිනී, දර්ශනයකරමින්; සී රණලසින්, සිංහනාදයෙන්; මහත්කොට භයානකභ ඬින්; සුරා, තැප්ලමින්; මෙලෙයිනි, මේ යථොක්තලක්ෂණයෙන් යුක්තවූ; වනම්වූ, වනමහිෂයෝ; මාරවිල, එනම්වල්හි; සිටිනි, සිටිත්;

179 කණත පැමිණි අදුනදැයුග නෙත් පෙ ටි ය
සු නත දෙබැම යුග තන ගනරන් තැ ටි ය
තණෙනත සිත සතුටුකරවන ලියසි ටි ය
ව ණ ත බැරි අනත සිරි පිරි නිකපි ටි ය

179–කණතපැමිණ්, කර්ණාන්තයට පැමිණියාවූ; හෙවත් දිඝවූ; යුග නෙත්, නෙත්‍රයුග්මයෙහි; අදුනදැ, අජනාලෙපකොට; පෙටිය, සහස්දල යන්ගේ විලාසදක්වමින්; සුනත, යහපත්ව නැමුනු; දෙබැම, භ්‍රැයුග්ම යක්ඇති; ගණරන්තැටිය, ස්වර්ණකලශපාත්‍රාකාරවූ; යුගතන, පයොධර යුගලඇති; තණෙනනසින, තාගේ නෙත්සිත්; තුටුකරවන, සතොෂක රවන්නාවූ; ලිය, කාන්තාවන්; සිටිය, සිටින්නාවූ; අනතසිරිපිරි, අනන්ත ඓශ්වර්යයෙන් පිරුණාවූ; නිකපිටිය, එනම් ග්‍රාමය; වණත, වර්ණනා කරත් හොත්; බැරි, භාරසි; නොපිළිවනැසි සේසි.

180 කලා සපිරි සඳසේ සසලපින්යු ත
නිලා තිබෙන දෙනුවන් සමග උවන ත
දූ ලා සිටින රන්ලිය වන් ලියඅන ත
ස ලා වතට වැද දූකයන් ලෙසටසි ත

180–සසලපින්යුත, ශශලාංඡනයෙන්යුක්තවූ; කලාසපිරි, ෂොඩශකලා වෙන් සම්පූර්ණවූ; සඳසේ, චන්ද්‍රයා වැනිවූ; නිලාතිබෙන, නීලවර්ණයෙන් තිබෙන්නාවූ; දෙනුවන්සමග, නෙත්‍රයුග්මයෙන්හා; දූලා, දිලියෙන්නාවූ; උවනත, මුඛමණ්ඩලයෙන්ද යුක්තව; සිටින, සිටින්නාවූ; රන්ලිය වන්, ස්වර්ණලතාවන්වැනිවූ; අනත, අප්‍රමාණවූ; ලිය, කාන්තාවන් ඇති; සලාවතට, එනම් පට්ටනමට; සිතලෙසට, සිත්වූපරිද්දෙන්; වැද, අවතීර්ණව; දූක, (නගරශ්‍රී) දර්ශනයකොට; යන්, ප්‍රයානය කරන්;

181 මනා ලෙසට තරඟින් රැගෙණ වෙල ල සේ
වනා තිබෙන තැන තැන දිමුතු මුතුරැ සේ
උනා නොහැර විද විද සිදු ලියපහ සේ
සිනා ගනෙවු නිරද තොසිනි නොකම ගේ

181–මනාවලසට, යහපත් පරිද්දෙන්; තරඟින්, ඌර්මිවෙගයෙන්; රළගණ, ග්‍රන්ථනයකොට; වෙල ලසේ, වේලාන්තරයෙහි; තැන තැන, තන්හි තන්හි; වනාතිබෙන, විසුරුවාතිබෙන්නාවූ; දිමුතු, දීප්තිමත්වූ; මුතුරළයේ, මුක්තාරාශිය; කෙබඳු වීදයත්? කිරද, සමුද්‍රනැමති වල්ලභයා; සිදුලිය, මණිමෙඛලාවගේ; පහසේ, ස්පර්ශයෙහි; අත, හස්තය; උනානොනැර, ඌනත්වයට නොපමුණුවා; විද, වලද; නොසිත්, සන්තෝෂයෙන් යුක්තව; නොකමසේ, අවකාශයක්නොව; සිනාගතෙවූ, හාස්‍යයකරන්නාක්මෙනි,

182 පැල දිගුවෙණු ර සරසන කොතාඹු **මිණිර** සිත්
දැල රිවි බිඹුබබලන වෙසෙස සහර සිත්
දෙල සඳපිහිටි මුත්තෙස්සරම දුක තො සිත්
ලෙල තුගුතුරෙක වැද සැනපෙන්න සිතුලෙසි න්

182–කොතාඹු මිණිරසින්, කෞස්තුභමාණික්‍යයාගේ රශ්මිය කරණකොටගෙණ; පැලදිගු, පශ්චිමදිශානැමති; වෙන්, විෂ්ණු දිව්‍යරාජයාගේ; උරසරසන, දසරුවඅලංකාරකරන්නාක්මෙන්; දල, මහත්වූ; රිවිබිඹු, සූර්‍ය්‍යමණ්ඩලය; සහරසින්, රශ්මින් සහිතව; වෙසෙස, විශෙෂයෙන්; බබලන, භ්‍රාජිතවත්ම; මුත්තෙස්සරම, ඊශ්වරමුනියාගේ මුත්තෙස්සරම යන නාමයකින් යුක්තවූ පට්ටනමෙහි; පිහිටි, පිහිටියාවූ; දෙලසඳ, මහෙශ්වර දිව්‍යරාජයා; දුක, දර්ශනයකොට; තොසින්, සන්තොෂයෙන්; ලෙල, ලීලොපෙතව; තුගුතුරෙක, උස්වෘක්ෂයකට; වැද, අවතීර්ණව; සිතුලෙසින්; සිත්වූ පරිද්දෙන්; සැනපෙන්න, සයනයකරන්න.

183 යො න් පැලදිගු දලරැඳි මෙන් තලාටි ක
ව න් පැල සිඳු මත කෙළිනා සදිවු ස ක
මි න් පිරිවර සමගව ගිය කල සස ක
ය න් මසබඳ සෙදනැගි තුරඟින් තිස ක

183–පැලදිගු, පශ්චිම දිශානැමති; යොන්, අඟනාවගේ; දලරැඳි, නලල බබලන්නාවූ; තලාටික මෙන්, තිලකයක්මෙන්ද; පැලසිඳුමත, පශ්චිම සාගරමස්තකයෙහි; කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; සදිවුසකවන්, සජීව සංඛ්‍යක්මෙන්ද; මින් පිරිවර සමගව, මිත්‍රයනැමති තාරකා පිරිවරහා, සසක, ශශාංකරාජයා; ගියකල, ගියාවූකාලයෙහි; මසබඳ, මාගේ මිත්‍රය; සෙද, එම ඇසිල්ලෙහි; තිසක, ශංකාරහිතව; තුරඟින්නැගි, නානැත පුෂ්ප ව්‍යඤ්ජනකයෙන් උල්ලසිතව; යන්, ප්‍රයාණයකරන්;

ඉක්බිති අරුණ වර්ණනාපිණ්ඩ සියඹර ඩෙබර
යනාදී සැහැල්ල කියනු.

184 සියඹර ඩෙබර මොර-කළුවර මුහුළුසුදුවර

පැසු නු රසදෙළුම්බා මහදම් බා ණ
හැසුනු කනක රම්බා නඹ රම් බා ණ

නවනාලිය වැලඳි-පුවඟු පුවඟු රැරඟ

දුනු කේ සසල ලෙලනා මල්ස ලා ණී
වැනුකේ සුවල කොලනා තල් ත ලා ණී

පලබර පර රු කී ය මගරැ කී ය
සලමදනල වැ කී ය නොවලැ කී ය
පුලවන සිරිමෙති ය එකිනෙ කී ය
බල ස පු රා ස කි ය තෝ ස කී ය

184 සියඹර, තින්තිණීවෘක්ෂය; ඩෙබර, බදරිය; මොර, පිලුය; කළුවර, කෘෂ්ණසාරය; මුහුළු, වකුලය; සුදුවර, ශුඩසාරය; (බ්ලූරුනය) පැසුනුරස, පරිපක්වරසඇත්තාවූ; දෙළුම්බා, දාඩිමවෘක්ෂය; මහදම්බාන, මහාජම්බුවෘක්ෂය; හැසුනු, සංහතවූ; කනකරම්බාන, රන්කෙසෙල්ගස්ය; අඹ, ආම්‍රය; රම්බාන, රඹය; (යනමෙයින්ද) නවනාලිය, අභිනව නාගලතාවන් ගෙන්; වැලඳි, වලජ්නවූ; පුවඟු, පූවක්ය; පූවඟු, ප්‍රියඞ්ගුය; රැරඟ, ඖෂධය; දුනුකේ, කේතකීය; සසල, චංචලවූ; ලෙලෙන, ලීලොපෙතවූ; මල්, පුෂ්පඇත්තාවූ; සලාණී, සාලවෘක්ෂපඞ්ක්තිය; වැනුකේ, වනුක්ය; සුවල කොල, සුනපත්‍රය; නා, නාගය; තල්, තාලය; තලාණී, ඇසලය; (යනමෙයින්ද) මදනලවැකිය, මන්දමාරුතය වැදී; සල, චංචලවූ; මගරැකිය, මාර්ගාවරණයකොට සිටියාවූ; පලබර, ඵලින්බරවූ; පරරුකීය, අන්‍යවෘක්ෂයන්ගෙන්ද, යුක්තවූ; එකිනෙකීය, එකිනෙකට; මෙකීය, මෛකීයපාලද්දවූ; නොවලැකීය, අලසය මානවූ; පුවල, මහත්වූ; වනසිරි, වනශ්‍රීය; සකිය, මිත්‍රය; තෝ, යුෂ්මත්තෙම; සකිය සපුරා, සවකීය අසම්පූර්ණයකොට; බල, නිරීක්ෂණයකර;

185 නිල් ල කසාකැල ගිරිනිල් ලියනාඟ ල
පුල් ල කුසුම බිඟුසහ ගල පුලිනත ල
දුල් ල හිවි සහළගර හලුදුම්න් ව ල
වෙල්ල වලවෙනැති සැපි සකි තොදූකප ල

185–නිල්ල, නිල්වූ; කසාකැල, කසාවනසමූහයෙහි; ගිරිනිල්, ගිරිකණ්ණිකාලතාය; ලියනගලා, ලාඟලිලතාය; (යනාවෙ ආදීන්ගේ) පුල්ලනුසුම, සුපුෂ්පිතපුෂ්පයන්හි; (දවන රවන.) බිඟුසහ, ගුම්ගුම්හි වැල්සේ සොබනා භෘඞ්ගසමූහයාගෙන්ද; පුලිනතල, ශිශිරකිරණ කල චාරුසන්නිභ සිනිල් සිනිඳු ඇල්බොල් පවනින් යුත් ඡායාසම්පන්න රමණීය රුකැත්ට විමලින දිගුපුළුල් ශොභාගත පුලිනතලයෙන්හා; නිවි, උස්ව; දුල්ල, දිලියෙමින්; හලු, වනගහණඑක පැහැර ආලෝකකරන්නාවූ; සහ ලහරදමින්, රුරගවෘෂයන්ගෙන්ද; අවල, ගැවසීගත්නාවූ; වෙල්ලවලවෙන, වෙල්ලවලනම් වනාන්තරයෙහි; ඇතිසැවි, ඇත්නාවූ වනඉපුරු; සකි, මිත්‍රය, දක, දශීනයකොට; නෝ, යුෂ්මත්තෙම; පල, ප්‍රයානයකර;

186 පෙම්පෙන්නා කත කුවෙනි විජසිදු ට
බිම් දු න්නා ලකහිමි කර සැපතකො ට
උම්දෙ න්නා සහ විසු නුවර ඉදිකො ට
තම්මැ න්නා අඩවිය දූනයන් නොසි ට

186–කුවෙනි, කුවෙනීනම්වූ; කත, ඉන්දීවරවන්ද නයන මුඛරම්‍යන රක්තබිම්බාධර කුචකනක කලසභාවනතවලින විචිත්‍රාකාර රෝමාවලි රජිත පෘථුලජඝනසකලසුත්පුල්ලසරසිජ පාදයෙන් රුචිරවූ දිව්‍යාඞ්ගනාව විසින්; විජසිදුට, වීරබලසිංහසේනාන කනක පාත්‍ර සිංහබාහුනම් මහරජානන්ගේ කෘතපුණ්‍යවිශෙෂ තෙජා නිරාමවූ විජය රජකුමාරයා හට; පෙම් පෙන්නා, ආදර බහුමාන දක්වමින්; ලකහිමිකර, ජිනවරපාරිභොග අසෙස භූමිප්‍රදෙශ ශ්‍රීලංකාම්පයෙහි; බිම්දුන්නා, ප්‍රබලතර කෲර නිසාචරග්‍රහණ භූමිය අවකාශකොටදී සබණ්ඩභාණ්ඩාගාරවූ සම්සතශ්‍රීලංකාම්පයෙහි සර්වනිවාසී ඝිමහිනි ශ්‍රෙනින්ගේ ප්‍රණිපාතනයෙන් නිරූපණරවූ දිව සැපත් පත් රාජ්‍යශ්‍රීයට පමුණුවා; සැපතකොට, දිවටදෙමින්; උම්දෙන්නාසහ, යක්‍ෂප්‍රලය විජයකළ විජයනම් ධරණීශ්වරකුල, කුවේනීනම් හිමිසයෝ සිතසාක්‍ෂිත්‍ය සංසර්ග ප්‍රේමයෙන් යුක්තව; ඉදිකොට, සකලනගරාඞ්ග සම්පත්තීන් සෘජුකොට නිමවනලද; නුවර, නානරය ඇති; තම්මැන්නා අඩවිය, වර්තමාන කාලයෙහි වල්වැහිබූ තම්මැන්නානම් වනාන්තරය; දක, දශීනයකොට; නොසිට, එහි අවස්ථානය නොකොට; යන්, ප්‍රයානය කරන්;

187 ලොබද වඩා රාබි මත් ක ත් ත ල ම
ස බ ද පතුරුවා දෙන රඟඅ ත් ත ල ම
ස බ ද බලා සිටතුටු කරනෙ ත් ත ල ම
නු බ ද පමානොව වැද යන් පු ත් ත ල ම

187–ලොබද, ලෝභයද; වඩා, වර්ධනයකොට; රඹී, සුරපානයකර; මත්, මනවපැමිණියාවූ; කත්තලම, ස්ත්‍රීසමූහයා; අත්තලව, හස්තතාල යෙන්; සබද පතුරුවා, ශබ්දපවත්වමින්; දෙනා, දෙන්නාවූ; රඟ, නෘත්‍යය; බලා, නිරීක්ෂණයකොට; සිට, අවස්ථිතව; සබඳ, මිත්‍රය; තලම, නාගේ චිත්තයද; නෙත්, නෙත්‍රයද; තුටුකර, සන්තොෂකරමින්; තුබද, යුෂ්මත්හුද; පමානොව, (ඒ ක්‍රීඩාදර්ශනයෙන්) ප්‍රමාදනොවී; පුත්තලම, පුත්තලමනම් කොළඹයට; වැද, අවතීර්ණව; යන්, ප්‍රයාණයකරන්;

188 දෙ වු සිරිසර දිසිවන රත් ප ර ප් පු ව
කො වු ලහනක සමගව වැස ස ර ප් පු ව
එ වු රසම් අඹ බිදිමින් ත ර ප් පු ව
ස වු සැපතින් යුතු දකු පොත් ප ර ප් පු ව

188–සිරිදෙව්, ශ්‍රීවිෂ්ණු දිව්‍යරාජයාගේ; සර, නිවාසවූ; දිසිවන, දීප්තිමත්වූ; රත්පරප්පුව, අරණ්‍යපර්වත ප්‍රාන්තයෙහි; කොවිලහනක සමගව, කෝකිලාඞ්ගනාවක් හා; වැස, වාසයකොට; සරප්පුව, ග්‍රීෂ්ම පහකොට; එවු, එනිවූ; රසම්අඹ, මධුරසහකාර ඵලයන්; බිදිමින්, භෙදකොට; තරප්පුව, අනුභවකර; සවුසැපතින්යුතු, සකලසම්පත්තියෙන් යුක්තවූ; පොත්පරප්පුව, එනම් පර්වතප්‍රාන්තය; දකු, දර්ශනයකර.

189 ලෙල රිවිරුස කලාවැල තරඟින් ගැව සි
ක ල පුරඳුරු කර ඉඳුවර පඳුර දි සී
කෙල නසරු හසසෙවු එන සුපුන් සි සී
වෙ ල පතුරෙක වැද නිදිගන්න සෙදනී සී

189–ලෙල රිවිරුස, ලීලෝපෙතවූ සූර්ය රශ්මිමාලාව; තරඟින්, තරඞ්ගයෙන්; ගැවසීකල, වැසීගියාවූ කාලයෙහි; හෙවත් පහන් කරබාගත් කල්හි; වැල, වෙලෙව්ව; පුරඳුරුකර, පුරාන්ධකාරකොට; කලා, තිමිර නැමති; ඉඳුවර පඳුර, ඉන්දීවර පජරය; දිසි, දෘශ්‍යමානවූ; සරු, ජගත් නැමති තටාකයෙහි; කෙලන, ක්‍රීඩාකරන්නාවූ; හසසෙවු, හංසරාජ යෙක්මෙන්වූ, සුපුන්සිසි, සම්පූර්ණ චන්ද්‍රදිව්‍යරාජයා; එන, ආගමනය කෙරෙද්ද; සෙද, එම ඇසිල්ලෙහි; වෙලපතුරෙක, ශාඛාන්තරයෙක; වැදු, අවතීර්ණව; නිසි, යොග්‍යාකාරයෙන්; නිදිගන්න, නිද්‍රාග්‍රහණය කරන්නේයි.

190 පෙ ර ගිරිලෙනින් බාසුරු බසුරු කේස ර
කා ර තර කෙසර පොලම්න් පිටත එනව ර
දු ර දුර පලන ගනඳුරු පිනිපා පත ර
හැ ර නිදි මිතුර බල මින් යෙහෙනි යාකා ර

190–පෙරගිරිලෙන්, පූර්වපර්වතනැමැති ගුහායෙන්; බාසුරු, භාස්කරනැමැති; බසුරු, බාහුශූරවූ; කේසර, අභින කේසර සිංහරාජයා; තර, ස්ථිරවූ; කර, රශ්මිනැමැති; කෙසරුපොළමින්, රෝමවිහිදුවා; පිටත එන වර, බාහ්‍යාගමනය කරන්නාවූ කාලයෙහි; පතර, මහත්වූ; ගනඳුරු, ඝනාන්ධකාර නැමැති; පිනිපා, හස්තියා; දුර දුර පලනා, දුරින්දුර පහවන්නාවූ නියාව; මිතුර, මිත්‍රය; නිදිහැර, නිද්‍රාවපහකොට; බලමින්, අවලෝකනයකොට; යෙහෙනි, සුවසේ; යාකර, යාත්‍රාකරන්නේයි.

191 වන ල කැ ළු ම් දසනග ලවනත හ මු ව
සි වු මැ ලි තු ම් රන්ලිය තුනුලියසු මු ව
වෙන සිතුපෙම් කරසිටිනා සලෙලු මු ව
ද නු ම න ර ම් මුවදෙර ගම නොදයො මු ව

191 ලවනත, රත්නාභරණයට; හමුව, සම්මුඛවූ; දසනග (මනසලෙලුවන් උමතුකරණ දිමුතුමුතුසේ හොබනා) දන්තාග්‍රයෙන්; වනල, විස්තීර්ණවූ; කැළුම්, කාන්තිඇති; සිවුමැලි, සුකුමාලවූ; උතුම්, උතුම්වූ; රන්ලිය, කනකලතාවන්වැනිවූ; තුනු, තනුශ්‍රීඇති; ලිය, කාන්තාවන්ට; සුමුව, සම්මුඛව; වෙන, ඔවුන් කෙරෙහි; සිතුපෙම්කර, චිත්තප්‍රේමවඩා; සිටිනා, අවස්ථිතිකරන්නාවූ; සලෙළුමුව, (යෞවනාවනාරමකරධවජවැනිවූ) සල්ලාල සමූහයාගෙන්; මනරම්, මනෝරම්‍යවූ; මුවදෙරගම, මුවදෙරනම් ග්‍රාමයෙහි සිරිවිලස්; නොද, යුෂ්මත්හුද; යොමුව, අභිමුඛව; දනු, දර්ශනයකර.

192 සස ලි ය තරඟ පෙල කෙළනා දි යා ස ර
අස ලි ය දිමුතු මුතු සක්පිරි දි යා ස ර
බැසලි ය පැන තරණ දූක කර පි යා ස ර
මුස ලි ය මුව දෙරින් සකි කර පි යා ස ර

192 සසලිය, චංචලවන්නාවූ; තරඟපෙල, රළපඞ්ක්තියෙහි; කෙළනා, ක්‍රීඩාකරන්නාක්වැනිවූ; දියාසර, බලවත් ජලවේගයෙන්; (අවුත්) අසලිය, ආසන්නප්‍රාප්තවූ; දිමුතු, දීප්තිමත්වූ; මුතුසක්, මුක්තාසංඛයෙන්ද; දියාසර, ජලචරයන්ගෙන්ද; බැස, අවතීර්ණව; පැන, ස්පන්දනයකොට; තරණ, එතරවන්නාවූ; ලිය, කාන්තාවන්ගෙන්ද; පිරි, සම්පූර්ණවූ; ඒ ස්ථානය, දූක, දර්ශනයකොට; පියාකරසර, ප්‍රියාකර වූනාගේ පඤ්චමනම් ස්වරයපවත්වා; සකි, යහළුව; මුසලිය මුවදෙරින්, මුසලියනාම් ද්‍රෝණ මුඛයෙන්; පියාසරකර, පක්ෂපත්‍රප්‍රසාරණය කරව.

193 පැ ල දිගගන පටවැටියෙහි අවරැ දු රු
ලෙ ල දිගතින් ලූරිවි පහනය සො දු රු
ග ල න කණමිණී ගන සිරිනි ගන දු රු
වෙ ල ව ගොසින් සැතපෙවසකි තුරුමැ දු රු

193 අවරැදුරු, අපර පර්වතනැමති; පටවැටියෙහි, පට්ටවර්තිකායෙහි; පැලදිගගන, පශ්චිමදිසාභාග නැමති අඟනාවගේ; දිගතින්, දික් නැමති හස්තයෙන්; ලෙල, ප්‍රජ්වලමානවූ; සොදුරු, සුන්දරවූ; රවිපහනය, සූර්‍ය්‍යමණ්ඩල නැමති ප්‍රදීපය; ලූ, දැල්වූකල්හි; කණමිණි ගනසිරිනි, කණකමාණික්‍ය සමූහයක්හුගේ ශොභාවෙන්; ගනදුරු, ඝනාන්ධකාරය; ගලන, ගලනාකල්හි; වෙලවගොසින්, ශීඝ්‍රවගොස්; තුරුමැදුරු, පාදපමන්දිරයෙහි; සැතපෙව, නිද්‍රොප ගතවෙව.

194 එ ක් අ ත් ලෙසක් සක්වා වෙනැර වන ත ට
ස ක් අ ත් අගින් පැන වනසන මාව ත ට
දි ක් අ ත් දිනිදු අළුකළ පත සිකිනෙ ත ට
නි ක්මෙත් මැනව් නෙත නිදි හැර මිතුර ත ට

194 එක් අත්ලෙසක්, ඒකාත්මිකාකාරවූ; සක්වා, චක්‍රවාකයන්; වනතට, වනතටාකාභ්‍යන්තරයට; වෙනැර, වියෝදුකින් යුක්තව පමුණුවමින්; සක් අත්අගින්, ශාඛාවෙලෙප් මුදුනෙන්; වනසන, වනවජ්ජානාවූ;(නොහොත්) වනසන්නාවූ; විනාශයට පත්කරන්නාවූ; මාවතට, මාර්ගයට; පැන, සපඥනයකොට; අත්දික් දිනිඳු, අස්තයට ගියාවූ දිවසකරයා; (නැවත පූර්වගිරිශිඛරසත්තව) සිකිනෙතට, මොනරසමූහයාගේ නේත්‍රයන් දක්වා; අලුකළපත, ආලෝකකළාවූ මාර්ගයෙන්; මිතුර, මිත්‍රය; තට, යුෂ්මත්හුගේ; නෙතනිදි, චක්ෂුර් නිද්‍රාව; හැර, පහකොට; නික්මෙත් නික්මයාම; මැනව්, මනාවන්නේයි.

195 පැ ර ර ළ සිලිල මතුවෙමිනි එකලෙ ස
මෝරරළ උනුන් ගත වැද වැද සරො ස
නැරකෙළ කරණ කොලහල හැමදව ස
මෝර ව ළ එසිරිසර නරඹන් සියැ ස

195 රළ, තරඞ්ගපඞ්ක්තිය; පැර, පහකොට; සිලිල, ජලයෙන්; එ; ලෙස, ඒකාකාරයෙන්; මතුවෙමිනි, උත්සාපිතව; මෝරරළ, මකරසමූහය උනුන්, ඔවුනොවුන්ගේ; ගත වැද වැද, ශරීරයෙහි හැපිගැපී; සරොස

කොපසහිතව; නැර, නිරන්තරයෙන්; කෙළ, ක්‍රීඩාකොට; හැම්දවස, සඳකල්හිම; කරණකොලහල, කරන්නාවූ කෝලාහලඇති; මෝරවළ, මෝරවළනම්වූ ජලාවාටයෙහි; එසිරිසර, ඒ ශ්‍රීසාරය; සියැස, සවකීය නේත්‍රයෙන්; නරඹන්, නිරීක්‍ෂණයකරන්.

196 මු තු බෙ ල් ල න් තරඟින් විසිරි වෙරල ස
සිතු ලො ල් ල න් මුතුඅවුලන නොවි ල ස
ලඳ කෙ ල් ල න් රූදක වෙමිනි සහතො ස
නොපැකිල් ල න් මමිතුරුසඳිනි එවිග ස

196 තරඟින්, ඌර්මිවේගය කරණකොටගෙන; මුතුබෙල්ලන්, මෞක්තික ශිප්පි සමූහය; විසිරි, විකීර්ණවූ; වෙරලස; වෙලාන්තයෙහි; සිතු ලොල්ලන්, චිත්තලොලතායෙන්; නොවිලස; අලසනොවී; මුතුඅවුලන මුක්තාඵල ඇහිඳින්නාවූ; ලඳ කෙල්ලන්, කන්‍යාවන්ගේ; රූදක, රූප දර්ශනයකොට; සහතොස වෙමිනි, සන්තෝෂවෙමින්; එවිගස, ඒක්‍ෂණ යෙහි; මමිතුරුසඳිනි, මාගේ මිත්‍රෝත්තමය; නොපැකිල්ලන්, එහිප්‍ර ස්ඛලිතනොවන්.

197 පෙන් නා ර මට අඟනන් සැරසී සි ටි ය
ස න් නා ර මට වැද තල්පොල් සල්ය ටි ය
දූ න් නා ර මට එනසතුටින් දිවපැ ටි ය
ම න් නා ර මට වැද නරඹන් සිතු සැ ටි ය

197 සන්නාරමට, උපවනයට; වැද,ප්‍රවිෂ්ටව; තල් පොල් සල්සටිය, තාල නාලිකෙර සාලද්‍රැමයන්හි; පෙන්නාරමට, ප්‍රේමාරම්භයට; සැරසී සිටිය, මණ්ඩිතව සිටියාවූ; අඟනන්, අඟනාවන්ද: දූන්නාරමට, එවෘ ක්‍ෂාරොහනයට; සතුටින්, සන්තෝෂයෙන්; දිවඑන, ධාවනාකොට එන්නාවූ; පැටිය, පැටවුන්ද; මන්නාරමට, මන්නාරමනම් පට්ටනමට; වැද, අවතීර්ණව; සිතුසැටිය, සිත්වූපරිද්දෙන්; නරඹන්, නිරීක්‍ෂණය කරන්.

ඉන්බිහි ඒඅන්තරමාර්ගයෙහිවූ අරණ්‍යවර්ණනා දක්වනුපිණිස ගනපිවිතුරු යනාදී කව කීහු.

198 ගතපිවි තු රු සරහන ලෙස පද ක් ක ම
කරවන තු රු ලියනෙත රුසිරු වැ ක් ක ම
සැදිපිසි තු රු තුරුමග දෙපස එ ක් ක ම
බල මමි තු රු සඳ අත්නාල මු ක් ක ම

198 පිවිතුරු, පවිත්‍රවූ; පදක්කම, එනම් ආභරණයෙන්; ගත, ශරීරය; සරහනලෙස, අලංකාර කරන්නාක්මෙන්; නෙත, (දුටුවන්ගේ) නෙත්‍රයෙහි; රුසිරුවැක්කම, ඒ රූපශ්‍රිය වැකීම; කරවන,පහළක රන්නාවූ; ලිය, මිණිමුතුදිමුතුමල් සැනි සතිත සොහොඹු වැකොද සෙව්වත්ද සිනිදී බොලිදී නමඑලිය නාගුලි නාගවල්ලි වස්සිකි කෝසාතකී පිප්පලි ගුජ ගළුචිකා කාරවල්ලි යසියන නොයෙක් ලතා සමූහයෙන්; සැදි, සැරහුනාවූ; විසිතුරු, විචිත්‍රාකාරවූ; තුරු, සුපුෂ්පිත මන්ද මාරුතලලිත අතුපතර ඇති අශෝකපින්න වට කව්ට්ට අඹාටක අරිට්ඨ හරීටක කණ්ඨකී විභිටක කුටජ පාටලි මධුක මහීරුහශ්‍රේණීන්ගේ විලාසය; මනඳපස එක්කම, මාංගල්‍යභයපාංගීවා සන්නයෙහිවූ; අනතාල මුක්කම, එනම් වනාන්තරය; මම්තුරුසඳ, මාගේමිත්‍රානාමය; බල, විලොකනායකර.

199 හැම ස ත් සිතැගිවත් දෙනලෙසිනි සුරතු ර
සි ය ප ත් මිතුරුකුල පැරකුම් නිරිඳු ස ර
තෙදකි ත් ලෙසින් පැලඹෙන නොහැර දියතු ර
දියනෙ ත් සසල දූස දූකලගු තුරෙක සි ර

139 හැමසත්, සකලසත්වයන්ට; සිතැඟිවත්, කැමතිවස්තුව; දෙන දෙන්නාවූ; සුරතුරලෙසිනි; කල්පවෘක්ෂයක්බඳුවූ; සියපත්මිතුරුකුල, සූර්යවංශයෙහිවූ; පැරකුම්නිරිඳුසර, පරාක්‍රමබාහුනම් මහරජානන්ගේ; තෙද, තේජස්ද; කිත්, යසසද; දියතුර, ජගදභ්‍යන්තරයෙහි; නොහැර, අවකාශයක් නැතිව; පැලඹෙන ලෙසින්,ප්‍රලම්බමාන වන්නාක්මෙන්; දියනෙත්, දිවසකරයාද; සසල, නිසා නාථයාද; දූස, නේත්‍රයුගලයෙන්; (දෑහෝනොහොත් ද්‍රව්‍ය පරම්බරාන්තයෙහි) දූක, දශිනයකොට; තුරෙකසිර, වෘක්ෂමස්තකයක; ලගු, ලග්නවෙව.

200 වැ ස උදයග අග සිඳ අඳුරු පවිරු සී
ර ස කරගින් සරම්ණි සුමුගින් තොල සී
ලෙ ස මතුරණ හිඟු අඹමල් ගතරිවි සී
ඇ ස නිදිදූහැ නැගිසිට යන්න සකිනි සී

200 උදයනඅග, උදයගිරි ශිඛරයෙහි; වැස, වාසයකොට; අඳුරු, අන්ධකාර නැමති; පවිරුසි, කාලුෂ්‍යරාශිය; සිඳ, ඡේදනයකොට; තොලසී, සුහුව; රස, රශ්මිනැමති; කරගින්, හස්තාග්‍ර කරණකොටගෙණ; සර, ශරත් බිඹුනැමති; මිණිසුමුගින්, මාණික්‍යකරඬුවෙන්; රවිසී, සූර්යසිනා

මහි සෑම්හු විසින්; මතුරණලෙස, මන්ත්‍ර ජපකරන්නාක්මෙන්; බිඟු, භෘංග නැමති; අකමල, ජපමාලාව; ගත, ග්‍රහණයකළකල්හි; (හෙවත් අරුණෝද් ගමනකාලයෙහි) ඇසනිඳි, තාගේ නේත්‍රයෙහි නිද්‍රාව; දුනැ, දුරු කර; නැඟිසිට, උත්ථානයකොට; සකි, සඛීද්‍රය; නිසි, කැමතිපරද් දෙන්; යන්, ප්‍රයානයකරන්.

201 යු ත් මිහිසඳ නුඹදුන් නිනද අසමි න
සි ත් පිණමින් පෙරමග ලූ වැටුපුමෙ න
ර ත් මිණ කිරණකුරු නැගි සල්පිල් මුදු න
ය ත් මැනවිය නරඹා මාවටුපටු න

201 නුඹ, යුෂ්මත්හු විසින්; දුන්, දුන්නාවූ; (හෙවත්, මඩමෘගජලනය කුක්කුටජලනය ගෝචරජලනයයි යන ත්‍රිවිධ ජලනයන් අතුරෙන් එක් තර ජලනයෙක්හි පතුරුවනලද) නිනද, තාගේ නිර්මලවූ නාදය; (හෙවත් එඇසුවන් දෙකන්පුර විනිවිදගොස් නොතුසිතුයොමා බිතුසිතුයම් සේ අසාසිටිනා සුමිහිරි පමණනම් අතිමධුරස්වරය) අසමින, ශ්‍රවණයකර මින්; මිහිසඳ, මහිකාන්තාවගේද; සිත්පිණමින්, චිත්තප්‍රීණනයකිරීමෙන්; පෙරමග, තාගේ පූර්වමාර්ගයෙහි; ලූවැටුපුමෙන, ආලෝකකළාවූ ප්‍රදීපය න්සේ; සල්පිල්මුදුන; වාණිජ්‍යපණශාලාමස්තකයෙහි; රත්මිණ, රක්ත මාණික්‍යයන්ගෙන්, නැගි; පැනනැගාවූ; කිරණකුරු, කිරණාංකුර යෙන්; යුත්, යුක්තවූ; මාවටුපටුන, මාවටුනොවනම් පට්ටනම; නරඹා, නිරීක්ෂණයකොට; යත්මැනවිය, යාත්‍රාකළමනායි.

202 ත සි ය ත් නැල්ගෙව්ලි සරණා ගොයන්ව ල
කොසියන් නෙදසි යෙති නුඹ දුක මගඅස ල
අ සි ය ත් කෝවිලට වැද නොව කලවික ල
ව සි ය ත් නැමද දෙයියන් සිරිපාකම ල

202 ගොයන්වල, ශාලික්ෂෙත්‍රවල්හි; සරණා, සංචාරණයකරන්නාවූ; ඇල්ගෙවිලි, ශාලිගෝපිකාඞනාවන්; මගඅසල, මාර්ගාසන්නයෙහි; තසියන්න, තසියායන අනුකරණ පවත්වනකල්හි; නුඹදැක, යුෂ්ම ත්හු දර්ශනයකොට; කොසියන්නෙදසි යෙති, කොහිගමනෙක්දැයි පිළිවිසිති; (ඒකාරණයෙන්) නොවකල විකල, කාලපලිරෝධයක්නොවී; අසියත් කෝවිලටවැද, අසියබණ්ඩාරනම් දේවස්ථානයට අවතීර්ණව; දෙයියන් සිරිපාකමල, ඒ දේවතාවාගේ ශ්‍රීපාදපද්මයට; නැමද, නමස් කාරකොට; වසි, ශීඝ්‍රව; යන්, ප්‍රයානයකරන්.

203 නොමද අමා ඔතමෙන් දෙන කන ක · න ය
නි සි ද කියන ලිය ලිය ගි තැන තැ න ය
නොසිද එනා පියනද යසි දූන් දූ · න ය
ස බ ද බලන් සිරිසර නුග වෙන ව න ය

203 කනකනය; කණ්ණියක් කණ්ණියක්පාසා; දෙන, දෙන්නාවූ; නොමද, බොහෝකොට; අමාඔතමෙන්, අමාවත්කරන්නාක්මෙන්; තැනතැනය, ඒ ඒ තණ්හි; නිසිද, සිත්සේඉද; කියන, කථනයකරන්නාවූ; ලියලියගි, ශාලිගෝපිකාඟනාවන්ගේ ලයාන්විත ගීතිකාරවය; දූන දූනය, අවබොධකිරීමෙන්; එනාපියනදයසි, ඒ නාගේ ප්‍රියභාෂිවගේ නාදයසි සිනා; නොසිද, එහි අවසානයනොකොට; සබද, සුහෘදය; නුගවෙන. නුගවෙනනම්වූ; වනය, අරණ්‍යයෙහි; සිරිසර, (වසන්තම දමෝදමාන මුධරමධුකරහාර හරිනාඩිකුරිත කුසුමිත ඵලිත පල්ලව විචිත්‍ර විසාලසාල නාගපුන්නාගාශෝක කෙතකි නකාමාලාදි තුරුපතර හිමියන් බදුවැලද ගියයොහොඹු ලාගුලී ගිරි කණ්ණිකා නාගවල්ලි ගළුචිකා කාරවල්ලිආදි නොයෙක් ලියජාතීන්) සාරවූ ශ්‍රිය; බලන්, නිරීක්ෂණය කරන්.

204 දි න කර කුලග පැරකුම් රජගෙ තෙදග න
දි න දින දික් විජය කෙරෙමින් වැජඹෙමි න
එ න වර කැටි ගැසීරුඳි විලස තැන තැ න
ව න තුරු ලතඹ පලුසුමු පෙණෙනුය දුල න

204 දිනකර කුලග, සූය්‍යවංශාධිපතිවූ; පැරකුම්රජුගේ, පරාක්‍රමබාහු මහරාජෝත්තමයානන්ගේ; තෙදගන, තේජස්නැමති වහ්නිය; දින දින, දවසක්පාසා; දික්විජය කෙරෙමින්, දශදිසාවිජයග්‍රහණයකොට; වැජඹෙමින, විජෘම්භමානවෙමින්; කැටිගැසී, රාශීභූතව; එනවර, එන්නාවූ කාලයෙහි; තැනතැන, තන්හි තන්හි; රුඳිවිලස, රජිතවූවාක් මෙන්; වනතුර, ඒ නුගවෙනනම් වනාන්තරයෙහි; දුලන, දිලියෙන් නාවූ; ලතඹපලුසුමු, අභිනව රක්තපල්ලවසමූහය; පෙණෙනුය, ප්‍රකාශවන්නේය.

ඉක්බිතිව වනවණ්ණනා දක්වනු පිණිස
සුවිමල්, යනාදීකවනිහු.

205 සුවිමල් සිවුමැලි වැලි තලවිල් පිට
දෙපතුල් ලතඹුරු සරහා හැම විට
පිපිමල් රෙණු ඇඟ තවරා සුවඳට
වනකල් බිලිඳුන් කෙළි නරඹන් සිට

205 සුවිමල්, අතිශයින් නිර්මලවූ; සිවුමැලි, සුකුමාලවූ; වැලිතල විල් පිට, වාලුකානලනැමති තටාකමස්තකයෙහි; දෙපතුල්, සුරස්තමෘදු කොමල පාදතල නැමති; ලතඹුරු, අභිනව තාම්බ්‍රපද්මයන්; හැමවිට, නිරන්තරයෙන්; සරහා, සමලංකෘතකොට; සුවඳට, සුගන්ධාපිණ්ඩස; පිපි මල්, සුපුෂ්පිතපද්මපරාග ධූලිනැමති; රොන්, රජස්; ඇඟතවරා, අභ්‍යරක්ත කොට; වනකල්, වනකාන්තාවන්ගේ; බිලිඳුන්, බාලදරුවන්ගේ; කෙළි, ක්‍රීඩා විලාසය; සිට, එහි අවස්ථිතව; නරඹන්, නිරීක්ෂණයකරන්.

206 සිද ඹුව වලාරැඳි පැහැදු ලේ
පද සත් දුන නිල්මිණිගල් තලේ
නද රජහස පෙළ දිව දිව වෙලේ
වැද රුවටී සිතලොබ දුරුකලේ

206 වලා, එවනාන්තරයෙහි; රැඳි, රජමානවූ; පැහැදුලේ, ප්‍රභා යෙන් දිලියෙන්නාවූ; සිඳඹුව, සිඬාගනාවන්; නිල්මිණිගල්, ඉන්ද්‍රනීල මාණික්‍යපර්වත නැමති; තලේ, තටාකයෙහි; පද සන්දුන, පාද ශබ්ද පැවැත්වූකල්හි; නද, නිසරසරයසි සනිටුහන්කොට; රජහසපෙළ, රාජහංසපඞ්ක්තිය; වෙලේ, යුහුව; දිවදිව, නැවත නැවත ධාවනයකර මින්; වැද, ඉන්ද්‍රනීල සලනලාවට අවතීර්ණව; රුවටී, මුග්ධව; සිත ලොබ; චිත්තලෝභය, දුරුකලේ, බැහැරකෙළේයි.

207 කමින් මිරිසපලු සාමුවසමු ද
බමින් ගසාකැස් පනිමින් එස ද
ලමින් රුකුළු අත මීබිතොම ද
සෙමින් ඉඳිනි රුක් වලවැද සැම ද

207 සාමුවසමුද, ගොනගුල් සමූහයා; මිරිසපලු, මරිවපල්ලවයන්; කමින්, අනුභව කරමින්; බමින්, භ්‍රමණයකරමින්; කැස්ගසා, කැස්යන අනුකරණ පවත්වා; එසද, ඒකාලයෙහි; පනිමින්, සපන්දනයකොට; රුකුලු, බිලයන්හි; අත, හස්තය; ලමින්, ප්‍රක්ෂෙපකරමින්; තොමද, බො හෝකොට; මීබී, මධුපානයකර; සැමද, සදකල්හි; රුක්වල, වෘක්ෂමය් තකයෙහි; සෙමින්, සුවිනීත භාවයෙන්; ඉඳිනි, නිද්‍රෝපෙකරෙත්.

208 ගිරි මු දු න ත හැ ලි ය  ඇද හැ  ලි ය
පිපිව න පෙ ත ස ලි ය  සලිම  ලි ය
හෝතු රු ප ලු එ ලී ය  රතදි  ලි ය
තැ න තැ න සිව් මැ ලි ය  සුදුවැ  ලි ය

208 ගිරිමුදුනත, පර්වතමස්තකයෙන්; ඇදහැලිය, වැගිරෙන්නාවූ; හැලිය, නිර්ඣර ධාරාවෙන්ද; සලිය, ශාලවෘක්ෂය; සලි මලිය, ශාල්මලීවෘක්ෂය යනාදී ආදියෙන්; පිපිවනපෙත, පුෂ්පිතවන සමූහයෙන්ද; හෙවත් කෙරෙර් චතුරඟුල ඉන්දීවර ජම්බු ජම්බීරසන්තිරබදරි සිඳුවාරබන්ධුජීවබර්ජුරනාගපාලිභද්‍ර ක්‍රමුකතාංවූ කදම්බතිනතිරණිඅර්ජුන මූවලිඳ සිඹලි මදන වම්පෙය්‍ය පිචු මඬකණිකාර ශිරීෂයයි යන ශාඛාමණ්ඩල මණ්ඩිත වෘක්ෂසමූහයෙන්ද, රත, රක්තවර්ණයෙන්; දිලිය, දිලියෙමින්; එලිය, එල් වෙත්තාවූ; පලු, පල්ලවයන්ඇති; හෝතුරු, හෝපලුවෘක්ෂයෙන්ද; තැන තැන, ඒ ඒ තන්හිවූ; සිවුමැලිය, සුකුමාලවූ; සුදුවැලිය, ශ්වෙත වාලි කාතලයන් ගෙන්ද–

209 සු ව දැ ති නි ලු පු ලි ය  සුවිපු  ලි ය
සු පි පි නෙ ළු ම් ම ලි ය  රොණවු  ලි ය
නද දෙ න මි ලො ලි ය  මීලො  ලි ය
තැ න තැ න වන වි ලි ය  නෙත් ක  ලි ය

209 සුවදැති, සුගන්ධව්‍යාප්තවූ; සුවිපුලීය, අතිශයින් මහත්වූ; නිලුපු ලිය, නිලෝත්පලයෙන්ද; සුපිපි, සුපුෂ්පිතවූ; රොණවුලිය, රේණුයෙන් ගැවසිගත්තාවූ; නෙළුම්මලිය, නලිනපුෂ්පයන්ගෙන්ද; මීලොලිය, මධු ලෝලයෙන්; නදදෙන, නාදපවත්වන්නාවූ; මීලොලිය, භෘඞ්ගසමූහයාගෙන්ද; තැන තැන, ඒ ඒ තන්හි; නෙත්කලිය, නෙත්සතුටුකරන්නාවූ; වනවිලිය, වනනටාකසමූහයෙන්ද–

210 හෝපලු ඉඳි ත ලි ය  කොබල  ලි ය
මීඅඹ දෙ ඹ ස ලි ය  පළු දෙ  ලි ය
මුවලඹ සුවදෙ ලි ය  රස බ  ලි ය
දුටුදන සිත්වෙ ලි ය  නිති ඇ  ලි ය

210 හෝපළු, අසෝකය; ඉඳි, ඛර්ජූරය, කොබලලීය, කොවිලාරය; මීඅඹ, සහකාරය; දෙඹ, පුන්නාගය; සලිය, සදෙලය; පළු, පළුය; දෙලිය, ලබුජය; මුවලඹ, මුඛාලම්බිත වන්නාවූ; රසබලීය, බලවත්වූ රසඇති; සුවදෙලිය, සුවඳෙල්ය; (යනාදී ආදිවෘක්ෂයන්) දුටුදන, දශීතායකලාවූ; සත්ඩයන්ගේ; සිත්විලිය, චිත්තාවලිය; නිති, අනවරතයෙන්; ඇලීය, ආලයවීය.

211 සැ ට ද සු ව දැ ලි ය පියුමැ ලී ය
ක ළු ම ඩු ර ත් ඇ ලී ය මොන ර ලී ය
පැසුනු නොයෙක් ඇ ලී ය කෙත්ව ලී ය
ඇල් ගෙ වි ලි ය බැ ලී ය රු දි ලී ය

211 සැටද, සැටද නම්වූ; සුවදැලීය, සුගන්ධශාලීය; පියුමැලීය; පියුම් හැල; කළුමඩු, එනම් ශාලිය; රත්හැලීය, රත්හැල; මොනරලීය, මොනරහැල; (යන මේ ආදී) පැසුනු, පරිපාකභාවයට ගියාවූ; නොයෙක්, අනෙකවිධවූ; ඇලීය, ශාලිකාජාතීන්ගේ; කෙත්වලීය, ක්‍ෂෙත්‍රවල්හි; රුදීලීය, රූපයෙන් දිලියෙන්නාවූ; ඇල්ගෙවිලිය, ශාලිගොපිකාඞ්ගනාවන්; බැලීය, බලා යව;

212 සැ දි සු ව දැ ල් ලා වනය විපු ල් ලා
රුදි මිහි ලො ල් ලා පිපි වනවි ල් ලා
බි ද න ව ප ල් ලා කනමුවපො ල් ලා
දුටු එ සි ය ල් ලා නෙතු සිතු ඇ ල් ලා

212 සුවදැල්ලා, (යථොක්තාකාර අනේකවිධවූ) සුගන්ධ ශාලිවර්ගයාගෙන්; විපුල්ලා, බොහෝකොට; සැදි, සජ්ජිතවූ; වනය, ඒ වනාන්තරයෙහි; රුදි, රජිතවූ; පිපි, සුපුෂ්පිතවූ; වනවිල්ලා, වනතඩාගයෙහි; මිහි ලොල්ලා (මිණිමුතු කුසුම් මුවරද ලොලින් තුඩුතබා මධුරස උකා බී මත්ව සත්දිදී සනගුම් ඉදුනිල් මිණිදූල්සේ දවන රවන මත්බමරපෙලින් හා; නවපල්ලා, අභිනවපල්ලවයන්; බිද, හෙදකොට; කන, භක්‍ෂණයකරන්නාවූ; මුවපොල්ලා, මෘගපොතකයන්ගෙන්ද; යුක්තවූ, එසියල්ලා, එසියල්ල; දුටු, දර්ශනයකළවුන්ගේ; නෙතු, නේත්‍රද; සිතු, චිත්තද; ඇල්ලා, ආලයවන්නේයි.

213 පිපිමල්රොන් බරේ ය තුරු සි රේ ය
පරපුටුරැව් කෙ රේ ය අර න රේ ය
සිකිපිල් දඟ ඇ රේ ය රඟ කෙ රේ ය
දුටු ඒ සි රි ස රේ ය ලොබ කෙ රේ ය

213 රොන්බරේය, රේණුයෙන් බරවූ; පිපිමල්, සුපුෂ්පිත පුෂ්පයන් ඇති; තුරුසිරේය, වෘක්‍ෂ මස්තකයෙහි; අර, ආරූඪව ඉඳ; නරේය, බලවත්කොට; පරපුටු, කුනාල සමූහයා; රැව්කෙරේය, රාව ප්‍රතිරාව කරන්නේය; සිකි, මියුරු; පිල්, කලාප්හි; දඟඇරේය, බඩයහැර; රඟකෙරේය, නෘත්‍යය කරන්නේය; ඒ සිරිසරේය, යථොක්ත ප්‍රකාරවූ ශ්‍රීසාරය; දුටු, දර්ශනයකළ ජනයා; ලොබකෙරේය, චිත්තලෝභය කරන්නේයි.

214 පු ර  වරල මල් ඇඳ රිටි සුඹුළු ප  ට
ස ර  තිලක සිරියල් නලල හැමවි  ට
ගි ර  මුගටියන් ගෙන සිටිනා අත  ට
කි ර  න අඟනන් නරඹව සිතුලෙස  ට

214 වරල, කෙශකලාපයෙහි; මල්, පුෂ්පයන්; පුර, සම්පූර්ණකොට; රිටි, එනම් වෘක්ෂයාගේ; සුඹුළුපට, ත්වක්පට්ටයන්; ඇඳ, ආච්ඡාදනය කොට; හැමවිට, නිරන්තරයෙන්; සිරියල්, අලතාකල්කය; නලල, ලලාටයෙහි; තිලකසර, තලාටිකා සමලංකෘතකොට; ගිර, කිරපක්ෂීන්ද; මුගටියන්, නකුලයන්ද; ගෙන අනට; හස්තග්‍රහණයකොට; සිටිනා, සිටින්නාවූ; කිරනඅඟනන්, මලවලාඟනාවන්; සිතුලෙසට, සිත්වූ පරිද්දෙන්; නරඹව, නිරීක්ෂණය කරව.

215 ම  ලි න්  නොවිදි සැදි තුඟු කුමුකුතුරු දු  ල
ව  ලි න්  නැගෙන සපු නැගි පෙනකොටතුමු ල
කො ලි න්  සැලෙන ගනසා මත් මියුරු කැ  ල
ව  ලි න්  මෙසිරි දුක යන් මිතුර මනක  ල

215 නොවිදි, නොවිහිදියාවූ; මලින්, පුෂ්පයන්ගෙන්, සැදි, උපලක්ෂිතවූ; තුඟු, උස්ව; දුල, බබලන්නාවූ; කුමුකුතුරු, ක්‍රමුක වෘක්ෂයන්; තුමුල, මහත්වූ; පෙනකොට, එනයෙන් උපලක්ෂිතව; වලින් නැගෙන, ඒ වනාන්තරයෙන් උස්සාහිතවූ; සපුනැසි, නාගරාජයනැසි සිනා; මත් මියුරුකැල, මත්ත මයූර සමූහයා; සැලෙන, චංචලවත්ම; කොලින්, ඒ ක්‍රමුක වෘක්ෂයන්ගේ පත්‍රයන් කරණකොටගෙණ; ගනසා, සාන්ද්‍රච්ඡායා ඇත්තාවූ; වලින්, ඒ වනාන්තරයෙන්; මෙ සිරි, මේ ඓශ්වර්‍ය්‍යය; දුක, දර්ශනයකොට; මනකල, මනොඥවූ; මිතුර, මිත්‍රය; යන්, යාත්‍රා කරන්නේයි.

216 අ බ ල  වෙසින් ගත පඬෙරඟ රඟන ව  ර
ලක ල  කර කමල කොපුලත උරිරුන  ර
වි සු ල  මෙන් දිගත අළුකර අවරඹ  ර
ප න ල  සඳ කැළුම් දුක ලඟු තුරෙක තු  ර

216 අබලවෙසින්, දුර්වලවේශයෙන්; පණ්ඩරඟ; මහේශ්වරයා, රඟන ගත වර, නෘත්‍ය කරන්නාවූ කාලයෙහි; ලකල, අලංකෘතවූ; කමල, නිර්මලවූ; කර, සූර්‍ය්‍යමණ්ඩලය නැමති; අත, ශිවහස්තධරවූ;

කොපුල, කපාලයෙහි; උර්රු, රුධිරධාරාව; තර, බලවත්කොට; විපුලමෙන්, විස්තීර්ණකලාසේ; අවරඹර, අපරාම්බරයාගේ; දිගත, දිශාන්තරය; අඑකර, රක්තාලෝක කෙරෙමින්; පතල, ව්‍යාප්තවූ; සඳකැළුම්, සන්ධ්‍යාවර්ණ කාන්තිය; දැක, දර්ශනයකොට; තුරෙක සිර, වෘක්ෂ මස්තකයක; ලගු, නිවාසග්‍රහණය කර;

217 ගැලෙන  අවර සමුදුර තුර නිසා  කර
විදන  වලඟ නිල් ගෙලපිල් කෙකා  කර
සරත  වගල සඳ සරමල් සරා  කර
තනෙත  පුරුදු නිදි දුහැතුරෙනි යා  කර

217 අවර සමුදුරතුර, පශ්චිම සමුද්‍රාභ්‍යන්තරයෙහි; නිසාකර, චන්ද්‍ර දිව්‍යරාජයා; ගැලෙන, නිමග්නවූකල්හි; නිල්ගෙල, නීලග්‍රීවයන්; කෙකාකර, කේකානාද පවත්වා; වලඟ, වාලධියෙහි, පිල්, පිඤ්ඡකලාපයන්; විදන, විසුරුවන්ට පටන්ගත්කල්හි; සර, අනඞ්ග දිව්‍යරාජයාගේ; අත, හස්තයෙහි; සරාකර, රාගසහිතකොට; මල්සර, කුසුමාසනයන්; වගලසඳ, ගිලිහීගිය ශ්‍රෝණියෙහි; තනෙත, තාගේ නෙත්‍රයෙහි; පුරුදු, පරිචිතවූ; නිදි, නිද්‍රාව; දුහැ; දුරුකොට, තුරෙනි, වෘක්ෂයෙන් නැගී; යාකර, යාත්‍රාකරව.

ඉක්බිති ප්‍රවර රුචිර යෞවනාවතාර මකරධ්වජ විජිතවූ
පරම රමණීන්ගේ ජල ක්‍රීඩා විශේෂ දක්වනු පිණිස
මල් මිණිමුතු යනාදි කව කීහු.

218 මල්  මිණිමුතු මුවරද මුවරඳ  මිනි
කුල්  මත්බිඟු රැව් සවණත සඳ  මිනි
ඇල්  නල විඳ තුනුගිම් පා කෙරෙ  මිනි
මල්  විලසල තුඟු තුරකට අර  මිනි

218 මිණිමුතු, සුපුෂ්පිතවූ; මල්, පුෂ්පයන්ගේ; මුවරද, මකරන්ද; මුවරදමිනි, තාගේමුඛයෙහි රජමානකොට; කුල්මත්, ක්‍රීඩාවෙන් මත්වූ; බිඟුරැව්, භෘංගධ්වනිය; සවණත, කර්ණාන්තයෙහි; සදමිනි, සජ්ජිතකොට; ඇල්නලවිද, (දධිමාලිසමුද්ගත හිමව් කුලපුවදැල්වෙලි නිකුත් ගඳගජන්මද කරපුවල පුරවධුන් තනාසිප හවූ එසුවඳ තාදගෙණ එන) සිහිල් සිනිදුඇල්බොල් පවන්ලැබ; තුනුගිම්; තනුඝර්මය; පාකෙරෙමින්, පහකොට; මල්විලසල, ඒපුෂ්ප සරසන්නයෙහි; තුඟු, උස්වූ; තුරකට, වෘක්ෂයකට; අරමිනි, ආරූඪවෙමින්–

219 තු ල  සිකිපිල් වරලසබැඳ සුවඳැති මල් පටි  නා
දු ල  ඉනමිණි වැල දිසිවන දුහුලැඳ මනනද  නා
නල  ලෙලරන් ලියසේ රූ සිරූ සිවුමැලි ලිය  නා
බ ල  එවිලෙහි කෙළිනා ඉපිළිපිළී දිය මුදු  නා

219 සිකිපිල්, මියුරුකලප්හා; තුල්, සමානවූ; වරලස, දිගුගනනිල් කුන්තලකලඹ; සුවඳැති, සුගන්ධවත්වූ; මල්පටින, පුෂ්පපට්ටයෙන්; බැඳ, බන්ධනයකොට; දුලඉන, (ප්‍රඵුල්ලකපිත්ථඵලමුද්‍රනෙන් දරා දසඅඟිල් ලෙලෙන මුෂ්ටිප්‍රමාණ) සිහුවලඟ; මිණිවැල, (රක්තමණි ඉන්ද්‍රනීලවජ්‍රකබුර වෛරෝඩි මිණිආදීන් යෝග්‍යවූ) මණිමෙඛලාදාමය; දිසිවන, දිලිහෙනපරිද්දෙන්; දුහුලැඳ, තුලුල්රක්තපට්ටවස්ත්‍රාච්ඡාදනයකොට; මනනදනා, උභයතීරප්‍රවිෂ්ට සකලසත්ත්වයන්ගේ මනෝනන්දනයකොට; නලලෙල, මන්දමාරුතස්ඵලනව ලීලෝපේතවන්නාවූ; රන්ලියසේ, සුවර්ණලතා සමූහයන් මෙන්; රූසිරූ, මනොඥවූ; සිවුමැලි, සුකුමාලවූ ගාත්‍රාඇති හෙවත් රාගෝ රාගමත්ත සල්ලාලයන්ගේ සිත්නෙත් භ්‍රමණයකොට රූපාමෘත කාන්තීන් පානයකරමින්; එවිලෙහි, එම අම්බුජාතයෙහි; දියමුදුනා, සිහිල් සිනිඳු දියකඳ මුදුනෙන්; ඉපිළි ඉපිළී, පින පිනා; කෙළිනා, ජල ක්‍රීඩා කරන්නාවූ; ලිය, කාන්තාවන්; බල, විලොකනය කර.

220 නි ල්  පැහැසර සරපත් ඇතුල  නා
තු ල්  පිනිබිඳු රැස්වන් ලෙලදෙ  නා
නි ල්  මිණිවිතඔත මුතුයයි සි  නා
ක ල්  බඳ රැවටෙති ඇරගෙණ ඉ  නා

220 නිල්පැහැසර, ශ්‍යාමවර්ණ ප්‍රභාස්වරවූ; සරපත්, පුෂ්කර පත්‍රයන්ගේ; ඇතුලනා, අභ්‍යන්තරයෙහි; වන්, වහනාවූ; තුල්, බොහෝවූ; පිනිබිඳු, තුෂාරබින්දුසමූහය; රැස්වන්, රාශීභූතව; ලෙලදෙනා, ලීලෝපේතවූකල්හි; නිල්මිණිවින, නීලමාණික්‍ය භාජනයෙහි; ඔත, පතිනවූ; මුතුයයිසිනා, මුක්තාඵලයයි චෙතනාකොට; ඇරගෙණ, උකාගණිමින්; කල්බඳ, කාන්තාවෝ; රැවටෙති, මුළාවෙත්;

221 න  ද  දුනුකේ මල් රොන් ඉවුර  තේ
සෙ  ද  සැළතේ නිලුපුල් සියප  තේ
සො ද  විලඹුව දුන් තම නෙත ව  තේ
ස ඳ සු  ණු සඳසුණු එක සිරිග  තේ

221 ඉවුරෙන්, ඒ තටාක තීරයෙහි; නද, නන්දිතවූ; දුනුකේමල්, ධූජකෙතකී පුෂ්පයන්ගේ; රොන්, මකරන්දරාශිය; නිලුපුල, නීලෝත්පල

යෙහිද; සියපතේ, ශතපත්‍රයෙහිද; සෙද, ඒ ඇසිල්ලෙහි; සැළුනේ, වැගිරගියේය; (නේකුමක්මෙන්ද,) සොඳ, සුන්දරවූ; විලඹුව, සරසාඞ්ගනා වන්; නෙතවනේ, නේත්‍රය හා වක්ත්‍රයෙහි; දුන්, අඳනලද; සඳසුණු, කර්පූරචූර්ණයෙහිද; සඳසුණු, චන්දනචූර්ණයෙහිද; එක සිර, එකඝව භාවය; ගතේ, ග්‍රහණය කෙළේයි.

222 පුල් නන් මල්රෙන් පහ වි
නිල් සිලිලෙහි තිබෙනු හි වී
දුල් රිවි කිරණින් නොම තැ වී
තුල් විලඹුව පට පෙරවි වී

222 පුල්, ප්‍රඵුල්ලවූ; නන්මල්, නොයෙක් පුෂ්පයන්ගේ, රෙන්, මකරන්දරේණු පටලය; පහව්, පැහැරගොස්; නිල්, ශ්‍යාමවර්ණවූ; සිලිලෙහි, සලිලයෙහි; හිවී, පහිතව; තිබෙනු, තිබිම; කුමක්මෙන්ද? දුල්, ජ්වලිතවූ, රිවිකිරණින්, සූර්‍ය්‍යරශ්මියෙන්; නොමතැවී, තාපනයනොවූ; විලඹුව, ඒ සරසාඞ්ගනාතොමෝ; පටපෙරවිතුල්වී, පට්ටවස්ත්‍රයකින් ප්‍රච්ඡන්නවූවාක්මෙන්වී.

223 විහිදුනු රත සර වන් රත්හ සේ
ගත ඇති පැහැ වෙන් වෙනු කුම් ලෙ සේ
වෙතදිය කෙළිනා ලිය තන ලෙ සේ
දැක විළිගෙන් සිය වෙස් වලන සේ

223 විහිදුනු, විකශිතවූ; රතසර, රක්තෝත්පලයන් කෙරෙහි; වන්, අවතීර්ණවූ; රත්හසේ, සවර්ණහංසයාගේ; ගත, ගාත්‍රයෙහි; ඇතිපැහැ, ඇත්තාවූප්‍රභාව; වෙන්වනු, වියොගභාවය; කුම්ලෙසේ, කුමක් මෙන්ද? වෙත, එසරාකරයෙහි; දියකෙළිනා, ජලක්‍රීඩාකරන්නාවූ; ලිය, පරමරමණීන්ගේ; තන, පයෝධරයන්හි; ලෙසේ, අභිලාසවර්ණය; දැක, දර්ශනය කොට; විළියෙන්, අසම්භාවයෙන් ලජ්ජාවටපැමිණ; සියවෙස්, සවකීය විලාසය; වලනසේ, වංචාකරන්නාක්මෙනි.

224 නි සි ලෙස දිය පහරක් වැද කත ව ත
ඉ සි රෙත දියරෙන් නොමදව දස අ ත
සි සි රැස් පතුරුව මින් නිල් ගුවන ත
දි සි සිරි කියලිය දුටුසත නෙත සි ත

224 කත, ඒ ජලක්‍රීඩා කරණ අඞ්ගනාවකගේ; වත, මුඛමණ්ඩලයෙහි, නිසිලෙස, සුදුසුපරිද්දෙන්; දියපහරක්, ජලප්‍රහාරයක්; වැද, ආසක්තව; නොමදව, බොහෝකොට; දියරෙන්, ජලරේණු සමූහය; දසඅත, දාත්

පසිත්; ඉසිරෙන, විසන්‍ිණීවූකල්හි; නිල්ගුවනත, අභිනීලගගනතල යෙහි; සිසි, චන්ද්‍රමණ්ඩලය; රුස්පතුරුවමින්, රශ්මිවිසුරුවමින්; දිසි, දිලි යෙන්නාවූ; සිරි, සෝභාව; දුටුසන, ඒ දශිනයකළ සත්වයන්ගේ; නෙතු සිතු, නේත්‍රචිත්තයට; කියලිය, ප්‍රකාශකෙළේය.

225 බැ ස සුර ගඟ කෙළිනා සුරඟන සේ
තො ස දියුණුව දිය කෙළිනා විල සේ
ඇ ස පැහැ සරවන් පියයුරු පිණි සේ
හ ස පුල් පියුමෙන් සැදිවිල බෝ සේ

225 තොසදියුණුව, ප්‍රීතියෙන් අධිකව; දියකෙළිනා, එහිජලක්‍රීඩාක රන්නාවූ;(අඟනාවන්ගේ විලාසය) සුරගඟ, ආකාශගඟායෙහි; බැස, අව තීණීව; කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; සුරඟනසේ, දිව්‍යාඟනාවන් වැනි විය; හස, හංසයන්ගෙන්ද; උපුල්, නිලොත්පලයන්ගෙන්ද; බෝසේ, බොහෝකොට; සැදි, සැරසුනාවූ; විල,ඒපද්මාකරයෙහි; ඇසපැහැ, ඒ අඟනාවන්ගේ නේත්‍රප්‍රභාස්වරයද; පියයුරු, පයෝධරද; සරවන්, සවරූපයමෙන් විය.

226 යු ත් සිරි සන ලෙල රල සෙවෙලි නා
ප ත් එන යන තිසරිදු ඉඳිමි නා
ම ත් බිඟු වෙත කොවුලන් ගීයෙ නා
නෙත් බලනුව විලසෙහි මියුර නා

226 සිරියුත්, ශ්‍රියාවෙන් යුක්තවූ; සන ලෙලරල, සියනණින් ලීලෝ පෙන රල ඇත්නාවූ; සෙවෙලිනා, ශෛවාලයෙන් යුක්තවූ; පත්, සම් ප්‍රාප්තව; ඉඳිමිනා, සපිනව; එන යන, ගමනාගමනය කරන්නාවූ; තිස රිඳු, හංසේන්ද්‍රයන් ඇත්තාවූ; මත්, මත්තවූ; බිඟුවෙත, භෘඞ්ගයන් සමීප යෙහි; කොවුලන්, කෝකිල පක්ෂීන් විසින් කරණලද්දාවූ; මියුරනා, මධු රවූ; ගීයෙනා, ගායනාවෙන් යුක්තවූ; එහි, ඒ තඩාගයෙහි; විලස, විලා ශය; නෙත්, නේත්‍රාවලින්; බලනුව, නිරීක්ෂණය කරව.

227 පැ න හී යනමෙන රත්කල අත ලේ
පැ න හී කෙළනා මලඟට විපු ලේ
පැණ ගී නොපැකිලි කිවියර එක ලේ
පැ න ගි උවමක් නොදුටුය වික ලේ

227 අනලේ, අතුල්‍යවූ; ෙනවත් බොහෝවූ; රන්කල, සුඛකාලයෙහි; පැන, සපන්දනයකොට; හියනමෙන්, උභයපාශ්වයෙන් ඔබ්මොබ දුවන් නාවූ සරරාසියක්සේ; (නොහොත් දෙනෙරරැය් දනත්හට නම තමන්

ගේ නෙත් ශරයෙන් හදදූරුකර) පැනඟී කෙළනා, පුනඃපුනා ක්‍රීඩා කරණ, විපුල, බොහෝවූ; මලගට, කොමලඟනගේ භාවයට; පැනඟී, ප්‍රශ්‍රයෙන්; නොපැකිලි, නොහැකුළුනාවූ; කිවියර, මහදනන් සෙබඟි දනුමට සරුවරුවන්සෙ වැජඹෙන ඇජර කවිවරයෝ; එකලේ, උදකලාව; විකලේ, විශෙෂයෙන් කල්පනාකොට; පැනඟී, ජලයෙහි; උවමක්, අනන්‍යොපමාවක්; නුදුටුය, දෘශ්‍යමානනොවීය.

228 බෝමුවරදිනි යුතු තඹ රත උන් බඹ ර
මේදිගුවලින් වල් පහරෙන යනු විසි ර
යාකරු පතුවලින් උදුනඹ ඉසිව ර
සේනැගි නැබුළු දුම්රෙද සිරිපැසි නොහැ ර

228 බෝමුවරදිනි, බොහෝවූ මකරන්දයෙන්; යුතු, යුක්තවූ; තඹරත, පද්මාභ්‍යන්තරයෙහි; උන්, හැසිරඋන්නාවූ; බඹර, භෘඟජාලාව ඇතිකල්හි; මේදිගුවලින්, මේඝනැමැති දීර්ඝවාලධියෙන්; වල, ඒවනාන්තරයට; පහරෙන, පහරදුන්කල්හි; (හෙවත් ඒ වනාන්තරයෙහි වශීකරන්ට පටන්ගත් ඇසිල්ලෙහි) විසිර යනු, හේබිඟුදල් විසිරයාම; කුමක්මෙන්ද? යාකරු, කර්මාරතෙම; පතුවලින්, වල්පතුව කරණකොටගෙණ; උදුන, උස්නට; අඹඉසිවර, ජලවිසුලකල්හි; එසේ නැගි, එයින් පැනනැගාවූ; නැබුළු, මහත්වූ; දුම්රෙද; ධූම මාලාවෙහි; සිරි, සොභාව; නොහැර, ඒකාන්තයෙන්; පැසි, පහළකෙළේයි.

229 සි ය රැලිදී දි ලිවිදුමෙන් ගන ගබ අතුරතු රේ
ලි ය රැළි නිපිළිගැලෙමින් දියකෙළ නිමිඑත රේ
සි ය සර රුපු එනවාදූක නොමසිට හස අඹ රේ
සි ය කරබාගෙන එදිනත ගොස් වනිපැල සයුරේ

229 ගණගබ, මහත්ලඹදෙනනීලමේඝ කූටයාගේ; අතුරතුරේ, අන්තරන්තරයෙහි; සියරැලිදී, සතවලිප්‍රදානයකොට; දිලි, දිලිහිවැටෙන; විදුමෙන්, විද්‍යුල්ලතා පරිද්දෙන්; ලියරැලින්, ඒ ජලක්‍රීඩායෙහි නියුක්ත පරමරුචිර තරුණාඟනා සමූහයා විසින්; ඉපිළී ගැලෙමින්, උත්සන්නනිමග්නතාවයෙන්; දියකෙළ, ජලක්‍රීඩාකොට; නිමි, නිමියාවූ; එනරේ, කාලයෙහි; (හෙවත් ගොඩනැගි කල්හි) සියසර, පද්මබන්ධුවූ දිවාකරයාගේ; රුපු, ශත්‍රුවූ චන්ද්‍රයා; ඒනවාදූක, ආගමන දර්ශනයකොට; සහස, සහසුකරයා; අඹරේ, ආකාසයෙහි; නොමසිට, වාසයනොකොට; සියකරබාගෙන, ස්වකීය රශ්මීය හකුළුවාගෙන; එදිනත, එදිනාන්තයෙහි; ගොස්, ගමනයකර; පැලසයුරෙ, පශ්චිම සාගරයෙහි; වනි, නිමග්නවී.

230 පවර දිනිඳුපියවෙන් වෙමිනි යන නි සා
ලකර තඹුරුමුව හකු ලුවමිනි විග සා
තුසර කඳුළු නිලුපුල් නෙතිනි ඉස ඉ සා
එවර විලඹ බිගු නදිනඩනුදී ගො සා

230 පවර, ප්‍රවරවූ; දිනිඳු, දිනේන්ද්‍රනමැති වල්ලභයා; වෙන්වෙමිනි, වියෝවෙමින්; යනනිසා, ප්‍රයානයකරණහෙයින්; ලකල, අලංකෘතවූ; තඹුරුමුව, තාමරසනැමති මුඛය; එවිගසා, එසැණෙහි; අකුලමිනි; මුකුලිතකොටගෙණ; තුසරකඳුළු, තුසාරබිඳුන් නමැති කඳුලුරුස; නිලුපුල්නෙතිනි, නීලෝත්පල නැමති නේත්‍රයෙන්; ඉස ඉසා, වගනයකොට කොට; එවර, එකාලයෙහි; විලඹ, විල්නැමති අඹිසාව; බිඟුනදින්, භෘඟධ්වනි නැමති නාදයෙන්; දීගොසා, ඝෝෂා පවත්වමින්; අඩනු, රෝදනයකිරිමක් (වැනිවී.)

231 තද ලෙස වැළඳි සියකර අකුලා පුව ල
සෙද රිවි පියගියෙන් වැද සෝක හද තු ල
සඳ හට වදින දවකල ගෙලෙහි මුතුවැ ල
සිඳ විසුලමෙන් නුබතුර පෙනෙය තුරුවැ ල

231 පුවල, ප්‍රෞඪව; තදලෙස, තේජෝභූනව; වැළඳි, ආලිඞගනයකලාවූ; සියකර, සවකීය රශ්මිනැමති හස්තය; අකුලා, බහාගෙන; රිවිපිය, ආදිත්‍ය වල්ලභයා; ගියෙන්, ගමනයකළහෙයින්; සෙද, එම ඇසිල්ලෙහි; වැද සෝක, සෝකයෙන් යුක්තව; හදතුල, හෘදයාභ්‍යන්තරයෙහි; සඳට, එකනෙහි පහළවූ චන්ද්‍රයාහට; වදින, වාදයෙන්; දවකල, එදිවානැමති කාන්තාවගේ; ගෙලෙහි මුතුවැල, ග්‍රීවයෙහි මුක්තාහාරය; සිඳ, ජේදනයකොට; විසුලමෙන්, විස්තීර්ණකළාසේ; නුබතුර, නභාන්තරයෙහි; තුරුවැල, තාරකාසමූහය; පෙණෙය, දෘශ්‍යමාන වන්නේය.

232 මහත් ගුණැති සුදනන් තම කිලුටු ඇ ත
දියත් නොහගවා පවසනසේ නිය ත
දිගත් පුරා පිරිසිඳු සොමි රැස්අන ත
වියත් පැමිණී සඳලප දක්වා දිමු ත

232 මහත්ගුණැති, මහත්තගුණසම්පනවූ; සුදනන්, සත්පුරුෂයන්විසින්; තම, තමන්ගේ; කිළුටුඇත, මලිනභාවයක් ඇතිකල්හි; දියත්, ජගතුයෙහිම; නොහගවා, වංචානොකොට; නියත, ඒකාන්තයෙන්; පවසනසේ, ප්‍රකාශකරන්නාක්මෙන්; දිගත්, දසදිසාවෙහි; අනත, අනන්තවූ; පිරිසිදු, පරිශුද්ධවූ; සොමිරුස්, සෞම්‍යරශ්මිය; පුරා, සම්පූර්ණකොට; වියත්පැමිණි, නභාවයට පැමිණියාවූ; සඳ, චන්ද්‍ර දිව්‍යරාජයා; ලපදක්වා, ලාංජන ප්‍රකාශකෙරෙමින්; දිමුත, දීප්තිමත්වූ.

233 තු ඟු රලතින් නැගු නි රඳ සක විල ස
දි ගු හෙලිකර සඳකැන් වසත නුබකු ස
බි ඟු ගුම් ගත මිණි මුතු කුමුදු වන බැ ස
ල ගු එමතුර මමිතුරු සඳිනි සිතුලෙ ස

233 නිරඳ, නදීරාජයාගේ; තුඟු, උස්වූ; රලතින්, තරඞ්ගනැමති හස්තයෙන්; නැගු, උත්සාපිතවූ; සකවිලස, සංඛයන්මෙන්; දිගුහෙලිකර, දසදිසාලෝකකෙරෙමින්; සඳ, චන්ද්‍රයා; කැන්, සවකීය කාන්තියෙන්; නුබකුස, නභඃකුක්ෂිය; වසත, පිහිනකලකල්හි; මිණ්මුතු, සුපුෂ්පිතවූ; කුමුදුවනබැස, කෛරවවනප්‍රවිෂ්ටව; බිඟු, ෂට්පදීන්; ගුම් ගත, ගර්ජනාකරන්ට පටන්ගත්කල්හි; මමිතුරු සඳිනි, මාගේමිත්‍රෝත්තමය; එමතුර, (ඒ සරසන්නයෙහිවූ සුපුෂ්පිත) වෘක්ෂයෙහි; සිතුලෙස, සිත්වූපරිද්දෙන්; ලඟු, ලඟිනු.

234 තොරව විලඹු පිය සර මුව මුකුළුකො ට
පෙ රව ගත් නැඹුළු ගන අඳුරු සළුප ට
ත රව කරින් කරහැර රිවි දිවිකල ට
ක රව පියාසර ලැගි තුරගින් නැගි ට

234 පිය, සුයසීනැමති වල්ලභයා; නොරව, වෙන්ව ගියකල්හි; විලඹි; විල්නැමති අඞ්කාව; සරමුව, සියපත්නැමති මුඛයන්; මුකුළුකොට, හකුළුවා; පෙරවගත්, ප්‍රාවරණයකළාවූ; නැඹුළු, මහත්වූ; ගනඅඳුරු, ඝනාන්ධකාරනැමති; සළුපට කාලවර්ණවස්ත්‍රපට්ටය; නරව, බලවත්කොට; කර, රශ්මිනැමති; කරින්හැර, හස්තයෙන් පහකොට; රිවි, දිවාකරවල්ලභයා; දිවිකලට; දුටුකල්හි; ලැගිතුරගින්, තා ලග්නකළාවූ විටපමස්තකයෙන්; නැගිව, උත්ථානයකොට; පියාසරකර, පක්ෂප්‍රසාරණයකරව.

235 එ වි ල වෙත පිහිටි සැදිතුඟු පාතු ලෙ හි
නි ම ල ගහින් සිරිපැකෙලෙසග කු ලෙ හි
වි පු ල ගුණැති නතිඳුතුමන් දුක වෙ ලෙ හි
ස ස ල නොවී නමඳුව සතොස කර ලෙ හි

235 එවිලවෙත, එතටාකසමීපයෙහි; පිහිටි, ප්‍රතිෂ්ඨිතවූ; තුඟු, උස්වූ; සැදි, සජ්ජිතවූ; පාතුලෙහි, ප්‍රාසාදාභ්‍යන්තරයෙහි; නිමලගහින්, නිර්මලවූ ගාත්‍රයෙන්; කෙලෙසග කුලෙහි, කෛලාශකූටපර්වතයෙහි; සිරිපැ, ශෝභාවපහළකළාවූ; විපුල, බොහෝවූ; ගුණැති, ගුණඇත්තාවූ; නතිඳුතුමන්, නාථේශ්වරොත්තමයන්; වෙලෙහි, ඒඇසිල්ලෙහි; දුක, දර්ශනයකොට; ලෙහි, චිත්තයෙහි; සතොසකර, සන්තෝෂවර්ධනයකර; සසල නොවී, චංචලනොව; නමඳුව, නමස්කාරකර.

236 සේ ව ක  සමග පැරකුම් නිරිඳුගෙ විපු  ල
ඒ ව ක  පැමිණි සපුමල් කුමරිඳු පබ  ල
තේව ක  ගුණැගි කන්නඩිසෙන් බිඳි තුමු  ල
ජා ව ක  කෝට්ටය දක යන් මග අස  ල

236 පැරකුම්රජුගේ, ශ්‍රීපරාක්‍රමබාහුනම් මහානරෙන්ද්‍රයාගේ; විපුල, බොහෝවූ; සේවකසමග, සේනානායකයින් හා; පබල, ප්‍රබලවූ; සපුමල් කුමරු, සෙම්පගප් පෙරුමාල් විසින්; ඒවකපැමිණි, තත්කාල ප්‍රවෘත්තවූ; තේවකගුණැගි, නොයෙක් වංකගුණඇති; තුමුල, බලවත්වූ; කන්නඩි සෙන්, එනම් ශත්‍රුසමූහයා; බිඳි, භෙදකොටහළ; ජාවකකෝට්ටය, ජාවකනම් කඳවුර; මගඅසල, මාර්ගාසන්නයෙහි; දක, දර්ශනයකොට; යන්, ප්‍රයාණයකරන්නේයි.

237 රු දි  නව රිවි කිරණෙව් මිහඹ තුරුසි  ර
සැ දි  එක බඳ ලෙලදල පළු පත් පත  ර
වි දි  මගතුරු බැස වැඩවිඳ ලොබවින  ර
ඉ දි  ගුණ සකි සෙද වැද යන් සුනිලඹ  ර

237 මිහඹතුරුසිර, සහපුරුතුරුමුදුනෙහි; රුදි, රජිතවූ; නවරිවිකිර ණෙව්, අභිනව සූර්‍යරශ්මියසේ; එකබඳ, එකාබද්ධව තිබෙන්නාවූ; ලෙල, ලීලෝපේතවූ; දල, දල්‍ලු; පතර, මහත්වූ; පලු, ඵලය; පත්, පත්‍රය; (යන මෙයින්) සැදි, සජ්ජිතවූ; විදිමගතුරු, වෙදිකා පර්‍ය්‍යන්තරයට; බැස, අවතීර්ණව; ලොබවිනර, නාගේ ලෝභයපමණට; වැඩවිඳ, ඒ අනුභවකොට; සෙද, සැණෙකින්; ඉදිගුණ, සෘද්ධිගුණඇත්තාවූ; සකි, මිත්‍රය; සුනිලඹර, සුනිලාම්බරයට; වැද, ප්‍රවිෂ්ටව; යන්, ප්‍රයාණයකරන්නේයි.

238 අ සි ත  ගැඹුරු දියමත නැගි තුහුර  ල ය
වි සි ත  සුමින් පැන පැන ගැසෙන වෙල  ල ය
එ සි ත  ලොබින් ගනුවෙන දිවර වෙල  ල ය
ත සි ත  ලෙසට ලුණුහොය බල කෙළ කො  ල ය

238 අසිත, නොමිහිරවූ; ගැඹුරු, ගම්භීරවූ; දියමතනැගි, ජලකඳ මුදුනෙන් පැනනැගුනාවූ; තුහුරලය, උත්තුඞ්ගතරලසමූහයද; වෙලලය, වාළු කාන්තයෙහි; පැනපැන, ස්පන්දනයකොටකොට; විසිත, විස්තීර්ණව; ගැසෙන, භ්‍රමණයවන්නාවූ; සුමින්, සෞනමත්ස්‍ය සමූහයද; එසිතාලො බින්, එහි චිත්තාලයකොට; ගණුව, ග්‍රහණයකරගනුපිණිස; වෙලලය, එවා එකාන්තයට; එන, එන්නාවූ; දිවර, ධීවරයන්ද යන මෙයින් යුක්තවූ; ලුණුහොය, ලුණුකලපුව; කෙළකොළය, ක්‍රීඩාකරමින්; තසිතලෙසට, නාගේ සිත්වූපරිද්දෙන්; බල, නිරීක්ෂණයකර.

239 ති ලා හිබෙන එකඟන සහ පුරුව න ය
ල ළා කෙළන කොවුලඟ නෙත් සරමු න ය
නොලා ගතෙයි එතනින් ගොස් කරමෙ න ය
ප ලා යව සබඳ නොරඳ ගල්මු න ය

239 එකඟන, ඒකඝනවූ; (හෙවත් සමුද්‍රපානයෙන් නුබකුසටනැඟි, මහත්කොට ලම්දෙනනිල්ලම්බුරක්යේ) තිලාහිබෙන, ශ්‍යාමවර්ණවූ; සහපුරුවනය, මීඅඹවනාන්තරයෙහි; ලලා, ක්ෂේපනයකොට; කෙළන, ක්‍රීඩාකරන්නාවූ; කොවුලඟ, කෝකිලාඞ්ගනාවන්ගේ; නෙත්සරමුනය, නේත්‍රනැමතිශරමුඛයන්; ගතෙහි, නාගේ ගාත්‍රයෙහි; නොලා, ලන් නොකොට; එතනින්ගොස්, ඒ ස්ථානයෙන් ගමන්කර; කරමෙනය, මෙහෙයිකොට; ගල්මුනය, එනම් අඩවියෙහිද; නොරඳ, ප්‍රමාදනොවී; සබඳ, පියබඳය; පලායව, ප්‍රයානයකර.

240 පෙ ර සිරිගණ සිරිපිරි ලකට වැඩක ර
නො ර නොව මෙත් විසූ නිසසර පැහැරිව ර
ත ර බියගෙන රුස්වූතැන මුහුදු තෙ ර
කො ර සැඩි තල් උයන් දූක සිත බියනොක ර

240 සිරිපිරි, ජිනවරපාරිභෝගශ්‍රියෙන් සම්පූර්ණවූ; සිරිලකට, සම ස්ත ශ්‍රී නිකරශ්‍රීලංකාද්වීපයට; සිරිගණ, සර්වඥරාජෝත්තමයානන්වහන්සේ; පෙර, අතීතකාලයෙහි; වැඩකර, වැඩමදූරමින්; මෙනි, මේ ලඞ්කාද්වීප යෙහි; නොරනොව, අවකාශයක්නොවී; විසූ, වාසයකළාවූ; නිසසර, නිසාචර හෙවත් යක්ෂසමූහයා; පැහැරිවර, දුරුකළකාලයෙහි; තරබිය ගෙණ, මහත්වූ භීතියෙන් යුක්තව; මුහුදුතෙර, සමුද්‍රතීරයෙහි; රුස්වූ තැන, රාශිභූතස්ථානයෙහි; කොරසැඩි, රළුවූ; තල්උයන්, තාලොද්‍යාන යන්; දූක, දෘෂ්ටිනයකර; සිත, චිත්තයෙහි; බියනොකර, භීතිනොකරව.

241 ර න් ව න් සුවන් සුවසර රිවුද බියව ලා
උ න් උ න් තැනින් සෙදවිත් ගොදුරු කරලො ලා
ර න් ව න් කරල් සිඳයන ඇල් කෙතුදු බ ලා
ය න් ම න් ලෙසින් මගබැස සඳළු වැලිත ලා

241 රන්වන්, පිජරවර්ණවූ; සුවන්, කීරපක්ෂිසමූහයා; සුවසර, දෙව් සරනන්වද; රිවුද, අරිශාපකෂින්වද; බියවලා, ඇත්නාවූ භයින් පහව; උන්උන්තැනින්, ඒඒ ස්ථානයෙන්; ගොදුරුකරලොලා, ගෝචරලෝලය කොට; සෙදවිත්, ඇසිල්ලකින් අවුත්; රන්වන්කරල්සිඳයන, සුවර්ණ වර්ණශාලිමඤ්ජරින් ඡේදනයකොටයන්නාවූ; ඇල්කෙතුදු, ශාලික්ෂෙත්‍ර යන්ද; බලා, අවලොකණයකොට; සඳළු, සඳපහන්වැනිවූ; වැලිතලා,

වාලුකාසතලඇති; මනබැස, මාර්ගයට අවතීර්ණව; මන්ලෙසින්; සිත්වූ පරිද්දෙන්; යන්, ප්‍රයානයකරන්නේයි.

242 පි නා සපු කැකුළු දී සිරිබමරකැ ලී
ම නා ලෙස කරදමල්විලඳ ඉස ය ලී
න නා නයන පෙරමග පුලින පියවි ලී
සි නා වලඹකලමල් මුවෙනි නොහැකි ලී

242 පිනාසපුකැකුළු, මුනුකල චම්පකකලිකානැමැතිප්‍රදීපද; බමර කැලි, භෘඞ්ගධ්වනිනැමති; සිරි, ආශිර්වාදද; දී, පවත්වා; මනාලෙස, සිත්වූ පරිද්දෙන්; කරදමල්, කරජපුෂ්පනැමති; විලඳඉස, අසනියමල් විසුරුවා; යලි, නැවත; නයන, නාගමනයකරන්නාවූ; පෙරමග, පූර්වමාර්ගයෙහි; පුලිනපියවිලි, වාලුකාසතලනැමති පියවිලියෙන්; නනා, සරහා; වලඹ, ඒ වනනැමති අම්බිකාතොමෝ; නොහැකිලි; නොහැකිලියාවූ; මල් මුවෙනි, සුපුෂ්පිතපුෂ්පනැමති මුඛයෙන්; සිනාකල, හාස්‍යකලාක්මෙනි.

243 ර ත් දදකිකිණි දැල් බැඳි පා පෙලැති රැ ඳු
තැ ත් තැන සඳ මිණිමුතු දිගත අළුවි ඳු
න ත් සිරි සපිරි නිති කිඳුරිඳුගෙ පුරබ ඳු
ස ත් තොසවෙමින් ගොස් යාපා පටුන් ව ඳු

243 කිකිණිදැල්බැඳි, බඳනාලද කිංකිණිජාලාඇති; රත්දද, ස්වර්ණ ධ්වජයන්; රැඳු, රජමානවූ; පාපෙලැති, ප්‍රාසාදපංක්ති ඇත්තාවූ; දිගත, දිශාන්තයෙන්; තැනතැන, තන්හි තන්හි; සැදූ, සජ්ජිතවූ; මිණිමුතු, මාණික්‍යමුක්තායෙන්; අළුවිඳු, ආලෝකවිහිඳුවනලද්දාවූ; නත්සිරි, නොයෙක් ඓශ්වර්‍ය්‍යශ්‍රීයෙන්; නිති, නිරන්තරව; සපිරි, සම්පූර්ණවූ; කිඳුරිඳුගේ, වෛශ්‍රවණයාගේ; පුරබඳු, ආලකමන්දානම් පුරයබඳුවූ; යාපා පටුන, සකලනගරාංගසම්පත්තින් නිරුත්තර පුරන්දරපුරාකාරවූ යාපා පට්ටනනම් නගරයට; සත්තොසවෙමින්, සොම්නසින් යුක්තව; ගොස්, ගමනයකොට; වඳු, ප්‍රවිෂ්ටවෙව.

මෙතෙකින් මාර්ගවර්ණනාව නිමවා ගන්තව්‍යස්ථාන නියෝග පුර සිරි වර්ණනාපිණිස නරනිවිමහල් යනාදී කව කීහු.

244 න ර නිවි මහල් රැඳිරන් කැරලි මුදුන ත
ව ර තුහු දෙරටු සහ පිළිමිණිඋර දිමු ත
ක ර පෙන මඬුළු පෙල විසිතුරුවම අන ත
නි ර තුරු බලන වැනි පුරසිරිසර අන ත

244 මුදුනත, මස්තකයෙහි; රැඳි, රජමානවූ; රන්කැරලි, ස්වර්ණ මඤ්ජර්‍ය්‍යෙන් යුක්තවූ; නර, ස්ථිරවූ; නිවි, උස්වූ; මහල්, (අනෙකභූමිභෙදෙ

දින හිමගිරිශිඛරාකාර පරමවිචිත්‍රචිත්‍රකර්ම්මනිර්ම්මිතාභිධවල භිත්තිසංඝට්ටිතා දීත් ශොභාමත්ව බබලන්නාවූ ත්‍රෛභූමක පංචභූමකාදී) මහල්ප්‍රාසාද සමූහයද; වර, උතුම්වූ; තුඟු, උත්තුඟවූ; දොරටුසහ, ගොපුරවාර සහිතවූ; පිළිමිණිඋර, (දිගුවිතත කිංකිණිජාල ශ්‍රැතාවලෝකින ජුවිජුබ මුතු වැලක් වැනිවූ) නිර්ම්මලප්‍රාකාරවලයද; දිමුත, දීප්තිමත්වූ; අනන, අනන්තවූ; විසිතුරුවම, විචිත්‍රාකාරමයවූ; කරපෙනම්වූඑපෙල, තම්බාගේ එණ මණ්ඩලපංක්තියෙන් උපලක්ෂිතකොටගෙණ; අනත, අනන්තනෙම; පුර සිරිසර, එපුරෙහි ශ්‍රෛශ්වර්‍ය්‍යසාරය; නිරතුරු, අනවරතයෙන්; බලනවැනි, නිරීක්ෂණයකරන්නාක්මෙනි.

| | | |
|---|---|---|
| 245 ම න ක ල් | දසත පවනින්රන් දද අඹ | ල |
| ඉ දු නි ල් | මිණි පා සෙව්නගෙහි මුතුවැ | ල |
| පැ හැ දු ල් | සලෙල විදුලිය සහ බලා පෙ | ල |
| සු වි පු ල් | ගනැයි සෙද රඟදෙනි ගෙසිකිකැ | ල |

245 ඉදුනිල්මිණි, ඉන්ද්‍රනීලමාණික්‍යයෙන් නිමවනලද; පාඅගෙහි, ප්‍රාසාදමස්තකයෙහි; සෙව්න, සෙවුනාලබන්නාවූ; මුතුවැල, මුක්තා ලතිකා ඇති; මනකල්, මනොඥවූ; පවනින්, මාරුතවේගයෙන්; දසත, දසදිසාවෙහි; අඹල, ආවෘතතාවත්නාවූ; රන්දද, සුවර්ණධ්වජයෝ; පැහැදුල්, නීලවර්ණයෙන් බබලන්නාවූ; විදුලිය සහ, සියදහස්නණත් රැලිදිදී දිලිහීවැටෙන විද්‍යුල්ලතාව හා; බලාපෙල, (මේඝවල්ලභයාගේ ගර්ජ්ජනාව හේතුකොටගෙණ සතුටින් අහස්හි විසිරගියාවූ) මදමත් බලාකාපංක්තිය; සලෙල, චංචලවත්ම; සුවිපුල්ගනැයි, අතිසඝින් මහත් වලාඅදනනීලමේඝවට්ටුපිකායයි සිතා; සෙද, සඳකල්හිම; ගෙසිකිකැල, ගෘහමයූරසමූහය; රඟදෙනි, පිඤ්ජාවන්‍ඝීනයකොට මදයෙන්මත්ව ගොස් කේකාරව ප්‍රහිරවදී නෘත්‍යයකරත්.

| | | |
|---|---|---|
| 246 ද ල | නව සඳ වරලස ගනක ලඹ හ | ස |
| ක ල | හසවත සතපත තනරණ කල | ස |
| ල ල | නලරණ ලතගත ගමන කලහ | ස |
| ද ල | සඳ සඳ වතකත නරඹව සක | ස |

246 හසලඹ, ප්‍රචණ්ඩානිලවේගයෙන් සිඳුපාකර අහස්කුස්අරා මහත් කොට ලඹදෙන්නාවූ; ගනක, ඝනාඞ්කයක් වැනි හෙවත් මේඝමාලා වක් වැනි; වරලස, කේසකලාපයක් ඇති; නවසඳ, අභිනව චන්ද්‍රයා වැනිවූ; දල, ලලාටයක් ඇති; සතපත, සුපුෂ්පිත සහස්‍රදලාකාර; කල හස, මන්දහාස්‍යයෙන් යුක්තවූ; වත, වක්ත්‍රයක් ඇති; රණකලස, හෙම ඝටසණ්ඨානවූ; තන, යෞවනාද්‍යනඋරෙත්සාපිත වටමටසිළුවූ තදපිය යුරන්ඇති; නල, මන්දමාරුතයෙන්; ලල, ලීලෝපේතවත්නාවූ; රණලත,

ස්වර්ණලතාවැනිවූ; ගත, ගාත්‍රඇති; කලහස, හංසධෙනුන්ට බඳුවූ; ගමන, ගමන්ඇති; දලසඳ, ඊශ්වරයාගේ; සඳවන, සීමන්තිනීන් වැනිවූ; කත, කාන්තාවන්; සකසා, සහපත්කොට; නරඹව, නිරීක්ෂනයකර.

247 ල වන් පැහැති සඳකැත් සදිසි මනත ද
රු වන් බරණ දිලිතුනු එපුරගණල ද
උ වන් සුපුන් සිසි සොමිකිරණින් වොර ද
ලෙව න් සඳ කිරණ ඔදකරවිය නොම ද

247 සඳකැත් සදිසි, සායන්තනවිදුපිකාකාරවූ; ලවන්පැහැති, දන්තාවරණ ප්‍රභාඇත්තාවූ මනතද, මනොනන්දකරවූ; රුවන්බරණ, රත්නාභරණයෙන්; දිලි, දිප්තිමත්වූ; තුනු, තනුඇති; එපුරලඳගණ, ඒ පුරස්ත්‍රී සමූහයාගේ; වොරද, විරාජමානවූ; උවන්, මුඛනැමති; සුපුන්සොමිකිරණින්, සම්පූර්ණනිශාකරමරීචියෙන්; ලෙවන්සඳ, සත්සිත්නැමති; කිරණ, ක්ෂීරාර්ණවය; නොමද, බොහෝකොට; ඔදකරවිය, උත්සන්නවූයේය.

248 උ වන් ලකුළු පියයුරු රත තුල්පතු ල
නු වන් මෙඇ මිණිමුතු පියුමෙන් අව ල
දු වන් පුලින පැහැනඹ පිරුණු තුනුවි ල
ලෙව න් නුවන් බිනු වැද කෙරෙති කොලහ ල

248 ලකුළු, සමලඞ්කෘතවූ; උවන්, එපුරසරාවන්ගේ මුඛමඩලහා; පියපුරු, පයෝධරයන්ද; රත, සුරක්තවූ; අතුල්, හස්තතලයන්ද; පතුල, පාදතලයන්ද; නුවන්, දිගුනිල් නේත්‍රසමූහයද; (යත) මෙඇ, මේආදිය වැනිවූ; මිණිමුතු, සුපුෂ්පිතවූ; පියුමෙන්, පද්මයන්ගෙන්; අවල, ආකුලවූ; දුවන්, ජඝනස්ථලනැමති; පුලින, වැලිතලාඇති; පැහැනඹ, ජම්බුවර්ණප්‍රභානැමති ජලයෙන්; පිරුණු, සම්පූර්ණවූ; තුනුවිල, එපුරඹුවන්ගේ තනුනැමති තටාකයෙයි; ලෙවන්නුවන්, ලෝකවාසීන්ගේ නේත්‍රනැමති; බිනු, භෘඞ්ගසමූහයා; වැද, අවතීර්ණව; කොලහලකෙරෙති, කෝලාහල කරත්.

249 පු ලා නිලුපුලෙව් දිගු නෙතැති පැහැදු ලා
කා ලා සපිරි සඳවන් මුවැති පුරක ලා
බ ලා මිනිස්බව නොලදින් සුසුම්ල ලා
ලොලා නොවන් උන්වෙත මිතුරඳුසුසු ලා

249 පුලා, ප්‍රඵුල්ලවූ; නිලුපුලෙව්, නිලෝත්පලවැනිවූ; දිගුනෙතැති, දිගුනිල්නුවන් ඇත්තාවූ; පැහැදුලා, ප්‍රභායෙන් උජ්ජ්වලිතවූ; කලාසපිරි සඳවන්, ෂොඩශකලාවෙන් සම්පූර්ණ චන්ද්‍රයාවැනි; මුවැති, මුඛමඩලඇත්

නාවූ; පුරකලා, ඒ නගර සොභිනීන්ගේ රූපවිලාසය; බලා, නිරීක්ෂණය කොට; මිනිස්බවනොලදිත්, මනුෂ්‍යාත්මභාවය නොලත්හෙයින්; සුසුම් ලලා, මියගුඹුරුලීම්වසයෙන්; දුකුසුලා, කයිරග්‍රහණයකොට; උන් වෙන, ඒ පරම රමනින් කෙරෙහි; මිතුර, මිත්‍රය; ලොලාණනාවත්, ලෝල නොකරත්තේයි.

250 පු ර වේ දෙපස දෙර දෙර රඹ තුරු රද න
න ර තුරු නැමි සිටිනාලෙස පලබරි න
ක ර පුද කුසුම් මිහිමලහට මුවැදිලි න
ව ර නම සුතන් රකිනුව නම කරණමෙ න

250 පුරවේදෙපස, ඒ නගරවීථි උභයාන්තයෙහි; දෙරදෙර, වාර යක් වාරයක්පාසා; රදන, රජමානවූ; රඹතුරු, කදලිවෘක්ෂයන්ගේ; පලබරින, මුවලඹදෙන්නාවූ ඵලභාරයෙන්; නිරතුරු, නිරන්තරයෙන්; නැමී, නම්නිහුනව; සිටිනාලෙස, සිටින්නාවූ විලාසය; කෙබඳුදයත්? මිහිමලහට, මහිකාන්තාවහට; කුසුම්පුදකර, මිණ්දූදිරිකුසුම පූජාකර; මුවැදිලින, මුඛාජලිබඳව වැද; වර, ප්‍රවරවූ; නම්සුතන්, නමනවන්ගේ ආත්මජයන්; රකිනුව, රක්ෂාකරණුපිණිස; නමකරණමෙන, නමස්කාර කරන්නාක්මෙනි.

251 ක ර ල දල විරුදු දපබිඳ ඔ ල මො ලය
දෙ ම ළ මල ල දෙලුවර සිං හ ල බ ලය
ප ට ල ලෙලවි සුරතින් ගෙණ කෙළු කෙ ලය
ඔ ස ල වෙලව දිවතුය එහි පෙල පෙ ලය

251 විරුදු,(පාරාවාරපර්යන්ත ශ්‍රීලංකාම්පායට ශක්‍රදෙවේන්‍ද්‍රලීලාවයන් රජසිරිපැමිණි ශ්‍රීපරාක්‍රමබාහු මහිපාලෝත්තමයාගේ ආඥාවට) විරුඩව වාසයකලාවූ; කරලදල, කණ්ඨසේනාසමූහයාගේ; ඔලමොලය, ඔල මොට්ටලවූ; දප, අහංකාරය; බිඳ, භෙදකොට; (හැර එනගරය ආවරණ කොට පැලඹෙනා); දෙමළ, ද්‍රවිඩය; මලල, මලයුරය; දෙළුවර, දෙළුව රය; සිංහල, සිංහලය; (යන සුරවීරබල විනයානන්නපුරුෂසමූහයා;) සුර තින්, (තමන්ගේ) දක්ෂිණෝත්තර හස්තායුගලයෙන්; පටල, පටබඳවූ; ලෙලවි, ලීලෝපේත ආයුධයන්; ගෙණ, ග්‍රහණයකොට; කෙළකෙළය, ක්‍රීඩාකිරීම්වසයෙන්; එහි, ඒ නගරයෙහි; පෙළපෙළය, පටිපාටියෙන් යුක්තව; ඔසල, උඩහුව; වෙලව, වෙනලව්ව ගෙවත් යුහුව; දිවතුය, ධාව නායකරත්තේයි.

252 ම හ සෙ න් හෙණෙන ලෙස දසගිව් යුදට පෙ ර
වැ ස නි න් මහත් සේතුව බඳිනා එව ර
රැ ඳි මෙ න් සයුරු පැහැතෙව්නා ගත නිතො ර
සො බ ම න් රම්දූ සුරනිදු බබලයි එපු ර

252 පෙර, පූර්වකාලයෙහි; දසගිව්පුදට, රාවණයුද්ධයට; මහසෙන් ගෙණෙනලෙස, මහත් සේනාවගෙණ ශ්‍රීලඞ්කාද්වීපයට එන්නා පිණිස; මහත් වැසතින්, බොහෝ වෙහෙසව; සේතුව, වැම්බර; බඳිනාඑවර, බන්ධනය කළාවූ ඒ කාලයෙහි; සයුරුපැහැ, ඒ සාගරයාගේ ප්‍රභාව හෙවත් නිල වර්ණය; රුදිමෙන්, රජිතවූවාක්මෙන්; නිතර, නිරන්තරයෙන්; නෙවුනා, බබලන්නාවූ; ගත, ගාත්‍රයක්ඇති; සොබමන්, සොභමානවූ; රම්දු, රාමෙන්ද්‍රනම්වූ; පුරනිදු, දිව්‍යරාජයා; එපුර, ඒ පුරප්‍රවරයෙහි; බබලයි, භ්‍රාජිත වෙයි.

253 කුරිරු දරුණු තෙදරුස් ගොස් වන් නාල
සොඳුරු තරුණු සුරසරවන් මන් නාල
අනත සසිරි රුඳි එනුවර රන් නාල
නිබඳ රඳන සුරදෙව්රද පුන් නාල

253 කුරිරු, ක්‍රෑරවූ; දරුණු, රෞද්‍රවූ; තෙදරුස්, තෛජෝරශ්මීන්; ගොස්, ගමනයකොට; වන්නාල, වැදීමට ගෙයක්වැනිවූ; සොඳුරු, සුන්දරවූ; තරුණු, තරුණවූ; මන්නාල, විත්තාලයකරන්නාවූ; සුරසරවන්, දිව්‍යස්ත්‍රීන් වැනි ස්ත්‍රීන් ඇත්තාවූ; අනත, අනන්තවූ; සසිරිරුඳි, සංශ්‍රීයෙන් රජිතවූ; රන්නාල, රත්නයන්ට උත්පත්තිස්ථානවූ; එනුවර, ඒ නගරයෙහි; පුන්නාල, පර්පූර්ණ ආලයඇතිව; සුරදෙව්රද, ශක්‍රදිව්‍ය රජයා; නිබඳ, නිරන්තරයෙන්; රඳන, රඳන්නාක්මෙන් වේ.

254 ඇමසඳ බිසරුවන් නොමදව වන උ ර ණ
එලිකර දිගත දිසිමෙන් නිසිසිසි කි ර ණ
නොමහැර දිලෙන තැන තැන පිළිම්ණි තො ර ණ
එනුවර සදිසි නුවරෙක්කොද මුළු දෙ ර ණ

254 ඇමසඳ, සදාකල්හි; නොමදව, බොහෝවූ; බිසරුවන්, අභිචාරිකාවන්; උරණවන, කෝපකරවන්නාවූ; දිගතඑලිකර, දිගන්තරාලෝක කෙරෙමින්; නිසි, මනොඥවූ; දිසි, දීප්තිමත්වූ; සිසිකිරණ, ශුභ්‍රාංශුමාලාවක්මෙන්; නොමහැර, නිරන්තරයෙන්; දිලෙන, ආලෝකකරන්නාවූ; තැනතැන, තන්හි තන්හි; පිළිම්ණිතොරණ, ස්ඵටිකමාණික්‍යපාෂාණයෙන් යුත් බිහිදොරඇති; එනුවරසදිසි, ඒ යාපාපට්ටනම් නගරවරයට තුල්‍යවූ; නුවරෙක්, පුටභේදනයෙක්; මුළුදෙරණ, සමස්තභූවනතලයෙහි; කොද, කවරෙක්ද?

මෙතෙකින් පුරසිරිනිමවා රාජ කිත්හිසම්භාෂණය පිණිස
තදනෙදම්ණි යනාදී සැහැලල නිමි.

255 තදතෙද මිණිගිගිණි-යසමුතුසකෙනි පිරි තොස
මදගල වරණරල ගිරිකුළුපෙල පුව ළ
සෙදහල තුරග වැලනැගි තුඟු රල විපු ල
පසඟතුරු ගුගුරණ-දසදෙස පතළ රුදුඝො ස

නි ත ර සපිරි දසසිරි පුරණ ඔස ළ
ප ත ර රුපු පහළ නොතබා විහිදහ ළ
වි ත ර වෙසෙස් දසදම් පුන්සඳිනි දු ල
එ පු ර කිරණ සරසහ තරණෙව් පුව ල

255 තදතෙද, සන්බද්ධතේජස් නැමති; මිණි, මාණික්‍යයෙන්; ගිගිණි, ගහණවූ; තොස, සන්තුෂ්ටවූ; යස, කීර්ති නැමති; මුතුසකෙනි, මුක්තා සඞ්ඛසමූහයෙන්; පිර, පිරුණාවූ; මදගල, මදගලිතවූ; වරණරල, හස්ති සමූහ නැමති; පුවල, ප්‍රෞඪවූ; ගිරිකුළුපෙල, පර්වතකූට පඞ්ක්තියක් ඇත්තාවූ; සෙදහල, සීඝ්‍රවූ; තුරගවැල; තුරඟශ්‍රේණි නැමති; විපුල, මහත්වූ; නැගි, උද්ගතවූ; තුඟු, උස්වූ; රල, තරඟඇත්තාවූ; දසදෙස, දශදිශාවෙහි; ගුගුරණ, නාද පවත්වන්නාවූ; පසඟතුරු, පංචාඞ්ගිකතූර්‍ය්‍ය නැමැති; පතළ, ව්‍යාප්තවූ; රුදුඝොස, මහත් ඝොෂා ඇත්තාවූ; නිතර, නිරන්තරයෙන්; සපිරි, සම්පූර්ණවූ; දසසිරි, දශවිධ පුණ්‍ය නැමැති දශවිධ ශොභාවන්; පුරණ, පුරන්නාවුන්ගෙන්; ඔසල, ගැවසීගත්තාවූ; පහළ, ප්‍රසිද්ධවූ; රුපුපතර, ශත්‍රු සමූහයා; නොතබා, ශෙෂනොකොට; විහිදහල, විසජ් නයකොට හැරියාවූ; විතරවෙසෙස්, විස්තර විශෙෂ ඇත්තාවූ; දසදම්, දශධර්මනැමති; පුන්සඳිනි, පූර්ණචන්ද්‍රයාගෙන්; දුල, ජ්වලිතවූ; පුවල, මහත්වූ; සර, සාරවූ; එපුරකිරණ, ඒ නගර නැමති ක්ෂීරාර්ණවය; සහතරණෙව්, රශ්මිසහිතවූවාක් මෙන් වී.

256 ස ක ලා 'අවි සිල්ප තතුගත් ලොව පැව ති
ස ක ලා සදිසි සපුමල් කුමරිඳු නැම ති
දැ ක ලා වන තරුණු රුපු ඔහුගෙ විකුම ති
එ ක ලා මදගජදළ යාන සැතපෙ ති

256 ලොවපැවති, මනුජලෝකප්‍රවෘත්තවූ; සකලාඅවිසිල්ප, මුද්ගර සිරි අඩයටි ශර ආදී නොයෙක් ආයුධ විශෙෂයන්ගේ ශිල්පයෙහි; තතු, තත්ත්වය; උගත්, උද්ග්‍රහණයකළාවූ; සකලාසදිසි, ශක්‍රදෙවේන්ද්‍ර විලාස ඇති; සපුමල්කුමරිඳු නමැති, සපුමල්කුමාරාභිධානවූ; තරුණු, (සිංහසේනාන කණකපාතුසන්නිභ) යෞවනාවස්ථාරයෙන් යුක්තවූ; විකුමැති, (දෘඪකර නිකරමකරාකරප්‍රලය දිනකර) වික්‍රමාන්විතවූ; ඔහුගේ, ඒ රාජකුමාරයාගේ නාමයානෝ; වන, තේජඃප්‍රභාභාසුරවූ වක්ත්‍රය; රුපු, ශත්‍රුජනයෝ; දැකලා, දර්ශනයකොට; එකලා, එකෙණෙහි; මදගජ, සපාතාවානභූමියපෘෂ්ට ශූලකපෝල භිත්තියෙන් නිරන්තරගලනාමද ජලප්‍රමුඛඅම්භපරාක්‍රම පජ රකුජරසමූහයාගේ; දළයාන, දන්තයානයෙහි; සැතපෙති, විශ්‍රාම්‍ය කෙරෙති.

257 ඇ දි මනහර නෙතරූ රසඳන ලක ළ
ඉ දි ගුණ ඔහු විහරණ දෙන සඳපුව ළ
සැ දි කරතල දෙව්දිය වතුරෙන් උතු ළ
රැ දි සිතුමිණ නොපැකිලදිවි කිරණතු ළ

257 නෙත, නෙත්‍රාපාංශයා; ලකළ, අලංකෘතවූ; මනහර, මනොඥවූ; රූ, (නරවරවධූන්ගේ විමල මුඛකමලවිකාශනයෙහි නභොමණි විලාසවූ) රූපසාරනැමති; රසඳන, රසාඤ්ජනය; ඇඳි, අඤ්ජනයකළාවූ; ඉඳිගුණ, ඇදනැත්නාවූ ගුණඇති; පුවල, ප්‍රෞඪවූ; ඔහු, ඒ කුමාරයා විසින්; විහරණදෙනසඳ, දිළිඳුගිම් නිවනිවා තිලිනවැසිවස්වත්ට පටන්ගත්කල්හි; සැදි, සජ්ජිතවූ; කරතල, හස්තතලය; දෙව් වතුරෙන්, දෙවුනාදියදහරින්; දියඋතුල, ජගත්පිරිඋතුරුවත්ට වත්කල්හි; රැඳි, රඤ්ජිතවූ; සිතුමිණ, චින්තාමාණික්‍යය; නොපැකිළ, ප්‍රස්ඛලිතනොව; කිරණතුළ, ක්ෂීරාර්ණවාභ්‍යන්තරයට; දිවි, ධාවනයකෙළේසි.

258 ප ත ග කුලග පැරකුම් රජුගෙ කුමරි ඳු
ස ත ග පිහිටි මිහිමතගුන් තුරග රූ ඳු
නි ස ග නැගී පවනෙව් විහිදුවා උ ඳු
ලෙස ග විය උදේනිය නකුලදෙතිරි ඳු

258 පතගකුලග, ශශකිරණවංශයට අධිපතිවූ; පැරකුම්රජුගේ, අමිතපරාක්‍රමාන්විත පරාක්‍රමබාහුනම් මහරජානන්ගේ; කුමරිඳු, ආත්මජකුමාරෙන්ද්‍රතෙම; සතග, සප්තාංගයකින්; මිහිපිහිටි, භූමිස්පෘෂ්ටවූ; මතගුන්, සරාජරාජප්‍රජාපාලනප්‍රවීනගජරාජයන්පිටද; රූඳු, රෞද්‍රවූ; තුරග, සෛන්ධවයන්පිටද; නැගී, ආරූඪව; පවනෙව්, චණ්ඩමාරුතයක්මෙන්; උඳු, ඍජුව; විහිදුවා, පත්වාඑත්නාවූ; නිසග, ස්වභාව; උදේනියනකුල, උදේනිය නකුලයයි යන; දෙතිරිඳු, ඒ නරෙන්ද්‍රයන්දෙදෙනාගේ; ලෙසගවිය, ගමනවිලාසය වූයේය.

259 ල ත ර විරිඳු තිරිඳුන් රැඳි මුළුදෙ රණ
නිතො ර නැමුන් කරවා සිය සිරිස රණ
ප ව ර ඉසුරුබර සපුමල් තරව රණ
තොහැර වැජඹි සිරිලක කර රැකව රණ

259 මුළුදෙරණ, සමස්තභූමණ්ඩලයෙහි; ලතර, සිත්දැඩිවූ; විරිඳුතිරිඳුන්, විරුද්ධනරෙන්ද්‍රයන්; නිතොර, නිරන්තරයෙන්; සියසරණ, ස්වකීය සරණයුගයට; න[illegible]මුන්[illegible] අවිනාතකරවමින්; පවර, ප්‍රවරවූ; ඉසුරුබර, ඓශ්වර්‍ය්‍යභාරාත්භාරවූ; [illegible]මල්තරවර[illegible], පද්මව[illegible]වම්පකපුෂ්පා

ත්‍රිබාන නරෙශ්වරතෙම; සිරිලක, ප්‍රතිදිනප්‍රභාස්වරස්වරත්නසිඤ්චු ශ්‍රී ලඞ්කාම්පය; නොහැර, (වෛරිවංකඳූඛරජතිමිරපූටපාටනයෙහි නාභො මණිවිලාසදක්වමින් යලිදු) අවකාශයක්නොදී; රැකවරණකර, රක්‍ෂා ආවරණකොට; වැජඹි, විජෘම්භමානවී.

260 බ ම න තෙදග මොහුරුපුවන පෙත පැති ර
ද ව න සඳෙහි වෙසෙසින් මදකුන් නොහැ ර
දු ම න උනඹු සොවගින් හළුව මුතුහ ර
හ ම න කඳුළු බිඳුහර දරති තනතු ර

260 මොහු, මේ කුමාරෙන්ද්‍රයාගේ; බමන, භ්‍රමමානවන්නාවූ; තෙදග, තෙජොවන්තිය; රුපු, ශත්‍රූන්නැමති; වනපෙත, අටවිය; පැතිර, ව්‍යාප්ත කොටගෙණ; මදකුන්නොහැර, අතුරුසිඳුරුනොදී; වෙසෙසින්, විශෙෂ යෙන්; දවනසඳෙහි, දවත්වපටන්ගත්කල්හි; දුමන, දෞර්මනස්වූ; උනඹු, ඒ ශත්‍රූවනිතාවෝ; සොවගින්, ශොකවන්හියෙන් යුක්තව; මුතුහර, (සුපුත්තනාරණහසුත්තුඹින් බොනපොකුරුම් බිඳුසේ සිහිල්සිනිඳු සුව පහසට පැළඳි) මුක්තාහාර; හළුව, පහකොට; හමන, වහනයවන්නාවූ; කඳුළුබිඳු, බාෂ්පබින්දූනැමති; හර, හාරය; තනතුර, පයෝධරාන්තර යෙහි; දරති, ධාරණයකෙරෙත්.

261 දු කු ම න් පොකුරබෙව් පහකරණ සැදිස ක
වි කු මෙ න් පසිදු එකුමරු රුසිරු නිරස ක
ස කු මෙ න් ඉසුරු පැරකුම් නිරිඳු අණස ක
එ කු ට න් දරණ අකුරෙක සදසි විනිස ක

261 පොකුරබෙව්, පුෂ්කරාම්බුවක්මෙන්; සකසැදි, ස්වකීයයන්ට සිඩවූ; දුකුමන්, දුඃඛචිත්තයන්; පහකරණ, දුරලන්නාවූ; විකුමෙන්, වික්‍රම යෙන්; පසිදු, ප්‍රසිඩවූ; රුසිරු, රූපශ්‍රීඇති; නිරසක, නිරාශඞ්කාවූ; එකු මරු, ඒ කුමාරතෙම; සකුමෙන්, ශක්‍රයාටබඳුවූ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යඇත් නාවූ; පැරකුම්නිරිඳු, පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාගේ; අණසක, ආඥාචක්‍ර යෙහි; විනිසක, විනිශ්චයනැමැති අක්‍ෂය; එකුටන්, එකතුක්රිම්ට; දරණ, දරන්නාවූ; අකුරෙකසදිසි, අකුරක්සමානවේ.

262 සි ර න කිරුළු අගමුතුහර රලපත ර
සු ර න උදුල සඳහස යස ලපැතස ර
ක ර න ජයසයුරු මොහුකරගනිසිව ර
උ ර න දිලිනි යස තෙදමුතුම්ණි නිත ර

262 සිරන, ශිරොන්තයෙහි පලඳනාලද; කිරුළුඅග, කිරීටාග්‍රයෙහි; මුතු හර, මුක්තාහාරනැමති; පතර, මහත්වූ; රල, තරඞ්ගඇති; සුරන, ශ්‍රීභ ස්තනයෙහි; උදුලසඳහස, උජ්වලිතවූ ශ්‍රීවත්සනැමති; සසලපැතසර, චචලවූ

පුප්ලෝමයන් ඇති; ජයසුරු, විජයසාගරය; මොහු, මේ නරේන්ද්‍රනාමති; අගහිමිවර, අනාසිසෘෂිවරයා; කරකරත, හස්තප්‍රාප්තකරගත්කල්හි; යසතද, යසස් හා තේජස්නැමති; මුතුමිණ්, මුක්තාමාණික්‍ය සමූහය; නිරන්තර, නිරන්තරයෙන්; උරතිලිනි, උරන්තයෙහි දීප්තිමත්වී.

263 සු රි ය  සදිසි තදතෙද එරජ හැමව  ර
වී රි ය  පසිදුවුන දසඅටරට නොහැ  ර
කාරි ය  සිතව නොමගෙණ ගෙණ දුක්පත  ර
ආ රි ය  සක්විතිහු ගියරට ඇර එත  ර

263 එරජ, එනරශ්‍රෙෂ්ඨයාගේ; සූර්යසදිසි, දිවසකරයාවැනිවූ; තද තෙද, දැඩිවූ තේජසද; වීර්ය, නොපසුබටව පවත්නාවූ වික්‍රමියද; නොහැර, අවකාශයක් නොව; හැමවර, සැමකල්හි; දසඅටරට, අෂ්ටාදශ දෙශයෙහි; පසිදුවූන, ප්‍රසිඬවූයේය; පතර, මහත්වූ; දුක්ගෙණ, කෂ්ටග්‍රහණය කොට; සිතව, සවකිය චිත්තයට; කාර්යනොමගෙන, කටයුතුනොදලකා වාසයකළාවූ; ආර්යසක්විතිහු, ආර්යචක්‍රවර්තිනාම් මහිපාලයෝ; රටඇර, ඒ යාපාපටනනාම්වූ නගරය අත්ඇර; එතර, සමුද්‍රපරතිරයට; ගිය, ගියාහුය.

264 බු දු න්  පානඹර සැදි මුදුන කිරුළ  සේ
අ දු න්  වමින් සක්දෙව්රජ ඉසුරු රැ  සේ
වැදු න්  යෙහෙත් යාපාපටන තිසි ලෙ  සේ
න දු න්  වෙහිම් සිරිඇති ලෙස වණමු කෙ  සේ

264 බුදුන්, විසුඩශ්‍රිනිකරයෙන් විශිෂ්ටවූ සර්වඥයන්වහන්සේගේ; පානඹර, ජානරුපාරවිඥ සන්නිභවූ ශ්‍රීපාදපද්මය; කිරුළසේ, තෙවුනාපල දනාලද කිරීටයක්මෙන්; මුදුනසැදි, උත්තමාංගයෙහි සුසජ්ජිනකළාවූ; වෙහිම්, මේ නරේශ්වරයා; සක්දෙව්රජ, ශක්‍රදිව්‍යරාජයාගේ; ඉසුරුරැසේ, ඓශ්වර්‍ය්‍යවිරාජිය; අදුත්වමින්, ලෝකයාට අගවමින්; යාපාපවූන, (සමෘද්ධ වස්තුයෙන් මත්තකප්‍රාප්තවූ) යාපාපටුනනාම් නගරයට; වැද, (නෙවර නාපාතංකාරගව්‍යාදදකසෝසනයෙහි හාත්‍රුභූපශ්‍රිදක්වා) අවතිර්ණව; තිසිලෙසේ, කැමතිලෙස; යෙහෙත්, සුවසේ; උත්, උපවෙසනප්‍රාප්තවූ; නදුන්, සන්තානන්දනයකළාවූ; සිරි, ඓශ්වර්යය; ඇතිලෙස, තත්වූ පරිද්දෙන්; කෙසේවණමු, කවරප්‍රකාරයකින් වර්ණනාකෙරෙමුද?

265 ඇ ම ස ඳ  විහිදි ගනරත්පැහැය පල  අ ගේ
බ ඳ ද ද  කිකිණිදූල් පවනින් කරණ  ද ගේ
සු ර ර ද  පහයවුත් මිහි පිහිටි එක  ර ගේ
සි රි න ද  සබාමඩුයෙහි සුසැදි මත  ර ගේ

265 ඇමසඳ, සඳකල්හි; විහිදී, විස්තීර්ණවූ; ගනරත්පැහැය, ඝන කනකප්‍රභාඇති; පලඅඟේ, පියසිමුදුනෙහි; බඳ, බඳනාලද; දද, ධවජයන්ගේ; කිකිණිදැල්, කිංකිනිජාලාවන්; පවනින්, මාරුතවේගයෙන්; කරණදගේ, චාංචලකරවන්නාවූ; සුරරද, ශක්‍රදේවේන්ද්‍රයාගේ; පහසවුත්, වෛජයන්තප්‍රාසාදයඅවුත්; මිහිපිහිටි, පෘථිවියෙහි පිහිටියේනම්; එක රඟේ, එකාකාරවූ; සිරිනද, සකලශ්‍රීයෙන් හෘදයගම්‍යකොට; මනරඟේ; සිත්වූපරිද්දෙන්; සුසැදී, සුසජ්ජිතවූ; සබාමඬුයෙහි, ඒ සභාමණ්ඩපයෙහි:-

266 මනකල් ලෙසින් රකිනා මුනි සා ස න ය
ඇමකල් මෙසිරි ලකඹර රැඳි සා ස න ය
සුවිමල් කරණ නිති නැන ගුණ වා ස න ය
සපු මල් කුමරු උත්සඳ සිං හා ස න ය

266 මනකල්ලෙසින්, මනොඥවූපරිද්දෙන්; මුනිසාසනය, විශ්වලොක මඞ්ගල්‍යවූ මුනීන්ද්‍රයාගේ නෛර්‍යාණිකශාසනය; රකිනා, රක්ෂාකරන්නාවූ; ඇමකල්, සඳකල්හිම; මෙසිරිලක, මේ ශ්‍රීලංකාවිපනැමති; අඹර, ආකාශයෙහි; රැඳී, රජිනවූ; සාසනය, ශශාංකරශ්මියාවැනිවූ; නැණ, කාලත්‍රයෙහි විනිවිදපවත්නාවූ ප්‍රඥාවද; ගුණ, භූමණ්ඩලමණ්ඩනෂට්ගුණයද; වාසනාය, වාසනාවද යනමේ හේතුකොටගෙණ; සුවිමල් කරණ, නිර්මල ක්‍රියාඇති (හෙවත් මහීපාලනයකරන්නාවූ); සපුමල්කුමරු, උලකුඩය දෙවීන්ගේ ජ්‍යෙෂ්ඨභ්‍රාතෘවූ මමපකානිධාන කුමාරොත්තමයා; සිංහාසනය, භූතනාගභෛරවභයානක මෘගරාජාසනාරූඪව; උත්සඳ, උපවේශන ප්‍රාප්තවූකල්හි:-

267 මහසෙන් අසුරගුරු සුරගුරු නත ගණී ඳු
අහ සි න් අවුත් බැසසිටි විලසින් පසි ඳු
මහසෙන් සමග නිති මැතිගණ සිරිපුරු ඳු
සහ ස ත් තොසින් වටකරසිටිසඳ නිරි ඳු

267 මහසෙන්, සෙනාධිපතිවූ ශරජන්මය; අසුරගුරු, කාව්‍යාධිපතිවූ භාර්ගවය; සුරගුරු, බහුශ්‍රුතාධිපතිවූ වෘහස්පතිය; නත, ශිතිකන්ථකාධිපතිවූ අනන්තනාගය; ගණිඳු, ප්‍රඥාධිපතිවූ මෛමාතුරය යන මොහු; අහසින් අවුත්, ආකාශයෙන් ආගමනයකොට; බැසසිටිවිලසින්, අවතීර්ණව සිටියාගේ; පසිඳු, දිගන්තර ව්‍යාප්තවූ සැලස්ඇති; මහසෙන්සමග, මහා සේනාව හා; සිරිපුරුදු, ශ්‍රීයෙහි අභ්‍යාසවූ; මැතිගණ, විසුධබුද්ධිසම්මිශ්‍රවණ සුතශොරසානුසාසන සාධුජනශ්‍රේෂ්ඨනාදීන් ප්‍රතිලබ්ධමන්ත්‍රිසමූහයා; සහ සත්තොසින්, සමග සතුටුව; නිරිඳු, ජිනවරණසයොජයෙන් නිජම සකාලාකෘතවූ ඒ නරේන්ද්‍රයා; වටකර, හාත්පසින්; සිටිසඳ, සම්හිප්‍රාපනවූකල්හි:-

268 කලක් නිල්කැළුම් වන් තුනු රුසිරු බ ඳ
කලක් සිට වෙනෙහි පුරුදුව ආ සබ ඳ
මලක් සේ එසබමැද ගොස් තමන් ස ඳ
මෙලක් දිව පසිදු නළුමුළු රැස්ව සෙ ඳ

268 නිල්කැළුම්, නීලකාන්ති සම්බන්ධ; කලක්වන්, කලම්බක්වැනිවූ; තුනුරුසිරු, තනුශ්‍රීයෙන් යුක්තවූ; බඳ, පියබඳක්ඇති; කලක්සිට, බොහෝ කාලයකපටන්; වෙනෙහි පුරුදුවආ, අරණ්‍යවාසිකාභ්‍යාසයෙන් යුක්තව ආවාවූ; සබඳ, පියසබඳ; මලක්සේ, නීලෝත්පලයක්මෙන්; එසබමැද, ඒ සභාමධ්‍යයට; ගොස්, ප්‍රවිෂ්ටව; තමන්සඳ, තාගේ චිත්තය සනසව; සෙඳ, ඒ ඇසිල්ලෙහි; මෙලක්දිව, මේ ලංකාවීපයෙහි; පසිදු, ප්‍රසිද්ධවූ; නළුමුළු, නාටකසමූහය; රැස්ව, රාශීභූතව.

ඉක්බිති නෘත්‍යවිශේෂයක් ප්‍රකාශකරණු පිණිස “අදිමින් සුදුපට”

යනාදී කව කීහු.

269 අදිමින් සුදු පටසළු හෙළ සඳුනෙන් තුනු තවරා
සරමින් උර මුතුහර සිර මලිගිය මල් සපුරා
සොබමන් යුගසරණත නූපුර රැවුදි ඉඳුරා
බසිමින් සබමැද රඟදෙති කියමින් ගී මියුරා

269 සුදුපටසළු, සිනිල් සිනිඳු ශෝභනපට්ටවස්ත්‍ර; අදිමින්, අවජාදනය කොට; හෙළසඳුනෙන්, අඟරාගශෝභනචන්දනයෙන්; තනුතවරා, කලත්‍රණකෘතින ජවිවර්ණප්‍රභානන ශරීරලිම්පනයකොට; උර, වක්ෂස්ථලයෙහි; මුතුහර, මුක්තාහාරයෙන්; සරමින්, මදරාජගජකුම්භශ්‍රීලීලාකාර මටනදපියයුරන් සිසාරා සමලංකෘතකොට; සිර, (ශරත්ගගනස්ථලයෙන් ලම්බුන් නිල්වළුල් දිනූනීලඝනසිනිඳු කුන්තලකලම්බකින් බබලන) උත්තමාංගයෙහි; මලිගියමල්, නීලවච්ඡුපිකාන්තරයෙන් දිලිහී වැටෙන විජ්ජුල්ලතාකාර මාලතීපුෂ්පදාමයෙන්; සපුරා, තෙවුනාපැලඳි සුවඳ පිඩක්සේ කොරවින්; සොබමන්, සොභමානවූ; යුගසරණත, කොකනදපද්මාභ්‍යන්තරයකට අපහාසකරන්නාවූ චරණයුගලාන්තරයෙහි; නූපුරුරැවුදී, පාදකටකරාවයෙන් මත්තාළලාලයන්ගේ නෙත්සිත් භ්‍රමණයකරවා; ඉඳුරා, නන්වූපරිද්දෙදන්; සබමැද, ඒ සභාමධ්‍යපම්බ්‍යයෙහි; බසිමින්, අවතීර්ණව; මියුරාගීකියමින්, අනුරාගයෙන් අනාකූත කළම්තිරිනාදයෙන් යුත් මනාගීකියමින්; රඟදෙති, නෘත්‍යකෙරෙත්.

270 බ ඳි මි න් මුතුපට රසුනද නවසඳවත් නල ලේ
ස ල ඹි න් රන්රසුයෙන් නදදෙවමින් පා කම ලේ
අ ඟ ර න් තන තනමින් ලෙලදී ඉන මිණි මෙවුලේ
අ ඟ න න් දෙනු රඟරඟ දුටු කානම් සිතුනොඇලේ

270 නවසඳවත්, අභිනව චන්ද්‍රයාවැනිවූ; නලලේ, ලලාටයෙහි; රුසු නද, සුවර්ණබුද්බුදකිංකිණිකනාදයෙන් යුක්තවූ; මුතුපට, මුක්තිකාපට්ටය; බඳිමින්, බන්ධනයකොට; පාකමලේ, කෝමලවූ ජඞ්ඝායුගලයෙහි; රන් සලඹින්, සුවර්ණනූපුරයෙන් හා; රසුයෙන්, ගෙජ්ජියෙන්ද; නදදෙව මින්, නාදපවත්වා; තන, දර්‍ශිතෝත්සන්නබුද්බුදාකාරඇති නිලවංචි යුග්මයකින් විරාජමානවූ පයෝධරමණ්ඩලයෙහි; අඟරන්, අඟරාගය; තන මින්, ලේපනයකොට; ඉන, කාංචනාකාර සිඟිත් සිහිඳු සිහිනිඟවටේ; මිණිමෙවුලේ, මාණික්‍යමෙඛලාදාමය; ලෙලදී, ලීලෝපේතකරවා; අඟ නන්, (ඝනකනකරත්නාභරණ ප්‍රවිවර්ණප්‍රභායෙන් ඒ සභාමණ්ඩපය ඒකාලෝකකරන්නාවූ) අඟනාවන් විසින්; දෙනරඟ, දෙන්නාවූ නෘත්‍ය යෙහි; රඟ, විලාසය; දුටු, දර්‍ශනයකළාවූ; කානම්, කවරෙක්නම්; සිතු නොඇලේ, චිත්තආලය නොකෙරේද?

271 හ ළ දිගුනිල් මානෙල් පෙති කැ ල් මා
කෙළ වා දිගු නුවනත ලා බැ ල් මා
ලෙල දෙන පුළුලුකුලේ නරුසැ ල් මා
න ළ ඟන දෙන රඟ කෙළෙ සිත ඇ ල් මා

271 හළ, පහලවූ; කැල්මා, කාන්තියෙන්; දිගු, දීඝවූ; නිල්මානෙල් පෙති, නීලෝත්පල දලාකාරවූ; දිගුනුවන, දීඝවූ නිලනුවන් සඟළෙහි; කෙළවා, කෙළවරින්; බැල්මා, මදලස්කොට බලනාබැළුම්; අනලා, හසනලයට පරික්‍ෂෙපකොට; ලෙලදෙන, ලීලෝපේතවන්නාවූ; පුළුලු කුලෙ, පෘථුලජඝනස්ථලයෙහි; නරුසැල්මං, නිච්චලනයෙන්යුක්තවූ; නළ ඟන, නෘත්‍යභිගුත්මහදනසෙබෙහි දුගුම්කර රුගුම්ගත් නරුණාඞ්ගනා වන් විසින්; දෙනරඟ, නිශ්‍රිකතැන් සශ්‍රිකකොටදෙන්නාවූ නෘත්‍යයෙන්; සිත, සභ්‍යයන්ගේ චිත්තය; ඇල්මා, ආලය; කෙළේ, පහළකෙළේයි.

272 ස ඳ ව න් දියවක සැදි පටු න ළ ළා
සුව ඳි න් පිරි පියයුරු රන් ක ළ ළා
ලෙලදුන් ලිය තුනුනු තලකැ ළ ළා
එ ළ දු න් දුටුපමණින් සිත අ ළ ළා

272 දියවකසැදි, අච්චිනම් ත්‍රිපිටයට පැමිණි; සඳවත්, චන්ද්‍රයාවැනිවූ; පටු, පැවිවූ; නලළා, ලලාටඇති; සුවඳින්පිර, සුගන්ධයෙන් පිරුණාවූ; (නෙ වත් කෙලිදෙළින් මත්පුමත්මනදෙලපුර සිපසැනනෙහනාරම් සුගන්

යෙන් පිරිසිඹිනාවූ) රත්කලලා, සවර්ණස්සටගණයානාවූ; පියවුරු, සූපිරිතනබරයේ ප්‍රේමයෙන් මහත්වූ පයොධරයන් ඇති; ලිය, ඒ කාන්තාවන්ගේ; තුනු, ශරීරාවයවයෙහි; නලකැලලා, තිලකලිකාවක් පමණ; නූ, නොවූයේය; ලෙලදුන්, ලීලෝපේතවූ; ඒලදුන්, ඒ නායිකාඞ්ගනාවන්; දුටුපමණින්, දර්ශනයකළ ප්‍රමාණයෙන්; සිතුඅලලා, චිත්තාලොලනය වන්නේයි.

273 ම ද හස රැඳි වත සඳ සිරි ඉ සි ලි ය
ම ද සත සිත් ගත් නුවන ග වි සි ලි ය
න ද රඟ දෙන මල් මොලකැටි නි සි ලි ය
සෙද දුටු අවියත් සත සිත රි සි ලි ය

273 මදහස, ඊෂත් හාස්‍යයෙන්; රැඳි, උපලක්ෂිතාවූ; වත, මුහුණ; සඳ සිරි, චන්ද්‍රයාගේ සවභාව; ඉසිලිය, දැරුයේය; නුවනග, (මේචකෝත්පල දලාකාර දිගුනිල්) නුවන්කෙළවර බැළුම්සර; විසිලිය, විසර්ජනය කොට; මදසත, කාමමදයෙන් මත්වූසත්වයන්ගේ; සිත්ගත්, චිත්තග්‍රහණයකළේය; නද, සතුටුවූ; රඟදෙන, නෘත්‍යදානයකරන්නාවූ; මල්, තරුණවූ; මොලකැටි, කෝමලවූ; නිසි, යොග්‍යවූ; ලිය, ඒ කාන්තාවන්; දුටුසෙද, දර්ශනයකළ ඇසිල්ලකින්; අවියත්සත, අව්‍යක්ත සත්වයන්ගේ; සිත, චිත්තය; රිසිලිය, ආලයකරවීය.

274 කි ස ලත් සුපුල් නිලුපුල් ඇ සි න්
ය ස ලත් ලියන් රඟදෙන නො සි න්
ගොස වත් මෙවුල් රුවු කුම් ලෙ සි න්
ර ස වත් හඬොනෙවු රස බ සි න්

274 කිසල, පත්‍රපළුවැනිවූ; අත්, මෘදු කොමල සුරක්තහස්තතලඇති; නිලුපුල්, නිලොත්පල දලාකාරවූ; ඇසින්, මල්වනමල්සරාකාර දිගුනුවන් කරණකොටගෙණ; යසලත්, ලබනලද යසස්ඇතිව; නොසින්, අනෙකාශ්‍රයෙන්; රඟදෙන, නෘත්‍යදානයකරන්නාවූ; ලියන්, කාන්තාවන්ගේ; ගොසවත්, ඝොෂාවත්වූ; මෙවුල්රුවු, මෙඛලාරාවය; කුම්ලෙසින්, කුමක් මෙන්ද? රසවත්, රසනම්ඇති මුඛ්‍යන්ගෙන්; රසබසින්, මධුරවචනය කරණකොටගෙණ; හඬොනෙවු, හඬඕනාමෙනි.

275 දු ත් සිරි නලළතවන් සඳ ම ඩ ලේ
බ ත් මුතුපට රැස්වන් මුව ම ඩ ලේ
ස ත් සඳකිරණින් දිසි සඳ ම ඩ ලේ
තු ත් ළඳලිය රඟදෙති රඟ ම ඩ ලේ

275 දුත්සිරි, හරිතාලතිලකයෙන් යුක්තාවූ; සඳමඬලෙවන්, අඩ්ඩචන්ද්‍රයාවැනිවූ; නලළත, ලලාටාන්තයෙහි; බත්, බඳනාලද; මුතුපට, මම්මතනි

ක පර්වතයෙහි; රැස්වත්, රශ්මිවැද දිලිහෙන්නාවූ; මුවමඬලෙ, මුඛමණ්ඩලය කුමක්මෙන්ද? කිරණින්, මරීචිමාලාව කරණකොටගෙණ; සත්සඳ, සත්සන්දනාශාලප්‍රමාණවූ; සඳමඬලෙ, චන්ද්‍රමණ්ඩලය වැනිවූහෙයින්; තුඹ උතුම්වූ; ලඳලිය, ලඳබොලඳ කල්බඳුන්; රඟමඬලෙ, රඟමණ්ඩපයෙහි; රඟ දෙති, නෘත්‍ය පවත්වති.

276 ලෙ ල   දල කියඹු වැල සැ   දී
වෙ ළ   වරඟන ලිය වැල   දී
ද ල   මුතුහර මලෙහි බැ   දී
දෙ ල   කර සත සිටිති ල   දී

276 ලෙල, ලලිතවූ; දල, ලලාටයෙහි; සැදී, සජ්ජිතවූ (තෙවත් ගෙත් තම්කරණලද;) කියඹුවැල, භූතකේශසමූහවැනිව; ලිය, ලතාමෙන්; වැලඳී, වෙලීගියාවූ; වරඟන, ඒ පරමරමණීන්වැනිවූ; වෙළ, වෙළෙප්හි; දලමුතුහර, මුක්තාහාරජාලානැමති; මලෙහිබැඳී, පාසයෙහි බඳව; සත, සත්වයෝ; ලඳී, ලැඳිව; දෙලකර, දොලකිරීම්වසයෙන්; සිටිති, සිටිත්.

277 සි නා   සුමුසු සුදුකුමුද   න
ව නා   එරඟ මඬල සොබ   න
ත නා   රඟන ලිය දකිම්   න
උ නා   සෝක හැර පියම   න

277 සුමුසු, යහපත්භාවයෙන් මිශ්‍රවූ; සිනා, හාස්‍යනැමති; සුදුකුමුදන, ශුබ්‍රකෛරවයන්ගෙන්; සොබන, සොභමානවූ; එරඟමඬල, ඒ නෘත්‍යමණ්ඩලයට; වනා, ප්‍රවිෂ්ටව; තනා, එනැත්හි; රඟනලිය, නෘත්‍යය කරන්නාවූ තරුණ සුන්දරීන්; දකිමින, දර්ශනයකිරීමහේතුකොටගෙණ; මන, තාගේ චිත්තයෙහි; සොක, දෞර්මනස්‍යය; උනා, ලිහිල්කොට; හැරපිය, මොචනයකර.

278 බ ඳි මි න්   නිල් වරලස ලා කුසුමන් සෙවුව   න් දී
කි ය මි න්   මියුරස ගී නොවරදවා පද ස   න් දී
න ග මි න්   අත එලමින් සුබ රඟ රඟ බැළු ම   න් දී
ර ඟ මි න්   සිටි නළඹුන් බල ලෙලදී රන්බ   න් දී

278 නිල්වරලස, ඝනනීලකේශකලාපයෙහි; සෙවුවන්දී, සුගන්ධිකනම්වූ; කුසුමන්ලා, පුෂ්පයන් ප්‍රක්ෂේපකොට; බඳිමින්, බන්ධනයකොට; මියුරස, මධුරස්වරයෙන් යුක්තව; ගීකියමින්, ගීත්කාකියන්නා හාසමග; නොවරදවා, විරුද්ධයක්නොව; පදසන්දී, පාදනූපුරධ්වනිපවත්වා; අත, මොලකැටි සපුමල්දම්හෙය් ලෙලෙතරනප්; හෙලමින් නාගමින්, උත්ක්ෂේපනාවක්ෂේපනකොට; රඟ, නෘත්‍යයට; (කියනාලද) සුබරඟ,

ගනාත්පු නියානෙත්; බැළුමන්ද, එමොලකත්කරාහුවනාගින් මදලස් බැළුම්නදමින්; මිණිබත්ද, පියුම්රාගවරළු ඉඳුනිල්මිණි ඇදී විභූෂණාභූෂණසමූහයා; ලෙලදී, ලීලෝපේතකරවා; රඟමින්, නෘත්‍යකරමින්; ඉඹ, සිඹින්නාවූ; නළඹු, නාටකාඞ්ගනාවන්; බල, විලෝකනයකර.

279 සඳට රවටන වනපුබුදුකර සෙමෙන් සිවිළි බිරුසි නා
රවට ගී මියුරෙහි ගලා රසයෙන් අනා සෙද කියමි නා
රඟට බැස බැහැවූම් නැටූකල කලුත්රඟදුටුකල ම නා
තවට පරසිඳු තවසරහු මුත් ලබති දිවඇස් වෙසෙසි නා

279 සඳට, ශරත් සුපුන්සඳමඬලට; රවටන, නින්දාකරන්නාවූ; වන, (ඉන්දීවරනයන සුරන්තාධරමාලගිමුකුළුදන්ත පඞ්ක්තියෙන් හොබනා විමල)මුඛමඬලත්; පුබුදුකර, ප්‍රබොධකොට; සෙමින්, සුවිනීතභාවයෙන්; සිළිබිරුසිනාසී, සිමන්තිනිලීලා පරම හාස්‍යයකොට; (හෙවත් ලජ්ජා බසින් යුක්තව සිනා පහළකොට;) ගීමියුරෙහි, ගීතිකානැමති මධුරයෙහි; ගලා, නිමග්නව; රවට, ලලිතරාගනන්නඩවනියෙන් යුක්තවූ; රසයෙන් අනා, නවනාට්‍යාදී ශෘඞ්ගාරරසයෙන් පිඩුකොට; කියමිනා, ගී කියමින්; සෙද, ඇසිල්ලෙහි; රඟටබැස, නෘත්‍යයට පැමිණ; බැහැවුම්, බොහෝ කොට; නැටූ, නෘත්‍යයකළාවූ; කල, මනොඥවූ; කලුත්රඟ, නළඟනන්ගේ විලාසය; මනා, සිත්වූපරිද්දෙන්; දුටුකල, දශීනයකළ කාලයෙහි; තවට, තාපසලීලායෙන්; පසිඳු, ප්‍රසිඩවූ; තවසරහුමුත්, තපශ්වරයෝ නමුත්; වෙසෙසිනා, විශෙෂයෙන් දක්නාපිණිස; දිවඇස්ලබති, දිව්‍ය නෙත්‍රලබන්නාහුවෙති.

280 රත ගිලි සල කිසල නියරුස් කුසුම්සි රී
අත අතු සමග තන පලබැම බමර සැ රී
ගත ගී මියුරු රුවු පරපුටු හඬිනිති රී
නෙතත පත නලඹ කැල වන වසර රඟදූ රී

280 සල, සසලවූ; රතඟිලි, රක්තාඞ්ගුලිනැමති; කිසල, තඹපළුඇති; නියරුස්, නඛරශ්මිනැමති; සිරි, ඉසුරුණාවූ; කුසුම්, පුෂ්පයන්ඇති; අත, ලීලෝපේතවූ හස්තනැමැති; අතුසමග, ශාඛාශ්‍රීඇත්තාවූ; තන, පයොධරනැමති; පල, ඵලඇත්තාවූ; බැම, භ්‍රැයුග්මනැමති; බමර, භෘඞ්ගයන් ඇති; සරි, මේ ආදීන් සැරහී සිට; ගත, පටන්ගත්තාවූ; ගීමියුරුරුවු, මධුර ගීතිකාරාවනැමති; පරපුටුහඬින්, කන්කළුනුණාලඩවනියෙන්; ඉතිරි, උත්සාපිතව; නෙතපත, නාගේ නේත්‍රාභිමුඛවූ; නළඹකැල, හොරහත් පුහුලන් නෙත්සිත් කළඹන නළඟනන් සමූව; වනවසර, වනාන්තරයෙහි; රඟදූරි, විලාස පහළකෙළේයි.

281 වෙසෙස සිසළු නොවරද බරත නොරතු ර
සකසස ගී රඟුම් වැයුමේ දුන විත ර
අලස නොව තිලින් නළුවන් පෑ නොහැ ර
මෙලෙස රඟුම් අවසනවසර ලත් ව ර

281 වෙසෙස, විශේෂයෙන්; බරත නොරතුරෑ, භාරතශාස්ත්‍රයාගේ නාඩ්යට; නොවරද, අවිරුඬව; සකස, යහපත්කොට; ගී, සප්තස්වරයෙන් යුක්තවූ ගීතිකාය; රඟුම්, බිහුර්මිලක්කම් ආදිවූ නොයෙක් නළුනාට කය; වැයු, මඳුලතුළුතාලම් ආදී පංචාංගනවාද්‍යයයි යන; මේ, මේ ආදී යෙහි; දූනවිතර, ප්‍රමාණයදුන; අලසනොව, ආලස්‍යනොවී; තිලින්, සන්තෝෂයෙන්; නළු, නාටකස්ත්‍රීන්; නොහැර, සමගිව; උවන්පෑ, මුන පාමින්; මෙලෙස, මේ යථෝක්ත ලක්ෂණයෙන්; රඟුම්අවසන, නළුමුළු කරනැවතී; වසරලත්වර, අවකාශලත් ඇසිලෙලෙහි:-

282 ලඳුන් රදූ අත්ලිය වැලඳි ඇමස ද
සඳුන් තුරක්වන් තුනු සිරිපිරි සුව ද
නදුන් එනරනිඳුසඳ සිරිරුඳුනු ප ද
මුදුන් දෙමින් සිට කිය මේ අස්න සො ද

232 ඇමසඳ, සදාකාලයෙහිම; ලඳුන්, සකල ලක්ෂණාන්විත රූපකාය සම්පත්තියෙන් නිරුපමතරවූ තරුණාඞ්ගනාවන් විසින් පිරිවරණලද;රදූ, (සමානකුලශීල යෞවනාභිරාමවූ) රාජධිතෘත්ගේ; අත්, (ඉන්ද්‍රනීලකන කවලයාභිරාම මෘදුකොමල සිනිල් සිනිඳු) දිගුරනත්නැමති; ලියවැලඳී, ලතායෙන් ආලිඞ්ගනය කරණලද්දාවූ; තුනුසිරි, (නරවරවධූන් විමලමුඛ කමලවිකාසනයෙහි නාභාමණ්විලාසයෙන් යුක්තවූ) තනුශ්‍රීනැමති; පිරිසුවඳ, සුගන්ධයෙන් පිරුණාවූ; සඳුන්තුරක්වන්, ශ්‍රීකරවෘක්ෂයක්මෙන්; නඳුන්, නන්දනයවූ; එනරනිඳුසඳ, ඒ නරේන්ද්‍රොත්තමයාගේ; සිරිරුඳුනු, යුක්තශ්‍රීයෙන් ශොභාමත්වූ; පද, ශ්‍රීපාදවන්දයට; මුදුන්දෙමින්, තාගේ උත්තමාඞ්ගයදී; සිට, අවස්ථානයකොට; සොඳ, සුන්දරවූ; මෙහවන් ලිඟුවිබත්ඇ අභින්ගෙණ රූපෙලකරනොවිහිද කළ විවිධ පදාඞ්ඩයෙන් යුක්තවූ; මේ අස්න, මේ සන්දේශවාක්‍යය; කිය, කථනයකර.

මෙතෙකින් ගගනව්‍යස්ථාන නගරවණීනා හා
කාව්‍යනායකවණිණනාභික්‍රාන්තව කාව්‍යකතෘහුගේ සංඝනිර්ශෙෂය
පිණිස සබඳ යනාදීසැහැලල කිහු.

සබඳ ඒ සුරෙන්ද්‍රයා සමාන නරේන්ද්‍රයාහට සභිඥප්‍රකාරවූ වණීණ විශෙෂයක් දක්වන්නේහෝ,

283 ද ස න  මහින් දුන හෙළු දෙමළ බණ ත  තු
ව ස න  දෙවුනුවර යතිදෙක් ලෙසට සි  තු
දෙස න  ලෙස එවූ මෙහසුන් රසනුමු  තු
අ ස න  මැනවි හිමි සිරිලදමෙන් අමු  තු

283 හෙළු, සිංහලය; දෙමළ, ද්‍රවිඩය යන; බණ, භාෂාවන්ගේ; නතු, නත්‍වය; දසනමහින්, දශනාමාත්‍රයෙන්; දුන, ශබ්දස්ත්‍රීශබ්දව්‍යාකරණාදී යෙන් විජානනයකොට; දෙවුනුවර, විචිත්‍රව්‍යුත්ජනාවාසව ප්‍රාසාදප ඞ්ක්තීන් හෙබියාවූ ශ්‍රීවිෂ්ණුදිව්‍යරාජභවනාභිධාන නගරයෙහි; වසන, නවාඞ්ගශාසනෘශාසනපර්‍යාප්තිධර ධර්මාර්ථදෙසනා ප්‍රතිවෙධයෙන් වාස යකරන්නාවූ; යතිදෙක්, ධර්මාදින්‍යාවායශීවිමලකීර්ත්තිමහාස්ථවිර පරම්පර වෙත් පැවති විඥකශෝත්‍රීමෘතබම්කථා කථනප්‍රභෙදයෙහි අභිදක්‍ෂවූ යතී න්ද්‍රයෙක් විසින්; සිතුලෙසට, සිත්වූපරිද්දෙන්; දෙසනලෙස, උච්චාරණ යකරණ පරිද්දෙන්; එවූ, එවනලද්දාවූ; රසනුමුතු, යමකප්‍රහෙලිකාභූඩා දී කාව්‍යරසයෙන් කවීන්ද්‍රයන්ගේ සිත්උමතුකරවන්නාවූ; මෙහසුන්, මේ කෝකිලසන්දේශය; හිමි, නවයුවති ජනචකෝරයන් රූපාමෘතකාන් තින් පිනනයකරන්නාවූ ස්වාමින්වහන්ස; අමුතුසිරිලදමෙන්, අනන්‍යාර්ජි ලාභයක්මෙන් සොම්නසින් යුක්තව; අසනුමැනවි, ශ්‍රවණයකිරීම යහ පති.

284 යසකුලහිදසපුර–පුරඳුරු අයුරු සිරිසර
සැදි දිනිඳු දූක ගිම්ලස වසවතු
සැසි රුපුත් එනපලවමිනි දසඅතු
කමලමලඟ සඟනා–නොසකෙළවමිනි උරසර

ද න් වා  හියුනු අණසක මුළුසක්වල  ට
පෙ න් වා  පැවති යසරැස් පුත්සිසි රඟ  ට

දෙ ව මි න්  ඉසුරු ඒසපුමල් නරවිරු  ට
කොරෙමින්  සඟිර නද යාපාපවුන් ර  ට
රුතියෙන්  රකිණලෙස පුල්වන් සුරිඳුහ  ට
බැතියෙන්  එයනි අයදිගි සෙත් පිරිත්කො  ට

284 යස, කීර්ත්තියෙන්; සිරිසර, ශ්‍රීසාරවූ; කුලහිදසපුර, කුලනැමති දෙවපුරයට; පුරඳුරුඅයුරු, ශක්‍රයාමැනිවූ; සැදි, සජ්ජිතවූ; වසවතු, වස වර්ත්තියා; දිනිඳුදූක, ජිනෙන්ද්‍රයන් දශීනයකොට; ගිම්ලස, ගිම්හයක්මෙන්; සැසී, දරුණුවූ; රුපුත්, ශත්‍රූන්; එන, එනකල්හි; දසඅතු, දශදිශා නතයන්හි; පලවම්නි, පන්නාහරිමින්; නොස, සන්තොෂයෙන්; සඟන, සවකීය අඟනාවන්ගේ; උරසර, හෘදයනැමති විල්හි; කමල, ආශා නැ මැති පියුම් උපදවන්නාවූ; මලඟකෙළවමිනි, අනඞ්ගක්‍රීඩාව කරවමින්;

නිපුණු, තීක්ෂණවූ; අණසක, ආඥාචක්‍රය; මුළුසක්වලට, සමස්ත චක්‍රවාට යට; දත්වා, ඥාපනයකරවා; පැවති, ප්‍රවෘත්තවූ; යසරැස්, කීර්තිනැමති රශ්මීන්; පුන්සිසිරගට, පූර්ණචන්ද්‍රයාමෙන්; පෙන්වා, දර්ශනයකරවා;

එසපුමල්නරවිරුට,, (අෂ්ටදික්ලලනා කුකුමෝහාපසෝභිතකල්කා මෝදකීර්ත්‍යභිප්‍රජ්වලිතවූ) චම්පකාභිධාන නරවීරයන්වහන්සේට; ඉසුරු දෙවමින්, දුර්වාන්තශත්‍රැපිඩුප්‍රක්ෂාලිත චඞමාරුතවිලාසයෙන් ජයශ්‍රී සහිත සුගන්ධවරවනිතාදී සකලෛශ්වර්‍ය්‍යප්‍රදානය කිරීමෙන්; නද, නන්දනෝද්‍යානව; යාපාපටුන්රට, ප්‍රතිදිනප්‍රභාස්වරසවිරත්නාභිඥවූ යාපාපට්ටනනම් නගරවරය; සතිරකරමින්, ස්ථිරකරදී; රුතිශයන්, රුචිරයෙන්; රකිණ ලෙස, රක්ෂාකරණපරිද්දෙන්; පුල්වන්සුරිඳුට, නානාතිමිසයෝසිතාක්ෂි ෂට්පදමුඛාරවිඥයෙන් ප්‍රමුදිතකොට දිවසැපත් විඳිනා උත්පලවර්ණ දිව්‍යරාජෝත්තමයානන්වහන්සේට; බැතියෙන්, භක්තිප්‍රේමයෙන් පුන් නව; එයති, පරහිඹිතනස්කාරනිකරදිනකරකිරණවූ ඒ මාගේ යතීන්ද්‍රයානන්වහන්සේ; සෙත්පිරිත්කොට, සත්‍යපරිත්තානුමෝදනා කිරිම් වසයෙන්; අයදින්, යාචඤාකරන්නේසි.

285 මිණිදිවුරත් මැදුර–මිණිදිවුවිලස බබල න
රුපුරම්බා රණවත් මතගිජිඳුව න
පැරකුම්බා නරනිඳු අදහස ලෙසි න
යෙහෙන් වෙසෙමින් නද–මහඹසු පඬිසෙ වෙසෙසි න

මැතිඳුන් සහ සෙනගවෙත ලම්නි දිවනෙ න
රුතියෙන් ඉසුරුදී පිරිපත ඇර ඉව න
තිතියෙන් රකිනලෙස පුල්වන් සුරිඳුවෙ න
බැතියෙන් සිට යදිති යතිසඳ යසදිමු න

285 මිණිදිව්, මිණිකැළුම්බාවන ඇත්තාවූ; රණමැදුර, සවර්ණමන් දිරයත්හි; මිණිදිව්විලස, මාණික්‍යශෝභාවිලාසයෙන්; බබලන, ලීලා පෙනවන්නාවූ; රුපු, ශත්‍රැරජනැමති; රඹාරණ, කදලිවනයට; වන්, ප්‍රවිෂ්ටවූ; මතගිජිඳුවන, මත්තහස්තියෙකු වැනිවූ; පැරකුම්බානරනිඳු, පරාක්‍රමබාහුනරේන්ද්‍රයාගේ; අදහසලෙසින, අදහස්වූපරිද්දෙන්; නද, නන්දනවූ; මහඹසුපඬිසෙ, මහෞෂධපණ්ඩිතයන්මෙන්; වෙසෙසින, විශේෂයෙන්; යෙහෙන්, ස්වාස්ථ්‍යයෙන්; වෙසෙමින, වාසයකරමින්;

මැතිඳුන්සහ, (චතුර්වේදඥණීවයෙහි පාරප්‍රාප්ත විචිත්‍රචිත්තකපිකවූ) මන්ත්‍රීනණයා හා; සෙනගවෙත, ඇත්අස් රථපාබල රුස්පිරිස්කෙරෙහි ද; දිවනෙතලම්නි, කරුණාදිවස්ඵලිය බහා; රුතියෙන්, අභිමතයෙන්; ඉසුරුදී, සකලෛස්වර්‍ය්‍යප්‍රදානයකිරීමෙන්; පිරිපතහැරඉවන, සම්පත්තාරය භූරිභූතකොට; තිතියෙන්, නිරන්තරයෙන්; රකිනලෙස, රක්ෂාකරණ පරිද්දෙන්; පුල්වන් සුරිඳුවෙන, ශ්‍රී ලඞ්කාවිප්පාවරණකොට ඇති උත්පල

වණ්ණිදිව්‍යරජයාගේ සමීපයෙහි; සිට, සම්ප්‍රාප්තව; යසඳිමුත, දසදිගනා රවනපන කීර්තිඝෝෂාඇති; යතිසඳ, කුඳුශඞ්ඛකුජරම්ඳර්ණයෙහි හරි සුවූ යතිඵලයත්වනත්සේ; යදිති, යාචස්‍යකෙරෙහි හෙවත් ආශිර්වාද කෙරෙති.

286 පුත් හ ස් අසුරුරුදි රජම්ණිමිණි නද න
පිත් රු ස් කරණ දූන සඳහම් මුනිනද න
සත් හ ස් බෝදිනයිනා කැම්ඳුන් නිති න
මත් තොස් වඩා රකිනුව යදිති අදරි න

286 පුත්හස්අසුරු, සම්පූර්ණ සන්තොෂාකාරයෙන්, රුදි, රජිතවූ; රජම්ණි, රාජෝත්තමනැම්ැහි; මිණි, මාණික්‍ය කරණකොටගෙණ; නද න, නඳනාවූ; මුනිනදන, මිත්‍ර සන්තොෂකරන්නාවූ; සදහම්, සබර්මය; දූන, ජානනාකොට; පිත්රුස්කරණ, සුචරිතයන් රුස්කරන්නාවූ; සත් හස්බෝදිනයිනාකැම්ඳුන්, සත්හස්කරුවූ බොධිනාගනායකනම් කම්ම සවාමීන්; නිතින, නිරන්තරයෙන්; රකිනුව, රක්‍ෂාකරණුපිණිස; මත් තොස්, චිත්තසන්තොෂය; වඩා, වර්ධනයකොට; අදරින, ආදරයෙන්; යදිති, යාචස්‍යකෙරෙත්.

287 ර සි ත් සපිරි මෙහසුන් රුගෙනගිය ලෙ සේ
වෙසි ත් සුනිල් රසඳන සදිසි ඇස ඇ සේ
බ සි ත් සිනිඳු කොවිලිඳු සඳිනි නොකම සේ
තොසින් පවතු සිය සිය නෑ සමග වැ සේ

287 රසින්, කාව්‍යරසයෙන්; සපිරි, සම්පූර්ණවූ; මෙහසුන්, මේසන්දෙශ වාක්‍යය; රුගෙනගියලෙසේ, ග්‍රහණයකොට යෙහෙන් ප්‍රධානයකලාක් මෙන්; සුනිල්, අතිනීලවූ; වෙසින්, විලාසයෙන්; ඇසඇසේ, නේත්‍රයක් පාසා; රසඳනසදිසි, නෙවුනාකොට අඳනාලද රසාජනයක්බඳුවූ; සිනිදු, සනිග්ධවූ; බසින්, වචනයෙන් යුක්තවූ; කොවිලිඳුසඳිනි, කොකිලපක්‍ෂිරාජොත්තමය; නොකම්සේ, සස්‍යබවක්නොව; සියනෑසමග, සම්භීය බන්ධුන් සහිතව; වැසේ, වාසයන්රිම්වසයෙන්; තොසින්, සන්තොෂයෙන්; සිය, ශතවර්ෂාධිකකාලයක්; පවතු, ජිවත්වෙහිවා.

288 උ ස දෙවුනුවර දිසි ඉරුගල් කුලට කිරු ල්
ය ස සිරි වඩන නිසි ගිරිවැසි තෙරිඳු එම ල්
තො ස යුතු තිලක පිරිවන් හිමි පවරනිම ල්
ර ස කර පැවසු පරපුටු සඳෙසරුත් ලක ල්

288 උසදෙවුනුවර, මහානුභාවසම්පන්න උත්පලවර්ණ දිව්‍යරාජ භවන ප්‍රතිෂ්ඨිත හෙයින්දෝ හෝ නොහොත් සමදම්ශුදජනාකිර්ණ

චෛත්‍යශූන්‍යකපමණ්ඩපක විවිධ උත්තුඟ ප්‍රාසාදපඞ්ක්තීන් හෙබියාවූහෙයින් දේ හෝ උත්තුඟවූ ශ්‍රීවර්ධනපුරරාජනගරයෙහි; ඉරුගල්කුලට, ඉරුගල්නාම් වංශයට; දිසි, දීප්තිමත්වූ; කිරුල්, කිරීටයක්වැනිවූ; යස, දිගුකිත පතල කීර්තිඝෝෂාඇති; නිසි, කැමතිපරිද්දෙන්; සිරවඩන, දානසීලාදී පුණ්‍යක්‍රියාවෙන් වඩනාව ලොකප්‍රසිද්ධවූ; ගිරිවැසිතෙරිඳු, ලොකනාථ ප්‍රතිබිම්බාතුඟහී චෛත්‍යබොධීන්ගෙන් ප්‍රතිමණ්ඩිතවූ මුලගිරිනාම් පර්වත ප්‍රාන්තයෙහි වාසයකළාවූ මහාස්ථවිරයන්වහන්සේගේ; එමල්, ශිෂ්‍යපරම්පරාවෙන්හා සංඝීය ගෝත්‍රසන්තානයෙන් මල්වූ; තොසයුතු, සම්පත්තිසැපයෙන් තුෂ්ණීම්භූතවූ; පවර, උතුම්වූ; නිමල් පාපකාලුෂ්‍යකර්මනිරපූර්ණචිත්තසන්තානයෙහි උදකප්‍රසාදමාණික්‍යයක් පැමිණි ජලතලාවක්සේ නිර්මලවූ; තිලකපිරිවෙන්හිමි, පර්යාප්තිධරවූ තිලක පරිවෙණාධිපති මහා ස්ථවිරයන්වහන්සේ විසින්; අරුත්ලකල්, අර්ථාලඞ්කාරවූ; පරපුටු සඳෙස, කොකිල සන්දේශ නම් ප්‍රකරණය; රසකර, යමක ප්‍රහේලිකාදි කාව්‍යරසයෙන් මධුරකොට; පැවසූ, ප්‍රකාශකෙළේයි.

---

| | | | |
|---|---|---|---|
| ල | ක | මුළු කිවිවරන් ගජසී සිරින් බි | දී |
| න | ක | නිය තිලක පිරිවෙන ලෙවුවැඩෙහි බැ | දී |
| පි | ක | ඝුළුසදෙස රුතියොන දදබැවින් මි | දී |
| සැ | ක | ඇර සෙබෙහි පැලඹෙනි රුත් රුවන් දි | දී |
| ස | ක | රජවසින් දහසෙකි සසියනු ප | ස |
| ල | ක | හිමි බසින් දිසිදුනම් කිවිදෙක් පිවි | ස |
| සැ | ක | හැර ලෙවන් පදරුත් උගහණු පිණි | ස |
| පි | ක | කුළු හසුන් රුත් විදහා කළ විනි | ස |